# දේව විශ්වාසය


## හා ළමා පරපුර



අබ්දුල්ලාහ් බින් හමද් අර්රක්ෆ්

# දේව විශ්වාසය හා ළමා පරපුර

ළමා වියේ දේව විශ්වාසය හා බැඳුණු ගැටලු විවරණය




කතෘ

**අබ්දුල්ලාහ් බින් හමද් අර්රක්ෆ්**

සිංහල අනුවාදය

**මුහම්මද් අකීල් මුහම්මද් අමීන්**

සෝදුපත් කියවීම

**අහ්මද් මුබාරක් මුහම්මද් මක්දූම්**

**මාහිර් රම්ඩීන්**

**මුහම්මද් අසීම්**

ⓗ جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالربوة ، ١٤٤٣هـ

***فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر***

الركف ، عبدالله حمد عبدالعزيز
أسئلة الطفل الإيمانية باللغة السنهالية. / عبدالله حمد عبدالعزيز
الركف ؛ مركز اصول .- الرياض ، ١٤٤٣هـ
١٣٥ ص ؛ ..سم

ردمك: ٨-٢٩-٨٣٥٢-٦٠٣-٩٧٨

١- التربية الاسلامية أ.مركز اصول (مترجم) ب.العنوان
ديوي ٣٧٧,١ ١٤٤٣/٤٣٦٨

**رقم الإيداع: ١٤٤٣/٤٣٦٨**
**ردمك: ٨-٢٩-٨٣٥٢-٦٠٣-٩٧٨**

Osoul Center
www.osoulcenter.com

This book has been conceived, prepared and designed by the Osoul Centre. All photos used in the book belong to the Osoul Centre. The Centre hereby permits all Sunni Muslims to reprint and publish the book in any method and format on condition that 1) acknowledgement of the Osoul Centre is clearly stated on all editions; and 2) no alteration or amendment of the text is introduced without reference to the Osoul Centre. In the case of reprinting this book, the Centre strongly recommends maintaining high quality.

4900 445 11 966+
0126 497 11 966+
www.osoulcenter.com

بسم الله الرحمن الرحيم



# පෙරවදන

අද දරුවන් හෙට පරපුරයි. එහෙයින් දේව විශ්වාසය, පුහුණුව, බුද්ධිය, මනස හා බැඳුණු ක්ෂේත්‍රයන්හි කියවීමට හා සවන් දීමට හැකි නිර්මාණ සැකසීම වඩාත් වැදගත් කරුණක් වී ඇත. මෙම වැදගත් ක්ෂේත්‍රයන්හි විවිධ වර්ගයේ නිර්මාණ තිබුණ ද ඊට අමතර ව අධ්‍යාපනය හා බැඳුණු තවත් නිර්මාණ අවශ්‍යව පවතී. එය සමාජයේ දක්නට ලැබෙන යථාර්ථයකි. අප මුස්ලිම් සමාජය ඇතුළු ව සමස්තයක් ලෙස ලෝකයේ වේගවත් වර්ධනයන් ඇති බවට සැකයක් නැත. මීට අමතරව, ජනමාධ්‍ය හා සමාජ ජාලවල විවෘතභාවයන් බොහෝ නිවාසවල ලබා දී ඇති නිදහසත් හේතු කොට ගෙන මෙම වයස්වල ළමුන් සඳහා සුදුසු වැඩසටහන් නැවත නැවත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පවතී.

අපගේ දරු පරපුරට ගැළපෙන පරිදි නිවැරැදි දේව විශ්වාසය හා බැඳුණු අධ්‍යාපනය තුළ මූලික මාතෘකාවන් ආචාර්ය අබ්දුල්ලාහ් බින් හමද් අර්රක්ෆ් විසින් මෙම පොතට ඇතුළත් කොට ඇත. දරුවන්ගේ දේව විශ්වාසය හා සම්බන්ධ ප්‍රශ්න සමග කටයුතු කරන්නට පුහුණු කිරීමේ නීති රීති හා මූලික කරුණු මෙම පොතේ ආරම්භ කොටසේ දැකිය හැක. පොතේ දෙවන කොටසේ නිතර දරුවන් විසින් අසනු ලබන බොහෝ ප්‍රශ්නවලට ප්‍රායෝගික උදාහරණ සපයමින් පිළිතුරු දී ඇත. මෙමගින් තම දරුවන්ට පිළිතුරු සැපයීමට දෙමාපියන්ට හැකි වේ.

දලාඉල් මධ්‍යස්ථානය



# ප්‍රස්තාවනාව

පැසසුම් සියල්ල සර්ව බලධාරී අල්ලාහ්ට හිමිය. තවද අවසාන වක්තෘ මුහම්මද් තුමාණන් හට ද එතුමාගේ ඥාතීන් සහ හිත මිතුරන් ඇතුළු සියලු දනන් හට ද අල්ලාගේ සදා ශාන්තිය හා සමාදානය උදා වේවා!

ළමා වියේ මුල් අවදියේදී දරුවා තුළ මෙලොව පැවැත්ම පිළිබඳ දැක්ම තහවුරු කිරීම අතිශය වැදගත් වේ. එම කාලයෙහි දරුවාගේ මානසිකත්වය තුළ අන්තර්ගත වන අදහස් පුද්ගලයකුගේ පෞරුෂත්වය විවිධ අංශවලින් සාදන ප්‍රධාන පදනම ලෙස සැලකෙ. දරුවා ජීවිතය පුරාම ඵලදායී සහ කාර්යක්ෂම පුද්ගලයෙකු ලෙස ගමන් කිරීමට සහ එහි විවිධ මාර්ග ඔස්සේ සමබර ලෙස ගමන් කිරීමට රුකුලක් වන අයුරින් එම පැවැත්ම පිළිබඳ දැක්ම සම්පූර්ණයෙන්ම ස්ථාපිත කිරීම වැදගත් වේ. දරුවා අසන සහ දකින දෙයින් මේ ලෝකයේ තමාගේ ම අනුවාදයක් ගොඩනගයි. ඉන්පසු ඔහුගේ ජීවිතයේ ඉතිරිව ඇත්තේ අවට තත්ත්වයන් අනුව මෙම ප්‍රධාන අනුවාදය වෙනස් කිරීම හා සංවර්ධනය කිරීම පමණි.

මෙම කාල පරිච්ඡේදය තුළ දරුවාගේ දැනුමෙහි ප්‍රභවය ඔහුගේ දෙමාපියන් ය. එමනිසා දරුවන්ගේ යහපත්කම පැන නගින්නේ ඔවුන්ගේ දෙමව්පියන් යහපත් අයුරින් ඔවුන්ව හදා වඩා ගැනීම මගිනි. මන්දයත් දරුවන්ට ඉගැන්වීමේ වගකීම ඔවුන් සතුය. මුහම්මද් නබි ﷺ තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ:

"ඔබ සැවොම වගකිව යුත්තන් ය. ඔබට පවරා ඇති දෑ පිළිබඳ ඔබෙන් විමසනු ලැබේ."(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

සැබැවින් ම, ඉහත කී දරුවන්ට ඉගැන්වීමේ කර්තව්‍යය සඳහා අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමේ අවධානය සහ උත්සාහය අවශ්‍ය වේ.

අප ජීවත් වන්නේ තෘෂ්ණාවන් සහ සැකයන් ව්‍යාප්තව පවතින කාලයක බැවින්, අවංකව, සැලකිල්ලෙන් හා තපාගශීලීභාවයෙන් තම දරුවන් ඇති දැඩි කිරීමේ උත්සාහය දෙමාපියන් විසින් ඉහළ නැංවිය යුතුය. එසේ කිරීම තුළින් ඇතැම්විට දරුවාගේ ආත්මය තුළ ඔහුගේ දෙමව්පියන් විසින් රෝපණය කරන ලද යම් හෝ බීජයක් දෙමව්පියන්ගේ මරණයෙන් පසු ස්ථිර ප්‍රතිලාභයක් ලබා දීමට ඉඩ ඇත. එවිට මරණයෙන් පසු ඵල ප්‍රයෝජන ලබා දෙන දෑ පිළිබඳ විස්තර කිරීමේ දී මුහම්මද් ﷺ තුමාණෝ (ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරන

හොඳ දරුවෙක්) යනුවෙන් පැවසූ පරිදි ඔවුන්ගේ මරණයට පසුවත් නොකඩවා ගලා එන එලදායී ක්‍රියාවන් වලින් එක් කරුණක් බවට එම දරුවා පත්වනු ඇත.

ඊට අමතරව, දරුවන් යනු දෙවිඳුන් අල්ලාහ් විසින් දෙමාපියන් කෙරෙහි භාර කරන ලද සම්පතකි. ඒ පිළිබඳ ශුද්ධ වූ අල්කුරානයේ දෙවිඳුන් මෙසේ ප්‍රකාශ කොට ඇත:

يُوصِيكُمُ اللَّهُ فِي أَوْلَادِكُمْ

" නුඹලාගේ දරුවන් විෂයයෙහි අල්ලාහ් අවධාරණය කරයි "(4:11)

මෙම වාක්‍යයෙහි අර්ථ විවරණය නම්: දෙමව්පියනි! ඔබේ දරුවන්ට ඔවුන්ගේ ආගමික හා ජීවන අවශ්‍යතා සපයා දීම, ඔවුනට ඉගැන්වීම, ඔවුන්ව ඇති දැඩි කිරීම, දූෂණයෙන් වළක්වා ගැනීම සහ දෙවියන්ට සැමවිට ම කීකරු වී ඔහුගේ අණ පිළිපැදීමට අණ කිරීම ඔබේ වගකීම යන්නයි. තවද දෙවිඳුන් මෙසේ පවසයි:

يَا أَيُّهَا الَّذِينَ آمَنُوا قُوا أَنفُسَكُمْ وَأَهْلِيكُمْ نَارًا وَقُودُهَا النَّاسُ وَالْحِجَارَةُ

" විශ්වාස කළ අයවලුනි ල නුඹලාත් නුඹලාගේ පවුලේ අයත් නිරා ගින්නෙන් ආරක්ෂා කර ගන්න. එහි ඉන්ධන වනුයේ මිනිසුන් හා ගල් ය." (66:6)

එමනිසා දරුවන් යනු දෙවිඳුන් විසින් දෙමාපියන්ට ලබා දුන් වගකීමකි. එම වගකීම නිසි අයුරින් ඉටු කිරීමේ හා එය අපතේ යවා දැඩුවමට භාජනය වීමේ තේරීම ඔවුන් සතු ය. මෙයින් ඇඟවෙන්නේ අල්ලාහ් දෙමව්පියන්ට වඩා සිය ගැත්තන් සමඟ දයානුකම්පිත බවය, මව්පියන් ඔවුන්ගේ දරුවන් කෙරෙහි මුළුමනින්ම ආදරය හා කරුණාව දක්වන අයවලුන් බව නොරහසක් වුව ද, ඔවුන්හට සිය දූ දරුවන් කෙරෙහි වූ වගකීම අල්ලාහ් අවධාරණය කළේ ඒ නිසාවෙනි.

ඒ අනුව, පවුලක් තුළ දරුවාගේ හැදියාව දියුණු කිරීමේ ක්‍රියාවලිය හොඳින් සිදු වූයේ නම්, දරුවාට බාහිර ලෝකය සමඟ හොඳින් කටයුතු කිරීමට හැකි වේ. තවද දරුවා හදා වඩා ගැනීමේ දී සහ ඔහු ආගමික වශයෙන් යහපත් ලෙස වර්ධනය කිරීමේ දී පවුලේ කාර්යභාරය තුළ යම් අඩුපාඩුවක් සිදු වීම නිසා ළමයෙකු තුළ විවිධාකාර ප්‍රශංසනීය ආකල්ප අහිමි වීමේ ප්‍රවණතාවය ඉතා ඉහළය. ළමයින්ගේ

හැදියාව දියුණු කිරීමේ කාර්යභාරය පදනම් වී ඇත්තේ වැරදි නිවැරදි කිරීම මත පමණක් නොව ආගමේ මූලධර්ම සහ එහි නීති ඉගැන්වීම මත සහ උපදෙස්, කතාවස්තු, පෙර සිදුවීම් යනාදියෙන් ආදර්ශයන් උපුටා ගනිමින් අරමුණු සාක්ෂාත් කර ගැනීමේ විවිධ ක්‍රම භාවිතා කිරීම මත හා ඔවුන්ගේ ආත්මයන් තුළ ඒ සියල්ල කිඳා බැස යන අයුරින් කටයුතු කිරීම මත ය. මෙමගින් ජීවිතය සහ සමාජය තුළ ඵලදායී පෞරුෂත්වයක් ඇති සමබර පුද්ගලයකු අප විසින් ලොවට ඉදිරිපත් කළ හැක.


මෙම පොත පරිච්ඡේද දෙකකින් සමන්විත ය . පළමුවැන්න : "දරුවන්ගේ ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීම" පිළිබඳ කරුණු අන්තර්ගත වන අතර එමගින් දෙමව්පියන්හට සිය දූ දරුවන් ඇතිදැඩි කිරීමට උපකාරී වන බොහෝ මූලික ක්‍රම හා මූලධර්ම (අල්ලාහ්ගේ අනුහසින්) දැකගත හැකිය. දෙවැන්න: දරුවන් තුළ දේව විශ්වාසය හා සම්බන්ධව පවතින ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පිළිබඳ ප්‍රායෝගික උදාහරණ ය. මෙය විවිධ වයස් කාණ්ඩවලට අයත් ළමුන් අතර ප්‍රචලිත - විශේෂයෙන් - දේව විශ්වාසයේ කුළුණු සය වැනි පොදු ප්‍රශ්න සහ එවැනි ප්‍රශ්න සමඟ කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳ නිදර්ශනයන් ඉදිරිපත් කරනු ඇත.

සියලු භාග්‍ය පිරිනමන්නා සහ නිවැරදි මාර්ගයට මග පෙන්වන්නා උත්තරීතර අල්ලාහ් ය.

අබ්දුල්ලාහ් බින් හමද් අර්රක්ෆ්

# Table of Contents


13 ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීම




දරුවන් තුළ ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීම 28

50 ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීමේ කුළුණු







ගැටළු විවරණයට
පිවිසුම
74

92
දරුවන් තුළ දේව විශ්වාසය
හා සම්බන්ධව පවතින
ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
පිළිබඳ ප්‍රායෝගික
උදාහරණ



## ආධ්‍යාත්මික

# වර්ධනය

## දියුණු කිරීම





## ආධ්‍යාත්මික වර්ධනය[1] දියුණු කිරීම

හැදියාව වර්ධනය කිරීමේ[2] ක්‍රියාවලිය වනාහි මානවයාගේ වර්ධනය සඳහා වූ මානව අවශ්‍යතාවයකි. එය ජීවන තත්ත්වය සහ වෙනත් අංශයන්හි දරුවා ස්ථාපිත කිරීමේ මෙවලම වේ. එමගින් දරුවාගේ සමාජ, අධ්‍යාපන, මානසික සහ සෞඛ්‍ය පෞරුෂත්වයන් ගොඩ නැගෙනු ඇත. එබැවින් දරුවන්ගේ ආධ්‍යාත්මික වර්ධනය සහ එහි වැදගත්කම පිළිබඳව සාකච්ඡා කිරීමට පෙර, අප විසින් හැදියාව වර්ධනය කිරීම යන සංකල්පය, එහි තේරුම සහ එම ක්ෂේත්‍රයේ විශේෂඥයින් එයින් අපේක්ෂා කරන දේ කුමක් ද යන්න පිළිබඳ අප දැනුවත් වීම ඉතා සුදුසු ය.


---

1. මෙම කෘතියෙහි ආධ්‍යාත්මික වර්ධනය යන්නෙන් අදහස් වන්නේ ඊමාන් නම් දේව විශ්වාසය සමඟ බැඳී ඇති හදාවඩා ගැනීමයි..

1. තර්බියියා නම් අරාබි පදය සඳහා හදාවඩා ගැනීම, වර්ධනය කිරීම, හැදියාව වර්ධනය කිරීම, අධ්‍යාපනය වැනි බොහෝ අර්ථ තිබුණ ද මෙම කෘතියෙහි මාතෘකාවට අදාළව මෙම පදය සඳහා හැදියාව වර්ධනය කිරීම යන අර්ථය විශේෂයෙන් තෝරා ගන්නා ලදි. ඒ පදය සඳහා නො-යෙකුත් ස්ථාන වල අධ්‍යාපනය යනුවෙන්ද අර්ථ දක්වා ඇත.

## හැදියාව වර්ධනය කිරීමේ

# සංකල්පය



*හැදියාව වර්ධනය කිරීමේ සංකල්පය යනු මාර්ගෝපදේශය, අධ්‍යාපනය, ශිෂ්ඨත්වය හා අභ්‍යාස තුළින් හොඳ පුරුදු ඇති කර ගැනීම අරමුණු කරගත්, රීති හා රෙගුලාසි මගින් පවත්වාගෙන යනු ලබන අරමුණු සහිත සංවර්ධිත ක්‍රියාවලියකි.*

*වැඩී එන දරුවාගේ සහජ ස්වභාවය ආරක්ෂා කිරීම සහ එය සුරක්ෂිත කිරීම, ඔහුගේ හැකියාවන් සහ සූදානම පෝෂණය කිරීම මෙන්ම මහපොළොවේ වාසය කිරීම සඳහා යහපත් මිනිසෙකු සූදානම් කිරීමට උපකාරී වන පරිදි ධර්මිෂ්ඨකම සහ පරිපූර්ණත්වය සපුරාලන දෙය වෙත එම සහජ ස්වභාවය හා හැකියාවන් මෙහෙයවීම ද එමගින් අර්ථවත් වේ. තවද හැදියාව දියුණු කිරීමේ සංකල්පය යනු සෑම ජීවන අංශයක් තුළ ම නායකත්වය නිර්මාණය කරන මෙවලමකි.*

## ආධ්‍යාත්මික වර්ධනයේ

# වැදගත්කම



*දේව විශ්වාසය යනු පැවැත්මෙහි පරම සත්‍යය සහ මනුෂ්‍යත්වයේ ශ්‍රේෂ්ඨතම හේතුවයි. එමෙන්ම එය මෙලොව ජීවිතයෙහි මිනිසුන්ගේ ගමන් මාර්ගයෙහි සන්ධිස්ථානයකි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කොට ඇත:*

*"ඔවුනතර විශ්වාස කළ අය ද සිටිත. (එකම දෙවිඳුන්) ප්‍රතික්ෂේප කරන අය ද සිටිති."* (2:253)

*දේව විශ්වාසය මතම මිනිසුන්ගේ ක්‍රියාවන් සහ හැසිරීම් ගොඩනැගෙනු ඇත. මතුලොව ඔවුනට ලැබෙන විවිධ තරාතිරම්හි ප්‍රධාන වෙනස එයය. පුද්ගලයෙකුගේ ජීවිතයේ වඩාත් ම තීරණාත්මක කාල පරිච්ඡේදය වන්නේ ළමා කාලයයි. මක්නිසාද යත්, මෙම කාල පරිච්ඡේදය තුළ දරුවාගේ ආත්මය තුළ (ඇදහීම්, වටිනාකම්, ව්□යවහාර, දර්ශන වැනි) අන්තර්ගත වන දෑ අනාගතයේ දී සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමට වඩා වෙනස් කිරීමට පවා අපහසු ය. ඇතැම් විට එය සිදු කළ නොහැකි කරුණකි. ඇතැම් විට එහි බලපෑම් පුද්ගලයාගේ පෞරුෂය තුළ සදා රැඳී පවතී. එමනිසා, ළමා කාලය තුළ ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීම යනු මිනිසෙකුගේ මෙලොව ජීවිතය ගොඩනැ□ගෙන ආරම්භක අඩියරයන් අතුරින් එකකි.*

පොදුවේ ගත් කල හැදියාව වර්ධනය කිරීම යනු එක් අයුරින් අවධානයෙන් යුතුව රැක බලා ගැනීමකි. අවධානයෙන් තොරව හැදියාව වර්ධනය කිරීමක් නොමැත. වඩාත් අවධානම් විය යුතු වැදගත් ම දෙය නම් දේව විශ්වාසය වර්ධනය කිරීම පිළිබඳවයි. අප ජීවත් වන්නේ බොහෝ පර්යේෂකයන් අධ්‍යාත්මිකභාවය හා දේව විශ්වාසය නොසලකා හරිමින් මානසික හා ශාරීරික කෝණය කෙරෙහි පමණක් අවධානය යොමු කරන කාලයක ය. මතුලොව සන්තෝෂයට තුඩු දෙන යහපැවැත්ම කෙරෙහි කිසිදු දැක්මක් නොමැති ව භෞතිකවාදී මාර්ගයෙන් සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා ඔවුහු සිය නිබන්ධනයන් යොමු කරති. එහෙත් ඉස්ලාම් හි හැදියාව වර්ධනය කිරීමේ පද්ධතිය මෙම කෝණයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වේ.

ඉස්ලාමය තුළ ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීම වනාහි ධර්ම දූතයාණන්ගේ පිරිසිදු යුගයේ සිට ම ස්ථාපනය කළ ප්‍රධාන කුළුණක් බව පැහැදිලිය. ඒ බව ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් නබි ﷺ තුමාගෙන් සවන් දුන් බව වාර්තා කරන මෙම නබි වදන සාක්ෂියකි.

"ඔබ සෑම කෙනෙකුම භාරකරුවෙකු වේ. ඔබලාගේ වගකීම් පිළිබඳ වගකිව යුත්තන් ඔබලා ම ය. පාලකයා භාරකරුවෙකු වන අතර ඔහුගේ යටත්වැසියන්ට ඔහු වගකිව යුතුය. කාන්තාව තම සැමියාගේ නිවසේ භාරකරුවෙකු වන අතර ඇයගේ වගකීම් කෙරෙහි වගකිව යුත්තේ ඇය ම ය. (බුහාරී හදීස් අංක 2558/ මුස්ලිම් හදීස් අංක 1829)

මෙමඟින් එතුමාණන් අප සියල්ලගේ උරහිස් මත ඇති දැවැන්ත වගකීම හා අප යටතේ පවතින උදවිය කෙරෙහි අප කුමක් ඉටු කළේ ද? යන වග අපගෙන් - නිසැකව - විමසනු ඇත යන්න පෙන්වා දුන්හ. තවදුරටත් එතුමා ප්‍රකාශ කළ බව මෙසේ සඳහන් වේ:

"කවරෙකුට අල්ලාහ් ඇතැමුන් කෙරෙහි පාලනය කිරීමේ බලයක් ලබා දී ඔවුන් ව අවංකව ඔහු රැකබලා නොග න්නේ නම් ඔහුට ස්වර්ගයේ සුවඳ පවා නොදැනෙනු ඇත" (බුහාරී හදීස් අංක 7150)

අවංකව හා සත්‍යවාදීව උපදෙස් ලබා දීමේ වැදගත්කම පිළිබඳ සටහනක් මෙහි දැක්වේ. යම් උපදේශයක් සෑම අංශයකින් ම උපදේශය ලබන්නාගේ ප්‍රතිලාභයට තුඩු දෙන අයුරින් තිබිය යුතුයි. තවත් මෙම මාතෘකාව හා



සම්බන්ධව වාර්තා වූ ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන්ගේ වදනක් පහත සඳහන් වේ:

“ඔබ ඔබේ පුතාට විනය කියා දෙන්න ග මන්ද ‘ඔබ ඔහුව ඇති දැඩි කළේ කෙසේද?ඔබ ඔහුට ඉගැන්වූයේ කුමක්ද? යන්න පිළිබඳ ඔබෙන් විමසනු ලැබේ. එමෙන් ම ඔබගේ කරුණාව හා ඔබට ඔහු කීකරුවීම පිළිබඳව ඔහුගෙන් විමසනු ලැබේ. (ෂුඃබුල් ඊමාන් ලිල් බයිහකී හදීස් අංක : 8141)

මෙමගින් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හ) තුමාණන් වගකීම ප්‍රථමයෙන් දෙමව්පියන්ගේ උරහිස මත තිබෙන බව සහතික කරයි. මන්ද ඔවුන් අධ්‍යාපනය හා විනය කියා දීමේ පළමු ප්‍රභවය වන බැවිනි. එමෙන්ම යහපත් අයුරින් විනය ගරුක ලෙස හැදියාව වර්ධනය කිරීම වනාහි සදකා නම් පුණ්‍යකර්මයට වඩා විශිෂ්ට බව වාර්තා වී ඇත. එය පහත අයුරිනි:

“මිනිසෙකු තම දරුවාට විනය කියා දී පුරුදු පුහුණු කිරීම වනාහි ආහාරපාන පරිත්‍යාග කිරීමට වඩා යහපත් වේ.” (තිර්මිදි හදීස් අංක 1951, සිල්සිලා අල් ළඊෆා යන ග්‍රන්ථයේ ඉමාම් අල්බානී තුමාණන් මෙම නබි වදන දුර්වල සනයට අයත් වදනක් යනුවෙන් සඳහන් කර ඇත.)

තවද යහපත් ගතිපැවතුම් දරුවාට උගන්වා දීම වනාහි සියලු පුණ්‍යකර්මයන්ට වඩා ශ්‍රේෂ්ඨ බව මෙසේ වාර්තා වී ඇත: දෙමව්පියන් පුතෙකුට යහපත් හැසිරීමකට වඩා ශ්‍රේෂ්ඨ යමක් ලබා දීමට නොහැක. (තිර්මිදි හදීස් අංක 1952, සිල්සිලා අල් ළඊෆා යන ග්‍රන්ථයේ ඉමාම් අල්බානී තුමාණන් මෙම නබි වදන දුර්වල සනයට අයත් වදනක් යනුවෙන් සඳහන් කර ඇත.)

ඉහත සඳහන් වදන් හා කියමන් සියල්ල මගින් අඟවනු ලබන්නේ විනය කියා දීම හා අධ්‍යාපනය ලබා දීම පිළිබඳ සැලකිලිමත් වීම සිය දූ දරුවන් කෙරෙහි දෙමාපියන් ඉෂ්ඨ සිද්ධ කරන අති විශිෂ්ට හා ඉමහත් කරුණක් යන්නයි.

අතීතයේ දී අප හැදී වැඩුණේ සාපේක්ෂව සංවෘත පරිසරයක ය. එනමුත් අද අප ජීවත් වන්නේ විවෘත




ලෝකයකයි. නිසැකවම ඒ වටා යහපත් සහ අයහපත් තත්ත්වයන් තිබෙනු ඇත. එහෙත් අප සෝදිසියෙන් නොසිට, සිදුවන්නේ කුමක්ද යන්න පැහැදිලිව වටහා නොගන්නේ නම්, අයහපත යහපත අභිබවා යා හැකිය, අප අවට සිදුවන කාලීන ව්‍යාකූලත්වයන් විශ්ලේෂණය කර යහපත් සංස්කෘතික හා අධ්‍යාපනික ක්‍රම මගින් ඒවා නිරීක්ෂණය කළේ නම් ඒවා පිළිබඳ අපට තේරුම් ගත හැකිය. ළමයින්ගේ ආත්මයන් තුළ ඇදහිල්ල හා දේව විශ්වාසය පදනම් කරගත් අර්ථයන්ට සහයෝගය දක්වන පවුලේ වාතාවරණය සහ ළමුන් පිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන ආයතන සහ පාසල් තෝරා ගැනීම යනාදී කරුණු කෙරෙහි උපදේශකයාගේ සැලකිල්ල අත්‍යාවශ්‍ය වේ. අප අවට සිදු වන දෑ තේරුම් ගැනීමට නොදැන සිටීම යනු වන්දි ගෙවිය නොහැකි විශාල පාඩුවක. කෙසේ වෙතත, හැදියාව වර්ධනය කිරීමේ කර්තව්‍ය අඛණ්ඩව සිදු කිරීම සහ ඉවසීම මගින් අපට හැකි උපරිම ප්‍රතිඵල - අල්ලාහ්ගේ අවසරයෙන් - ලැබෙනු ඇත. මක්නිසාදයත්, හැදියාව වර්ධනය කිරීමේ සංකල්පය යනු හුදු මගපෙන්වීම් පමණක් නොව, පසු විපරම් කිරීම සහ අඛණ්ඩ ව එම මගපෙන්වීම සිදු කිරීම් යනාදිය ද ඒ සඳහා අවශ්‍ය වේ.



## ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීම

# අත්‍යවශ්‍යයි





වර්තමාන ළමා පරපුර මානසික හා සංස්කෘතික පිම්මක් මත හා පුළුල් විවෘතභාවයක් අත් විඳිමින් ජීවත් වේ. ඔවුන් වටා සිදු වන ආකර්ෂණීය සිදුවීම් අවතක්සේරු කිරීම අති භයානක ය. මිනිස් පැවැත්මේ දුෂ්කරම කර්තව්‍යය යැයි සැලකෙන හැදියාව වර්ධනය කිරීමේ කර්තව්‍ය අප වෙත පවරා තිබේ. නියතව, ජනයා කෙරෙහි - විශේෂයෙන් කුඩා ළමුන් - දේව විශ්වාසය ඉගැන්වීම හා ඒ කෙරෙහි ඇරයුම් කිරීම වනාහි ධර්ම දූතවරුන් හා ඔවුනට පසුව පැමිණි ප්‍රතිසංස්කරණවාදීන්ගේ ක්‍රමවේදය වේ. මෙයින් මෙම කර්තව්‍යයෙහි අවශ්‍යතාවය සහ සමාජයට එය කොපමණ අත්‍යාවශ්‍යද යන්න පැහැදිලි වේ. ඒ පිළිබඳ පළ වූ අල්කුර්ආන් වැකි හා නබි වදන් පහත සඳහන් ය.

නූහ් (අලෛයිහි සලාම්) තුමාණන් දූෂිතයන් සමඟ යන සිය පුත්‍රයා කැඳවා අනතුරු ඇඟවූ ආකාරය මෙලෙස සඳහන් වේ:

“මාගේ දයාබර පුතණුවනි! අප සමඟ නැග ගන්න. (කම දෙවිඳුන්) ප්‍රතික්ෂේප කළ අය සමඟ නොසිටින්නැ’යි නූහ් පැවසීය. (11:42)

සිය දරුවන් කෙරෙහි ඉබ්‍රාහීම් (අලෛයිහි සලාම්) තුමාණන්ගේ උපදේශනය පිළිබඳ අල්ලාහ් මෙසේ පවසයි:

“මාගේ දරුවනි! අල්ලාහ් නුඹලාට මෙම ධර්මය තෝර්රා දී ඇත. මුස්ලිම්වරුන් ලෙසින් මිස නුඹලා මරණයට පත් නොවිය යුතුයැ’ යි ඉබ්‍රාහීම් ද යඃකූබ් ද තම දරුවන්ට අවධාරණය කළහ. (2:132)

ලුක්මාන් (අලෛයිහිස් සලාම්) සිය පුත්‍රයාණන් කෙරහි කළ ප්‍රථම උපදේශනය වන්නේ අල්ලාහ්ට ආදර්ශයන් තැබීමෙන් වැළකී සිටීමයි:

ලුක්මාන් තම පුත්‍රයාට අනුශාසනා කරන විට “මාගේ දයාබර පුතණුවනි! අල්ලාහ්ට සමානයන් කල්පනය නොකරන්න. සමානයන් කල්පනය කිරීම ඉමහත් අපරාධයක් යැ’යි ප්‍රකාශ කළහ. (31:13)

අපගේ ධර්ම දූත මුහම්මද් නබි ﷺ තුමාණන් ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමාට උපදෙස් දුන් අයුරු පහත සඳහන් වේ:

දරුව! අල්ලාහ් ගැන සිහියෙන් සිටින්න. එවිට ඔහු ඔබව ආරක්ෂා කරනු ඇත. අල්ලාහ් ගැන සිහියෙන් සිටින්න. එවිට ඔබ ඔහුව ඔබ ඉදිරියෙහි සොයා ගනු ඇත. ඔබ විමසන විට අල්ලාහ්ගෙන් විමසන්න. ඔබ උපකාරය පතන විට අල්ලාහ්ගෙන් ම උපකාරය පතන්න. (තිර්මිදි හදීස් අංක 2516, ඉමාම් අල්බානී තුමාණන් මෙම නබි වදන නිවැරැදි බව සනාථ කර ඇත) ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීමේ උනන්දුව දැඩි ලෙස තිබිය යුතු බව මෙම නබි වදන හඟවයි.

මෙම කර්තව්‍යයෙහි අවශ්‍යතාවය විදහා දක්වන තවත් කරුණක් නම්, එය සියලු ක්ෂේත්‍රයන් හි ප්‍රධානියා සහ පදනම බව දැන සිටීම ය. වක්තෘවරයාණන්ගේ ක්‍රමයවේදයට අනුව දේව විශ්වාසය දරුවා ඉගෙන ගෙන ඔහුගේ හදවතේ එය ස්ථිරව පතිත වන්නේ නම් වන්දනාමාන සහ අනෙකුත් අමතර ආගමික කරුණු එය ලුහුබැද පසු පසින් පැමිණෙනු ඇත. එමනිසා ඒ කෙරෙහි උනන්දු වීම සාර්ථකත්වයට හා සෘජු මගෙහි නිරත වීමට (අල්ලාහ්ගේ අනුමැතියෙන) හේතුවක් වේ. මන්ද දෙවිඳුන් හා විනිශ්චය දිනය කෙරෙහි විශ්වාස කිරීම තුළ බොහෝ කරුණු පවතී. දේව විශ්වාසය දැඩිව පවතින සෑම අවස්ථාවකදීම, එය තහනම් මාවතක ගමන් කිරීමෙන් මිනිසා වළක්වාලනු ඇත.

මෙම කර්තව්‍යයෙහි අවශ්‍යතාව විදහා දක්වන තවත් කරුණක් නම්, සමහර දෙමව්පියන් තම දරුවන් තවමත් කුඩා වියේ පසු වන බව කියමින් ඔවුනට ආගමික කරුණු ඉගැන්වීම අතපසු කරයි.  ළමයින් වැඩුණු පසු ඔවුනට එවැනි අධ්‍යාපනයක් ලබා දීමට නොහැකි වේ. තම දරුවාට නිවැරැදි අධ්‍යාපනය නිවැරැදි කාලයේ දී ලබා දීම නොසලකා හරින්නේ නම් එය ඔවුන්ගේ නොසැලකිලිමත් බව පෙන්නුම් කරයි. බොහෝ දරුවන් නොමඟ යෑමට හේතුව ඔවුන්ගේ දෙමාපියන් ඔවුනට ආගමෙහි මූලික හා අමතර දෑ ඉගැන්වීම කෙරෙහි දැක් වූ අකැමැත්ත හා නොසැලකිල්ලය. ඔවුන් කුඩා වියේ දී නොමඟ යැවූ හේතුවෙන් එම ළමුන් වැඩිවියට පත් වූ පසුව තමන්හටත් තම දෙමව්පියන්හටත් කිසිදු ප්‍රතිලාභයක් ලබා නොදෙන තත්ත්වයක් හට ගැනෙනු ඇත.

මේ සියල්ලට අමතරව මාධ්‍ය හරහා ළමයින්ගේ පෞරුෂයන් තුළ විශාල විකෘති කිරීම් සහ ව්‍යාජ සංකල්ප ප්‍රවර්ධනය කරන ළමා වැඩසටහන් ප්‍රමාණය පිළිබඳ වඩාත් සැලකිලිමත් විය යුතුයි. එම මාධ්‍ය රැල්ලට විරුද්ධ වන ආකාරයේ ආධ්‍යාත්මික වර්ධනයක් දරුවන් තුළ පෝෂණය කිරීම අවශ්‍ය වී තිබේ. මන්දයත් ආධ්‍යාත්මික වර්ධනය ආගමානුකූල ප්‍රභවයන් මගින් සිදු කරනු ලැබේ. එය දරුවා ඇති දැඩි කිරීම හා සම්බන්ධ බොහෝ ගැටලුවලින් ආරක්ෂා කරන මෙවලමක් වන අතර එම ගැටලු නිරාකරණය කිරීමට ද එය උපකාරී වේ. ආධ්‍යාත්මික වර්ධනය දරුවන් කෙරෙහි වූ දෙමව්පියන් සතු අයිතිවාසිකම් අතුරින් එකකි. ලෞකික ජීවිතයේ සතුට සඳහා හේතුවකි. - අල්ලාහ්ගේ අනුමැතියෙන් - මතුලොව ජය ගැනීමේ සාධකයකි. තවද මතුලොවෙහි මිනිසුන් අතර වෙනස්කම් සිදු වන්නේ ද මෙම දේව විශ්වාසය පදනම් කරමිනි.

අවසාන වශයෙන්, දරුවන් තුළ ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීමේ කර්තව්‍ය වනාහි එය ජීවිතයේ විශාල ප්‍රශ්නවලට පිළිතුරු සපයන හෙයින් - දරුවා තුළ අධ්‍යාත්මික ස්ථාවරත්වය සහ මානසික ආරක්ෂාව සපයයි. එය දෙවිඳුන් අල්ලාහ්ගේ ග්‍රන්ථයෙන් වි□යුත්පන්නයක් වන අතර නබි තුමාණන්ගේ ජීවන මාර්ගයෙන් අවබෝධය ලැබූවකි. එමෙන්ම එය විශේෂීකරණය වී ඇත්තේ ප්‍රභවයේ සහ ක්‍රමයේ පැහැදිලි බව සහ අරමුණුවල දේවත්වය මාර්ගයෙනි. දරුවාගේ පෞරුෂත්වයේ අඛණ්ඩතාව සහ ස්ථාවරත්වය කරා ළඟාවීම සඳහා දරුවාගේ අවශ්‍යතා පිළිබඳවත් සැබෑ යථාර්ථය පිළිබඳවත් හැදියාව දියුණු කිරීමේ ක්‍රියාවලියේ යථාර්ථය පිළිබඳවත් පූර්ණ අවබෝධයකින් යුතුව පවතින්නකි.

ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීමේ

# ඉලක්කයන්





*මෙහි පොදු පරමාර්ථය නම් සර්ව බලධාරියා වූ දෙවිඳුන් අල්ලාහ් කෙරෙහි සැබෑ ගැතිකම තහවුරු කර ගැනීමයි. මෙම ඉලක්කය සඳහා විවිධ උප අරමුණු සාක්ෂාත් කර ගැනීම ද අවශ්‍ය වේ. ඒවා අතුරින් කිහිපයක් පහත සඳහන් කොට ඇත.*

*පළමුවැන්න : නිවැරැදි මඟ පෙන්වීමකින් හා තීක්ෂණ බුද්ධියෙන් දෙවිඳුන් අල්ලාහ්ට නැමදුම් කරන ධර්මිෂ්ඨ මනුෂ්‍යය වර්ගයකු සූදානම් කිරීම සඳහා මුස්ලිම් සමාජයේ ළමා පරපුර නිවරැදි දේව විශ්වාසය මත ඇති දැඩි කිරීම.*

දෙවැන්න : අල්ලාහ්ගේ දූතයාණන්ගේ ආදර්ශයන් අනුගමනය කරමින් මුස්ලිම් ප්‍රජාවේ සෑම සාමාජිකයෙකු ම ශ්‍රේෂ්ඨ ගුණාංග වලින් සමන්විත වීම. එතුමාණන් පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ ශුද්ධ වූ අල්කුර්ආනයේ සාක්ෂි දරයිඃ "ඔබ ඉමහත් යහ ගුණයක සිටින්නෙහි ය." (68:4)

තවද එතුමාණන් විසින් ම සිය මෙහෙවර පිළිබඳ මෙසේ පැහැදිලි කර ඇත : මා යහපත් ගතිපැවතුම් සම්පූර්ණ කිරීම වස් යවන ලදී. (අහ්මද් හදීස් අංක 8939, ඉමාම් අල්බානී තුමාණන් මෙම නබි වදන නිවැරැදි බව සනාථ කොට ඇත)

තුන්වැන්න : මුස්ලිම් ප්‍රජාව තුළ සහෝදරත්වයේ හැඟීම වර්ධනය කිරීම. එමගින් දරුවන් තුළ ප්‍රජාව කෙරෙහි පක්ෂපාතිත්වය පිළිබඳ හැඟීම ශක්තිමත් වනු ඇත. එවිට ඔහු සිය ප්‍රජාවේ ගැටලු ගැන සැලකිලිමත් වන අතර ඔහුගේ සහෝදරයන් සමඟ ද බැඳී සිටිනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයිඃ විශ්වාස කළ අය (සියල්ලෝ ම) සොහොයුරෝ ම ය . (49:10)

නබි ﷺ තුමාණන් මෙසේ සඳහන් කොට ඇතඃ දේව විශ්වාසවන්තයෙකුට තවත් දේව විශ්වාසවන්තයෙකු යනු විවිධ කොටස් එකිනෙක බැඳී ඇති ගොඩනැගිල්ලකට සමානය. (බුහාරී හදීස් අංක 6026)

තවද මෙසේ සඳහන් කොට ඇතඃ දේව විශ්වාසී අයවලුන් තමන් අතර දයානුකම්පිත වීම, තමන් අතර ප්‍රේමය පෙන්වීම සහ කාරුණික වීම යන කරුණු සඳහා උපමාවක් නම් එක් ශරීරයකි. ශරීරයේ යම් කොටසක් රෝගාතුරු වේ නම් මුළු ශරීරය ම නින්ද නොයෑම, උණ ගැනීම මගින් ඒ වෙනුවෙන් පෙනී සිටිනු ඇත. (බුහාරී හදීස් අංක : 6011) මෙමගින් මුස්ලිම් සමාජයේ දරුවන් අතර සත්‍යවාද, දේව විශ්වාසී සහෝදර බැඳීම් තහවුරු වේ.

හතරවැන්න : සිය සමාජයට ඵලදායී සාමාජිකයෙකු බිහිකිරීමට උපකාරී වන මානසික හා චිත්තවේගීය සමතුලිත පුද්ගලයකු ගොඩනැගීම. එමෙන්ම මහපොළව ප්‍රතිසංස්කරණය කර, එහි වස්තූන් ප්‍රයෝජනයට ගෙන, මිහිපිට දෙවියන්ගේ නියෝජිතයකු වීමේ බර හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා යුතුකම් ඉටු කළ හැකි අයෙකු බිහි කිරීම.

මෙමගින් සැබෑ ආධ්‍යාත්මික වර්ධනය සැනින් ආරම්භ කිරීමේ අවශ්‍යතාව පැහැදිලි වේ. අධ්‍යාත්මික බලය නිර්මාණය කිරීම, පුද්ගලික අභිප්‍රේරණය වර්ධනය කිරීම, අභ්‍යන්තර අවහිරය සවිබල ගැන්වීම සහ වචන හා ක්‍රියාවන් තුළ අධ්‍යාත්මිකත්වය ව්‍යාප්ත කිරීම යනාදිය සඳහා මෙම ආධ්‍යාත්මික වර්ධනය අඛණ්ඩව ක්‍රියා කරයි. මෙමගින්, හැදියාව දියුණු කිරීමේ කායික හා මානසික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් දියත් කිරීමට කෙනෙකුට පහසු වේ.

## හැදියාව වර්ධනය කිරීමේ

# මූලධර්ම



හැදියාව දියුණු කිරීමේ පදනම ගොඩනැගී ඇති මූලධර්ම සමූහයක් ඇත. ඒවා කුළුණු දෙකක් මත කේන්ද්‍රගත කළ හැකිය. පළමුවැන්න බුද්ධිමය මූලධර්ම වන අතර දෙවැන්න ප්‍රායෝගික මූලධර්මයයි. බුද්ධිමය කුළුණ දැනුම හා දේව විශ්වාසය යන කොටස් දෙකකට බෙදේ.

### පළවෙනි කොටසඃ දැනුම.

මෙය සදාචාරාත්මක හැඟීම් අවබෝධ කර ගැනීම සහ ගොඩනැගීම සඳහා වූ ප්‍රධාන දොරටුවක් බඳු ය. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයිඃ දන්නා අයත් නොදන්නා අයත් එක සමාන වන්නේ දැයි අසන්න. යහපත් උපදෙස ලබන්නේ බුද්ධිමත්හු ය. (39:9)

නබි ﷺ තුමාණන් පවා තම මිතුරන්හට ප්‍රයෝජනවත් දැනුම ඉගැන්වීමට උනන්දු වූ අතර නිර්ඵල දැනුමෙන් දෙවියන්ගෙන් රැකවරණය පතන ලෙසත් එතුමා ඔවුනට ඉගැන්වීය. එතුමාණන් තම මිතුරන්ට ඉගැන්වූ ප්‍රාර්ථනාවක මෙසේ සඳහන් වේඃ අහෝ අල්ලාහ්! ප්‍රයෝජන නොලබන දැනුමෙන් සහ බිය නොවන හදවතෙන් මා ඔබෙන් රැකවරණය පතමි . (මුස්ලිම් හදීස් අංක : 2722)



### දෙවන කොටස : දේව විශ්වාසය.

එනම්, දේව විශ්වාසයේ කුළුණු සය පිළිබඳව දරුවන්ගේ හදවත් තුළ රැඳී ඇති දෑ මෙමගින් අදහස් වේ. එය ජීවිතය සහ ඉන් ඔබ්බට ඇති දේ මූර්තිමත් කරන සාමූහික අර්ථයක. නබි ﷺ තුමාණන් සිය සමාජයේ දරුවන්ගේ හදවත් තුළ නිවැරදි දේව විශ්වාසය වර්ධනය කිරීම කෙරෙහි උනන්දු විය.

ප්‍රායෝගික කුළුණ සම්බන්ධයෙන් ගත් කල, එය වන්දනාමානය, ප්‍රායෝගික භාවිතය සහ ආචාර ධර්ම යන කොටස් තුනකට බෙදිය හැකිය.

**පළමු කොටස :** වන්දානමානය. එලදායී හැදියාවක් සඳහා දරුවන් තුළ අවංක අභ්‍යන්තරයක් සහ පෞරුෂත්වය වර්ධනය කරන සුවිශේෂී ගති ලක්ෂණයන් වර්ධනය කළ යුතුය. එමගින් දරුවා සිතෙහි පිරිසිදු බවෙන් නැතිනම් චිත්තපාරිශුද්ධියෙන් හා තම දෙවිඳුන් සමඟ සෑම විටම සම්බන්ධ වී තම ජීවිතයට මුහුණ දෙනු ඇත. ඔහුගේ සාරධර්ම, සහ සිතුවිලි පමණක් නොව ඔහුගේ බලාපොරොත්තු සහ අභිලාෂයන් පවා නිසි පිළිවෙලකට සැකසේ. නබි ﷺ තුමාණෝ මුආද් (රළියල්ලාහු අන්හු) තුමාට මෙසේ පවසති: අහෝ මුආද් අල්ලාහ් මත දිවුරා පවසමි! මා ඔබට ආදරය කරමි, සෑම සලාතයකටම පසු "අහෝ අල්ලාහ්! ඔබව සිහිපත් කිරීමටත්, ඔබට ස්තුති කිරීමටත් ඔබට යහපත් අයුරින් වන්දනාමාන කිරීමටත් උදව් කරනු මැනව" යනුවෙන් තෙපලීම අත් නොහරින්න. (මුස්ලිම් හදීස් අංක: 2722)

මෙහිදී වන්දනාමාන කිරීම සර්වබලධාරී දෙවිගෙන් ලද ත්‍යාගයක් බව හා එය හුදෙක් පුද්ගල උත්සාහයක් පමණක් නොව එය අල්ලාහ්ගෙන් වූ භාග්‍යයකි යන වග එතුමාණන් ඔහුට උගන්වයි. තවද වන්දනාමාන කිරීම වනාහි සැමවිටම ඒ කෙරෙහි දෙවියන්ගෙන් උපකාරය ඉල්ලා සිටිය යුතු බව එතුමාණන් අවධාරණය කරයි. මෙමගින් දේව විශ්වාසවන්තයකු - තම දෙවිඳුන් අල්ලාහ්ට නැමදුම් කරන විට - සහයෝගය ඔහුගෙන් ම ඉල්ලා සිටිය යුතු බවත් ඔහු මත ම විශ්වාසය තැබිය යුතු බවත් ඔහුගේ සිත තුළ ස්ථිර ලෙස මුල් බැස ගනී. මන්ද, කීකරුකමට මඟ පෙන්වන්නා සර්වබලධාරී ඔහු වන බැවිනි.

**දෙවන කොටස:** ප්‍රායෝගික භාවිතය. දැනගත් දෑ ක්‍රියාත්මක නොකිරීම එකී දැනුම ශූන්‍ය වී යාම හා සමානය. මතුලොවෙහි මිනිසුන් අතර වූ වෙනසෙහි පදනම ද ක්‍රියාව වේ. "අණුවක තරම් යහපත කළ තැනැත්තා එය දකියි ග අණුවක තරම් අයහපත කළ තැනැත්තා එය දකියි " (99:7-8)

**තෙවන කොටස:** ආචාර ධර්ම. ඉස්ලාම් දහමෙහි පදනම වන්නේ යහ අයුරින් හැසිරෙන මිනිසෙකු ගොඩනැගීමයි. නබිතුමාණන් ද එතුමාගේ පණිවිඩය ආචාර ධර්ම සහ ඒ කෙරෙහි පුරුදු පුහුණු කිරීම යන අර්ථය වටා යොමු වී ඇති බව විශ්වාසය කළහ. එතුමාණන් ඒ පිළිබඳ මෙසේ වදාලහ: මා යහපත් ගතිපැවතුම් සම්පූර්ණ කිරීම වස් යවන ලදී. (අහ්මද් හදීස් අංක 8939, ඉමාම් අල්බානී තුමා මෙම නබි වදන නිවැරැදි බව සනාථ කොට ඇත.) එමෙන්ම එතුමාණන් ආචාර ධර්ම වෙත පහත අයුරින් උනන්දු කරවයි.

නියත වශයෙන්ම මාහට වඩාත්ම ආදරණීය තැනැත්තා හා විනිශ්චය දිනයේ මා සමඟ සමීපව වාඩිවන තැනැත්තා ඔබ අතුරින් ආචාර ධර්මයෙන් හෙබි පුද්ගලයා වේ. (තිර්මිදි හදීස් අංක 2018) ඒ අනුව, ආචාර ධර්ම යනු ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීමේ පැහැදිලි ප්‍රතිඵලයකි.

## හැදියාව වර්ධනය කිරීම හා සම්බන්ධ

# උදාහරණ කිහිපයක්




ප්‍රායෝගික උදාහරණ සැපයීම මූලධර්ම හා සාරධර්ම උකහා ගැනීමට උපකාරී වන වැදගත්ම අංගයකි. නබි صلى الله عليه وآله وسلم තුමාණන් සහ එතුමාගේ හිතමිතුරන් දරුවන් තුළ දේව විශ්වාසයේ අත්තිවාරම ගොඩනැගූ ආකාරය කෙබඳු ද යන්න පැහැදිලි කරන උදාහරණ කිහිපයක් මෙහි දැක්වේ.



1. නබි صلى الله عليه وآله وسلم තුමා හසන් සහ හුසේන් (රළියල්ලාහු අන්හු) වෙනුවෙන් අල්ලාහ්ගෙන් රැකවරණය පැතූ ආකාරය ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හ) තුමාණන් මෙසේ විස්තර කරයි. ඔබේ මුතුන්මිත්තන් (එනම් ඉබ්‍රාහීම්) ඉස්මාඊල් සහ ඉස්හාක් වෙනුවෙන් අල්ලාහ්ගෙන් රැකවරණය පැතුවේ මේ අයුරිනි (අහෝ දෙවියන! මා ඔබේ පරිපූර්ණ වචන වලින් සෑම ෂෙයිතානුන්ගෙන් හා (සත්ව හෝ වෙනත්) විෂ සහිත දැයින් සහ සෑම නපුරු, හානිකර, ඊර්ෂ්‍යා දෘෂ්ටියකින් ම රැකවරණය සොයමි. (බුහාරි හදීස් අංක :3371)

2. අබූ හුරයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් මෙසේ වාර්තා කරය. සෑම දරුවෙකුම ෆිත්‍රා නම් අවනත වීමේ පිවිතුරු සහජ විශ්වාසය මත උපත ලබන්නේය. එහෙත් යුදෙව්වරයෙකු හෝ කිතුණුවකු හෝ ගින්නට නමදින්නකු බවට ඔහුගේ දෙමාපියන් ඔහු ව පත් කරති යැයි නබි صلى الله عليه وآله وسلم තුමාණන් ප්‍රකාශ කළහ. (බුහාරි හදීස් අංක 1358)

3. උමර් ඉබ්න් අබි සලමා (රළියල්ලාහු අන්හු) මෙසේ පවසයි: මම අල්ලාහ්ගේ දූතයාණන්ගේ රැකවරණය යටතේ සිටි කුඩා පිරිමි ළමයෙක් වෙමි. මා ආහාර අනුභව කරමින් සිටියදී මාගේ අත පිඟාන වටා යමින් තිබිණි. එවිට නබි صلى الله عليه وآله وسلم තුමාණන්: අහෝ දරුව! අල්ලාහ්ගේ නාමය සඳහන් කර ඔබේ දකුණු අතෙන් අනුභව කරන්න. ඔබට සමීපතම ආහාරය අනුභව කරන්න යනුවෙන් නබි صلى الله عليه وآله وسلم තුමාණන් පැවසූහ. (බුහාරි හදීස් අංක 5376/ මුස්ලිම් වැකි 2022)



4. ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පවසයඃ දිනක් මම නබි ﷺ තුමාණන් පිටුපස සිටියෙමි. එවිට එතුමාණන් පහත අයුරින් පවසා සිටියහ. අහෝ දරුවා! අල්ලාහ් පිළිබඳ සිහියෙන් සිටින්න. එවිට ඔහු ඔබව ආරක්ෂා කරනු ඇත. අල්ලාහ් ගැන සැලකිලිමත් වන්න. එවිට උන් වහන්සේව ඔබ ඉදිරියෙහි දැක ගනු ඇත. ඔබ විමසන විට  අල්ලාහ්ගෙන් විමසන්න. ඔබ උපකාරය පතන්නේ නම් අල්ලාහ්ගෙන් උපකාරය පතන්න. ඔබට යම් ප්‍රයෝජනයක් ලබා දීම සඳහා මිනිසුන් එක්රැස් වුවහොත්, අල්ලාහ් ඔබ වෙනුවෙන් දැනටමත් නියම කර ඇති දේ හැර අන් කිසිවක් ඔවුන් ඔබට ප්‍රතිලාභ වශයෙන් ලබා නොදෙන බව දැන ගන්න. (තිර්මිදි හදීස් අංක 2516)

5. අල් හසන් ඉබ්නු අලී (රළියල්ලාහු අන්හු) තුමාණන් මෙසේ වාර්තා කරයිඃ විත්ර් සලාතයේ තිබෙන කුනූත් පාරායනයෙහි ප්‍රකාශ කිරීම සඳහා මෙම වචන මාලාව මා හට නබි ﷺ තුමාණෝ ඉගැන්වූහ. අහෝ අල්ලාහ්! ඔබ කවරෙකුට මඟ පෙන්වූයෙහි ද ඔවුන් අතර මට ද මඟ පෙන්වනු මැනව. ඔබ කවරෙකුට සුවය පිරිනැමුවෙහි ද ඔවුන් අතර මට ද සුවය ලබා දෙනු මැනව. ඔබ කවරෙකු භාර ගත්තෙහි ද ඔවුන් අතර මා ද භාර ගනු මැනව. ඔබ පිරිනමා ඇති දෑ හි අභිවෘද්ධිය ලබා දෙනු මැනව. ඔබ තීන්දු කළ දෑ හි හානියෙන් මා ආරක්ෂා කරනු මැනව. සැබැවින් ම ඔබ තීන්දු කරන්නෙහි ය. නමුත් ඔබ මත තීන්දු කරනු ලැබීමක් නොමැත. සැබැවින් ම ඔබ භාරගත් අය ලිස්සී නොවැටෙන්නේ ය. අපගේ පරමාධිපතියාණෙනි! ඔබ අති උත්කෘෂ්ට විය. අති උත්තරීතර විය. (අබූ දාවූද් හදීස් අංක 1425, ඉමාම් අල්බානි තුමා මෙම නබි වදන නිවැරැදි බව සනාථ කර ඇත)

6. අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමාණන් මෙසේ වාර්තා කරයිඃ අහෝ දරුවා! ඔබ ඔබේ පවුලට ඇතුළු වූ පසු සලාමය පවසන්න. එය ඔබටත් ඔබේ නිවසේ වැසියන්ටත් ආශිර්වාදයක් වනු ඇත යනුවෙන් නබි ﷺ තුමාණන් ප්‍රකාශ කළහ. (තිර්මිදි හදීස් අංක 2698, ඉමාම් අල්බානි තුමාණන් මෙම නබි වදන හසන් සනයට අයත් බව ප්‍රකාශ කොට ඇත)

7. ජුන්දුබ් අල් බජ්ලී (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කරයිඃ අප සැම ශක්තිමත් තරුණයින් වශයෙන් සිටි කාලයක දී නබිතුමාණන් සමඟ සිටි අතර අල්කුර්ආනය ඉගෙන ගැනීමට පෙර අප දේව විශ්වාසය ඉගෙන ගත්තෙමු. ඉන්පසුව අප අල්කුර්ආනය ඉගෙන ගත් අතර එමගින් අපගේ දේව විශ්වාසය වැඩි විය. (ඉබ්නු මාජාහ් හදීස් අංක 61, ඉමාම් අල්බානි තුමාණන් මෙම නබි වදන නිවැරැදි බව සනාථ කර ඇත.)

8. අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හ) තුමාණන්ගේ මෑණියන් වන උම්මු සුලයිම් අර් රුමයිසා (රළියල්ලාහු අන්හා) තුමිය ඉස්ලාමයට ඇතුල් වූයේ අනස් කුඩා වියේ සිටියදී ය. එවිට ද ඇය අනස් (රළියල්ලාහු අන්හු) තුමාහට නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බවත් මුහම්මද් ﷺ තුමාණන් අල්ලාහ්ගේ දූතයෙකු බවත් සාක්ෂි දරමි යැයි පැවසීමට පුරුදු පුහුණු කරමින් සිටියාය. (සියරු අඃලාමින් නුබලා 2:305)

9. ඉබ්‍රාහීම් අත්තයිමී (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කරයිඃ දරුවකු කතා කිරීමට ආරම්භ කරන විට එම දරුවාට ලා ඉලාහ ඉල්ලල්ලාහ් (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත) යනුවෙන් හත් වරක් ඉගැන්වීමට නබි තුමාණන්ගේ හිතමිතුරන් පුරුදුවී සිටියහ. එමගින් එම දරුවා කතා කරන පළවැනි දෑ එය බවට පත් වේ. (මුසන්නෆ් අබ්දුර් රස්සාක් 7977)



# දරුවන් තුළ ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීම



දරුවන් තුළ ආධ්‍යාත්මික වර්ධනය ඇති කිරීම වනාහි වඩාත් ම වැදගත් මාතෘකාවකි. මන්දයත්, එය යහපත් පුරුදු ස්ථාපිත කිරීම හා සංවර්ධනය කිරීම හා හදවතේ ගැඹුරට නිවැරදි දේව විශ්වාසය ඇතුළත් කිරීම සහ ඒවා ශක්තිමත් කිරීම, ගුණවත් සදාචාරයන් කරා මග පෙන්වීම සහ ඒවා සියලු ක්‍රියාවන්හි යෙදවීම සඳහා උපකාරී වීම නිසාවෙනි. මෙම වයස් සීමාව තුළ, ළමයා ලෝකය පිළිබඳ ඔහුගේ දැක්ම ගොඩනගා ගන්නා අතර, ඒ තුළින් ඔහු තම ආකල්පය, සදාචාරය සහ ගනුදෙනු ගොඩනගනු ඇත. ඔහුගේ යථාර්ථය තුළ එය කොතරම් පවතිනවා ද යන්නට අනුව, ඔහු ජීවිතයේ සතුට හා මතුලොව සාර්ථකත්වය උපයා ගනී. මෙය දෙමව්පියන්ගේ යුතුකම බැවින් අල්කුර්ආනය ඒ පිළිබඳව මෙසේ සඳහන් කරයිඃ නුඹලාගේ දරුවන්ගේ විෂයයෙහි අල්ලාහ් අවධාරණය කරයි. (4:11)

නබි صلى الله عليه وآله وسلم තුමාණෝ එම වගකීම පිළිබඳ පැහැදිලිව මෙසේ සඳහන් කළහඃ සෑම දරුවෙකුම ෆිත්‍රා නම් අවනත වීමේ පිවිතුරු සහජ විශ්වාසය මත උපත ලබන්නේය. එහෙත් යුදෙව්වකු හෝ කිතුණුවකු හෝ ගින්නට නමදින්නකු බවට ඔහුගේ දෙමාපියන් ඔහුව පත් කරති. (බුහාරී හදීස් අංක 1358)

මෙම නබි වදනින් බොහෝ දේ උපුටා ගත හැක. ඒවායින් ස්වල්පයක් පහත සඳහන් වේඃ

1. දේව විශ්වාසය සහජ මිනිස් ස්වභාවයක් වන අතර එයින් යමෙකු බැහැර වන්නේ නම් සැබැවින් ම ඔහු මහා ව්‍යසනයක් වෙත යොමු වේ.

2. දරුවන් හදා වඩා ගැනීමේ දී දෙමව්පියන්ගේ විශාල වගකීම සහ යුතුකම මෙම නබි වදන පෙන්වා දෙයි.

3. හැදියාව දියුණු කිරීමේ දී පසුබිම හා පරිසරයේ බලපෑම කෙසේද යන්න මෙම නබි වදන පැහැදිලි කරයි.

මිනිසාගේ මුල් අවධියේ සිටම සාක්ෂියක් හෝ සනාථ කිරීමක් නොමැතිව දේව විශ්වාසය සඳහා මිනිසාගේ හදවත සූදානම් කර තිබීම දෙවිඳුන් අල්ලාහ්ගෙන් වූ ආශීර්වාදයකි. ඒ අනුව එම සහජ ස්වභාවය ආරක්ෂා කර එය සවිබල ගැන්වීමට දෙමාපියන් උපරිම ලෙස උත්සාහ කළ යුතුය. අල්කුර්ආනය සහ සුන්නාව යන මූලාශ්‍ර මත පිහිටි සැබෑ ආගම අනුව ඔවුන් තම දරුවන් ඇති දැඩි කළ යුතු අතර ඔවුන් කිසි විටෙකත් පදනමකින් තොර වූ අවටින් කනට ගැටෙන සාම්ප්‍රදායික හැදියාව දියුණු කිරීමේ ක්‍රම මත ක්‍රියාත්මක නොවිය යුතුය. එපමණක් නොව සත්‍ය නොවන සාම්ප්‍රදායික ඉස්ලාමය වනාහි විවෘත යුගයක දී නොමඟ යෑමෙන් ආරක්ෂා නොකරන අතර සිය අනන්‍යතාවය අතුරුදහන් වීමෙන් හෝ පෞරුෂත්වය දුර්වල වීමෙන් ද ආරක්ෂා නොකරයි.

දරුවාගේ පිරිසිදු හදවත කිසිදු කැටයමක් හෝ මෝස්තරයක් නොමැති ආභරණයක් බඳු ය. එමෙන්ම, ඒ මත යමක් කෙටීම ද නොහැක්කක් නොවේ. ඔහුට යහපත් දෑ පුරුදු පුහුණු කර ඒවා ඔහුට උගන්වා දී ඒ ආකාරයෙන් ම ඔහු වර්ධනය වූයේ නම් ඔහු ලෞකික ජීවිතයෙහි සහ මතුලොවෙහි සතුටින් සිටිනු ඇත. ඔහුගේ දෙමව්පියන් සහ උපදේශකයින් ඔහුට ලැබුණු එකී පරිත්‍යාගයෙහි කොටස් කරුවෝ වෙති. අනෙක් අතට එම දරුවා අයහපත් අයුරින් හැදී වැඩුණේ නම් ඔහුගේ ජීවිතය අභාග්‍යමත් වී විනාශ වී යනු ඇත. ඔහුගේ භාරකරුවන් කෙරෙහි ද එම පාපය ලැබෙනු ඇත. කුඩා කාලයේ සිදු කරන මඟපෙන්වීම් වඩාත් ශක්තිමත් ය. දරුවා පිළිබඳ නොසැලකිලිමත් වී ඔහුගේ අභිමතයට අනුව ක්‍රියා කිරීමට අවකාශය ලබා දුන්නේ නම් පසුව නැවත වතාවක් ඔහුව යහමඟට ගෙන ඒම ඉතා දුෂ්කර වේ.

සැබෑ ඉස්ලාමීය ඉගැන්වීම්වලට කැපවී සිටින ස්ථිර දේව විශ්වාසයකින් හෙබි පවුලක හැදී වැඩෙන දරුවෙකු වනාහි සෑම දෙයකින්ම තම දෙමාපියන් පිටපත් කර, ඔහුගේ දෙමව්පියන්ගේ දැක්ම තුළින් තමාගෙ 'ම සංකල්ප ගොඩනගා ගනු ඇත. ආගමික සංකල්ප දැඩිව හා මෘග ලෙස ඉදිරිපත් කිරීම හේතුවෙන් ළමයින් තුළ ප්‍රතිවිරුද්ධ බලපෑමක් බිහි වීමට හේතුවක් වන අයුරින් කටයුතු කරන ඇතැමුන් අප දැක ඇත්තෙමු. ඉස්ලාමීය ඉගැන්වීම්වලට බැඳී නැති දෙමව්පියන් සමඟ ළමයා හැදී වැඩුණහොත්, අනාගතයේ ඔහු ආගම වෙත ආකර්ෂණය කර ගැනීම දුෂ්කර වේ. මන්ද ඔහු ජීවිතයේ ප්‍රාථමික අවධියේදී ආගමෙහි බලපෑම ඔහුගේ දෙමව්පියන් තුළ දැක නැත. එබැවින් කිසිම ආගමික මූලධර්මයක් ඔහු තුළ බිහි නොවේ.



# දරුවන් තුළ ආගමික වර්ධනය



ආගම (දරුවන් තුළ) ආරම්භ වන්නේ දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ වූ එක් මූලධර්මයක් හරහා ය. ඒ හරහා මැවීමේ සංකල්පය, මතුලොව, දේවදූතයන් සහ ෂයිතානුන් වැනි වෙනත් මූලධර්ම ඔහු තුළ හටගැනීමට ආරම්භ වේ. ළමා කාලයේ ආගමික වර්ධනය අංග ලක්ෂණ හතරකින් සංලක්ෂිත වේ.

අ **යථාර්ථවාදී අංගය:** *දරුවා තම ආගමික සංකල්ප කෙරෙහි වටහා ගත හැකි යථාර්ථයක් ලබා දෙයි. ඔහුගේ වර්ධනයත් සමඟ ඒවා විශ්ලේෂණය කිරීමට අදියරයෙන් අදියර පා තබයි. සත්‍යය වටහාගෙන, වැඩිවියට පත්වන විට එයට නිසි තැන ලබා දෙයි.*

ආ **ආකෘතික හා රූපික අංගය:** *කුඩා දරුවකු වැඩිහිටියන්ගේ නැමදුම් හා වන්දනාවන් පිටපත් කරන්නේ ඒවායෙහි අර්ථය තේරුම් නොගෙන හා ඒවායෙහි අධ්‍යාත්මික සාරය දැන ගැනීමෙන් තොරව ය. මෙහි ඇල්මෙන් උපදේශකයා ප්‍රයෝජනය ලබා ගැනීම වඩා උචිතය. එසේ කළ යුත්තේ, ඉස්ලාමයේ කුළුණු සහ එහි සදාචාරයන් ල දේව විශ්වාසයේ කුළුණු සහ එහි බලපෑම් ළමයින් හට ඔහු පුරුදු පුහුණු කිරීම සඳහා ය.*

**ඇ උපාය අංගය:** දරුවා යම් නැමදුමක් ඉටු කිරීම හේතුවෙන් තම දෙමව්පියන්ගේ, උපදේශකයාගේ සහ ඔහු වටා සිටින අයගේ සතුට ලබා ගන. ඇතැම් විට ඔහු එසේ කරන්නේ ඔවුන්ගේ ආදරය ලබා ගැනීමට සහ යම් ප්‍රතිලාභ අත් කර ගැනීමට හෝ යම් දඬුවමකින් ආරක්ෂා වීමට ය.

**ඈ චිත්තවේගී අංගය:** මනසේ සැඟ වී තිබෙන සැබෑ සහජ දේව විශ්වාසය නිසා යම් අවස්ථාවන් වලදී දැඩි ලෙස දරුවා තම ආගමට අධ්‍යාත්මිකව බැඳී සිටී. සැබැවින්ම බැඳීම් වලින් ඉතා උසස් වන්නේ අල්ලාහ් කෙරෙහි ඇති වන බැඳීම වේ.

ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම හා - විශේෂයෙන් අර්බුදයන් නොමඟ යැවීම් හා අවධානය වෙනතකට යොමු කරවීම් විවිධාකාරයෙන් ව්‍යාප්ත වී ගොස් තිබෙන මේ කාලයෙහි - කුඩා දරුවන් තුළ දේව විශ්වාසය ඇති කිරීම සඳහා දෙමාපියන් සහ උපදේශකයින් උනන්දුවෙන් ක්‍රියා කිරීමේ වැදගත්කම ඉහත සඳහන් කළ දෙයින් අපට වටහා ගන්නට පුළුවණි. ඒ අනුව දෙමව්පියන් විසින් සිදු කළ යුතු වැදගත්ම දෙය නම්:

පළමුවː දරුවාගේ මනස තුළ තිබෙන සහජ ස්වභාවය පෝෂණය කිරීමය. මෙය ඒකදේවවාදයේ වචනය දරුවාට ඉගැන්වීම වටා කේන්ද්‍රගත වේ.

දෙවනුවː සර්වබලධාරී අල්ලාහ් සහ ඔහුගේ දූතයා කෙරෙහි වූ ආදරය ශක්තිමත් කිරීම මත සහ අල්කුර්ආනීය ඉගැන්වීම් මත පදනම් වූ විශ්වාසයේ කුළුණු හය අවබෝධ කර ගැනීමට සහාය වීම.

ආත්මයන් තුළ අවනත වීමේ පිවිතුරු සහජ ආගමික විශ්වාසය පැවතීම, දෙමාපියන්හට ඔවුන්ගේ හැදියාව වර්ධනය කිරීමේ මෙහෙවරට උපකාරී වන කරුණු අතුරින් එකකි. මෙම පිවිතුරු සහජ විශ්වාසය ආගමානුකූලව කටයුතු කිරීමේ අභ්‍යන්තර හැඟීමක් වෙත මිනිසා යොමු කරනු ඇත. මෙකී අභ්‍යන්තර හැඟීම අනෙක් සියලුම හැඟීම් මෙන් වෙනස් වීම හෝ වෙනස් කිරීම ප්‍රතික්ෂේප කරය. එහෙත්, එය මඟ පෙන්වීම සහ යාවත්කාලීන කිරීම පිළිගන. තවද මෙම පිවිතුරු සහජ විශ්වාසය කුමන ඉලක්කයක් සඳහා නිර්මාණය කර ඇත්තේ ද එම මුල් ඉලක්කය හැර වෙනත් විවිධ ඉලක්ක සඳහා ද භාවිතා කළ හැකිය. කෙසේ වෙතත, ඉස්ලාමය මෙම ස්වභාවය නිර්මාණය කර ඇති ඉලක්කය කරා පමණක් යොමු කරන ලෙස ඉල්ලා සිටී.

මුස්ලිම් දරුවකුට පුරුදු පුහුණු කළ යුතු වැදගත්ම දෙය නම් විශ්වාසයේ කුළුණු හය වේ. එයින් වඩාත්ම වැදගත් දෙය නම් අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසයයි. අල්ලාහ් කෙරෙහි විශ්වාසය තැබීම සහ ඔහුට ආදරය කිරීම තුළින් - එහි ප්‍රතිඵලයක් වශයෙන් - දේව විශ්වාසයේ ඉතිරි කුළුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වේ. අල්ලාහ් කෙරෙහි වූ ආදරය වනාහි ඔහු පිළිබඳ විශ්වාස කිරීමේ හා ඔහුට යටත් වීමේ ප්‍රධාන ඇඟවීමක. එයින් අර්ථවත් වන්නේ ඔහුට කීකරු වීමට සහ ඔහුට අකීකරු වන අයවලුන්ට විරුද්ධ වීමට නම් අල්ලාහ් කෙරෙහි වූ ආදරය අනිවාර්ය වේ යන්නයි. මෙම ආදරය ලෞකික ජීවිතයේ ඕනෑම කෙනෙකුට ආදරය කිරීමට වඩා ඉහළින් විය යුතුය. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයිː "නුඹලාගේ දෙමාපියන් ද නුඹලාගේ දරුවන් ද නුඹලාගේ සොහොයුරන් ද නුඹලාගේ භාර්යාවන් ද නුඹලාගේ පවුලේ අය ද නුඹලා රැස් කළ ධනය ද අලාභ වේ යැයි නුඹලා බිය වන වෙළඳාම ද නුඹලා ප්‍රිය කරන වාසස්ථාන ද අල්ලාහ්ටත් ඔහුගේ දූතයාටත් ඔහුගේ මාර්ගයේ සටන් කිරීමටත් වඩා නුඹලාට ප්‍රිය වේ නම් අල්ලාහ් තම නියෝගය පත වන තුරු බලා සිටින්න. අල්ලාහ් වැරදි කරන අයට යහ මග නොපෙන්වන්නේ යැ'යි පවසන්න. (9:24)

අල්ලාහ් ඔහු විසින් පිළිගත් ගැත්තන්ගේ පළමු ගති ලක්ෂණය වශයෙන් ඔහු කෙරෙහි වූ ඔවුන්ගේ ආදරය පත් කොට ඇත. ඒ පිළිබඳ ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේː විශ්වාස කළ අයවලුනි! නුඹලා අතුරින්

යමෙක් තම ධර්මය වෙනස්කර ගතහොත් අල්ලාහ් මතුවට වෙනත් ජන සමාජයක් ගෙන එයි. ඔහු ඔවුන් ප්‍රිය කරයි. ඔවුහු ද ඔහු ප්‍රිය කරති. ඔවුහු විශ්වාස කළ අය කෙරෙහි නිහතමානී ව ද (ඒකම දෙවිඳුන්) ප්‍රතික්ෂේප කරන්නන් කෙරෙහි යටහත්නොවී හිස ඔසවමින් ද සිටිති. ඔවුහු අල්ලාහ්ගේ මාර්ගයෙහි ශුද්ධ වූ ධර්ම සටනෙහි යෙදෙති. ඔවුහු අපහාස කරන්නන්ගේ අපහාසයට බිය නොවෙති. අල්ලාහ්ගේ දයාව මෙයයි.ඔහු සිතූ අයට එය පිරිනමයි. අල්ලාහ්ත්‍යාගශීලී කෙනෙකි. සර්වඥයෙකි. (5:54)

කොන්දේසි විරහිත ආදරයෙන් අල්ලාහ්ව ඒකීයට පත් කිරීම මගින් මිස පිරිසිදු ඒක දේවවාදය කිසි විටෙකත් පැවතිය නොහැකි බව ඔහු මෙසේ ප්‍රකාශ කරයි: අල්ලාහ් නොවන විවිධ දෙවිවරුන් සිතින් මවා ගෙන අල්ලාහ්ට ප්‍රේම කරන්නා සේ ඔවුනට ප්‍රේම කරන අය ද මිනිසුන් අතර සිටිති. විශ්වාස කළ අය (ඔවුනට වඩා) අධික ව අල්ලාහ්ට ප්‍රේම කරන්නෝ වෙති. (2:165)

අල්ලාහ් අපව මැවීමේ අරමුණ වන වන්දනාමාන කිරීම වනාහි ආදරය හා ප්‍රේමයේ උච්චතම ස්ථානය වේ. ඒක දේවවාදයේ මූලාරම්භය දෙවිඳුන් අල්ලාහ්ට පමණක් වූ අවංක ආදරයයි. දෙවියකු වශයෙන් කෙනෙකු කෙරෙහි විශ්වාස කිරීමේ හා ඔහුට වන්දනාමාන කිරීමේ යථාර්ථය ද එයයි. ගැත්තෙකු දෙවිඳුන් කෙරෙහි දක්වන ප්‍රේමය සම්පූර්ණ වන තුරු සහ සියලු අනෙකුත් ප්‍රේමවන්තයින්ට වඩා ඔහු කෙරෙහි වූ ප්‍රේමය උසස් වන තුරු ඒක දේව වාදය පරිපූර්ණ වන්නේ නැත. යම් කරුණක් විනිශ්චය කළ යුත්තේ මෙකී දෙවිඳුන් කෙරෙහි වූ ප්‍රේමය මිස අන් අය කෙරෙහි වූ ප්‍රේමය නොවේ. සෙසු මිනිසුන් කෙරෙහි වූ ආදරය මිනිසාගේ සතුට හා සාර්ථකත්වය සපයන මෙකී දෙවිඳුන් කෙරෙහි වූ ආදරයට පසුව පැවතිය යුතුය.

දේව විශ්වාසය වටා ගොඩනැගී ඇති මෙම ප්‍රේමය දරුවන්ගේ හැදියාව නිවැරැදි ව පවත්වා ගැනීමට, ඉස්ලාම් ආගම ඔවුන් තුළ තහවුරු කිරීමට සහ අල්ලාහ් සහ ඔහුගේ දූතයා කෙරෙහි කීකරු වීමට පුරුදු පුහුණු කිරීම සඳහා වූ ඉතා සුදුසු ක්‍රමයකි. තවද අල්ලාහ් සහ ඔහුගේ දූතයා කෙරෙහි ප්‍රේමයෙන් පිරුණු ඕනෑම හදවතක් ඇති පුද්ගලයකු වනාහි ඔහු සිය ප්‍රතිපත්තිය, වන්දනාව සහ සදාචාරය වෙනුවෙන් කැපවී සෘජුව සිටී. ඉන් පසු ඔහු විසින් මූලික නොවන අමතර කරුණු වල යම් ගැටලුකාරී තත්වයන් හෝ අතපසුවීම් හෝ අමතක වීම් සිදු වුව ද කම් නැත. මන්දයත් - අල්ලාහ්ගේ අනුමැතිය ඇතුව - ඔහු තුළ ඇති අල්ලාහ් කෙරෙහි වූ ආදරය ඔහුව නැවත නිවැරදි මාවත වෙත ගෙන යයි. මන්ද ප්‍රේමය සඳහා බාහිර පමණක් නොව අභ්‍යන්තර පෙළඹීම් ද තිබෙන බැවිනි.

ඉස්ලාමීය ප්‍රතිපත්ති මාලාව ඉදිරිපත් කරන පැවැත්ම පිළිබඳ දර්ශනය සුවිශේෂ වන්නේ එහි සහජ මිනිස් ස්වභාවය සමග ඇති ඒකාග්‍රතාවය සහ අව්‍යාජ බුද්ධිය සමග ගට්ටනයක් ඇති නොවීම සහ එයට කිසිදු ප්‍රතිවිරෝධතාවයකින් තොරව පැවතීම ය. තවද එය වෙනත් කිසිදු ආගමක් හෝ දර්ශනයක් තුළ සොයාගත නොහැකි ගති ලක්ෂණ වලින් ද සුවිශේෂ වේ. එය බුද්ධිමය, ප්‍රතිපත්තිමය හා ව්‍යවස්ථාදායක පද්ධතිය තුළ සර්ව සම්පූර්ණ වූ දර්ශනයකි. බුද්ධිමය හා ප්‍රතිපත්තිමය පද්ධතියක් වන එය විශ්වයේ ආරම්භය, එහි අවසානය, එහි ඇති සත්‍යයන් සහ ඉන් ඔබ්බට ඇති දේ පිළිබඳ ගැඹුරු පැහැදිලි කිරීමක් සපයයි. එය මිනිසාගේ ජීවිතයේ ආරම්භය සහ එහි අවසානය පිළිබඳ විවරණය කරයි. ඉන්පසු විශ්වය හා මිනිසා නිර්මාණය කිරීමේ අරමුණ පෙන්වා දෙයි. එමගින් මිනිසාගේ බුද්ධිමය ස්වභාවය අනුව ඔහු ඇසිය යුතු ඔහුගේ පැවැත්ම පිළිබඳ ප්‍රශ්න වලට එය පිළිතුරු සපයයි. මන්ද මෙම ප්‍රශ්නවලට ප්‍රමාණවත් පිළිතුරු සොයා නොගෙන මිනිසාට මේ ජීවිතයේ කිසි විටෙකත් සහනයක් ලබා ගත නොහැක. ලෞකික ජීවිතයේ සැබෑ අර්ථය ඔහු සොයා නොගත්තේ නම් ඔහුට කලකිරීමෙන් හා ව්‍යාකූලභාවයෙන් සදා දිවි ගෙවීමට සිදු වේ.



# ආධ්‍යාත්මික වර්ධනයෙන් ලැබෙන

# ප්‍රතිලාභ



ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීම හෙවත් දේව විශ්වාසය හා බැඳුණු අධ්‍යාපනය ලබන්නා හට ලැබෙන ප්‍රතිලාභ රාශියක් ඇත. ඒවායින් කිහිපයක් පහත සඳහන් වේ:

1 යහපත් ක්‍රියාවන් කිරීමට උත්සුක වීම. ඔහු දෙවිඳුන් අල්ලාහ්ගේ තෘප්තිය හා දයාව වෙත සමීප කරවන යම් දොරටුවක් සොයමින් කටයුතු කරයි.

2 අභ්‍යන්තර සංයමය ශක්තිමත් කිරීම. සක්‍රීය දේව විශ්වාසය මගින් මිනිසාගේ හැදියාව පාලනය කෙරේ.

3 ලෞකික ජීවිතයට මුවා නොවීම. ඔහුගේ හදවත එම (ලෞකික ජීවිතයත් සමග) සම්බන්ධ නොවේ. එය ඔහුගේ ආශාවන්හි ප්‍රභවය සහ ඔහුගේ ක්‍රියාවන්ගේ අරමුණ බවට පත් නොවේ.

4 දෙවිඳුන්ගේ සහයෝගය. අල්ලාහ් තම විශ්වාසවන්ත සේවකයාට නිවහන් දෙකෙහිම සතුට ලබා දී සැබෑ ප්‍රතිලාභය ඔහු සඳහා තහවුරු කිරීම මගින් ඔහුගේ කරුණු සියල්ල භාර ගනු ඇත.


5 දෙවිඳුන් කෙරෙහි වූ ඇල්ම. අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසය වර්ධනය වන විට, ගැත්තා තුළ දෙවිඳුන් කෙරෙහි ඇති විශ්වාසය, ඇල්ම සහ ඔහුගේ මැවිල්ලෙන් (ආධ්‍යාත්මිකව) දුරස් වීම ද වර්ධනය වේ.

6 ඍණාත්මක කරුණු තුරන් වී යාම සහ පුද්ගලයන් අතර ගැටලු අඩු වීම. හදවත් තුළ අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසය වර්ධනය වන විට, තන්හා ආශාවන් කෙරෙහි පක්ෂග්‍රාහී වීමේ බලපෑම සීමිත වේ. එපමණක් නොව (යම් යහපතක් කිරීමේ) චේතනාවන් ශක්තිමත් වන අතර, උතුම් හා උසස් සදාචාරයන් කරා මිනිසා යොමු කරයි.

7 මිනිසුන් කෙරෙහි ධනාත්මක බලපෑම: ශක්තිමත් දේව විශ්වාසවන්තයා තමා සහ තමන් වටා සිටින අය ප්‍රතිසංස්කරණය කිරීමට උත්සාහ කරයි.

8 සන්සුන් සහ සාමකාමී හැඟීම්: දෙවිඳුන් කෙරෙහි විශ්වාසය ගැත්තෙකුගේ හදවතේ සක්‍රීය ව තිබෙන තාක් , අනවශ්‍ය බියසැක ඔහුගේ හදවතෙන් හීන වී යනු ඇත.

# ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීමේ ආකාර



දරුවන්ට ඔවුන්ගේ දේව විශ්වාසය ශක්තිමත් කරන, ඔවුන්ගේ හැදියාව හා සදාචාරය නිවරැදි කරන සහ මුහම්මද් صلى الله عليه وآله وسلم තුමාණන්ගේ සමාජය සමඟ ඔවුන්ගේ සම්බන්ධතාවය බලගන්වන දේ ඉගැන්වීම දෙමාපියන් සතු වගකීමකි. මෙම අර්ථය යටතේ අන්තර්ගතවන කරුණු අතුරින් ප්‍රමුඛත්වය ලැබෙන කරුණු පිළිවෙලට පහත සඳහන් වේ.



1. දේව විශ්වාසයේ කුළුණු සය සහ දහමෙහි විශාලත්වය ඉගැන්වීම. තවද මානව ස්වභාවය සහ සහජ බුද්ධිය සමඟ වූ දහමෙහි ඒකඟතාව පිළිබඳ ඉගැන්වීම. එමෙන්ම දේව විශ්වාසයේ සාරය ශූන්‍ය වන අයුරින් පවතින කටපාඩම් කිරීම වැනි සාම්ප්‍රදායික ක්‍රමවේදවලින් දුරස් වී හදවත් අවදි කරන, බුද්ධියට අනුබල දෙන සහ හැදියාව ශෝධනය කරන ප්‍රායෝගික ආකාරයකින් එම දැනුම ලබා දීමට උත්සුක වීම.

2. නබි صلى الله عليه وآله وسلم තුමාණන්, එතුමාගේ පවුල් ඥාතීන, භාර්යාවන් සහ හිතමිතුරන් කෙරෙහි ආදරය උගන්වමින් දරුවන් ඇති දැඩි කිරීම. එම ආදරය සීමාව ඉක්මවා යන අයුරින් හෝ ඔවුන් අගතියට පත් කරන අයුරින් නොතිබිය යුතුය.

3. ආගම උත්කර්ෂයට නැංවීම පිළිබඳ සහ එහි චාරිත්‍ර වාරිත්‍ර හා ප්‍රකාශනයන් පිළිබඳ කියා දෙමින් දරුවන් ඇති දැඩි කිරීම. එමෙන්ම ඒවා පරිහානියට හෝ නින්දාවට ලක් කිරීම මෙන්ම ඒවා පිළිබඳ උදාසීනත්වයෙන් පසුවීම පිළිබඳ ඔවුනට අනතුරු ඇඟවීම.

4. යහපත් ක්‍රියාවන් මඟින් තොරව දේව විශ්වාසය සම්පූර්ණ නොවන බවත් එකී විශ්වාසය යහපත් ක්‍රියාවලින් වැඩි වන බවත් පාපිෂ්ඨ ක්‍රියාවලින් අඩු වන බවත් ඔවුනට ඉගැන්වීම. සදාචාරය, හැදියාව සහ නැමදුම තුළින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සැබෑ දේව විශ්වාසය දරුවන් තුළ පෝෂණය කිරීම අවශ්‍ය වේ.

5. අවසන් දින පිළිබඳ විශ්වාසය දරුවන්ගේ ආත්මයන් තුළ තැන්පත් කිරීම. එය මහිමයට පත් කිරීම. ගැත්තෙකු ලෞකික ජීවිතයේ සිදු කරන ක්‍රියාවන් සමග එහි ලැබෙන විපාකය සම්බන්ධ වී ඇති බවත් ස්වර්ගය යහපත් ක්‍රියාවන් කළ අය සඳහාත් නිරය යනු පාපයන් කළ අය සඳහාත් හිමි වන බව පැහැදිලි කිරීම.

6. ගැත්තන් පිළිබඳව උත්තරීතර දෙවිඳුන් සෝදිසියෙන් පසු වන බවත් ඔහු ඔවුන්ව දකිමින්, ඔවුනට සවන් දෙමින් සිටින බවත් ඔවුන් ගැන කිසිවක් ඔහුට නොසැඟවෙන බවත් තහවුරු කිරීම.

7. දරුවා ඔහු සතපය මත සිටින හැඟීම ඔහුගේ සිත තුළ කාවද්දමින් ආගමික හැඟීම් වර්ධනය කිරීම. මෙම හැඟීම ආඩම්බරයෙන් සහ ශක්තිමත්ව සිය ආගම මත රැඳී සිටිය යුතු බව ඔහුට හඟවයි.



# දේව විශ්වාසය ස්ථාපිත කිරීම සඳහා වූ

# අධ්‍යාපනික ක්‍රමවේද කිහිපයක්

මෙම අධ්‍යාපනික ක්‍රම කොටස් දෙකකට බෙදිය හැක. පළමුවැන්න දැනුවත් විමේ වයසට[1] පෙර වූ කාලය හා දෙවැන්න ඊට පසු කාලයයි.

දැනුවත් වීමේ වයසට පෙර දේව විශ්වාසය දරුවකුගේ සිත තුළ ස්ථාපිත කිරීමට උපකාරී වන කරුණු.

1. දෙවිඳුන් පිළිබඳ ඇඟවීමක් ඇති අබ්දුල්ලා, අබ්දුර්රහ්මාන්, අබ්දුල්කරීම් වැනි අවවින් සවන් දෙන නාමයන් ගැන දරුවාට අදහස් දැක්වීම සහ ඒවායේ අර්ථයන් කෙටියෙන් පැහැදිලි කිරීම. එසේම, ඔහු සලාතයේ ඇරයුමට සවන් දීම පිළිබඳ සැලැකිලිමත් වීම. ඔහුට දිනපතා පාරායනය කළ යුතු මෙනෙහි කිරීම් හා තෙපලීම් ඉගැන්වීම සහ ඒවා නිසි අයුරින් නොකඩවා කියවීමට උනන්දු කරවීම. ඔහු ඉදිරියේ ඒවා පාරායනය කිරීම. දෙවිඳුන් ඔහුට දුන් පරිත්‍යාග ගැන මතක් කර දීම - විශේෂයෙන් ආහාර වේලෙහි එය වරින් වර පැමිණෙන නිසා - අනුභව කිරීමට පෙර දෙවිඳුන්ගේ නාමයෙන් අනුභව කරමි (බිස්මිල්ලාහ්) යනුවෙන් සඳහන් කිරීමට සහ අවසන් වූ පසු ඔහුට ප්‍රශංසා කිරීමට ඉගැන්වීම.

2. දරුවාට අල්කුර්ආනයේ පරිච්ඡේද ස්වල්පයක් කටපාඩම් කර දීම. එය උත්තරීතර අල්ලාහ්ගේ වදන් බව අබවෝධ කර දීම. ප්‍රථමයෙන් අල් - ෆාතිහා පරිච්ඡේදය, අල් - ඉඛ්ලාස් පරිච්ඡේදය මෙන්ම අල්කුර්ආනයේ අවසන් පරිච්ඡේද දෙක ඉගැන්වීම ඉතා සුදුසුය. එමෙන්ම, නිවරැදි දේව විශ්වාසයේ අර්ථයන් අඩංගු ඇතැම් කවි සහ ගීත සමහරක් කටපාඩම් කරවීමට ද හැකිය.

3. ප්‍රීතිමත් හා සුන්දර අවස්ථාවන්හි දෙවිඳුන් මෙනෙහි කිරීමට සැලකිලිමත් වීම. විශේෂයෙන් ළමා කාලයේ දී බලකරමින් එසේ කිරීමට අවශ්‍ය නැත. එමෙන්ම දෙවිඳුන්ගේ කෝපය, දඬුවම සහ නිරය පිළිබඳ අනවශ්‍ය ලෙස පවසා බිය ගැන්වීමද සුදුසු නැත.

4. මැවීම්හි අලංකාරත්වය සහ එහි ශක්තිමත්භාවය සහ එහි සුසංයෝගය කෙසේද යන්න පිළිබඳ දරුවාට මග පෙන්වීම. එමගින් මැවුම්කරුගේ ශ්‍රේෂ්ටත්වය හා හැකියාව පිළිබඳ ඔහු දැන ගනු ඇති අතර ඔහු කෙරෙහි ආදරයක් ඔහු තුළ ඇති වේ. - මන්ද දෙවිඳුන් ද ඔහුට ආදරය කරන අතර ඔහු වෙනුවෙන් ලොවෙහි නිර්මාණයන් සියල්ල වසඟ කර ඇත.

---

1. දැනුවත් විමේ වයස සඳහා නිශ්චිත කාල සීමාවක් නොමැත. එය දරුවාගෙන් දරුවාට වෙනස් වේ. ඇතැම් දරුවන් වයස අවුරුදු පහේදී මෙන්ම තවත් දරුවන් වයස අවුරුදු හතේදී දැනුවත් විමේ වයසට එළඹෙනු ඇත. එනමුත් පොදු නීතිය නම් යහපත් හා අයහපත් දෑ කුමක්දැයි වෙන්කර හඳුනා ගැනීමටත් කියන දේ දැන හඳුනා ගැනීමටත් දරුවකුට හැකි වේ නම් එය දැනුවත් වීමේ වයසයි. දරුවන් හදාවඩා ගැනීමේ ක්ෂේත්‍රයේ විද්වතුන් මෙසේ ප්‍රකාශ කරයි: පාසැල් වියට පෙර වූ ළමා කාලයේදී ළමයා තුළ වටිනාකම්, ආචාර ධර්ම වැනි දෑ ස්ථාපිත කිරීම ඉතා වැදගත් වේ.

5. හැදියාවේ ආචාර ධර්ම හා දයාව, සහයෝගීතාවය, කතා කිරීමේ හා සවන්දීමේ ආචාර ධර්ම පුරුදු පුහුණු කිරීම. අලංකාරමත් ආදර්ශයන් තුළින් ඉස්ලාමීය පරමාදර්ශ දරුවා තුළ පෝෂණය කිරීම. එමඟින් ඔහු ශ්‍රේෂ්ටත්වයෙන් පිරි වාතාවරණයක ජීවත් වීමට පුරුදු වේ. එමෙන් ම ඔහු වටා සිටින අයගෙන් ඔහු සෑම යහපතක්ම උපුටා ගනී.



දැනුවත් වීමේ වයසට පසු, වෙනත් අධ්‍යාපනික ක්‍රම කිහිපයක් පෙර සඳහන් අධ්‍යාපනික ක්‍රම සමග එකතු කරනු ලැබේ. ඒවා පහත අයුරිනිඃ

1. මෙම විශ්වයේ විශාලත්වයෙහි තරම, එහි සංකීර්ණ නිමැවුම, එහි පරිපූර්ණත්වය සහ පිළිවෙල පිළිබඳ කරුණු දරුවාට ඉගැන්වීමෙන් ඔහු සර්වබලධාරී දෙවිඳුන් මහිමයට පත් කරනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයිඃ "මෙය සියලූ දේ ක්‍රමවත්ව පිහිටුවා ඇති අල්ලාහ්ගේ නිමැවුමකි"(27:88)

2. අල්ලාහ්ගේ ක්‍රියාවන් හා නිර්මාණ තුළ තිබෙන ඔහුගේ ප්‍රඥාව පිළිබඳ ඔහුට සිහිගැන්වීම. මෙමගින් එම දරුවා තුළ අල්ලාහ් කෙරෙහි ආදරයක් ඉපදෙන අතර ඔහුට ඔහු ප්‍රශංසා කිරීමට අරඹයි. රාත්‍රිය සහ දවාල, හිරු හා සඳ සහ ඉන්ද්‍රියන් (ඇස, කන, නාසය, දිව, ශරීරය ආදිය) නිර්මාණය කිරීමේ ප්‍රඥාව පිළිබඳ මතක් කර දීම මේ සඳහා කදිම උදාහරණ කිහිපයකි. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයිඃ ඔවුහු තමන් තුළ ම සිතා නොබැලුවෝ ද? අහස් ද පොළොව ද එදෙක අතර තිබෙන දෑය ද සාධාරණ හේතුවකට හා නියමිත කාල සීමාවකට මිස අල්ලාහ් නිර්මාණය නොකළේය. (30:08)

3. යහපත කරා ආකර්ෂණය වන, නපුරෙන් පලවා හරින සමකාලීන සිදුවීම් තුළින් ඥානවන්ත ආකාරයකින් දරුවාට මග පෙන්වීමට ඇති අවස්ථාවන් හරහා ප්‍රයෝජන ගැනීම. නිදසුනක් වශයෙන්, ඔහු අසනීප වුවහොත්, අපි ඔහුගේ සිත දෙවිඳුන් සමග අනුයුක්ත කළ යුතුය, රෝගියකු උසුරිය යුතු ප්‍රාර්ථනාවන් හා අල්ලාහ් පිළිබඳ යහපත් අපේක්ෂාව තිබිය යුත්තේ කෙසේද යන්න ඉගැන්විය යුතුය. ඔහුට කැමති පලතුරු හා රසකැවිලි අපි ඔහුට ලබා දුන් අවස්ථාවක, දෙවිඳුන් ඔහුට ලබා දීමට සැලැසූ මෙම ත්‍යාගය සඳහා කෘතවේදය පළ කරන ලෙස අප ඔහුගෙන් ඉල්ලා සිටිය යුතුයි. වෙන්කර හඳුනා ගැනීමේ හැකියාව සහ තීක්ෂණ බුද්ධිය දරුවාට නොමැති නම් කටුක සිදුවීම්වලදී දෙමව්පියන් දේව විශ්වාසය හා සබැඳි සංකල්ප ඔහුට ඉගැන්වීමෙන් වැළකී සිටිය යුතුය.

4. දරුවන් තුළ බිහි කිරීමට අප වෙර දරන ඉස්ලාමීය සදාචාරයන් වලට ඔවුන් පුරුදු වීමට නම් ප්‍රායෝගිකව ඒවා ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය වේ. එමනිසා, උපදේශකයා සදාචාරයන් මගින් හොඳ ආදර්ශයක් දරුවා ඉදිරියේ නිරූපණය කළ යුතුය. සදාචාරයන් හා හැසිරීම් හරහා ආගම හා සදාචාරාත්මක වටිනාකම් අතර සබැඳියක් ඇති කිරීම යනු අපගේ හැදියාව දියුණු කිරීමේ ක්ෂේත්‍රය සැබෑ වූ, න්‍යායාත්මක භාවයකින් තොර වූ සංකල්පයක් බවට පත් කරනු ඇත.

5. දරුවන් කළ යුතු දෑ කිරීමටත් නොකළ යුතු දැයින් වැළකී සිටීමටත් අරමුණු සහිත ආදර්ශමත් කතාන්දර වලින් ප්‍රයෝජන ගැනීම. එම කථා බලපෑම් ඇති කරන නාට්‍යමය ආකාරයකින් පැවසිය යුතු අතර එහි අඩංගු සංකල්ප හා සදාචාරාත්මක අගයන් ඉස්මතු කර පෙන්විය යුතුයි. කවි හා ගීත මගින් ද පරමාදර්ශ හා යහපත් සදාචාර දරුවා තුළ පෝෂණය කළ හැක. නබි තුමාණන්ගේ චරිතාපදානය නිරූපණය කිරීමෙන් එතුමා පිළිබඳ හැඳින්වීමක් දරුවාට ලබා දිය හැකිය. එය එතුමා පිළිබඳ ආදරය සහ එතුමාට කීකරු වීමේ හැඟීම දරුවා තුළ නිපදවයි. විශේෂයෙන් එතුමාගේ ළමා කාලය හා සම්බන්ධ කරුණු, දරුවන් සමග එතුමාගේ තත්ත්වයන් සහ එතුමා ඔවුනට දැක් වූ කරුණාව, එතුමාගේ පෙනුම, එතුමාගේ ඉහළ සදාචාරාත්මක තත්ත්වයන් සහ එතුමාගේ හිතමිතුරන්,

භාර්යාවන් (විශ්වාසවන්තයින්ගේ මව්වරුන්) සහ සෙසු පවුලේ ඥාතීන්ගේ (අල්ලාහ්ගේ තෘප්තිය ඔවුන් සියල්ල කෙරෙහි අත් වේවා) කථා වස්තු ඉදිරිපත් කිරීම ඉතා උචිතය.

6. ඔවුන්ව ආගමානුකූලව හදාවඩා ගැනීමේ දී සමබරතාවය අත්‍යවශ්‍ය වේ. ක්‍රියාත්මක කිරීමට තරම් ශක්තියක් නොමැති කරුණු ළමයින් හට නොපැටවිය යුතුයි. සරදම සහ විනෝදාස්වාදය දරුවාගේ මුල් ලෝකය බව අප අමතක නොකළ යුතුයි. එමනිසා, ඔහුගේ ස්වාභාවික හා මානසික වර්ධනයට විරුද්ධ වන කරුණුවලින් ඔහුව වෙහෙසට පත් කිරීමෙන් වැළකී සිටිය යුතුයි. දරුවාගේ මූලික අවශ්‍යතාවන් තහනම් කරන කාරණයන් හි සීමාව ඉක්මවා කටයුතු කිරීම සහ අධික ලෙස විවේචනය කිරීම ඍණාත්මකභාවය හා දරුවා තුළ වරදකාරී හැඟීම් මතු වීමට හේතු වේ. සාමාන්‍යයෙන්, එය සිදු වන්නේ දෙමව්පියන් තම දරුවා පරමාදර්ශ චරිතයක් බවට පත්කිරීමට වඩාත් උනන්දු වන පළමු දරුවා සමඟ ය.

7. වැඩිහිටියන්ගේ අඛණ්ඩ මැදිහත්වීමක් නොමැති ව දරුවා ඔහුට අයිති ස්වභාවය තුළම සිටීමට අත් හැරිය යුතුයි. අවට පරිසරයට සුදුසු ඔහුගේ හැකියාවන් සහ අවබෝධතාවන් සොයා ගැනීමට අවස්ථාව ලබා දෙන ක්‍රියාකාරකම් අපි ඔහුට සලසා දිය යුතුය. මෙය ඔහුට ඔහුගේ හැකියාවන් සමඟ දියුණු වීමට සහ යමක් සොයා ගැනීමට ඇති ආශාව වර්ධනය කරයි.

8. දිරිගැන්වීම මඟින් දරුවන් තුළ ධනාත්මක බලපෑමක් ඇති වන අතර එය ඔහුගෙන් අපේක්ෂා කෙරෙන දෑ කෙරෙහි උපරිම උත්සාහය යොදවීමට පොළඹවයි. නිසි අයුරින් දරුවාගේ හැදියාව ආදරය හා සෙනෙහස මුල් කරමින් සිදු වූයේ නම්, ඔහුට ශ්‍රේෂ්ට හා සමබර හැදියාවන් උපයා ගැනීමට එය මඟ පාදයි. දරුවා සිය උරුමයන් පිළිබඳ දැනුවත් වීමට උදව් කිරීම අත්‍යවශ්‍ය වේ. එමඟින් ඔහු කෙරෙහි අනිවාර්ය දෑ කුමක් ද යන්න හා වැරදි හා නිවරැදි දෑ මොනවාද යන්න දරුවා දැන ගනී. එමෙන්ම විනයගරුකභාවය ඇතිව, තරුණ විය විනාශ කිරීමෙන් වැළකී සිට, සිය ආත්ම ගෞරවය හා තත්ත්වය ආරක්ෂා කිරීම පිළිබඳ හැඟීම ද දරුවාට ලබා දිය යුතුයි.



9. උතුම් අල් කුර්ආනයේ ගරුත්වය ස්ථාපනය කිරීම සහ එය දරුවාගේ හදවතේ උත්කර්ෂයට නැංවීම. ඔහුට එහි ශුද්ධද්තවය පිළිබඳ හැඟීම ඇති කිරීමට සහ එහි ආඥාවන්ට කීකරු වීම සඳහා පහසු ආකර්ශනීය ක්‍රම භාවිතා කිරීම. ඔහු එය නිවරැදිව පාරායනය කරන්නේ නම්, එමඟින් ඔහු ධර්මිෂ්ඨ දේවදූතයන්ගේ තරාතිරම වෙත ළඟා වන බව ඔහුට දැනුවත් කිරීම. ඔහුට (අල්කුර්ආනය පාරායනය කිරීමට පෙර අඌදු බිල්ලාහි මිනෂ් ෂයිතානිර් රජීම්, බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්) යනුවෙන් පැවසීම හා හොඳින් සවන් දී අල්කුර්ආනයට ගෞරවය දැක්වීම වැනි) අල්කුර්ආන් පාරයනය කිරීමේ ආචාර ධර්ම අනුගමනය කිරීමේ ආශාව මෙන්ම අල්කුර්ආනයට සවන් දීමේ පුහුණුව ලබා දීම. මෙය ඔහුගේ භාෂාමය හැකියාවන් වැඩි කරන අතර අල්කුර්ආනය හෝ වෙනත් ග්‍රන්ථ කියවීම වෙත ඔහුව යොමු කරයි. ඔහු විසින් (අල් - ෆාතිහා / අල් - ඉඛ්ලාස් / අල් - ෆලක් සහ අන් - නාස් වැනි දේව විශ්වාසය හා සම්බන්ධ සංකල්ප අඩංගු පරිච්ඡේද කටපාඩම් කර ඇති නම් එහි පදවල තේරුම ඔහුට ඉගැන්විය යුතුය. ඊට අමතරව, විවිධ ආදර්ශන ක්‍රම උපයෝගී කරගනිමින් උතුම් අල්කර්ආනයේ සඳහන් කතාන්දර සරල හා තේරුම්ගත හැකි ආකාරයකින් නැවත නැවතත් ඔහුට කියා දිය යුතුයි.

10. අපට ප්‍රශ්නෝත්තර ශෛලියෙන් ප්‍රයෝජන ගත හැක. අප ඔහු වෙත ලබා දීමට අපේක්ෂා කරන තොරතුරු එම ප්‍රශ්නය තුළ අඩංගු විය යුතුයි. එමෙන්ම ඔහුගේ වයස සහ දැනුමේ තරාතිරමට ගැළපෙන ඉතා කෙටි වචන වලින් පිළිතුර සකස් වී තිබිය යුතුයි. දරුවා තුළ සාරධර්ම හා උතුම් සදාචාරයන් බිහි වීම මෙන්ම හොඳම දේ කෙරෙහි ඔහුගේ ආකල්පය වෙනස් වීම වැනි දෑ කෙරෙහි ප්‍රශ්නෝත්තර ශෛලියෙන් විශාල බලපෑමක් ඇති වේ.

11. වර්ණ ගැන්වීමේ ක්‍රම ඔස්සේ ඉගැන්වීමෙන් ප්‍රයෝජන ගත හැක. එහි දී වර්ණ ගැන්වීමට අවශ්‍ය පින්තූරයේ දේව විශ්වාසය හා බැඳුණු අර්ථයන් අඩංගු විය යුතුයි. එමෙන්ම නොයෙකුත් තරඟ හරහා ද ළමයාට ඉගැන්විය හැකිය. තරඟ වනාහි පුළුල් හා විවිධ වර්ග සහිත ක්ෂේත්‍රයකි. චාලක ශක්තිය සංවර්ධනය කරන තරඟ දරුවන් ප්‍රිය කරන නිසාත් ඒවා සමඟ ක්‍රියාශීලී වන නිසාත් ඒ ක්‍රමය ඉතා උචිතය.

12. සරල හා ආදරණීය ආකාරයකින, ඔහුගේ මනසට ග්‍රහණය කළ හැකි කෙටි ක්‍රමයකින් හා ඔහුගේ මානසික මට්ටමට ගැළපෙන අයුරින් දරුවාට දේව විශ්වාසය හා සම්බන්ධ නබි වදන් කිහිපයක් හෝ එයින් සමහර කොටස් විග්‍රහ කළ යුතුයි. දේව විශ්වාසය වර්ධනය කරන උදාහරණයක් ලෙස (කද්දරල්ලාහු මා ෂාඅ ෆඅල්: අල්ලාහ් නියම කර ඇති අතර ඔහු කැමති දෙයක් ඔහු කරය) (තවක්කල් අලල්ලාහ්: අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබන්න) (අල්ලාහු අලා කුල්ලි ෂයින් කදීර්: අල්ලාහ් සෑම

දෙයක් කෙරෙහිම ශක්තිවන්තයා) වැනි වාක්‍ය ඛණ්ඩ නැවත නැවත කියවීම හරහා ද ඔහුට ඉගැන්විය හැකිය. ඒවා ළමයා තුළ ස්ථාපනය වී ස්වෙච්ඡාවෙන් ම ඒවා පරිහරණය කිරීමේ පුරුද්ද ඔහු තුළ ඇති වේ. දෙමව්පියන්ගේ සහ උපදේශකයාගේ උපකාරය ඇතිව, දේව විශ්වාසය හා සබැඳි (මා මුස්ලිම් වරයෙකි, මා මාගේ දෙවියන්ට ආදරය කරමි සහ දේව විශ්වාසයේ කුළුණු වැනි වාක්‍ය ඛණ්ඩ සහ ප්‍රකාශන වලින් දරුවාට තම පන්තිය සහ නිදන කාමරය සරසා ගත හැකිය. දරුවා මෙම අධ්‍යාපන ක්‍රම වරින් වර දකින නිසා, ඔහුගේ මනසෙහි ඒවා ස්ථිරව රැඳා පවතී.

13. කරදර හා උවදුරු වලින් තොර වූ කෙනෙකු මෙලොවෙහි නොමැති බව දරුවාට ඉගැන්විය යුතුය. ලෞකික ජීවිතයේ සෑම කෙනෙකුම සර්ව බලධාරී අල්ලාහ් විසින් විපත් හා දුක්කරදර වලින් පරීක්ෂාවට ලක් වේ. සර්වබලධාරී දෙවිඳුන් ප්‍රඥාවෙන් තොරව යමක් සිදු නොකරන බවත්, ප්‍රතිලාභ ගෙන දෙන්නා හා හානියෙන් වළක්වාලන්නා දෙවිඳුන් අල්ලාහ් බවත්, ඔහුගේ දයාව ඔහුගේ කෝපය ඉක්මවා ගොස් ඇති බවත් ඔහුට ඉගැන්විය යුතුය. සහනයක් සැමවිටම ලැබෙන්නේ විපත්තියෙන් පසුව බව අපි ඔහුට පැහැදිලි කළ යුතුය. එය අල්ලාහ්ගේ පොදු නීතියකි. දෙවිඳුන් කෙරෙහි යහපත් අපේක්ෂාව ඔහු තුළ ශක්තිමත් කළ යුතුයි. මන්ද යහපත් අපේක්ෂාව ද වන්දනාමානයකි. අපගේ තේරීමට වඩා දෙවියන්ගේ තේරීම වඩා යහපත් බව ඔහුගේ සිතෙහි ස්ථාපිත කළ යුතුයි. මිනිසාට ඉවසිලිවන්තව සිටීම හා මෙම විපත් සමග කටයුතු කිරීමේදී ආගමානුකූල සාධකයන් පරිහරණය කිරීම, තෘප්තියට පත් වීම හා විපාකය බලාපොරොත්තුවෙන් සිටීම හැර අන් කිසිවක් කළ නොහැකි බව පැහැදිලිව තේරුම් කර දිය යුතුයි. අවසාන වශයෙන්, අයැදීම (දුආ ප්‍රාර්ථනාව) අපි ඔහුට ඉගැන්විය යුතුය. එය සැමවිටම ගැත්තාට ලාභදායී ගනුදෙනුවකි.




# හැදියාව වර්ධනය කිරීමේ ක්‍රම



දරුවාගේ ආත්මය තුළ දේව විශ්වාසය ස්ථාපනය කිරීමට උපකාරී වන වඩා වැදගත් ක්‍රම පහත සඳහන් වේ.

**1. අලංකාරමත් ආදර්ශය:** ආදර්ශය දරුවාගේ ආත්මයට ගැඹුරින් බලපාන ශ්‍රේෂ්ටත ම හා වඩාත් ම වැදගත් ක්‍රමයක් ලෙස සැලකේ. නබි ﷺ තුමාණෝ දරුවාගේ ජීවිතය තුළ ආදර්ශමත්භාවය පිළිබඳ වැදගත්කම මෙසේ අවධාරණය කර ඇත. අබ්දුල්ලාහ් ඉබ්නු ආමිර් رضي الله عنه තුමාණන්ගේ හදීසයක මෙසේ සඳහන් වී ඇත. වරක් නබි ﷺ තුමාණන් අප සමග සිටිය දී, මාගේ මෑණියන් මා කැඳවා මා ඔබට යමක් ලබා දීමට ඇත. එය ලබා ගැනීමට පැමිණෙන මෙන් පවසා සිටියා ය. එවිට නබි ﷺ තුමාණන් ඔබ ඔහුට ලබා දීමට අපේක්ෂා කළේ කුමන දේ ද යනුවෙන් විමසා සිටියහ. මා ඔහුට රටඉඳි ලබා දීමට අපේක්ෂා කළෙමි යැයි ඇය පැවසුවාය. එවිට නබිදුන් ඔබ ඔහුට "ඔබ අපේක්ෂා කළ දෑ" ලබා නොදුන්නේ නම් ඔබට අසත්‍ය ප්‍රකාශය (කිරීමෙන් ලැබෙන පාපය) ක් ලියනු ලැබේ) යනුවෙන් පැවසූහ. තවත් වාර්තාවක මෙසේ වාර්තා වී ඇත: කවරෙකු යමක් දෙන බව දරුවකු කැඳවා පසුව එය ඔහුට ලබා නොදුන්නේ නම්, එය ද අසත්‍ය ප්‍රකාශයකි. එබැවින්, ආදර්ශමත්භාවය ඵලදායී ක්‍රමයකි. මෙම නබි වදන හරහා - විශේෂයෙන් - දරුවන් සමග කටයුතු කිරීමේ දී අවංකභාවයේ වැදගත්කම අවධාරණය කෙරේ.

**2. සැබෑ දේශනා:** දේශනාවන් විවිධාකාරයෙන් සැපයිය හැකිය - එයින් එක් ආකාරයක් නම් ව්‍යවහාරයේ තිබෙන පරිදි සෘජු දේශනාවයි. නැතහොත් උපමාවන් ඉදිරිපත් කිරීම, එසේත් නැතිනම් කතාවස්තුවක් හරහා, එසේත් නැතිනම් සංවාද ආකාරයකින් එම දේශනය ඉදිරිපත් කළ හැක. දරුවා තුළ මැලි කමක් ඇති නොවීමට නම් සුදුසු කාල වේලාවක් අප තෝරා ගත යුතුයි.



3. **පෙළඹවීම සහ අනතුරු ඇඟවීම:** *ඇතැම් විට මෙම ක්‍රමවේදය විපාකය සහ දඬුවම් දීමේ ක්‍රමය ලෙස හැඳින් වේ. මෙම ක්‍රමවේදය අල්ලාහ් නියම කළ මිනිසාගේ සහජ විශ්වාසය වෙත සෘජු ව ස්පර්ශ වන බැවින් මෙය වඩාත් ප්‍රබල, චිත්තවේගීය ක්‍රමයක් ලෙස සැලකේ. එම සහජ විශ්වාසය නම්: ප්‍රතිලාභයට ඇති ඇල්ම සහ එය ක්‍රියාවට නැංවීම, එමෙන් ම හානියට වෛර කිරීම සහ එයින් වැළකී සිටීම වේ. මෙම ක්‍රමය අත් හදා බැලීමේදී සීමාව නොඉක්ම වී, අගතියක් සිදු නොකර එය සාධාරණව සිදු කළ යුතුය. දරුවාට සියුම් පෞරුෂයක් තිබේ නම් ඔහුව බිය නොගැන්විය යුතුය. මන්ද ඇතැම් විට එය ඔහු තුළ විරුද්ධ බැලපෑමක් ඇති කිරීමේ සම්භාවිතාව ඉතා ඉහළ බැවිනි. එහෙයින්, මෙවැනි අවස්ථාවක අප පෙළඹවීමේ ක්‍රමය වෙත ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. බිය ගැන්වීමේ ක්‍රමයට වඩා පෙළඹවීමේ ක්‍රමය එවැනි වයස් මට්ටමක පසුවන දරුවන් සඳහා අත්‍යාවශ්‍ය වේ.*

4. **පුරුදු පුහුණු කිරීම:** *සර්වබලධාරියාණන්ගේ තෘප්තිය බලාපොරොත්තුවෙන් සෑම ක්‍රියාවක් ම කිරීම ට දරුවා පුරුදු කිරීම, ඔහු කෙරෙහි භීතිය සහ ලැජ්ජාශීලීභාවය, සෑම විටම ඔහු මත රඳා පවතින ස්ථිර විශ්වාසය හා සියල්ල ඔහුගේ සන්තකයෙහි යන කරුණු පිළිබඳ විශ්වාසය දරුවාට පුරුදු පුහුණු කළ යුතුයි. මේ සියල්ල ඔහුට සෑම දුක්ඛිත තත්වයක් ඉදිරියේ ම ධෛර්යවන්ත ලෙස කටයුතු කිරීමට උපකාරී වන ශක්තිය සහ ස්ථිර භාවය උරුම කර දෙන අතර ඔහුගේ හදවත සහ ආත්මය සමනය කරන තෘප්තිය සහ නිශ්චිතභාවය ද ඔහුට උරුම කර දේ.*

5. **අනේක වාරයක් නැවත නැවතත් සිදු කිරීම:** *ඉගෙන ගත් දෑ මිනිසාගේ මනස තුළ රඳා පැවතීම සඳහා මේ ක්‍රමය ඵලදායී බව නූතන විද්‍යාව හා අත්හදා බැලීම් හරහා සනාථ වී ඇත.*

6. **සංවාදය සහ සාකච්ඡාව:** *දරුවා සමඟ සංවාදයක එකතු වීම මගින් ඔහුගේ හැඟීම් පුළුල් වන අතර දැනුමේ සීමාවන් ඔහුට විවෘත වේ. එහෙත්, අපි දරුවාගේ මතයට සහ ආත්මයට ගරු කළ යුතුය. ඔහුට හොඳින් සවන් දී ඔහු සමඟ නිහඬව වාද කළ යුතුය. එවිට සංවාදය සාර්ථක හා ඵලදායී සන්නිවේදනයක් ලෙස තහවුරු වන අතර එමගින් අපට දරුවාගේ හැදියාව දියුණු කිරීමටත් ඔහුට මඟ පෙන්වීමටත් හැකි වේ.*

7. **පොත්පත්:** *දරුවාගේ විද්‍යාත්මක, සංස්කෘතික හා ආධ්‍යාත්මික අවශ්‍යතාවන්ට ගැළපෙන ආකාරයකින් සකස් කළ පුස්තකාලයක් තිබීම වැදගත්ය. ශ්‍රව්‍ය, දෘශ්‍ය සහ ඩිජිටල් වැනි විවිධ ක්‍රම මගින් එම පුස්තකාලය සකස් කරදීම ගුණවත් ය. කතන්දර වැදගත් අධ්‍යාපනික මෙවලමක් වන නිසා එහි කතන්දර සමූහයක් අඩංගු වීම ද වැදගත් ය. නබි ﷺ තුමාණන්ගේ සහ ඔහුගේ කල්‍යාණ මිතුරන්ගේ චරිතාපදානයේ අර්ථවත් කථා රාශියක් දක්නට ලැබේ.*

**8. නවීන අධ්‍යාපනික මෙවලම් සහ තාක්ෂණය :** ඒවා අදහස් දිග හැරීමට සහ එම අදහස් දරුවා තුළට කාවැද්දීමට උපකාරී වන මෙවලම් වන අතර එමගින් එම අදහස්හි අර්ථයන් තේරුම් ගැනීමට සහ ග්‍රහණය කර ගැනීමට ඔහුට හැකි වේ. එම නවීණ අධ්‍යාපනික මෙවලම් මෙම අදහස් සහ මූලධර්ම දරුවාගේ සිත් ඇදගන්නා සුලු ඒවා පිළිගැනීමට සුදුසු මනෝ තත්ත්වයක් ඇති කරන අයුරින් වර්ණවත් ආකාරයකින් ප්‍රදර්ශනය කළ යුතුයි.

**9. ස්වාභාවික පෙළඹවීම් ක්‍රම:** සෙල්ලම් කිරීම, සහයෝගීතාවය, අනුකරණය කිරීම ඇතුළුව දරුවාගේ විවිධ අභ්‍යන්තර පෙළඹවීම් හරහා අපට ප්‍රයෝජන ලබා ගත හැකිය. සෙල්ලම් කිරීම හරහා අවට ලෝකය දරුවා අබවබෝධ කර ඔහුගේ අදහස් සහ හැඟීම් ප්‍රකාශ කිරීමට ඔහුට හැකි වේ. ලෞකික ජීවිතයේ සහ විශ්වයේ සැබෑ අරුත පැහැදිලි කිරීම සඳහාත් දරුවාගේ ආත්මයේ සාරධර්ම සනිටුහන් කිරීම වැනි දෑ සඳහාත් මෙම ක්‍රමය භාවිතා කළ හැක. එය සරල හා සුදුසු ආකාරයකින් විය යුතුයි. සිදුවීම් නිරීක්ෂණය කිරීම සහ අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම යනාදී කරුණු - මග පෙන්වන අවස්ථාවේ දී - නිවරැදි ව පරිහරණය කළේ නම් ඒවා දරුවාගේ ආත්මය තුළ ප්‍රබල බලපෑමක් ඉතිරි කරයි.

**10. අයැදීම (දුආ):** අයැදීම යනු දෙවිඳුන් කෙරෙහි වූ මිනිසාගේ අවශ්‍යතාව සහ ඔහුගේ කරුණාව කෙරෙහි වූ මිනිසාගේ බලාපොරොත්තුව හඟවන්නකි. අයැදින මෙන් අල්ලාහ් තම ගැත්තන් ධෛර්යමත් කර ඇති අතර ඔවුනට පිළිතුරු දෙන බවට ද පොරොන්දු වී ඇත. ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ: "මා කැඳවන්න. මම නුඹලාට පිළිතුරු දෙමි"යි නුඹලාගේ දෙවිඳුන් පවසයි. (40:60) අයැදීම යනු උපදේශකයෙකු තම හැදියාව දියුණු කිරීමේ ඉලක්කය කරා ළඟා වීම සඳහා භාවිතා කළ හැකි හොඳම ක්‍රමයකි. ඒක දේවවාදය සහ දේව විශ්වාසයෙහි ස්ථිරභාවය සඳහා මෙතෙක් සිටි ශ්‍රේෂ්ටතම උපදේශකයින් වන දෙවිඳුන්ගේ වක්තෘවරුන් විසින් භාවිතා කළ ක්‍රමය ද එයයි.



ශුද්ධ වූ අල්කුර්ආනයේ ඒ පිළිබඳ මෙසේ සඳහන් වේ. "මාගේ දෙවියනි ! මෙම ගම්මානය අභය ස්ථානයක් කරනු මැනව, මා ද මාගේ දරුවන් ද ප්‍රතිමාවන් වැඳීමෙන් ආරක්ෂා කරනු මැනවැ" යි ඉබ්‍රාහීම් ප්‍රකාශ කළ සැටි සිහි කරන්න." (14:35) එමනිසා, දරුවාගේ යහපත වෙනුවෙන් අයැදීම වනාහි ඔහුගේ හැදියාව දියුණු කිරීමේ දී ඔහු වෙනුවෙන් කරන ඉමහත් උපකාරයකි.

**11. රඟ දැක්වීම සහ අනුකරණය:** සහජයෙන්ම, ළමයා අනුකරණයට ප්‍රිය කරයි. මස්ජිදයෙහි සලාතය මෙහෙය වන ඉමාම්වරයෙකු මෙන් පාරායනය කර සලාතය මෙහෙය වීමටත්, උපදේශකයකු මෙන් නැගිට උපදේශනය කිරීමටත් ගුරුවරයෙකු මෙන් විග්‍රහ කර ඉගැන්වීමටත් ඔහුට අවස්ථාව සලසා දිය යුතුය. මෙමඟින් එම මෙහෙයවීම් හි අන්තර්ගත අර්ථයන් ඔහුට වැටහෙනු ඇති අතර එවැනි තනතුරු වල අගයන් ඔහු තුළ ආරක්ෂා වේ.



## සාර්ථක උපදේශකයකු - හැදියාව දියුණු කරන්නා -

# තුළ තිබිය යුතු විශේෂ ගති ලක්ෂණ.



**1. දයාව සහ කරුණාව:** දරුවන්ගේ හදවත් කරුණාව මගින් දිනා ගැනීමට නම් හැදියාව දියුණු කිරීමේ කර්තව්‍ය මෘදු හා සියුම් ගුණාංග සමග සම්බන්ධ විය යුතුයි. එසේ නොවේ නම් එහි අපේක්ෂිත ප්‍රතිලාභය නොලැබේ. අල් - අක්‍රා ඉබ්න් හාබිස් رضي الله عنه අල් - හසන් සහ අල් - හුසේන් رضي الله عنهما සිප ගනිමින් සිටි නබි ﷺ තුමාණන් දෙස බලා මෙසේ පවසයි : මාහට දරුවන් දස දෙනෙකු සිටින අතර මා ඔවුන් අතුරින් කිසිවෙකු හෝ සිපගෙන නැත. අල්ලාහ්ගේ දූතයා ﷺ ඔහු දෙස බලා "අන් අයට අනුකම්පා නොකරන තැනැත්තාට දයානුකම්පිතව සලකනු නොලැබේ" යනුවෙන් පැවසීය. (බුහාරි හදීස් අංක 5997) තවද මෙසේ නබි ﷺ තුමාණන් පවසා ඇත: පොළොවේ වාසය කරන්නන් කෙරෙහි දයාව දක්වන්නන්, ඔවුන් කෙරෙහි අහසෙහි සිටින තැනැත්තා දයාව දක්වනු ඇත. (අබූ දාවූද් හදීස් අංක 4941, ඉමාම් අල්බානි තුමාණන් මෙම වැකිය නිවැරැදි බව සනාථ කර ඇත)

**2. දරාගැනීම සහ සමාව ලබා දීම:** අපගේ ධර්ම දූත මුහම්මද් ﷺ තුමාණන් මෙම යහගුණාංගයේ මුදුනට ම පැමිණ ඇත. ඒ පිළිබඳ අනස් رضي الله عنه තුමාණන් මෙසේ වාර්තා කරයි. වරක් මා අල්ලාහ්ගේ දූතයාණන් සමග එතුමාණන් - නජ්රාන් ප්‍රදේශයට ආවේනික වූ ඝන දාරයන් සහිත - ඇඳුමක් ඇඳ සිටිය දී ගමන් කරමින් සිටියෙමි. ගම්බද අරාබිවරයෙකු එතුමා පසුපස ගොස් එතුමාගේ වස්ත්‍රය ඉතා තදින් ඇද්දේය. එතුමාගේ උරහිස මා දුටුවෙමි. ඔහු තදින් ඇද්ද හේතුවෙන් එය තුවාල වී තිබුණි. මුහම්මද්! ඔබ සතුව ඇති අල්ලාහ්ගේ ධනයෙන් ස්වල්පයක් මාහට ලබා දීමට අණ දෙනු' යැයි එම අරාබි වරයා පැවසී ය. අල්ලාහ්ගේ දූතයාණෝ ﷺ තුමා ඔහු දෙස බලා සිනාසෙමින් ඔහුට යමක් ලබා දෙන ලෙස අණ කළේය. (බුහාරි හදීස් අංක 5709)

සමාව දීම ද දරාගැනීමේ ඝනයට අයත් එක් ගුණාංගයකි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: සමාව දීමේ ගතිගුණය පිළිපදිනු, තවද යහපත අණ කරනු, තවද අඥානයින්ගෙන් ඉවත් වනු. (7:199) දරාගැනීමේ ගුණාංගය තහවුරු කිරීම පිණිස නබි ﷺ තුමාණන් කෝප නොවී කටයුතු කරන ලෙස උනන්දු කර ඇති අතර කෝපයෙන් වැළකී සිටින මෙන් උපදෙස් දී ඇත. තවත් වාර්තාවක මිනිසෙකු නබි ﷺ තුමාණන්ගෙන් "මා හට උපදෙස් ලබා දෙනු" මෙන් ඉල්ලා සිටියහ. එවිට නබි ﷺ තුමාණන් "කෝප නොවන්න" යනුවෙන් උපදෙස් ලබා දුන්හ. ඒ මිනිසා (නැවත නැවතත් ඒ අයුරින් ම) විමසූ අතර නබි ﷺ තුමාණන් සෑම අවස්ථාවක ම "කෝප නොවන්න" යනුවෙන් ම උපදෙස් ලබා දුන් හ. (බුහාරි හදීස් අංක 6116)

**3. ඉවසීම:** උපදේශකයා ඉවසිලිවන්ත විය යුතු අතර තම දරුවන් ඇති දැඩි කිරීමේ දී හෝ අධ්‍යාපනය ලබා දීමේ දී ඉක්මන් නොවිය යුතුය. තවද ප්‍රතිඵල සැනින් ලබා ගත් යුතුයි යනුවෙන් හෝ ඉලක්කය තහවුර කර ගත යුතුයි යනුවෙන් හෝ උපදේශකයා ඉක්මන් නොවිය යුතුය. එවිට අසාර්ථකත්වය



*සහ බලාපොරොත්තු සුන්වීම යන හැඟීම දරුවාගේ ආත්මයට කාන්දු වේ. ඉවසීමෙන් තොර වූ උපදේශකයෙකු, කිසිදු සැපයුමයක් නොමැති සංචාරකයෙකු හා සමාන ය.*

4. **යුක්තිය:** *පැහැදිලි හේතුවක් නොමැතිව උපදේශකයා දරුවන් දෙදෙනෙකු සමඟ අසාධරණ ලෙස කටයුතු කරන්නේ නම්, දරුවන්ගේ සංහිඳියාව අඩු වන අතර ඔවුන් අතර සමගිය ද මැකී යයි. යම් හෝ කරුණක අයුක්තිය අන්තර්ගත වේ නම් එය ඒ කරුණ අපකීර්තියට පත් කරයි.*

5. **අවංකකම:** *ළමයා සමඟ ගනුදෙනු කරන විට උපදේශකයා සත්‍යවාදී සහ අවංක විය යුතු ය. මන්ද අවංකකම යනු දෙවියන්ගේ පණිවිඩකරුවන්ගේ ගති ලක්ෂණයක් වන අතර ල එය යම් කරුණක් වැඩි දියුණු කිරීම සහ ප්‍රගුණ කිරීම සහ එහි ඉලක්කය හා සාර්ථකත්වය කරා ළඟා වීමට වූ මූලික අවශ්‍යතාවයකි.*

6. **ශ්‍රද්ධාව:** *මන්ද කවරෙකු දෙවිඳුන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුතු ව කටයුතු කරන්නේ ද, ඔහු අපේක්ෂා නොකරන අයුරින් අල්ලාහ් ඔහුට සහාය දෙන්නේ ය. ශ්‍රද්ධාව යනු ලෞකික සහ මතුලොව ජීවිතයේ සාර්ථකත්වය සහ යහපැවැත්ම මෙන්ම භාග්‍යයෙහි සහකාරයා ය.*

7. **චිත්ත පාරිශුද්ධිය:** *ක්‍රියාව අල්ලාහ් වෙනුවෙන් සිදු නොකළේ නම්, එය එහි හිමිකරු වෙත ආපසු විසි කරනු ලැබේ. ඔහු එම ක්‍රියාව වෙනුවෙන් දැමූ වෙහෙස හා තෙහෙට්ටුව හැර අන් කිසිවක් ලබා නොගනී.*

8. **දැනුම:** *මන්දයත් දැනුමැත්තා වර්තමානය හා අනාගතය නාස්ති කරන නූගත් අය මෙන් නොව ඔහු වර්තමානය හා අනාගතය ගැන නිරීක්ෂක ය.*

**9. ප්‍රඥාව:** උපදේශකයා සියල්ලක්ම ඒවාට හිමි සුදුසු ස්ථාන ලබා දෙන විට ඒවා සියල්ල ඒවාට ආවේනික වූ ප්‍රතිලාභ ලබා දෙනු ඇත. එසේම හැදියාව දියුණු කිරීමේ මෙහෙවර ද එහි ප්‍රතිලාභය දෙනු ඇත්තේ එය නිසි අයුරින් ක්‍රියාත්මක කිරීමෙනි.එහෙයින්, දරුවාගේ ආත්මය තුළ බැස හැදියාව දියුණු කර ඉගැන්වීම උපදේශකයාගේ මෙහෙවර වේ.

**10. හැදියාව දියුණු කිරීමේ කර්තව්‍ය පිළිබඳ ආත්ම විශ්වාසය:** හැදියාව දියුණු කිරීම වනාහි මානසික සහ අධ්‍යාත්මික දීමනාවකි. හැදියාව දියුණු කිරීමේ ක්‍රියාවලිය විශ්වාස නොකරන ඕනෑම කෙනෙකුට එවැනි දීමනාවක් අන් අයෙකුට ලබා දිය නොහැක.

**11. සංවර්ධනය:** උපදේශකයෙකු ලෙස තම කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය කරුණු ළඟා කර ගැනීම සඳහා සිය හැකියාවන් සහ දක්ෂතාවයන් වර්ධනය කර ගැනීමට උපදේශකයා සැලකිලිමත් විය යුතුයි.







# ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීමේ කුළුණු



**පළවෙනි කුළුණ:**

අල්ලාහ් කෙරෙහි විශ්වාසය

**දෙවන කුළුණ**

සුරදූතයන් කෙරෙහි විශ්වාසය

**තුන්වන කුළුණ**

දේව ග්‍රන්ථ කෙරෙහි විශ්වාසය

**හතරවන කුළුණ**

ධර්ම දූතයින් කෙරෙහි විශ්වාසය

**පස්වන කුළුණ**

අවසන් දින පිළිබඳ විශ්වාසය

**හය වැනි කුළුණ**

පෙර නියමය කෙරෙහි විශ්වාසය

## පළවෙනි කුළුණ:

# අල්ලාහ් කෙරෙහි විශ්වාසය



සහජ හැඟීම, මනස සහ ආගම යන සියල්ලම දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ පිළිබිඹු කරයි. සෑම ජීවියෙකු ම තම මැවුම්කරුවාණන් කෙරෙහි විශ්වාස කිරීමේ සහජ විශ්වාසයෙන් යුතුව නිර්මාණය කරනු ලැබ ඇත. එය බුද්ධිමය කෝණයෙන් සෑම ජීවියකු සඳහා ම මැවුම්කරුවෙකු සිටිය යුතුයි යන හේතුව නිසාත් ආගමික කෝණයෙන් හෙළිදරව් කරන ලද සියලුම ආගම් දෙවියන්ගේ පැවැත්ම සනාථ කරන හේතුව නිසාත් ය. දෙවිඳුන් කෙරෙහි විශ්වාස කිරීම කරුණු හතරකින් සමන්විත වේ.

- පළමුවැන්න : දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ විශ්වාසය.
- දෙවැන්න : ඔහුගේ ආධිපත්‍ය පිළිබඳ විශ්වාසය. නියත වශයෙන්ම ඔහු පිරිනමන්නා ය. මැවුම්කරු ය. පරිපාලකයා ය.
- තෙවැන්න : ඔහුගේ දේවත්වය කෙරෙහි සහ එහි ඒකීයත්වය කෙරෙහි විශ්වාසය මෙන් ම ඔහුට හවුල්කරුවන් නොමැති බව විශ්වාස කිරීම.
- හතරවැන්න : පරිපූර්ණත්වය සහ අලංකාරය තහවුරු කරන ඔහුගේ නාමයන් සහ ගති ලක්ෂණ කෙරෙහි විශ්වාසයයි.

අප මේ කරුණු හතර දරුවාට ඉගැන්විය යුතුයි. එවිට ඔහු සිය දෙවියාණන්ව දැන හඳුනා ගැනීම මත සහ මහිමයට පත් කිරීම, ඔහුට ඇලුම් කිරීම මත වැඩෙනු ඇත. මෙම කුළුණ සෙසු කුළුණු වල මූලික පදනම වේ.

### සර්වබලධාරී අල්ලාහ් කෙරෙහි වූ ප්‍රේමය අපි දරුවන් හට උගන්වන්නේ කුමන හේතූන් නිසා ද?

1. එයට හේතුව නම් පැවත්මක් නොමැතිව සිටියදී අල්ලාහ් අපව නිර්මාණය කොට ළ තවද අප ව ක්‍රමවත් කර වෙනත් ජීවීන්ට වඩා අප ව විශිෂ්ට කොට ඇත. ශ්‍රේෂ්ඨතම ආශීර්වාදය වන ඉස්ලාමය අපට පිරිනමා ඇත. ඔහුගේ භාග්‍යයන් අතුරින් රාශියක් - අප ඒවාට සුදුස්සන් නොවූවත් - අපට ලබා දී ඇත. එපමණක් නොව ඔහුගේ භාග්‍යයෙන් අප සිදු කළා වූ ක්‍රියාවන් සඳහා වේතනයක් වශයෙන් ස්වර්ගය ද හිමි වන බව අපට ප්‍රතිඥා දී ඇත. ප්‍රථම හා අවසාන තපාගශීලී ගුණ ඇත්තා ඔහුම ය.

2. ප්‍රේමය මගින් - බාහිර හා අභ්‍යන්තර - ගෞරවය සහ ගරුබිය නිර්මාණය වේ. දෙවියන්ගේ දඬුවම හෝ නිරය පිළිබඳ භීතිය මත පමණක් ගොඩනඟන ලද බැඳීමක් වෙනුවට අපගේ දරුවන් තුළ දෙවියන්ට ගරු කිරීම මගින් ගොඩනැගෙන බැඳීම ඉතා අත්‍යවශ්‍ය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔහු කෙරෙහි ඔවුන්ගේ භක්තිය අධ්‍යාත්මික ප්‍රීතියක් බවට පත්වන අතර එය වැරදි වලින් ඔවුන්ව ආරක්ෂා කරනු ඇත.

3. එමෙන් ම, අල්ලාහ් නොමියන සදා ජීවමානීය. ඔහුට මද නින්දක් හෝ තද නින්දක් හෝ හට නොගනී. ඔවුන් සිටින සෑම තැනකම ඔවුන් සමග ඔහු සිටින අතර, ඔවුන්ගේ දෙමව්පියන්ට වඩා ඔහු ඔවුනට ආරක්ෂාව සපයයි. අල්ලාහ් සමග සම්බන්ධකම් පැවැත්වීම සහ ඔහුට ආදරය කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන්නේ එබැවිනි. මෙමගින් අල්ලාහ්ගෙන් ඔවුනට ශක්තිමත් සහයෝගයක් තමන් වෙත ලැබෙනු ඇතැයි ඔවුන් දැනගනී.

4. දරුවන් අල්ලාහ්ට ප්‍රේම කරන්නේ නම් ඔවුන් අල්කුර්ආනයට ද ප්‍රේම කරන අතර සලාතය නම් නැමදුමට ද අනුගත වනු ඇත. දෙවිඳුන් අලංකාරය. ඔහු අලංකාර දෑ ප්‍රිය කරන බව ඔවුන් දැන සිටියේ නම්, ඔවුන් අලංකාර ව තිබෙන සියලු ක්‍රියාවක ම නිරත වනු ඇත. පසුතැවිලි වූ, පවිත්‍ර වූ, කරුණාවන්ත, ත්‍යාගශීලී, ඉවසිලිවන්ත, විශ්වාසවන්ත හා භක්තිවන්ත අය දෙවිඳුන් ප්‍රිය කරන බව ඔවුන් දැන සිටියේ නම්, ඔවුන් ඔහුගේ තෘප්තිය හා ප්‍රේමය ලබා ගැනීමට සහ ඔහුගේ සහයෝගය සහ ආරක්ෂාව දිනා ගැනීමට උපරිම උත්සාහයක් දරනු ඇත. තවද, ඔහු ද්‍රෝහී, අවිශ්වාසවන්ත, අහංකාර, වැරදිකාර, අයුක්ති සහගත සහ දූෂිත අයට අකැමති බව ඔවුන් දැන සිටියේ නම්, දෙවිඳුන් උදෙසා සහ ඔහුගේ තෘප්තිය උදෙසා මේ සියලු ගතිලක්ෂණ වලින් දුරස්ව සිටීමට ඔවුන් හැකි අයුරින් වෙර දරනු ඇත.

5. අල්ලාහ්ට ප්‍රේම කිරීම යන්නෙන් අදහස වන්නේ අප සමග ඔහු සිටින බවට වූ හැඟීමයි. මෙමගින් කනස්සල්ල හා දුක නැතිව සහනය, සන්සුන්කම සහ නිශ්චිතභාවය ඇති වේ. මේ සියල්ලට අමතරව, මානසික හා ශාරීරික රෝග වලින් ආත්මයේ සහ ශරීරයේ ආරක්ෂාව තහවුරු වේ. වඩාත් වැදගත් වන පාපයෙන් මිදුණු සුරක්ෂිත ජීවිතයක් ගත කිරීමට හැකි වේ.



## සර්වබලධාරියාණන් කෙරෙහි වූ ප්‍රේමය අපේ දරුවන්ට උගන්වන්නේ කෙසේද?

**1.** දේව විශ්වාසය හා බැඳුණු සංකල්ප දරුවාගේ මනසෙහි මුල්බැස ගැනීමට ඇති එකම ප්‍රවේශය හැඟීම් ය. එනම්, සූර්යයා, වැසි සහ සුළඟ වැනි අවට සොබාදහමේ වස්තූන් උපයෝගී කර ගනිමින් දරුවාගේ මැවුම්කරු කෙරෙහි ඇති විශ්වාසය ශක්තිමත් කිරීම සඳහා දරුවාගේ හැඟීම් පිළිබඳ සැලකිලිමත් විය යුතුයි. මේ විශ්වය හසුරුවන මැවුම්කරුවෙකු සිටින බව මේ හරහා අපි දරුවාට ඉගැන්විය යුතුයි. තවද ඒ පිළිබඳ විමසිලිමත් ව ප්‍රශ්න කිරීමට ඔවුන් ව පොළඹවිය යුතුයි. දරුවාගේ දෘෂ්ටිය තුළ දේව විශ්වාසය පිළිබඳ දර්ශනයක් රෝපණය කිරීම සඳහා අප උපරිම උත්සාහයක් දැරිය යුතුයි. එමගින් ඔවුන් අධ්‍යයනය කරන සෑම විද්‍යාත්මක පර්යේෂණයන් තුළ ම දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ සාක්ෂි ඔවුනට දැකගත හැකි වේ.

තවද, දෙවියන්ගේ ආශ්චර්යමත් හැකියාව සහ විස්මිත මැවීම් ඉස්මතු කිරීමට අපි සැලකිලිමත් විය යුතුය. මිනිසා නිර්මාණය කිරීමේ මූලධර්මය පිළිබඳ අවධානයෙන් බලන ලෙස දෙවියන්ගෙන් වූ මඟපෙන්වීම ද අපි සැලකිලිමත් විය යුතු කරුණු වලින් එකකි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: මිනිසා කවරකින් නිර්මාණය කරන ලද්දේ දැයි සිතා බලන්වා.(86:05) තවද උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: ස්ථිරව විශ්වාස කරන අයට පොළොවෙහි ද නුඹලා තුළ ද බොහෝ සාධක ඇත. නුඹලා නොසිතන්නෙහු ද? (51:21) එසේ ම, මිනිසාගේ ආහාර නිරීක්ෂණය කිරීම සහ දෙවිඳුන් එය මැවූ ආකාරය සහ එහි අදියරයන් පිළිබඳ අවධානයෙන් බලන ලෙස දෙවියන්ගෙන් වූ මඟපෙන්වීම ද අප සැලකිලිමත් විය යුතුය. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: මිනිසා තම ආහාරය දෙස අවධානය යොමු කරන්වා. (80:24) ඊට අමතරව, අල්ලාහ්ගේ මහිමය පෙන්වන ඔහුගේ නිර්මාණ නිරීක්ෂණය කිරීම හරහා ඔහුගේ හැකියාව ද ඉස්මතු කළ යුතුය. ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ: ඔටුවා නිර්මාණය කරන ලද්දේ කෙසේ දැයි ඔවුන් බැලිය යුතු නොවේ ද? අහස ඔසවන ලද්දේ කෙසේ ද? කඳු සිටුවන ලද්දේ කෙසේ ද? පොළොව දිග හරින ලද්දේ කෙසේ දැ' යි ඔවුන් බැලිය යුතු නොවේ ද?(88:17-20) අප මෙම ගැඹුරු අර්ථයන්, නිර්මාණයේ විස්මිතභාවය සහ නිර්මාණකරුගේ ශ්‍රේෂ්ඨත්වය යනාදී කරුණු විවිධ වයස්වල දරුවන්ගේ මනසෙහි ස්ථාපිත කිරීම සඳහා විවිධාකාර නවීන තාක්ෂණික මෙවලම් භාවිතා කළ යුතුයි. දරුවා ඔහු තුළ තිබෙන සහජ විශ්වාසය නිසාවෙන්, ඔහු වෙනුවෙන් ම මේ සියලු විශිෂ්ට දෑ නිර්මාණය කර ඒවා ඔහු වෙනුවෙන් ම වසඟ කර දුන් තැනැත්තාට ප්‍රේම කරනු ඇත.

**2.** අල්ලාහ්ගේ පරිපූර්ණත්වය සහ අලංකාරය පෙන්නුම් කරන නාමයන් සහ ගතිලක්ෂණ දරුවාට ඉගැන්වීම. සර්වබලධාරී දෙවිඳුන් අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත ය. ඔහුගේ දයාව සියලු දේ කෙරෙහි ව්‍යාප්තව ඇත. ඔහු ක්ෂමාශීලී ය. අත් වැරදීම් සඳහා සමාව ලබා දෙන්නා ය. සමාව හා ගැත්තන් කළ පාපයන් සැඟවීමේ ගුණාංග හිමි අති ක්ෂමාශීලි ය. ඔහු ඉල්ලීමක් හෝ හේතුවක් නොමැතිව පිරිනමන ත්‍යාගශීලී ය. සියලුම ප්‍රතිලාභ සඳහා තම ගැත්තන් හට මඟ පෙන්වන මාර්ගෝපදේශකයා ඔහුය. ඔහු ආදරය කරන හා ආදරය ලබන සෙනෙහස පුදන්නෙකි. මෙම දැනුම දෙවිඳුන් කෙරෙහි ප්‍රේමය නිපදවීමට උපකාරී වන බවට කිසිදු සැකයක් නැත.

3. "ඔබ මට කීකරු නොවන්නේ නම් දෙවිඳුන් ඔබට දඬුවම් කරනු ඇත" යනුවෙන් පැවසීමෙන් වැඩිහිටියන් වැළකී සිටිය යුතුය. දෙවියන්ට අකීකරු වන අයට දඬුවම් කරන බව දරුවාට ඉගැන්වීම අතරත් දෙවියන්ගේ දඬුවම සැමවිට ම මට කීකරු වීම මත වේ යනුවෙන් ප්‍රකාශ කිරීම හෝ තර්ජන එල්ල කිරීම අතරත් වෙනසක් තිබේ. මෙය දරුවාට දෙවියන්ගේ ශක්තිය සහ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ ගැඹුරින් සිතීම වළක්වාලයි. දෙවිඳුන් පිළිබඳ තර්ජන එල්ල කිරීම හරහා දරුවන් ඇති දැඩි කිරීම මත අප රැඳී නොසිටිය යුතුය. ඊට පටහැනිව, අපි ඔහුට දෙවිඳුන් කෙරෙහි වූ ආදරය හා ඔහු මහිමයට පත් කිරීම යන කරුණු පිළිබඳ ඉගැන්විය යුතුය. සර්වබලධාරී දෙවිඳුන් පිළිබඳ දරුවාගේ දර්ශනයට බලපාන කිසිවක් අප ආරෝපණය කිරීමෙන් වැළකී සිටිය යුතුයි.

4. දරුවා තම දෙමව්පියන් අනිවාර්ය වූ සලාතයන් හෝ වෙනත් වගකීම් ඉටු කිරීම, තහනම් දැයින් වැළකී සිටීම වැනි දෑ නිරීක්ෂණය කරන විට, ඔහු සාමාන්‍යයෙන් එයට හේතුව විමසයි. එසේ කිරීමට හේතුව දෙවිඳුන් කෙරෙහි තිබෙන ප්‍රේමය සහ කීකරුකම බව ඔවුන් ලබා දෙන පිළිතුර තුළ සඳහන් විය යුතුය. මේ ක්‍රමය දෙවිඳුන් කෙරෙහි වූ ප්‍රේමය ආදර්ශයට ගනිමින් හැදියාව දියුණු කිරීමේ වර්ගයට අයත් වේ. මන්ද දරුවා සදා තම දෙමාපියන් අනුගමනය කරයි. දරුවන්ගේ හදවත් තුළ දෙවිඳුන් කෙරෙහි වූ ප්‍රේමය ස්ථාපිත කරන තවත් කරුණක් නම් ස්වර්ගය සහ දෙවිඳුන් එහි තම දැහැමි ගැත්තන් සඳහා සූදානම් කර ඇති සදාකාලික භාග්‍යයන් ගැන ඔවුන් සමඟ කථා කිරීමයි.


5. දරුවා ඔහුගේ වගකීම්හි යථාර්ථය වටහා ගන්නා වයස වෙත ළඟා වූ විට, අල්ලාහ් කෙරෙහි වූ ප්‍රේමයේ භාරදූරය ඔහුට ඉගැන්විය යුතුය. එයට හේතුව අපව නිර්මාණය කළ, ක්‍රමවත් කළ පෝෂණය කළ මෙන්ම ඔහුගේ අනෙකුත් සෑම නිර්මාණ වලට වඩා අපව ශ්‍රේෂ්ඨමත් නිර්මාණයක් ලෙස පත් කළ තැනැත්තා ඔහුය. ඔහු උතුම් ඉස්ලාමයේ භාග්‍ය අපට ලබා දුන්නේ ය. අප අවට ඇති සියලුම ආශිර්වාද දෙවියන්ගෙන් බව අපි දරුවාට ඉගැන්විය යුතුය. එමෙන්ම, එම ආශීර්වාද සඳහා දෙවියන්ට පැසසුම හා ස්තුති පුද කරන්නේ කෙසේද යන්නත් තවත් බොහෝ දෑ ඔහුගෙන් අයැද සිටින්නේ කෙසේද යන්නත් අපි ඔහුට ඉගැන්විය යුතුය. ආශීර්වාද පිළිබඳ මෙවැනි නිරීක්ෂණයන් ප්‍රේමය දිරිග න්වන සුළු ය.

6. දරුවා තුළ දෙවිඳුන් සහ ඔහුගේ දූතයාණන් කෙරෙහි ප්‍රේමයක් ඇති කිරීමට උපකාරී වන කියමන්, ක්‍රියාවන් සහ අවස්ථාවන් ඇතුළු සියලු මාර්ග ඔහුට ඉගැන්වීම.



# දෙවන කුළුණ
## සුරදූතයන් කෙරෙහි විශ්වාසය





සුරදූතයන් කෙරෙහි විශ්වාසය පහත සඳහන් කරුණු වලින් සමන්විත වේ. ඔවුන්ගේ පැවැත්ම පිළිබඳ විශ්වාසය, ඔවුන් අතුරින් - විශේෂයෙන් - නාමයන් ප්‍රචලිත අය කෙරෙහි විශ්වාසය , ඔවුන් පිළිබඳ වාර්තා වූ සත්‍ය තොරතුරු විශ්වාස කිරීම සහ ඔවුනට ප්‍රේම කිරීම. දේවදූතයන් පිළිබඳ දරුවාගේ ආත්මය තුළ ස්ථාපිත කළ යුතු වැදගත් අධ්‍යාපනික අන්තර්ගතයන් පහත සඳහන් වේ.

1. ඔවුන් ආලෝකයෙන් නිර්මාණය කරන ලද මැවීම් බව දරුවාට ඉගැන්වීම. ආඉෂා رضي الله عنها තුමිය මෙසේ පවසයි: "දේවදූතයන් ආලෝකයෙන් නිර්මාණය කොට ඇත. ජින්වරු ගිනි දැල්ලෙන් නිර්මාණය කොට ඇත. ආදම් නිර්මාණය කොට ඇත්තේ (අල් කුර්ආනයේ) ඔබට අර්ථ දක්වා ඇති ආකාරයට ය" වේ යනුවෙන් නබි ﷺ තුමාණන් ප්‍රකාශ කළ හ. (මුස්ලිම් හදීස් අංක 299) මෙම නිර්මාණය සහ එහි ස්වභාවය පිළිබඳ සවිස්තරාත්මකව කරුණු පහදා නොදී සාමාන්‍ය අයුරින් විස්තර සඳහන් කිරීම ප්‍රමාණවත් වේ.

2. ඔවුන් අතුරින් නම් සඳහන් වූ දේවදූතයන් පිළිබඳ දරුවාට ඉගැන්වීම. උදාහරණයක් ලෙස: සුරදූතයින්ගේ ප්‍රධානියා වන ජිබ්රීල් عليه السلام, අල්කුර්ආනය පහළ වූයේ ඔහු හරහා ය. මීකාඊල් عليه السلام වර්ෂාව පහළ කිරීමට භාරව සිටී. සූර් නමැති නලාව පිඹීමේ වගකීම ඉස්‍රාෆීල් عليه السلام වෙත පැවරී ඇත. එසේම, සිංහාසනය උසුලන්නන්, ලේඛකයින්, ආරක්ෂකයින් යනාදී අයුරින් නොයෙකුත් වගකීම් සඳහා භාර ව කටයුතු කරන දේව දූතයින් රාශියක් සිටී.

3. ඔවුන්ගේ සංඛ්‍යාව අති විශාල බවත්, ඒ සංඛ්‍යාව පිළිබඳ සර්වබලධාරී දෙවිඳුන් හැර වෙන කිසිවෙකු නොදන්නා බවත්, ඔවුන් දෙවියන්ගේ අණට කීකරු වන ජීවීන් බවත්, ඒ සෑම කෙනෙකුට ම නිශ්චිත මෙහෙවරක් පැවරී ඇති බවත්, ඒවා සමග ඔවුන් බැඳී ඇති බවත් අප දරුවාට පැහැදිලි කළ යුතුයි.

4. ඔවුන් පාපයන් සිදු කිරීමෙන් සුරක්ෂිත ය. ඔවුන් වෙහෙසට පත් නොවී, මැලි නොවී අහංකාර නොවී අඛණ්ඩව දෙවියන්ට වන්දනාමාන කරන අතර ඔවුන් දේව විශ්වාසී අයවලුනට ආදරය කරති. ඔවුනට සහයෝගය දක්වති. ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කර ඔවුන් ආරක්ෂා කරති. ඔවුන් අල්ලාහ් සිහිපත් කිරීමේ සභාවන්වලට සහභාගී වන අතර ඒවා ලුහුබැඳ සොයා යති.

5. දේවදූතයන්ගේ යහපත් ස්වභාවය සහ විශ්වාසවන්තයින් කෙරෙහි ඔවුන් දක්වන සැලකිල්ල අවබෝධ කර දී දරුවා තුළ ඔවුන් කෙරෙහි ප්‍රේමයක් ඇති කිරීමට උනන්දු වීම. මොවුන් දෙවිඳුන් ව මහිමයට පත් කරන, සමාව ඉල්ලා සිටින, විශ්වාසවන්තයින් සඳහා ප්‍රාර්ථනා කරන නිසාත් ස්වර්ගයට ඇතුළු වන විට ඇදහිල්ලෙන් හා යහපත් ක්‍රියාවලින් සතපයේ මාවතෙහි සෘජු ව රැඳී සිටි විශ්වාසවන්තයින්හට ශුභාරංචිය ගෙන එන නිසාත් ඔවුනට සහයෝගය දක්වා ශක්තිමත් කරන නිසාත් ඔවුන් ඔවුන්ගේ (විශ්වාසවන්තයින්ගේ) ක්‍රියාවන් හි ආරක්ෂකයෝ නිසාත් ඔවුන් කෙරෙහි ප්‍රේමයක් ඇති කිරීමට උනන්දු වීම මගින් මෙම උතුම් ජීවීන් කෙරෙහි ඇති පක්ෂපාතිත්වය හා සෙනෙහස ශක්තිමත් වේ. සිය ගැත්තන්ගේ ආරක්ෂාව උදෙසා දෙවිඳුන් ඔවුන්ව එවන බව මෙසේ ශුද්ධ වූ අල්කුර්ආනයේ සඳහන් වේ: මිනිසාට ඔහුගේ ඉදිරිපසින් ද පසුපසින් ද අඛණ්ඩව පැමිණෙන්නෝ (සුර දූතවරු) සිටිති. ඔවුහු අල්ලාහ්ගේ අණ පරිදි ඔහු ආරක්ෂා කරති. (13:11)

6. සුරදූතයින් කෙරෙහි වූ විශ්වාසය ඔවුන්ව ගෞරවයට පත් කිරීම අනිවාර්ය කරන්නෙකි. මන්දයත්, ඔවුන් ගෞරවනීය ජීවීන් වන බැවිනි. ඔවුන් කිසි විටෙකත් දෙවියන්ට අකීකරු නො වන අතර ඔවුනට අණ කළ සියල්ල ඔවුන් ඉටු කරති. ඔවුනට නොගැළපෙන සියලු ගතිලක්ෂණ වලින් ඔවුන් නිදොස් බව සුවිශුද්ධ කළ යුතුයි.


7. මිනිසුන් පීඩා විඳින දෙයින් සුරදූතයන් ද පීඩා විඳින හේතුවෙන් පෞද්ගලික සනීපාරක්ෂාව කෙරෙහි උනන්දු කරවීම. නබි ﷺ තුමාණෝ පැවසූ බව ජාබර් ඉබ්න් අබ්දුල්ලාහ් رضي الله عنه මෙසේ පවසයි : සුදුළූණු අනුභව කරන තැනැත්තා (තවත් වරක ඒ තුමා මෙසේ පවසා ඇත) ළූණු, සුදුළූණු සහ ලීක්ස් අනුභව කරන තැනැත්තා, අපගේ මස්ජිදයට ළඟා නොවිය යුතු ය. මක්නිසාදයත් සාමාන්‍ය මිනිසා පීඩා විඳින දෙයින් දේවදූතයන් ද පීඩා විඳින හේතුවෙනි. (මුස්ලිම් හදීස් අංක 564)

8. සුරදූතයන්ගේ පැවැත්ම සහ ඔවුන් කෙරෙහි විශ්වාස කිරීම තුළ බොහෝ සියුම් හේතු අන්තර්ගත ය. දෙවියන්ගේ දැනුමේ පරිමාව සහ ඔහුගේ හැකියාව හා ප්‍රඥාවේ ශ්‍රේෂ්ඨත්වය මිනිසා දැන ගැනීමට සැලැස් වීම. දෙවියන්ගේ අණ පරිදි තමා ආරක්ෂා කරන සහ තමාට සහාය දෙන සේනාවක් සිටින බව දැන ගැනීමෙන් මුස්ලිම්වරයෙකු තුළ ආරක්ෂිත බවක් දැනීම වැනි කරුණු ඒවා අතුරින් ස්වල්පයකි.

9. සැකැස්මෙන්, පැවත්මෙන් හා නිරීක්ෂණයෙන් දේවදූතයන් සමඟ අපට ඇති සම්බන්ධය මිනිසාට ඔහුගේ වැදගත්කම හා වටිනාකම හෙළි කරන අතර ඔහු නොවැදගත් හා පහත් යැයි කියන සංකල්පය පහ වී යයි. මෙලෙසින් මිනිසා සිය ආත්මයේ වටිනාකම දැන හඳුනා ගෙන තමාට පවරා ඇති□ ශ්‍රේෂ්ඨ වගකීම සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිම උත්සාහයක් දරයි.

# තුන්වන කුළුණ

# දේව ග්‍රන්ථ කෙරෙහි විශ්වාසය



දේව ග්‍රන්ථ කෙරෙහි විශ්වාසය පහත සඳහන් දෑ වලින් සමන්විත වේ:

1. දෙවිඳුන් විසින් හෙළිදරව් කරන ලද ග්‍රන්ථ වල පැවැත්ම පිළිබඳ විශ්වාසය. තවද එය ඔහුගේ ගැත්තන් කෙරෙහි වූ ඉමහත් දයාවක් වන අතර යහමගෙහි නිරත වීම සඳහා සෑම සමාජයකටම ගැළපෙන නීති සහ රීති වලට අනුව එවැනි ග්‍රන්ථ පහළ කර ඇත. ග්‍රන්ථ පහළ කිරීම මහත් ආශීර්වාදයක් බව මෙය දරුවාට පැහැදිලි කරයි. මන්ද, දෙවිඳුන් යනු කවුරුන් ද, මතුලොව, යහපත හා නපුර යනු කුමක් ද යන්න පිළිබඳ එය අපට හඳුන්වා දී ඇත.

2. ඉබ්‍රාහිම් عليه السلام හට පහළ වූ ලේඛන, මූසා عليه السلام හට පහළ වූ තෝරාහ්, දාවූද් عليه السلام හට පහළ වූ සබූර්, ඊසා عليه السلام හට පහළ වූ තවුරාතය සහ මුහම්මද් ﷺ තුමා හට පහළ වූ අල්කුර්ආනය වැනි නම් ප්‍රසිද්ධියට පත් ග්‍රන්ථ සත්‍ය බව තහවුරු කිරීම.


3. කිසිදු පරස්පරතාවයකින් හෝ විරුද්ධත්වයකින් තොරව මෙම පොත් එකිනෙක අනුමත කරන බව විශ්වාස කිරීම. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "අපි ඔබට සත්‍යයෙන් යුත් ධර්ම ග්‍රන්ථය පහළ කළෙමු. එය තමාට පෙර පැවති ධර්ම ග්‍රන්ථය සත්‍ය කරවන්නක් ද එය ආරක්ෂා කරන්නක් ද වේ. (5:48)



4. ඒවායෙහි සඳහන් සනාථ කරන ලද තොරතුරු සත්‍ය බව තහවුරු කිරීම සහ පෙර දිව්‍ය ග්‍රන්ථ පෙර තිබුණු ස්වභාවයෙන් නොමැති බවත් එය වෙනස් කිරීමට ලක් වුණු බවත් ඉගැන්වීම. මන්දයත් ඒවා තාවකාලික වූ අතර එකල බිහි වූ සමාජය සඳහා පමණක් ඒවා නියම කරන ලදී. අල්කුර්ආනය ආරක්ෂා කරන බව අල්ලාහ් ප්‍රතිඥා දුන් මෙන් ඒවා ආරක්ෂා කිරීමට අල්ලාහ් ප්‍රතිඥා දුන්නේ නැත.

5. අල්කුර්ආනය මගින් පෙර පැවති සියලුම වේද ග්‍රන්ථ අහෝසි වී ගිය බවත් විනිශ්චය දිනය දක්වා එහි විධානයන් අනුගමනය කිරීමට බැඳී සිටිය යුතු බවත් විශ්වාස කිරීම. එහි නියෝග වලට අවනත වීම සහ එය තහනම් කළ දැයින් වැළකී සිටීම, එය තහනම් කරන දේ තහනම් කිරීම, එය අනුමත කළ දේ අනුමත කිරීම, එහි පැහැදිලි දේ ක්‍රියාත්මක කිරීම සහ - මිනිසාගේ බුද්ධියට - උකහා ගත නොහැකි දෑට යටත් වීම සහ එහි සීමාවන් හා ඉගැන්වීම් උල්ලංඝණය නොකිරීම අත්‍යවශ්‍ය වේ.

දේව ග්‍රන්ථ කෙරෙහි විශ්වාසය තුළ අන්තර්ගත වන වැදගත් කරුණක් නම් උතුම් අල්කුර්ආනය දරුවාට කුඩා කල සිට ම කටපාඩම් කරවීමයි. එම කාර්යභාරය හොඳින් සිදු කර අල්කුර්ආන් පදවල පසුබිම දරුවාට දැනුවත් කරන්නේ කෙසේදැයි උපදේශකයා දැන සිටියේ නම් (අල්කුර්ආනය කටපාඩම් කිරීම) ළමයින්ගේ බුද්ධිය වැඩි දියුණු කරන ඉතා වැදගත් ක්‍රියාකාරකමක් වනු ඇත. උතුම් අල්කුර්ආනය අපට ආරාධනා කරන්නේ අහස සහ භූමිය නිර්මාණය කිරීම, මිනිසා නිර්මාණය කිරීම සහ අප අවට ඇති දේ නිර්මාණය කිරීම ගැන මෙනෙහි කිරීමට හා සිතීමට ය. එවිට අපගේ විශ්වාසය වැඩි දියුණු වන අතර දැනුම ක්‍රියාවන් සමඟ මිශ්‍ර වේ. අල්කුර්ආනය කටපාඩම් කිරීම සහ එහි අර්ථයන් අවබෝධ කර ගැනීම පුද්ගලයා විශේෂ බුද්ධිමත් අවධියකට ගෙන යයි. එය නිවැරදිව කියවීමට පුරුදු කිරීමෙන් දරුවාගේ වාග් විද්‍යාව සහ භාෂා ශෛලිය වැඩි දියුණු වේ. බියබැතිකම, ගරුබිය, ඇලුම්කම, යටත් වීම, හදවත් සහ හැඟීම් සියුම් වීම වැනි ආගමික චිත්තවේගයන් ද එය පෝෂණය කරන අතර එහි ඉගැන්වීම් හා ආචාරධර්ම දෛනික සෑම අංශයක් හරහා ම ක්‍රියාවට නැංවීමට පුරුදු පුහුණු කරයි. එය දරුවා නිවැරදි ජීවිතය හා උතුම් සදාචාරය මත වර්ධනය කරනු ඇත. අල්කුර්ආනය කටපාඩම් කිරීමේ පංති වලට ඇතුලත් වීමෙන් ඔවුනට ලැබෙන ඉමහත් ප්‍රතිඵල සහ විශාල ආශීර්වාදය ද එයින් ලැබෙන තවත් ප්‍රයෝජන වලින් එකකි.



## මතක තබා ගැනීමට (කටපාඩම් කිරීමට) දරුවා උනන්දු කරවන්නේ කෙසේද?

**1.** අල්කුර්ආනය කටපාඩම් කිරීම, පාරායනය කිරීම, ඉගැන්වීම සහ එහි ඉගැන්වීම් ක්‍රියාවට නැංවීමේ මහිමයන් අපි ඔහුට ඉගැන්විය යුතුයි. මුහම්මද් ﷺ තුමාණන් අල්කුර්ආනයේ මහිමය පිළිබඳ පහත අයුරින් සඳහන් කර ඇත:

- අල්කුර්ආනය කියවන්න, එය නැවත නැගිටුවීමේ දිනයේ දී එහි සගයන් සඳහා මැදිහත්කරුවෙකු ලෙස පැමිණෙනු ඇත. (මුස්ලිම් හදීස් අංක 805)

- අල්කුර්ආනය කටපාඩම් කළ තැනැත්තා උදෙසා (ස්වර්ගයට ඇතුල් වීමේ දී) මෙසේ කියනු ලැබේ -"පාරායනය කරන්න තවද උසස් වීම් ලබා ගන්න .ලොවෙහි ඔබ (සන්සුන් ව) පාරායනය කරමින් සිටි ආකරයට ම පාරායනය කරන්න. මක්නිසාද යත් ඔබේ නිලය ඔබ කියවන අවසාන පදයේ ය". (තිර්මිදි :2914)

- අල්කුර්ආනය පාරායනය කරන විශ්වාසවන්තයෙකුට උදාහරණය නම්, හොඳ සුවඳක් සහ හොඳ රසයක් ඇති පැඟිරි ය. අල්කුර්ආනය පාරායනය නොකරන විශ්වාසවන්තයෙකුට උදාහරණය නම් සුවඳක් නැති නමුත් රසයක් ඇති රටඉඳි ය. අල්කුර්ආනය පාරායනය කරන කුහකයෙකු ට උදාහරණය නම්, සුවඳැති නමුත් තිත්ත රයිහානා නමැති ඖෂධ පැළෑටි වර්ගය යි. අල්කුර්ආනය පාරායනය නොකරන කුහකයෙකු ට උදාහරණය නම් සුවඳක් නැති හන්ළලා නමැති තිත්ත රසයක් සහිත කොමඩු ය. (බුහාරි හදීස් අංක 5427)

- ඔබ අතරින් ශ්‍රේෂ්ඨතම පුද්ගලයා වනාහි අල්කුර්ආනය ඉගෙන ගෙන එය උගන්වන්නා ය. (බුහාරි හදීස් අංක 5027)

අල්කුර්ආනය කෙරෙහි අපගේ දැහැමි මුතුන් මිත්තන් දැක්වූ සැලකිල්ල පිළිබඳ උදාහරණ දරුවාට කියා දිය යුතුය. මෙය දරුවා තුළ උද්යෝගය ජනනය කරන විශාල ක්‍රමයකි.

**2.** අල්කුර්ආනය උගන්වන පාසල්වලට හෝ මස්ජිදයෙහි පැවැත්වෙන අල්කුර්ආන් කටපාඩම් කිරීමේ පංතිවලට ඇතුළත් කළ යුතු ය. නැතහොත් ඔහුට අල්කුර්ආනය ඉගැන්වීමට ගුරුවරයෙකු සොයා ගත යුතු අතර ළමයින් හෝ සිසුන් අතර තරගකාරී වාතාවරණයක් ඇති කර ඔවුනට තෑගි හෝ උද්යෝගය ජනනය කරන යමක් ලබා දිය යුතුය.





3. දරුවාගේ ආරම්භක අවදියේ සිට ම අල්කුර්ආනය කටපාඩම් කිරීමේ ක්‍රියාවලිය සරලව ක්‍රියාත්මක කළ යුතුය. එවිට ඔහු ඒ කෙරෙහි ඇල්මක් දක්වයි. උදාහරණයක් ලෙස (ජුස් අම්ම) නමැති අල්කුර්ආනයේ අවසන් කොටසින් ඔහු කටපාඩම් කිරීමට ආරම්භ කළ හැකිය. මන්ද සමාන අකුරකින් අවසන් වන කෙටි පද තිබීමෙන් එම කොටස විශේෂිත ය. මෙය දරුවාට ගැඹුරින් මතක තබා ගැනීම පහසු කරයි. තවද මෙම පරිච්ඡේදවල දේව විශ්වාසයේ කුළුණු පිළිබඳ කරුණු අඩංගු බැවින් ඒවා ඔහුගේ විශ්වාසය නිවැරදි කර ඔහුගේ ආකල්පය හැඩගස්වනු ඇත. එපමණක් නොව ඒවා ඔහුට සෞඛ්‍යය හා ආරක්ෂාව ද සපයයි. මන්දයත් අල්කුර්ආනය යනු මෙනෙහි කිරීමක් හා රෝග නිවාරණයකි. ඒ සියල්ලට අමතරව එය දරුවාගේ වාග් විද්‍යාව හා කථන දක්ෂතාවය ද ශක්තිමත් කරයි.

4. දරුවා අල්කුර්ආනය පාරායනය කිරීමේදී හා කටපාඩම් කිරීමේදී අල්කුර්ආන් වැකිවල අර්ථය කෙටියෙන් විග්‍රහ කිරීම ගැන සැලකිලිමත් වීම. එහි පදවල අර්ථයන් ඔහුගේ බුද්ධිය සහ හදවත විවෘත කරනු ඇත. කුඩා දරුවෙකු පැහැදිලිව විග්‍රහ කිරීමට නොසුදුසු අය යැයි කවුරුත් නොසිතිය යුතු ය. මන්ද මතක තබා ගැනීමේ සහ තේරුම් ගැනීමේ විශ්මිත හැකියාවන් දරුවා තුළ අන්තර්ගත වේ.

5. අල්කුර්ආනය සුවයකි, දයාවකි සහ ආශීර්වාදයකි. ඒ බව අපි දරුවාට ඉගැන්විය යුතුයි. දෙවිඳුන් මෙසේ පවසයි : විශ්වාස කළ අයට දයාවක් ද රෝග නිවාරණයක් ද වන දෙයක් අපි කුර්ආනයෙහි පහළ කළෙමු. (17:82) එය සම්පූර්ණ ලෙස හෝ එහි කොටසක් දරුවා කටපාඩම් කර ගන්නේ නම් අසනීප වූ විට එමඟින් තමාහටත් තමන් වටා සිටින අයහටත් දේව මෙහෙය තුලින් ලෙඩ රෝග සුව කළ හැක.

## හතරවන කුළුණ

# ධර්ම දූතයින් කෙරෙහි විශ්වාසය



ධර්ම දූතවරුන් කෙරෙහි විශ්වාසය වනාහි, ඔවුන්ගේ අවංකකම කෙරෙහි විශ්වාසය, ඔවුන් පිළිබඳ වාර්තා වූ නිවරැදි තොරතුරුවල සත්‍යතාව පිළිබඳ විශ්වාසය, ඔවුන් අතුරින් - විශේෂයෙන් - නාමයන් ප්‍රචලිත අය කෙරෙහි විශ්වාසය සහ අල්ලාහ් ඔවුන්ගේ ගෝත්‍රිකයන් අතුරින් ඔවුන්ගේ සදාචාරාත්මක හා මානසික වෙනස නිසා, ඔහුගේ පණිවිඩය ඔවුනට ලබා දීමට ඔවුන්ව තෝරාගෙන ඇති බව විශ්වාස කිරීම යනාදී කරුණු ඒ තුළ ඇතුළත් වේ. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි : කවර දූතයෙකු වුවත් ඔහු තම ජන සමාජයට පැහැදිලි කර දෙනු පිණිස එම ජන සමාජයේ බසින් ම අපි එව්වෙමු. (14:04) එමනිසා, ධර්ම දූතවරයා දේවදූතයෙක් නම්, එම සමාජය ඔහුව තේරුම් නොගනී. මෙම ධර්ම දූතවරුන් කෙරෙහි විශ්වාසයේ දී කිසිවෙකු අතර වෙනසක් සිදු නොකළ යුතු ය. එබැවින් අපි ඔවුන් අතුරින් ස්වල්ප දෙනෙකු විශ්වාස කර අනෙක් අය ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතු ය. අපි ඔවුන් සියල්ල විශ්වාස කළ යුතුයි. සියලු ධර්ම දූතවරුන් ඔවුන්ගේ දේව පණිවිඩ විෂයෙහි අවංක වූ අතර සිය සමාජය කෙරෙහි උපදෙස් දීමට යුහුසුළු වූ හ. ඔවුන් දෙවිඳුන් පිළිබඳව ඉදිරිපත් කරන දේ සම්බන්ධයෙන් සුරක්ෂිතයින් වන අතර ඔවුන් අතුරින් අවසානයා වන මුහම්මද් ﷺ තුමාගේ නීති පමණක් අනුගමනය කිරීමට අපි බැඳී සිටිය යුතුයි.

ධර්ම දූතවරුවන් පිළිබඳ දරුවාගේ ආත්මය තුළ ස්ථාපිත කළ යුතු වැදගත් අධ්‍යාපනික අන්තර්ගතයන් පහත සඳහන් වේ.

1. සර්වබලධාරී අල්ලාහ් සෑම සමාජයකට ම එම සමාජය තුළින් ම එක් ධර්ම දූතවරයෙකු තෝරා එවා ඇති බවත් ඔවුන් අල්ලාහ්ට පමණක් වන්දනා කිරීම වෙතත්, ඔහු හැර නැමදුම් කෙරෙන සියල්ල ප්‍රතික්ෂේප කිරීම වෙතත් ඇරයුම් කළෝය. ඔවුන් සියල්ලෝම සත්‍යවන්ත, සත්‍යවන්තයින් ලෙස පිළිගනු ලැබූ, නිහතමානී, ධර්මිෂ්ඨ, බුද්ධිමත්, භක්තිමත් හා අවංක අයවලුන් වන බවත් පැහැදිලි කළ යුතුයි.

2. පළමු ධර්ම දූතවරයා සිට අවසන් ධර්ම දූතවරයා දක්වා ඔවුන් රැගෙන ආ පණිවිඩය වන්දනාමානයහි මූලාරම්භය හා පදනම සමඟ එකඟ වන බව පැහැදිලි කිරීම. එය ඒක දේවවාදය යැයි හඳුන්වනු ලැබේ. - එයින් අදහස් වන්නේ: විශ්වාසයෙන්, වචනයෙන් සහ ක්‍රියාවෙන් කළ හැකි සියලු නැමදුම් ක්‍රම හරහා සර්වබලධාරී අල්ලාහ්ව ඒකීයට පත් කිරීම හා ඔහු හැර නැමදුමට ලක් වන සියලු දෑ ප්‍රතික්ෂේප කිරීමයි.



3. අල්ලාහ්ට පමණක් නැමදුම් කිරීම හා ඔහුව ඒකීයට පත් කිරීම, මනුෂ්‍ය වර්ගයා නිවැරදි මාවතකට යොමු කිරීම, ආගමේ හා ජීවිතයේ අංගයන් මිනිසුන්ට ඉගැන්වීම, අන්ධකාරයෙන් ආලෝකයට ගෙනයාම සහ සමාජයට නායකත්වය ලබා දීම සහ අල්ලාහ්ගේ නීතිය ක්‍රියාත්මක කිරීම, ධර්ම දූතවරුන් ආදර්ශයක් ලෙස ගැනීම සහ ඔවුන්ගේ මාවත අනුගමනය කිරීම වැනි ඔවුන් අල්ලාහ් විසින් එවනු ලැබූ සියුම් ආධ්‍යාත්මික හේතු පැහැදිලි කිරීම.

4. දෙවිඳුන් සිය ගැත්තන් කෙරෙහි පෙන්වන දයාව හා ඔවුන් කෙරෙහි ඔහු දක්වන සැලකිල්ල පිළිබඳ දැනුවත් වීම. මනුෂ්‍ය වර්ගයා ඔහුගේ මාවතට යොමු කිරීම සඳහාත්, ඔහු කළ ආශීර්වාදයන් වෙනුවෙන් ඔහුට කෘතවේදය පළ කිරීමේ වැදගත්කම ඉස්මතු කිරීම සඳහාත් අල්ලාහ් ධර්ම දූතවරුන් යවා තැබූ බව අවධාරණය කිරීම. පණිවුඩකරුවන් සහ ධර්ම දූතවරුන්ට ආදරය කිරීම පිළිබඳ දරුවාට අවධාරණය කළ යුතුයි. මන්ද ඔවුන් අල්ලාහ්ගේ පණිවිඩය නිසි අයුරින් නිවේදනය කර ඔහුගේ ගැත්තන් හට උපදෙස් ලබා දුන් අය වෙති. සාමාන්‍ය මිනිසුන් සතුව දැනුවත්භාවය සහ තීක්ෂණය බුද්ධිය කොතරම් තිබුණ ද, ඔවුන් ධර්ම දූතවරු මෙන් නොවේ. සෑම කෙනෙකුට ම ඔවුනොවුන්ගේ අයිතිවාසිකම් ලබා දීමෙන් සමබර සමාජයක් ලෙස සමස්ත ජාතිය ම ප්‍රතිසංස්කරණය කරමින් පොදු සංවිධානයක් කරා ළඟා වීමට සාමාන්‍ය මිනිසකුට නොහැක. එමෙන් ම ධර්ම දූතවරුන් මිනිසුන්හට ප්‍රයෝජනවත් දෑ උගන්වන අතර හානියක් වන දැයින් ඔවුන්ව වළක්වාලයි.

5. අල්ලාහ්ගේ දූතයාණන් වන මුහම්මද් ﷺ තුමාණන් කෙරෙහි ප්‍රේමය තහවුරු කිරීම. එවිට එතුමාට කීකරු වීමට, එතුමා අනුගමනය කිරීමට, මෙනෙහි කිරීමට සහ සියල්ලට වඩා එතුමාණන්ට ප්‍රේම කිරීමට, එතුමාණන්ට සහයෝගය ලබා දුන් අයට සහයෝගය ලබා දීමට, විරුද්ධ වූ අය සමඟ විරුද්ධ වීමට , එතුමාගේ උතුම් නාමය සඳහන් වූ විටෙක ඔහුට ගෞරවය කිරීමක් වශයෙන් ඔහු කෙරෙහි සාමය හා ආශිර්වාදය අයැද සිටීමට සහ ඔහුගේ ගුණාංග හා විශේෂාංග අගය කිරීමට දරුවා පෙළඹේ. එමෙන් ම, කෙනෙකුට එතුමාගේ සොහොන්කොත අසල සිටීමේ හෝ එතුමාගේ මස්ජිදය බැහැ දැකීමේ භාග්‍ය අල්ලාහ් ලබා දුන්නේ නම් එතුමාගේ සොහොන්කොත අසල ගෞරවණීය ආකාරයෙන් හැසිරීම හා එතුමාගේ මස්ජිදය තුළ දී නිශ්ශබ්දතාවය සුරැකීම.

## නබිඳුන් කෙරෙහි ප්‍රේමය දරුවාට උගන්වන්නේ කෙසේ ද?

1. සර්වබලධාරී අල්ලාහ් තම දූතයාණන් වන මුහම්මද් ﷺ තුමාණන්ට ප්‍රේම කරන බවත්, ඔහුව තෝරාගෙන මුළු මිනිස් සංහතිය කෙරෙහි ම වඩා ශ්‍රේෂ්ඨයකු බවට පත් කළ බවත් අපි ළමයාට ස්ථිර වශයෙන් කියා දිය යුතුයි. එමෙන්ම එතුමාට ප්‍රේම කිරීම අපට ද අල්ලාහ් අනිවාර්ය කර ඇත. නබිතුමාණන්ට ප්‍රේම කිරීම යනු සර්වබලධාරී අල්ලාහ්ට ප්‍රේම කිරීමේ සලකුණක් බව අපි දරුවාට ඉගැන්විය යුතුය. කවරෙකු නබිතුමාට ප්‍රේම කරන්නේ ද ඔහු අල්ලාහ්ට සැබවින්ම ප්‍රේම කරයි.

2. නබි ﷺ තුමාණන් මෙම ආගම වෙත මග පෙන්වීමෙන් හා ඒ පිළිබඳ නිවේදනය කිරීමෙන් සියලු ලෝකයන් කෙරෙහි දයාවක් වන බවත්, නැවත නැගිටුවීමේ දිනයෙහි සැබෑ දේව විශ්වාසවන්තයන් වෙනුවෙන් මැදිහත් වීමෙන් ඔවුන්ට ද දයාවක් වන බවත් මතක් කර දීම.

3. නබිතුමාගේ උතුම් චරිතාපදානයෙන් ඇතැම් පාඩම් ඔහුට කියවා පෙන්වීම. සියලුම මනුෂ්‍ය වර්ගයා කෙරෙහි නබි ﷺ තුමාණන් උතුම් ආදර්ශයක් සහ උදාහරණයක් බව දරුවාට ඉගැන්විය යුතුය. විශේෂයෙන් එතුමාගේ ප්‍රාතිහාර්යයන්,ශ්‍රේෂ්ට සදාචාරය, අසරණයින් කෙරෙහි ඔහු දැක්වූ සහයෝගය, දුප්පතුන් කෙරෙහි ඔහු දැක්වූ අනුකම්පාව, අනාථ දරුවන් කෙරෙහි ඔහු දැක්වූ සැලකිල්ල සහ දුර්වලයන් කෙරෙහි ඔහු දැක්වූ කරුණාව ගැන සඳහන් කළ යුතුය. දරුවාගේ වර්ධන මට්ටමට සමබරව අපගේ භාෂා ශෛලිය විය යුතු අතර ඔහුගේ බුද්ධි මට්ටමට ගැළපෙන දේවල් මගින් පමණක් සෑහීමට පත් විය යුතුයි. දරුවාගේ මනස, වයස සහ පසුබිමට සරිලන විවිධ ක්‍රම භාවිතා කිරීමට අප උත්සුක විය යුතු අතර පෞද්ගලික වෙනස්කම් සහ පාරිසරික තත්ත්වයන්හි ස්වභාවය සැලකිල්ලට ගත යුතුය.

4. තම දෙමව්පියන් සහ ඔහු අවට සිටින්නන් නබි ﷺ තුමාණන් හා එතුමාගේ ප්‍රකාශයන් සහ සමස්ත ජීවන මාර්ගය මෙන්ම එතුමා අනුගමනය කිරීමේ ආශාව හා එතුමාගේ නාමය සඳහන් වූ සෑම අවස්ථාවක ම එතුමාට ශාන්තිය හා ආශීර්වාදය ප්‍රකාශ කර සිටීම හරහා උත්කර්ෂයට නංවන ආකාරය දරුවා දැක ගත යුතුයි. දෙමාපියන්ගේ ප්‍රායෝගික හැසිරීම සහ ඔවුන්ගේ ක්‍රමවේදය – උදාහරණයක් ලෙස, පියා යම් අනිවාර්ය හෝ අනිවාර්ය නොවන සලාතයක් ඉටු කරන අවස්ථාවක, ධර්ම දූතයාණන් කළේ මේ අයුරු ය යනුවෙන් පැවසීම – මහත් සේ බලපෑම් ඇති කරන අධ්‍යාපන ක්‍රමවලින් එකකි. ආදර්ශය ලබා දෙමින් හැදියාව දියුණු කිරීම වනාහි නිවැරදි හැදියාව සහ ආධ්‍යාත්මික වර්ධනය දියුණු කිරීම කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. උපදේශකයින් විසින් අනුගමනය කළ යුතු ආදර්ශය ධර්ම දූතයාණන් ය. ඔවුන් එතුමා මග පෙන්වූ මාවතේ ගමන් කළ යුතුය. තවද දරුවන් සමග ප්‍රායෝගිකව හා යථාර්ථවාදීව එතුමාගේ ජීවන මග ඔවුන් ක්‍රියාවට නැංවිය යුතුය.

5. ඉස්ලාමයේ පරිපූර්ණත්වය, නබිතුමාගේ ශ්‍රේෂ්ඨ ගුණාංග සහ එතුමාගේ මිතුරන්ගේ මහිමය පෙන්නුම් කරන නිවරැදි නබි වදන් කිහිපයක් දරුවාට කටපාඩම් කර දිය යුතුයි. නබි වදන් වනාහි දේව විශ්වාසය, හැදියාව සහ ස්වයං වර්ධනය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. දරුවාගේ වයස් කාණ්ඩයට ගැළපෙන වැදගත් සදාචාරයන් කිහිපයක් ඇතුළත් පැහැදිලි අර්ථයන් සහිත කෙටි නබි වදන් උපයෝගී කරමින් තරග ද පැවත්විය හැක. මේ සඳහා නොයෙකුත් තෑගි බෝග ලබා දීම වැනි උනන්දුව ඇති කරවන ක්‍රමයන් භාවිතා කිරීම පිළිබඳ වැඩිහිටියන් සැලකිලිමත් විය යුතුයි.

6. නබිතුමා සමඟ කටයුතු කිරීම සහ එතුමාව මහිමයට පත් කිරීම හා සම්බන්ධ නබි තුමාගේ මිත්‍රවරුන්ගේ කථාන්තර සඳහන් කිරීම. විශේෂයෙන් අනස් رضي الله عنه තුමාගේ කතාව වැනි නබිතුමා අනුගමනය කිරීමේ තීව්‍රතාවය පෙන්නුම් කරන එකල ජීවත් වූ කුඩා දරුවන්ගේ කථා කියා දීම උචිතය. අනස් رضي الله عنه තුමාගේ කතාව මේ අයුරිනි. වරක් ඇඳුම් මසන්නෙකු නබි තුමාණන් ව තමා පිළියෙළ කළ ආහාර වේලකට ආරාධනා කළේය. මා නබි තුමාණන් සමඟ ඒ ආහාර වේලට ගියෙමි. ඔහු බාර්ලි පිටි වලින් සෑදූ රොටි සහ පුහුල් (වර්ගයක්) හා - අච්චේ සහ වාතයේ වියලූ ලුණු මිශ්‍ර - මස් සහිත හොදි නබි තුමා වෙත ලබා දුන්හ. අල්ලාහ්ගේ දූතයාණන් පිඟාන වටේ තිබෙන පුහුල් කැබලි අහුලා ගන්නා අයුරු මා දුටුවෙමි. එතැන් සිට මා එම ආහාරයට ඇලුම් කළෙමි. (බුහාරී හදීස් අංක 5439) නබි තුමාණන් හට තම මිත්‍රයින් ආදරය කළ ආකාරය සහ එතුමා වෙනුවෙන් කැප වූ ආකාරය සහ ඒ ගැන පැවසෙන කතාන්දර පැවසීමට උපදේශකයා සැලකිලිමත් විය යුතුය.

7. නබි ﷺ තුමාණන්ට ප්‍රේම කිරීමෙන් ඇති වන බලපෑම ඔහුට ඉගැන්වීම. ඒ සඳහා උදාහරණයක් පහත සඳහන් වේ. මිනිසෙකු නබිතුමාගෙන් නැවත නැගිටුවීමේ දිනය ගැන "එය කවදාද" යනුවෙන් විමසුවේ ය. නබි ﷺ තුමාණෝ "ඔබ ඒ සඳහා කුමක් සූදානම් කර ඇත්ද" යනුවෙන් ඇසුවේය. මා අල්ලාහ්ට හා ඔහුගේ දූතයාට ආදරය කරමි. එය මිස අන් කිසිවක් සූදානම් කර නැත යනුවෙන් ඔහු ප්‍රකාශ කළ හ. එවිට නබි ﷺ තුමාණෝ "ඔබ ආදරය කරන අය සමඟ සිටිනු ඇත" යනුවෙන් පැවසූ හ. අනස් رضي الله عنه තුමා මෙසේ පවසයි: නබි ﷺ තුමාණන් "ඔබ ආදරය කරන අය සමඟ ඔබ සිටිනු ඇත" යනුවෙන් පැවසීම අසා සතුටු වූ අයුරින් අපි කිසි විටෙකත් සතුටු නොවෙමු. එබැවින් මා නබිතුමාට ද අබූබක්ර් සහ උමර් رضي الله عنهما වැනි අයට ද ආදරය කරමි. මාගේ ක්‍රියාවන් ඔවුන්ගේ ක්‍රියාවන්ට සමාන නොවුණ ද මා ඔවුන් කෙරෙහි දක්වන ආදරය නිසා මා ඔවුන් සමඟ සිටිනු ඇතැයි බලාපොරොත්තු වෙමි. (බුහාරී හදීස් අංක 3688)

8. නබි තුමා කෙරෙහි ආදරය පිළිබඳ කවි, කතන්දර, දේශනා සහ ලිපි වැනි නිර්මාණාත්මක ක්‍රියාකරකම් එළි දැක්වීමට උදව් කිරීම. "නබිතුමා කෙරෙහි ආදරය" යන මාතෘකාව යටතේ තරඟ පවත්වා ඔවුන්ව දිරිමත් කිරීම.




# පස්වන කුළුණ

## අවසන් දින පිළිබඳ විශ්වාසය



අවසන් දින පිළිබඳ විශ්වාසය තුළ මරණය, නැවත නැඟිටුවීම, විනිශ්චය, විපාකය, සිරාත් පාලම, තුලාව, ස්වර්ගය සහ නිරය පිළිබඳ විශ්වාසය ද ඇතුළත් වේ. දැනුවත් වීමේ වයසට පසු, දරුවා අවසන් දිනය පිළිබඳ සංකල්ප කිහිපයක් පැහැදිලිව වටහා ගැනීමට පටන් ගනී. කෙසේ වෙතත්, ඒ වයසට පෙර, ඒ සංකල්ප කෙටියෙන් හා සංක්ෂිප්තව විග්‍රහ කර දීම වඩා හොඳය. මරණින් මතුව තව ජීවිතයක් ඇති බවත් විශ්වාසවන්තයින් සඳහා ස්වර්ගය ද, අවිශ්වාසවන්තයින් සඳහා නිරය ද අල්ලාහ් නිර්මාණය කළ බව අපි දරුවාට පැහැදිලි කළ යුතුය.

**අවසන් දිනය පිළිබඳ දරුවාගේ ආත්මය තුළ ස්ථාපිත කළ යුතු වැදගත් අධ්‍යාපනික අන්තර්ගතයන් පහත සඳහන් වේ.**



1. මිනිසුන් ලෞකික ජීවිතයේ සිදු කළ ක්‍රියාවන් සඳහා යහපතට යහපත සහ අයහපතට අයහපත යන අයුරින් විපාක ලබා දීමට අවසන් දිනයේ නැවත නැගිටුවනු ලැබෙන බව දරුවා දැන සිටිය යුතුයි.

2. අල්ලාහ් ස්වර්ගය ආශීර්වාද හා සතුටු පිරි සදාකාලික ගෘහයක් බවට පත් කර ඇති බව දරුවා දැන සිටිය යුතුයි. අල්ලාහ් එය නිර්මාණය කළේ තම විශ්වාසවන්ත ගැත්තන්ට ප්‍රතිඵල දීම සඳහා ය. එමෙන් ම අවිශ්වාසවන්තයින්ට සූදානම් කර ඇති නිරය ද අල්ලාහ් නිර්මාණය කළේය. මේ පිළිබඳ දැනුවත් කළ යුත්තේ ස්වර්ගයේ ආශීර්වාද සහ විශ්වාසවන්ත ගැත්තන් සඳහා එහි අල්ලාහ් සූදානම් කර ඇති දේ කෙරෙහි දරුවා දිරිගැන්වීම මගිනි.

3. අල්ලාහ්ගේ දයාව සහ සමාව සහ ඔහුගේ ගැත්තන් කෙරෙහි ඔහු දක්වන කරුණාව දන්වන සියුම් ක්‍රම උපයෝගී කරමින් මරණය හා මතුලොව ගැන දරුවා සමඟ කතා කිරීම. එමගින් අනවශ්‍ය සිතුවිලි ඔවුන් තුළ ඩැහැ ගන්නේ නැත. එකම අදියරයන් හරහා ගමන් කරන සියලුම ජීවීන් සමඟ මෙම මරණය සම්බන්ධ කර ඔහුට විග්‍රහ කළ හැකිය. එහෙත් "වන්දනාවන් හා වෙනක් වගකීම්" පැවරීමෙන් මිනිසා සුවිශේෂී වූ අතර අල්ලාහ් ඔහු වෙනුවෙන් සෑම නිර්මාණයක් ම වසඟ කර දී, විපාකය ද ලබා දෙන බව ඔහුට පොරොන්දු විය.

4. *අල්ලාහ් අයුක්තිය පිළිනොගන්නා බවත්, අයුක්තිය සිදු කරන්නාට දඬුවම් නොකර අත්නොහරින බවත් ල අයුක්තියට ලක් වූ තැනැත්තාට යුක්තිය ද යහපත් තැනැත්තාට වේතනය ද ලබා නොදී නොසිටින බවත් විග්‍රහ කර දීම. ඇතැමුන් අසාධාරණකම් කරමින් ජීවත් වන අතර එලෙස ම ඔවුන් මිය යති. එසේ නම්, අප දැන් ජීවත්වන ජීවිතය හැර යහපත් තැනැත්තාට වේතනය දෙන,අයහපත් තැනැත්තාට දඬුවම් කරන, සෑම කෙනෙකුට ම ලැබිය යුතු උරුමයන් ලැබෙන වෙනත් ජීවිතයක් තිබිය යුතු බව අප දරුවාට විග්‍රහ කළ යුතුයි.*



# හය වැනි කුළුණ

## පෙර නියමය කෙරෙහි විශ්වාසය



පෙර නියමය කෙරෙහි විශ්වාසයට අල්ලාහ්ගේ දැනුම, නියෝගය, හැකියාව, මැවීම සහ අභිමතය යන විෂයන් හි පරිපූර්ණත්වය පිළිබඳ විශ්වාසය ද ඇතුළත් වේ. ළමා වියේ මුල් අවධියේදී, දරුවාට පෙර නියමය හා බැඳුණු සංකල්ප තේරුම් ගත නොහැකි අතර දළ වශයෙන් වයස අවුරුදු නවයට පෙර ඔහුට මෙම සංකල්පයෙහි තේරුම වටහා ගත නොහැකි බව සමහර (විද්වතුන්) අදහස් කරති. කෙසේ වෙතත්, දරුවාගේ ආත්මය තුළ පෙර නියමය පිළිබඳ ස්ථාපිත කළ යුතු වැදගත් අධ්‍යාපනික අන්තර්ගතයන් පහත සඳහන් වේ.

1. මෙම කුළුණ පදනම් වී ඇත්තේ අබ්දුල්ලා ඉබ්න් අබ්බාස් رضي الله عنهما විසින් විස්තර කරන ලද නබි වදන මතය. එතුමා මෙසේ වාර්තා කරයි: වරක් මා නබි ﷺ තුමාණන් පසුපස සිටියෙමි. එවිට එතුමාණන්: දරුවා! අල්ලාහ් ගැන සිහියෙන් සිටින්න, එවිට ඔහු ඔබව ආරක්ෂා කරනු ඇත. අල්ලාහ් ගැන සිහියෙන් සිටින්න. එවිට ඔබ ඔහුව ඔබ ඉදිරියෙහි සොයා ගනු ඇත. ඔබ විමසන විට අල්ලාහ්ගෙන් විමසන්න. ඔබ උපකාරය පතන විට අල්ලාහ්ගෙන් ම උපකාරය පතන්න. ඔබට යම් ප්‍රයෝජනයක් ලබා දීම සඳහා මිනිසුන් එක්රැස් වුවහොත්, අල්ලාහ් ඔබ වෙනුවෙන් දැනටමත් නියම කර ඇති දේ හැර අන් කිසිවක් ඔවුන් ඔබට ප්‍රතිලාභ වශයෙන් ලබා නොදෙන බව දැන ගන්න. ඔබට කිසියම් දෙයකින් හානියක් කිරීමට ඔවුන් එක්රැස් වන්නේ නම්, අල්ලාහ් ඔබට විරුද්ධව දැනටමත් නියම කර තිබූ දේ හැර අන් කිසි හානියක් ඔවුන් ඔබට නොකරනු ඇත. පෑන් ඉහළට එසවී පිටු වියළී හමාරය. (තිර්මිදි හදීස් අංක 2516, ඉමාම් අල්බානී තුමා මෙම නබි වදන නිවරැදි බව සනාථ කර ඇත.) තවත් වාර්තාවක: ඔබ අල්ලාහ් ගැන සිහියෙන් සිටින්න. එවිට ඔබ ඔහුව ඔබ ඉදිරියෙහි සොයා ගනු ඇත. පහසු සහ සමෘද්ධිමත් අවස්ථාවලදී අල්ලාහ්ව හඳුනාගෙන පිළිගන්න. විපත්තියේදී ඔහු ඔබව සිහිපත් කරනු ඇත. තවද ඔබට මග හැරුණු දේ ඔබට සිදු නොවනු ඇත. ඔබට සිදු වී ඇති දෙය ඔබට මග හැරෙන්නේ නැත. නියත වශයෙන් ම ජයග්‍රහණය ලැබෙන්නේ ඉවසීමෙන් බව දැන ගන්න. නියත වශයෙන් ම සහනය පීඩාව සමඟ ය. නියත වශයෙන් ම දුෂ්කරතා සමඟ සැහැල්ලුව ද ඇත. (අහ්මද් හදීස් අංක 2803)

   මෙම නබි වදන දරුවන්ගේ හැදියාව දියුණු කිරීම ක්ෂේත්‍රයේ උල්පතක් ලෙස සලකනු ලැබේ. එමෙන්ම, නිවරැදි විශ්වාසය සමඟ දරුවන් ඇති දැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා උතුම් නබි ﷺ තුමාණන් තම සමාජය වෙත කළ විශාල උපදෙස් මෙහි අඩංගු වේ.

2. ළමා වියේ මුල් අවධියේ දී දරුවා සමඟ පෙර නියමය හා බැඳුණු කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමෙන් වැළකී සිටීම අත්‍යවශ්‍ය වේ. පෙර නියමය පිළිබඳ එම වියේ පසුවන දරුවාට දැනුවත් කළ හැකි කරුණු නම්: කලින් නියම කර ඇති දේ පිළිබඳ වූ දෙවියන්ගේ දැනුමෙහි විශාලත්වය, ඔහුගේ හැකියාව, දැනුවත්භාවය, නිර්මාණය සහ - යමක් සිදු කිරීමට ඇති මිනිසාගේ - නිදහසත් සමඟ බැඳුණු අල්ලාහ්ගේ අභිමතය, මිනිසා ඔහුගේ ස්ව කැමත්තෙන් කළ ක්‍රියාවන් සඳහා පූර්ණ වගකීම භාර

ගැනීම සහ ඒ ක්‍රියාවන් අනුව වේතනය හෝ දඬුවම් ලැබීමට සුදුස්සෙකු වීම යනාදී කරුණු සංෂිප්තව පැහැදිලි කිරීම ය. එහෙත්, මෙම සංකීර්ණ කරුණු දරුවාගේ මනස අවහිර කරන්නේ නම්, උපදේශකයා එය සරලව, ඔහුගේ මනසට තේරුම් ගත හැකි ආකාරයකින් විග්‍රහ කළ යුතුයි.

3. අයැදීම යොමු කළ යුත්තේ අල්ලාහ්ට පමණක් වන නිසා අන් අයගෙන් නොව ඔහුගෙන් පමණක් අයැද සිටීම, ඔහුගෙන් පමණක් උපකාර පැතීම යනාදී කරුණු දරුවාට පුරුදු පුහුණු කිරීම. ඔහු රැඳිය යුත්තේ අල්ලාහ් මත බවත්, ඔහු කෙරෙහි විශ්වාසය තැබිය යුතු බවත්, දෙවියන්ගේ ආඥාව කෙරෙහි ඉවසිලිවන්ත විය යුතු බවත් දැනුවත් කිරීම.

4. දෙවිඳුන් තමාට යහපත් දේ හැර අන් කිසිවක් නියම නොකරන බව දරුවාට ඉගැන්වීම. ඔහු මේ ජීවිතයේ දෙවියන්ගේ පෙර නියමය සමඟ බැඳී සිටී. එමනිසා, ඔහු මානසික අවපීඩනයට හෝ දුර්වලතාවයට පත් නොවිය යුතු අතර අල්ලාහ්ගේ පෙර නියමය පිළිබඳව සතුටු වූ ආත්මයකින් දුෂ්කරතාවන්ට මුහුණ දිය යුතුය. - ශුද්ධ වූ අල්කුර්ආනයේ (9:51) හි සඳහන් වන - "අල්ලාහ් අපට නියම කළ දේ මිස අන් කිසිවක් අපට සිදු නොවෙයි " යනුවෙන් ඔහු තරයේ විශ්වාස කළ යුතුයි.

5. සිදු වන සෑම දෙයක ම නියාමනයන් දෙවිඳුන් සන්තකයෙහි ය. ඔහු අභිමත කරන දෑ හා තෝරා ගත් දෑ ඔහු සිදු කරනු ඇත. මන්ද ඔහුගේ නිර්මාණයන්හි නිරපේක්ෂ පාලනයක් ඔහුට ඇත. මේ අයුරින් දැන ගැනීම මඟින් දරුවා ඔහුගේ මැවුම්කරු සමඟ ඇති සම්බන්ධය වර්ධනය කර ගනී. ඉනික්බිතිව අපේක්ෂාවන් සහ ප්‍රාර්ථනාවන් ඔහු වෙතට යොමු කරයි.



6. මෙම කුළුණ කෙරෙහි ඇති විශ්වාසය දරුවාගේ ආත්මය තුළ සමබරතාවය සහ මානසික සහනය තහවුරු කරයි. තමා වටා සිදුවන යහපත් හෝ අයහපත් සෑම දෙයක්ම තමාට යහපත් බවත්, නිරපේක්ෂ නපුරක් නොපවතින බවත් විශ්වාසවන්තයා හඳුනාගත් කල එමගින් ඔහුට සහනයක් සහ මානසිකව ස්ථාවරභාවයක් ලැබේ. මෙය ඔහුට ඇති වන ගැටලු සහ දුක්කරදර ඉදිරයේ අල්ලාහ්ගේ ඉරණම පිළිගැනීමේ හැදවතක් ඇති කර ගැනීමට ඉවහල් වේ. අල්ලාහ්ගේ අභිමතයට විරුද්ධ නොවී තමාගේ කරුණු අල්ලාහ් වෙත බාර කර, සැනසිලිදායක හදවතකින් හා සන්සුන් මනසකින් ජීවත්වීමටත් හේතු වේ. අල්ලාහ්ගේ පෙර නියමයන් විශ්වාස කරන්නන් විපත් හා ව්‍යසනයන්ගෙන් කිසි විටෙකත් බියට හෝ කලකිරීමට හෝ කෝපයට හෝ පත් වන්නේ නැත. ඔහු අල්ලාහ්ගෙන් විපාක ලැබෙනු ඇතැයි බලාපොරොත්තුවෙන් ඔහුගේ පෙර නියමයට යටත් වන අතර ඔහුගේ පහත සඳහන් ප්‍රකාශය කම්පනය සිදු වූ සැනින් තමාටම මතක් කර දෙයි ෑ තරමක බියෙන් ද සාගින්නෙන් ද දේපළ, ජීවිත හා බෝග හානි කිරීමෙන් ද නුඹලා පරීක්ෂා කරන්නෙමු. ඉවසූ අයට සුබාරංචි කියන්න. තමන්ට කිසියම් විපතක් සිදු වූ විට "අපි අල්ලාහ්ට හිමි අය වෙමු. අපි ඔහු වෙත ම ආපසු යන්නෝ වෙමු"යි ඔවුහු පවසති. ඔවුන්ට තම දෙවියන්ගේ දයාව හා කරුණාව ඇත. යහ මග ලද්දෝ ද ඔවුහු ම ය. (01:155-157)

7. දෙවිඳුන් විසින් නියම කරන ලද පෙර නියමය හේතුවෙන් පීඩාවට පත් වූ පසුව එම පෙර නියමයෙහි යහපත් කම ඔවුන් දැනුවත් වී ඔවුන්ගේ ජීවිත යහපත් අතට හැරුණු අයගේ සමහර කතාන්දර හා ඉතිහාස දරුවාට කියා දීමෙන් අපට ප්‍රයෝජන ගත හැකිය.

8. පෙර නියමය පිළිබඳ විශ්වාසය සාරාංශගත වී ඇත්තේ සෑම දෙයක් කෙරෙහි අල්ලාහ්ගේ විස්තරාත්මක හා සම්පූර්ණ දැනුම වටාත්, නැවත නැගිටුවීමේ දිනය දක්වා සෑම ජීවියෙකු වෙනුවෙන් ඔහු විසින් කලින් නියම කර ඇති දේ සංරක්ෂිත ඵලකයෙහි ලියා තිබීම වටාත්, සියලු ජීවීන් සහ වස්තූන් ඔහුගේ අභිමතය යටතේ සහ මැවීම් යටතේ තිබීම වටාත් ය.






# ගැටළු විවරණයට

# පිවිසුම



මනසෙහි විශාල සංකල්ප හා තොරතුරු ස්ථාපනය වීම වස් ප්‍රශ්න කිරීමේ ඇල්ම දරුවා තුළ මැවුම්කරු වූ අල්ලාහ් අන්තර්ගත කර ඇත. ළමා අවධිය ප්‍රශ්න කිරීමේ අවධිය ලෙස සැලකේ. මන්ද එම අවධියේ දරුවාගේ කතා බොහෝමයක් ප්‍රශ්න කිරීමේ ආකාරයෙන් පවතින බැවිනි. තවද අවට පරිසරයේ තිබෙන කරුණු ගැන තමන් කිසිවක් නොදන්නා බව දරුවන්ට හැගෙන අතර නොදැනුවත්කම බිය ජනනය කරන හෙයින්, ඔවුන් තුළ ඇති සියලු ශක්තීන් හරහා ඉගෙන ගැනීමට ඉක්මන් වෙති. අවුරුදු තුනක ළමයෙක් ඔහුගේ දෙමව්පියන්ගෙන් සහ සහෝදර සහෝදරියන්ගෙන් ප්‍රශ්න දහසක් අසන බව අප දකින්නෙමු. එයට දෙමව්පියන් ලබා දෙන පිළිතුරු ඔහු තුළ බලපෑමක් ඇති කරන අතර ඒවා අදියරයෙන් අදියර ඔහුව මාරු කරන බවටත් කිසිදු සැකයක් නැත. ප්‍රශ්න කිරීමේ දී එහි ආකාරයන් හා මාතෘකාවන් වෙනස් වීම එයට කදිම සාක්ෂියකි. කුමක්ද? එය කොහේද? එය සිදු වූයේ කෙසේද? එය පැමිණියේ කොහෙන්ද? එය කුමක්ද? ඔබ දන්නවාද? වැනි ප්‍රශ්න ඔබ නිතරම ඔහුගෙන් සවන් දෙන ඒවාය. එසේ විමසීමට හේතුව නම්, ඔහුගේ අවධානය අවදි කරවන සියලු දේ දැන ගැනීමට සහ ඔහුට පෙනෙන සහ ඇසෙන දේවල් තේරුම් ගැනීමට ඔහුට අවශ්‍ය බැවිනි. ඇතැම් විට එකී ප්‍රශ්නය සඳහා වූ එම පිළිතුර ඔහු විසින් තේරුම් ගත හැකි වන අතර එසේ නොවිය ද හැක. ඇතැම් විට ඔහු පිළිතුර වෙත ඇහුම්කන් දිය හැකි අතර ඇතැම් විට එයට ඇහුම්කන් නොදී සිටිය ද හැක.

දරුවන් ස්වභාවයෙන්ම කුතුහලයෙන් පිරි ජීව කොට්ඨාශයකි. ඇතැම් විට දරුවකු ජීවත් වන පරිසරය සහ පවතින අවස්ථාවන් අනුව එම කුතුහලය තුළ අධික වර්ධනයක් සිදු විය හැක. අපට කුඩා කාලයේ තිබූ ප්‍රශ්න සහ වර්තමානයේ කුඩා ළමුන් සතුව තිබෙන ප්‍රශ්න අතර සංසදනය කිරීමේදී අප විස්මයට පත් වන්නේ කාලය, ස්ථානය සහ විද්‍යාවේ අභිවෘධියේ වෙනස නිසාය. උපදේශකයින් විසින් භාවිතා කරනු ලබන අධ්‍යාපන ක්‍රමය දරුවන් අසන ප්‍රශ්නවල ස්වභාවය කෙරෙහි පැහැදිලිවම යම් බලපෑමක් හෝ යම් අඩුවක් ඇති කරන බවට කිසිදු සැකයක් නැත. දරුවන් ඉල්ලන දේ සතුටින් පිළිගෙන එයට අවස්ථාව ලබා දෙන උපදේශකයා ඒ දරුවන්ගේ සිත් තුළ ගැඹුරින් මුල්බැස ගනී. ඊට පටැනිව, ප්‍රශ්න ඉදිරිපත් කළ නොහැකි, ඒවා ප්‍රතික්ෂේප කරන සහ කෑගසමින් දරුවන්ට විරුද්ධ වන අයගෙන් කිසිවක් ගැන විමසීමට දරුවන් නොව වැඩිහිටයන් පවා ඉදිරිපත් නොවනු ඇත. දරුවෙකු අනවශ්‍ය සෑම දෙයක් ගැන ම දැන ගැනීම අයහපත් හා පිළිගත නොහැකි තත්ත්වයකි යන විෂයයහි අපි එකඟ වෙමු. එහෙත්, දරුවන් ඔවුන්ගේ ජීවිතයට යම් අයුරින් බලපාන දේවල් පිළිබඳ විමසීමට බිය හැඟීමෙන් පසු නොවීම ඉතා වැදගත් ය. ඔවුන් භංග වූ අවිශ්වාසදායී අයවලුන් යන හැඟීම ඔවුන් තුළ නොහැඟීම ඉතා වැදගත් ය. එයටත් වඩා ඉතා වැදගත්ම දෙය නම්, සිය දෙමාපියන් හා ඥාතීන් සමඟ කතා කරන අවස්ථාවේ දී ඔවුන් තුළ සැහැල්ලුවක් සහ පහසුවක් දැනිය යුතුය.

# ළමුන් තුළ ප්‍රශ්න කිරීමේ ස්වභාවය බහුල වීමට හේතු



දරුවාට ප්‍රශ්න රාශියක් ඇසීමට තුඩු දෙන අති වැදගත් හේතු පහත සඳහන් කරුණු වටා ඒකරාශී වනු ඇත.

1. දරුවාගේ මානසික හා බුද්ධි වර්ධනයේ අවශ්‍යතා සපුරාලීමේ මෙවලමක් ලෙස ගවේෂණය කිරීමට සහ සොයා ගැනීමට ඇති දරුවාගේ ආශාව.

2. තමන් වටා ඇති භෞතික දේවල් අවබෝධ කිරීමට ඇති දරුවන්ගේ අවශ්‍යතාව.


3. පෙර අත්දැකීම් නොමැතිකම නිසා දරුවන් යම් දේවල් කෙරෙහි දක්වන සැලකිල්ල සහ බිය. උදාහරණයක් ලෙස, සතුන් දරුවන්ට පහර නොදුන්න ද දරුවන් බියට පත් වේ. ආරක්ෂිත බවක් දැනීම සඳහා ඔවුන් ප්‍රශ්න රාශියක් අසන්නේ එබැවිනි.

4. දරුවන්ගේ භාෂාමය හැකියාවේ වර්ධනය. වරින් වර බොහෝ ප්‍රශ්න අසන විට එය සිදු වේ. මේ අයුරින් ඔහු ප්‍රශ්න කරන්නේ භාෂාව අත්හදා බැලීමේ සිය ආශාවට අනුව ප්‍රශ්නයට පිළිතුර සෙවීමේ ආශාව නිසා හෝ ඔහුගේ හැකියාවන් පෙන්වීමට අවශ්‍ය නිසා හෝ සමාජ සහභාගීත්වයේ අවශ්‍යතාව නිසාවත් නොවේ.

5. එය දෙමාපියන් සහ දරුවන් අතර සන්නිවේදනය හා චිත්තවේගීය බෙදාහදා ගැනීමේ අවස්ථාවකි.

6. තමා සහ තමාගේ දෙමව්පියන් කෙරෙහි ඇති දරුවාගේ විශ්වාසය වර්ධනය වීම සහ සිය ආත්ම අභිමානය වර්ධනය වීම.

# දරුවන්ගේ ප්‍රශ්න වල ස්වභාවය



දරුවාගේ ප්‍රශ්න තේරුම් ගැනීමට නම්, අපි බුද්ධිමය හා භාෂාමය ප්‍රශ්න සහ මනෝවිද්‍යාත්මක ප්‍රශ්න අතර වෙනස හඳුනාගත යුතුය. පළමු වර්ගයේ දී, දරුවා යමක් ගැන දැන ගැනීමට හෝ යමක් ගැන පැවසීමට උත්සාහ කරයි. එහෙත්, දෙවැන්නෙහි, එහි අභිප්‍රාය වන්නේ මානසික සහනයයි. මෙහි හුදෙක් පිළිතුර ම ඉලක්කය නොවේ. මෙහි දී මූලික කාරණාවක් අනිවාර්ය ලෙස අවධාරණය කිරීම අවශ්‍ය වේ. ප්‍රශ්න සඳහා තීරණාත්මක අවස්ථානුකූල සාධක හා ඇඟවීම් ඇත. දරුවා තුළ ප්‍රශ්න ඇසීමට පෙළඹ වූ නිශ්චිත තත්ත්වය හා අවස්ථාව හැරුණු විට අපට ප්‍රශ්නයේ වටිනාකම තීරණය කිරීමට හෝ එය තේරුම් ගැනීමට හෝ එහි අර්ථය අර්ථ දැක්වීමට හෝ නොහැකිය. නිශ්චිත ප්‍රශ්නයකට කිසිදු වටිනාකමක් නැති නමුත් එය එහි වටිනාකම, ඇඟවීම සහ වැදගත්කම උකහා ගන්නේ අවට තත්ත්වයන් හා අවස්ථාවන් අනුව ය. දරුවන් විසින් අසන ප්‍රශ්නවල මුඛ්‍ය කාර්යයන් තුනක් ඇත.

1. දරුවා තුළ මානසික සමතුලිතතාවය ඇති කිරීම. දරුවාගේ බොහෝ ප්‍රශ්න පදනම් වී ඇත්තේ මානසික ආනුභාවය මත ය.

2. නිගමනාත්මක චින්තනය හරහා ඔහු ගොඩනගන හෝ සම්බන්ධ කරන තොරතුරු මත පදනම්ව නව දැනුමක් ලබා ගැනීමට උත්සාහ කරයි.

3. දරුවා ජීවත්වන සංස්කෘතික හා සමාජ රාමුව තුළ තිබෙන සදාචාරාත්මක හා චර්යාත්මක සාරධර්ම ඇතුළු අවට පරිසරය සහ වැදගත් ජීවන කරුණු දැන හඳුනා ගැනීම.

# දරුවන් තුළ ඇති ප්‍රශ්න වර්ග





*දරුවන් අසන ප්‍රශ්න වර්ගීකරණය කිරීම වැදගත් වන්නේ මෙම ප්‍රශ්නවලට පිළිතුරු එම වර්ගීකරණය අනුව වෙනස් වන බැවිනි. එහෙයින් ප්‍රශ්න පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.*

1. **භාෂාමය ප්‍රශ්න:** *උදා: සියලු දේවල් (එයට තිබෙන නාමයන් සමග) නම් කෙරෙන්නේ කුමක් නිසා ද? නාමයන් වෙනස් නොවන්නේ කුමක් නිසා ද? අපි නව භාෂාවක් නිර්මාණය නොකරන්නේ කුමක් නිසා ද?*

2. **පැවත්ම හා බැඳි ප්‍රශ්න:** *උදා: අප පැමිණියේ කොහෙන්ද? අපේ පරමාන්තය කොහෙ ද? දරුවන් මෙලොවට පැමිණෙන්නේ කෙසේ ද? මරණයෙන් අදහස් කරන්නේ කුමක්ද? විශ්වය ගැන කුමක් කිව හැකි ද? ආදිය.*

3. **කැරලිකාර ස්වරූපයෙන් යුත් ප්‍රශ්න:** *මේවා කේන්ද්‍රගත වී ඇත්තේ වැඩිහිටියන් කරන දේ කිරීමට දරුවන්ට ඉඩ නොදෙන්නේ ඇයි? යන අදහස වටා ය. මෙවැනි ගැටළු ප්‍රශ්නාකාරයෙන් නොව වැඩිහිටියන් අනුකරණය කිරීමට උත්සාහ කිරීමේ ස්වරූපයෙන් පැමිණේ.*

4. **පරීක්ෂණාත්මක ප්‍රශ්න:** *දරුවන් මෙවැනි ප්‍රශ්න අසන්නේ පවුලේ උදවිය සතු හැකියාවන් පරීක්ෂා කිරීමට සහ පවුලේ උදවිය තුළ දුර්වලකමක් ලෙස ඔවුන් දකින දේ විවේචනය කිරීමට ය. සාමාන්‍යයෙන් මෙවැනි ප්‍රශ්න සිය මිතුරු අනෙකුත් දරුවන්ගේ පවුලේ උදවිය සමග සැසඳීම හේතුවෙන් ඇති වන අතර ඔවුන් සාමාන්‍යයෙන් අවධානය යොමු කරනුයේ පවුලෙහි මූල්‍ය හා ශාරීරික හැකියාවන් වෙත ය.*

**5.** **කාංසාව නම් අහේතුක භීතියෙන් ජනනය වන ප්‍රශ්න:** දරුවන් ඔවුන් තුළ වර්ධනය වන කාංසාව ඉවතලීම සඳහා නිතර ප්‍රශ්න අසයි. දෙමව්පියන්ගෙන් කෙනෙකු නොමැති වීම හේතුවෙන් හෝ යම් අයුරින් දරුවා අතහැර යාමක් සිදු වීම හේතුවෙන් හෝ දරුවා තුළ ඇති වන හැඟීම අහේතුක භීතියෙන් ප්‍රශ්න ඇසීමට තුඩු දේ.

**6.** **ශරීරය ගවේෂණය කිරීම හා සම්බන්ධ ප්‍රශ්න:** මෙම ලැයිස්තුවේ ඉහළින් ම තිබෙන ප්‍රශ්නය නම් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය අතර භෞතික වෙනස්කම් පිළිබඳ ප්‍රශ්නයයි.

මෙම වර්ගීකරණය මඟින් තම දරුවන් විසින් අසනු ලබන ප්‍රශ්නයේ පසුබිම දෙමාපියන් හට තේරුම් ගත හැකිය. දරුවන් ප්‍රශ්නයක් අසන්නේ හුදෙක් ප්‍රශ්න ඇසීමේ අරමුණින් පමණක් නොව එමඟින් යම් දෙයක් තේරුම් ගැනීමේ චේතනාවෙනි.

## දෙමව්පියන් දරුවන්ගේ ප්‍රශ්න නොසලකා හරින්නේ ඇයි?

දරුවන් විසින් විමසනු ලබන ප්‍රශ්න දෙමව්පියන් විසින් නොසලකා හැරීම ල ඔවුනට දොස් නැගීම ල ඇතැම් විට පිළිතුර සහ එහි වැදගත්කම හෝ එහි මානසික හා අධ්‍යාපනික කාර්යභාරය නොදැන සිටීම පමණක් නොව ල වෙනත් හේතු නිසා විය හැකිය. ඒවායින් වඩාත් ම වැදගත් හේතුව වන්නේ:

**1.** දරුවාගේ ප්‍රශ්නය අනවශ්‍ය හා විකාර යැයි වැඩිහිටියන් සිතීම. ඒ හේතුවෙන් ඔවුන් ඒ ගැන වැඩි සැලකිල්ලක් නොදක්වයි. වැඩිහිටියන් දරුවන්ගේ අයිතිවාසිකම් අභිබවා යාමේ උගුලට හසු වන්නේ දරුවා සේම සරල හා සාධාරණ ආකාරයෙන් සිතීම හේතුවෙනි. එවැනි අභිබවා යෑම් වැඩිහිටියන් විසින් අනුගමනය කෙරෙන යම් මානසික පාලනයක් දරුවා තුළ ද ඇති කරයි. දරුවා තම සරල, බොළඳ ප්‍රශ්නය දැනුමක් ලබා ගැනීම පිණිස වූ සැබෑ ආශාවකින් හෝ අවට ලෝකය පිළිබඳ සොයා ගැනීමට තිබෙන ආශාවට එම ප්‍රශ්න යොමු කරන බව අමතක කරමින් වැඩිහිටියන් කටයුතු කරති. එපමණක් නොව ඔහුට යම් හෝ අවස්ථාවක අහිමි වූ මානසික සමතුලිතතාවය නැවත ලබා ගැනීම යන ඔහුගේ ප්‍රශ්නයේ ක්ෂණික මානසික අරමුණ ද නොසලකා හරිති.

**2.** දරුවා විසින් විමසන ලද ප්‍රශ්නයේ සංකීර්ණත්වය පිළිබඳ වැඩිහිටියන් දැනුවත් නොවීම. විශේෂයෙන් එම ප්‍රශ්නය නිශ්චිත වයස් සීමාවක් දක්වා සාකච්ඡා කළ නොහැකි යම් සංස්කෘතියක් තුළ සමාජ හෝ සදාචාරාත්මක තහනම් කිරීම්වල අංගයක් සමඟ සම්බන්ධ වේ නම්. ඇතැම් විට දරුවන් අසන ප්‍රශ්නවල ඇති සංකීර්ණත්වය සහ අපහසුතාවය හේතුවෙන් වැඩිහිටියන් ද අපහසුතාවයට පත් වේ. එබැවින් වැඩිහිටියන් එවැනි ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු සැපයීමට පෙර සිට ම සූදානම් ව සිටිය යුතුය.

**3.** ඇතැම් විට දරුවන් අධික ලෙස ප්‍රශ්න ඇසීම සහ එය වරින් වර සිදු කිරීම ද වැඩිහිටියන්ගේ නොසැලකිලිමත්කමට තවත් හේතුවක් වේ. දරුවන්ගේ ප්‍රශ්නවල මානසික වැදගත්කම ඔවුන් වටහා ගන්නේ නම් වෙනස් ආකාරයකින් ඔවුන් ක්‍රියා කරනු ඇත. එනම් නොසැලකිලිමත් නොවී දරුවන් නොකඩවා ප්‍රශ්න ඇසීමට උනන්දු කරවයි. දරුවන් වනාහි ඇසෙන ශබ්දයක් හරහා සිතන්නන් බඳු ය.

4. වැඩිහිටියන් දරුවන් අසන ප්‍රශ්න කෙරෙහි ප්‍රමාණවත් සැලකිල්ලක් සහ අවධානයක් යොමු නොකිරීමට තවත් එක් හේතුවක් නම්, ඇතැම් ප්‍රශ්න ඍජු ආකාරයකින් නොව වක්‍රාකාරයෙන් සැකසී තිබීමයි.

5. දෙමාපියන් පිළිතුරු දීමෙන් වැළකී සිටීමට හේතුවක් විය හැක්කේ දරුවා දැන ගැනීමට අවශ්‍ය දෑ කුමක් ද යන්න පිළිබඳ දෙමාපියන් විසින් හඳුනා නොගැනීමයි. ඔවුන් තම දරුවන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු සෙවිය යුතු අතර ඔවුන්ට අවංකව හා සත්‍යවාදීව ඒවා දන්වා සිටිය යුතු බව එම දෙමව්පියන්ට අපි නිහතමානීව ප්‍රකාශ කර සිටිමු.

6. දරුවන් සතුව සීමිත මානසික හැකියාවන් පවතින හෙයින් සංකීර්ණ හා දීර්ඝ පිළිතුරු අවශ්‍ය වන ප්‍රශ්න මග හැරීම. එම අවස්ථාවේදී, දරුවා එවැනි ප්‍රශ්නයකට එළඹුණේ කෙසේ දැයි දෙමව්පියන් සිතන්නට පටන් ගෙන එයට පිළිතුරු නොදී මග හැර යති.



## දරුවා අසන ප්‍රශ්න සමඟ දෙමාපියන් කටයුතු කළ යුත්තේ කෙසේද?

දෙමව්පියන් සතු යුතුකම නම් දරුවන් අසන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සැපයීම මෙන් ම දේව විශ්වාසය සමඟ සබැඳි ගැටළු සම්බන්ධයෙන් සංවාද හා සාකච්ඡා මාර්ග සලසා දීමයි. ආගම පිළිබඳ වූ ඔවුන්ගේ අදහස් හා ආකල්ප ගැන කතා කිරීමට ඔවුනට උදවු කළ යුතුය. එමඟින් සන්සුන්භාවය සහ තෘප්තිය මෙන් ම - සීමාව ඉක්මවා යෑම හෝ අගතියක් ඇති කිරීම යන තත්ත්වයෙන් තොර ආගමික සමතුලිතතාවය සහතික කරන - ආගම පිළිබඳ වූ සැබෑ අවබෝධය ද ඔවුන්ගේ සිත් තුළ නිපදවයි. දරුවන් ආගම පිළිබඳ අසන ප්‍රශ්න සියල්ල සඳහා නිවැරදි පිළිතුරු දෙමාපියන් දැන ගැනීම අවශ්‍ය නැත. කෙසේ වෙතත්, ඔවුන් අල්ලාහ් කෙරෙහි දැඩි විශ්වාසයක් ඇති ව හැදී වැඩීම සඳහා දේව විශ්වාසයේ කුළුණු හය ඔවුනට විග්‍රහ කළ යුතුය. දෙමව්පියන් තම කුඩා දරුවාගේ ප්‍රශ්න එකළස් කිරීමේ වගකීම තම වැඩිමහල් දරුවෙකුට පැවරුවහොත් එය කෙතරම් අගනේ ද?විශේෂයෙන් ඔහුට සැලකිල්ලක් සහ දිරිගැන්වීමක් ලැබුණේ නම් බොහෝ විට ඔහු එම කාර්යය සුහදව පිළිගනු ඇත. අපි වැඩිමහල් දරුවන්ගේ සිත් තුළ ප්‍රශ්න කිරීමේ වටිනාකම ඇතුළු කරන නිසාත් එම වගකීම පිළිබඳ විමසා ඇගයීමට ලක් වන නිසාත් ඇතැම් විට ඔවුන් එමඟින් විනෝදයක් ලබති. එමෙන් ම අනාගතයේ දී ඔවුන් දෙමව්පියන් වන විට ඔවුන්ගේ දරුවන්ගේ ප්‍රශ්න ගැන සැලකිලිමත් වීම පිළිබඳව උනන්දුව ද ඔවුන්ගේ සිත් තුළ අපි වර්ධනය කරන්නෙමු. තවත් කෝණයකින්, පිළිතුරු සෙවීමට උපකාරී වන ප්‍රශ්න රාශියක් අපට එකතු වේ. එමෙන් ම ඔවුනට පසුව අනාගතයේ දී ඔවුන්ගේ සහෝදර සහෝදරියන් ද එවැනි ප්‍රශ්න ඇසීමේ දී ඒවාට පිළිතුරු සූදානම් කිරීමට ද හැකි වේ. අපි පෙර සූදානමින් තිබූ ප්‍රශ්න අතුරින් යම් ප්‍රශ්නයක් අසා එයට පමා නොවී පිළිතුරු දීමේ දී දරුවා කෙතරම් නම් සතුටු වේ ද? ප්‍රශ්නවලට හොඳ පිළිතුරක් ලබා දීම ගැන සැලකිලිමත් වීම ඔහුට සහ අප සමඟ ඇති ඔහුගේ සම්බන්ධතාවයට - දෙවියන්ගේ අනුමැතියෙන් - විශාල බලපෑමක් ඇති කරනු ඇත. විශේෂයෙන් නාඹර වියේ දී සැක සහිත මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගැනීම වෙනුවට, අනාගතයේ දැනුම විෂයෙහි දෙමව්පියන් දරුවාගේ පළමු සහ විශ්වාසදායක මූලාශ්‍රය බවට මෙය පත් කරනු ඇත.

දෙමව්පියන් අවධානය යොමු කළ යුතු කරුණක් නම්, දරුවන්ගේ ප්‍රශ්න අතුරින් වර්ග දෙකක් අතර තිබෙන වෙනස වේ. **පළමුවැනි ප්‍රශ්න වර්ගයඃ** ළමයා වරින් වර අසන බව අප හඳුනා ගත්, ඔහු තම පවුලේ අධික අයගෙන් ඒ ප්‍රශ්නය අසන,ඒ අනුසාරයෙන් වෙනත් ප්‍රශ්න ද හට ගත හැකි අවශ්‍යයෙන් පිළිතුරු දිය යුතු ම (අත්‍යවශ්‍යක) ප්‍රශ්න. **දෙවැනි ප්‍රශ්න වර්ගයඃ** අහඹු ප්‍රශ්න. මෙහි දී අපි කතාව වෙනත් මාතෘකාවක් වෙත යොමු කළහොත් එම ප්‍රශ්නය ඔහුට අමතක වී යනු ඇත. පළමු ප්‍රශ්න වර්ගය නොසලකා හැරීම නුවණට හුරු නැත. එයට පිළිතුරු දීමට, ඒ ගැන සොයා බැලීමට හෝ එයට පිළිතුරු දිය හැකි පුද්ගලයෙකු සෙවීමට අප අපගේ උපරිමය කළ යුතුය. එය වැදගත් අධ්‍යාපන මානයකි. අහඹු ප්‍රශ්න සම්බන්ධයෙන්, විශේෂයෙන් ඒවා ළමයාට නොතේරෙන දේවල් ගැන නම් ඒවා නොසලකා හැරීම කම් නැත.

## දරුවන් අසන ප්‍රශ්න සමඟ කටයුතු කිරීමේ

# මූලධර්ම



දරුවන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයන අතරතුර දෙමාපියන් සැලකිය යුතු මූලධර්ම සහ සාරධර්ම රාශියක් ඇත.

1. **ගරු කිරීම:** දරුවාගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන දෙමාපියන් ඔහුගේ ගැටළු ඔහු සමඟ බෙදාගන්නා බවත් ඒවා අගය කරන බවත් ගරු කරන බවත් ඔහුට හැඟේ. මෙම සහභාගීත්වය දරුවාට ඔහුගේ මානසික සමබරතාවය සහ සන්සුන් භාවය නැවත ලබා දෙයි. එහි ඵලයක් ලෙස දැඩි ආත්ම විශ්වාසය ද, ප්‍රශ්න ඇසීමේ නිරවද්‍යතාවය ද සාකච්ඡාවක දී තාර්කික පදනමකින් යුතු ක්‍රමානුකූලත්වය ද ඔහු තුළ ඉතා ඉක්මණින් අපට නිරීක්ෂණය කරන්නට පුළුවනි.

2. **විශ්වාසය සහ අවංකභාවය:** දරුවන්ට ඔවුන් දැනුවත් සහ ඔවුනට හුරුපුරුදු භාෂාමය ප්‍රකාශන හරහා ලබා දෙන පිළිතුරු වල නිරවද්‍යතාවය පිළිබඳ දෙමාපියන් විසින් සැලකිලිමත් විය යුතු අතර එහි අන්තර්ගතය හානි නොවන අයුරින් එම තොරතුරු සරල විය යුතුයි. සැබෑ ලෙස පිළිතුරු ලබා දීම වනාහි අවසානයේ දී ස්ථාවරත්වය, විශ්වාසය සහ මානසික ආරක්ෂාව සාක්ෂාත් කර ගැනීමට හැකි වන අයුරින් සැකසී තිබීම අදහස් කෙරේ.

3. **දරුවන්ට සුවිශේෂී වූ චේතනාවන් සමඟ කටයුතු කිරීම:** ඒවා ඔවුන් ජීවත් වන පසුබිමෙන් පැන නගින චේතනාවන් ය. නිදසුනක් වශයෙන්, පවුල තුළ අලුත උපන් බිළිඳකු ඉපදුණු පසු (පෙර ඉපදුණු) දරුවා කනස්සල්ලට හා කලබලයට පත් වේ. ඔහු මෙසේ ඇසිය හැකිය: ළමයින් පැමිණෙන්නේ කොහෙන්ද? මෙහිදී විද්‍යාත්මක පිළිතුරක් ලබා දීමෙන් අපට ඔහුගේ ගැටලුව විසඳිය නොහැක. ඔහුට මෙවැනි ප්‍රශ්න ඇසීමට පාදක වූ සැබෑ චේතනාව සමඟ ගනුදෙනු කිරීම හා ඔහු ගැන විශේෂ සැලකිල්ලක් දැක්වීම ඉතා අවශ්‍යය.

වැඩිහිටියන් කුඩා දරුවනට ලබා දීමට හැකි විශිෂ්ට දේ නම්, කතන්දර, ඉතිහාසය සහ සැබෑ අත්දැකීම් හරහා පමණක් බුද්ධිය ආලෝකමත් කිරීම පමණක් නොව, කල්පනාවෙහි යෙදීම, යෝජනා ඉදිරිපත් කිරීම,පෙනෙන බාහිර කටයුතුවලින් නතර නොවී ඒවායින් ඔබ්බට පැමිණ සිතීමට පොළඹවා ගැනීමට හුරුපුරුදු කිරීම ය. එමෙන් ම ධනාත්මක අන්තර් ක්‍රියාකාරීත්වය, ඵලදායී සාකච්ඡාව, අරමුණු සහිත සංවාදය සහ අදහස් හුවමාරු කර ගැනීම ද අත්‍යවශ්‍ය වේ. එසේම, ඔවුන් දරුවන් තුළ සිතීමට පොළඹවන ප්‍රශ්න ද ඇසිය යුතුය.

අපට ප්‍රශ්නයක් සඳහා පිළිතුරු සැපයීමේ කාර්යය විශාල ලෙස භාවිතා කළ හැකිය. නිදසුනක් ලෙස පවුලේ රැස්වීමක දී දරුවාගෙන් යම් ප්‍රශ්නයක් අසන ලෙස දෙමව්පියන් යෝජනා කළ යුතුයි. පසුව ප්‍රශ්නය සාමාන්‍ය දෙයක් නම් සහ ගැඹුරු බවක් හෝ සංවේදීතාවයක් නොමැති නම් සෑම කෙනෙකුට ම

පිළිතුරු සැපයීමට එක්වීමට අවකාශය ලබා දිය යුතුයි. කෙසේ වෙතත්, කුඩා දරුවා අසන නොවැදගත් ප්‍රශ්නය නිසා ඔහු වැඩිමහල් සහෝදරයෙකුගෙන් සමච්චලයට ලක් නොවීම වැදගත් ය. එවැනි දෙයක් සිදු වුවා නම්, පියා දරුවාගේ පැත්තේ සිටගෙන, ඔහුගේ ධෛර්යයට ප්‍රශංසා කළ යුතු අතර දෙවිඳුන් පැවසූ දේ සඳහන් කිරීමෙන් අප සියල්ලගේ ප්‍රශ්න ඇසීමේ අවශ්‍යතාව පැහැදිලි කළ යුතුයි. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයිඃ "දැනුමෙන් නුඹලා වෙත පිරිනමනු ලැබ ඇත්තේ ස්වල්පයක් මිස නැත" (17:85) කණ්ඩායම් වශයෙන් පිළිතුරු දීමේ අවස්ථාවක දී, අපි දරුවාගේ ප්‍රශ්න හරහා ඉලක්ක රාශියක් සාක්ෂාත් කර ගන්නෙමු.



# සංවාදයෙන් අධ්‍යාපනය



දරුවන් සඳහා සුදුසුම ක්‍රමය වන්නේ සාකච්ඡාව, ප්‍රශ්න හා පිළිතුරු මත ගොඩනැගුණු සංවාද ක්‍රමයයි. එය දිව චලනය කිරීමට උපකාරී වන අතර අධ්‍යාපන කුසලතාව ලබා ගැනීමට ක්‍රියා කරයි. සංවාදය යනු යම් දෙයක අර්ථය පැහැදිලි කර එහි අරමුණ සාක්ෂාත් කර ගැනීම එයින් සිදු වේ. සංවාදය අතරතුර දරුවාට සිය ගෞරවය දැනිය යුතු අතර, මෙහි ප්‍රතිඵලය වනුයේ කනස්සල්ල, බිය සහ මානසික ආතතියන් වලින් යටපත් වීමෙන් දරුවා හා දරුවාගේ හැඟීම් මුදා ගැනීමයි. සංවාදය හා සාකච්ඡාව අතරතුර ළමයා මානසික සහනයක් ලබා එමෙන් ම දෙපාර්ශවයම ගැටලුවේ හේතු දැනගෙන විවෘත ව කතා කර, දරුවා ද තමා තුළ ඇති සියල්ල හෙළි කර අවංකව කතා කරන්නේ නම්, විසඳුම සැහැල්ලු වන අතර සාර්ථකත්වය ද එසේම පහසු වේ.

දරුවා සහ ඔහුගේ දෙමව්පියන් අතර සිදු වන සංවාදය හරහා පවුලට බොහෝ ප්‍රතිලාභ ලැබෙනු ඇත. ඒවා නම්:

- **දැන හඳුනා ගැනීම:** ළමයා පවුලේ සෙසු සාමාජිකයින්ට සමීප වේ.
- **සමගිය:** සංවාදය පවුලේ සාමාජිකයන් අතර එකඟතාව වැඩි කරන අතර ආදරය සහ එකිනෙකාට සමීප වීම ද එමගින් සිදු වේ.
- **මිත්‍රශීලීත්වය:** මෙයින් අදහස් කරන්නේ සංවාදයේ නිල තේමාව පමණක් අපට අවශ්‍ය නොවන බවයි. සාකච්ඡාවේ සැබෑ අරුතය ඔප්නැංවෙන්නේ සියුම් වචන සහ ආකර්ශනීය වාතාවරණ හරහා ය.

පෙර සඳහන් දේවල් වලට අනුව, සංවාදයෙන් අධ්‍යාපනය යනු යම් යම් අංගයන්ගෙන් සුවශේෂී ක්‍රියාවලියක් බව අපට පෙනී යයි. ඒවා නම්:

1. සංවාද දරුවාට තනිවම සිතීමට හා කරුණු සොයා ගැනීමට නිදහස ලබා දෙයි. මෙහි නිර්මාණශීලීත්වය කෙරෙහි අනුබල දීම හා ඔහුගේ පෞරුෂය වර්ධනය ද අඩංගු වේ.
2. කිසිදු සංකීර්ණත්වයක් සංවාදය තුළ නැති අතර එය ඉතා සරලය. දරුවා නිදහසින් සහ ලැජ්ජාවකින් තොරව එහි නිරත වේ.
3. සංවාද දරුවන්ගේ ආත්මවලට සතුට හා ආත්ම විශ්වාසය ගෙනෙන අතර අන් අයට ඇහුම්කන් දීමට එය ඔවුන්ට උගන්වයි.
4. සංවාද යනු දරුවාට සෙවීමට සහ ස්වාධීන චින්තනයට අවස්ථාවක් ලබා දෙයි. එවිට ඔහු විවිධ කෝණවලින් සෑම දෙයක් ම දකිනු ඇත. එය ඔහුට තාර්කික චින්තනයට හුරු කරයි.

5. එය දරුවාගේ අවධානය අවදි කරයි. නොසැලකිල්ලෙන් හා ගිලන්බවෙන් දුරස් කරයි. එමෙන්ම ක්‍රියාශීලිත්වය වෙත ද ඔහුව යොමු කරයි.

# සංවාදය සඳහා **ප්‍රශ්න සැකසීම**



දරුවන්ගෙන් විමසිය හැකි වාක්‍ය ඛණ්ඩ රාශියක් තිබේ. ඒවා අතුරින්:

• කුමක් සිදුවේද?: මෙම වර්ගය දරුවා තමා වටා ඇති දේ සෙවීමට පොළඹවයි .ඔහු දකින දේ සෘජු ව විස්තර කිරීමට එය ඔහුට උපකාරී වේ.

• ඔබට අවශ්‍ය කුමක්ද?: මෙම වාක්‍ය ඛණ්ඩය ඔහුගේ අවශ්‍යතා පැහැදිලිව පෙන්වා දීමට උපකාරී වේ.

• ඔබ එය කරන්නේ කෙසේද?: මෙය ඔහුට නිදහසේ සිතීමට උදව් වන අතර පිළිතුරක් සෙවීමට ඔහුගේ පරිකල්පනයට අනුබල දෙයි.

• එය සිදු වන්නේ ඇයි?: බාහිර කාරණා අභිබවා ගොස් ඒවායේ හේතු සොයා බැලීමට මෙය ඔහුට උදව් කරයි. කාරණාවන් අතර තිබෙන සබඳතාවන් ඔහු විශ්ලේෂණය කිරීමට පටන් ගනී.

• මෙසේ සිදු වූ විට අපි කුමක් කරමුද? මෙය නැවත සිතා බැලීමට සහ විවිධ කෝණවලින් කරුණු දෙස බැලීමට ඔහුට උදවු කරයි.

දරුවාගෙන් ඇසිය හැකි ප්‍රශ්න විවිධ අයුරින් වෙනස් වේ. නමුත් දරුවන් සමඟ සංවාදයක නියැලීමේ දී එයින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දෙන හොඳ ප්‍රශ්නවල වැදගත්ම ලක්ෂණ නම්:

1. එම ප්‍රශ්න හැකිතාක් කෙටි වීම.

2. එම ප්‍රශ්නය නිශ්චිත එක් සංකල්පයක් වටා පමණක් සහ පැහැදිලිව තිබීම.

3. දරුවා ජීවත් වන වයස, වේලාව, ස්ථානය සහ තත්ත්වයට ගැළපෙන පරිදි එම ප්‍රශ්නය තිබීම.

4. එම ප්‍රශ්නය හරි වැරැදි කෙරෙහි පමණක් අවධානය යොමු නොවන සේ තිබීම. එය දරුවාගේ මනස විවෘත කරන පරිකල්පනය සඳහා ඉඩක් ලබා දෙන බුද්ධිය විස්තීරණ කරන ප්‍රශ්නයක් වීම.



# දරුවන් අසන ප්‍රශ්නවලට
# පිළිතුරු සැපයීමේ ක්‍රම



ප්‍රශ්න වර්ග සහ ආකාර ගැන අපි ඉහත කතා කළෙමු. මෙහි දී, අපි පිළිතුරු ගැන කතා කරන්නෙමු. මන්ද ළමයින්ගේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන ක්‍රම ඔවුන්ගෙන් විමසූ වේලාව, ස්ථානය සහ තත්ත්වය අනුව වෙනස් වේ. පිළිතුරු සැපයීමේ ක්‍රමවලින් වඩාත් ප්‍රචලිත වන්නේ:



1. වාචික සෘජු පිළිතුරු සැපයීම: එය බහුලව භාවිතා වන පිළිතුරු ක්‍රමයයි. මෙහි දී දරුවා ප්‍රශ්නයක් අසන අතර දෙමව්පියන් සාමාන්‍යයෙන් ඉක්මනින් හා කෙටියෙන් එයට වාචික පිළිතුරක් සපයයි.

2. කෙටිකතාවක් හරහා පිළිතුරු දීම: එය ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ වක්‍රාකාරයකි. එම කෙටිකතාව ප්‍රශ්නයේ ස්වභාවයට ගැළපෙන අයුරින් තිබිය යුතුයි. සාමාන්‍යයෙන් ළමයින් ඒ ආකාරයේ පිළිතුරු වලට ඇලුම් කරන අතර එයට ඇහුම්කන් දෙනු ඇත.

3. දෘශ්‍ය මාධ්‍ය හරහා පිළිතුරු සැපයීම. ඇතැම් අවස්ථාවන් වලදී විද්‍යාත්මක ප්‍රශ්න වැනි නිදර්ශන සහ ඡායාරූප භාවිතා කරමින් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයක් දරුවා අසනු ඇත. විශේෂයෙන් වර්ණ හා ආකර්ෂණීය ඡායාරූප නම් අවබෝධය සඳහා වූ මුඛ්‍ය මෙවලමක් මෙන් එය සලකනු ලැබේ.

4. නිරීක්□ෂණය කිරීම හරහා පිළිතුරු දීම: ඇතැම් විට සැබෑ ලෙස දේවල් නිරීක්ෂණය කර පිළිතුර නිගමනය කිරීමට හැකි වීම සඳහා ප්‍රශ්නය හා සම්බන්ධ ස්ථානයකට ගෙන යාමෙන් ප්‍රායෝගික ව පිළිතුරු දිය හැකි ප්‍රශ්නයක් දරුවා ඇසීමට හැක. උදා : අවට ජීවත් වන සතුන් ගැන විමසීම, ඔවුන් ජීවත් වන ආකාරය, ඔවුන් කන දේ සහ ඔවුන් ප්‍රජනනය කරන්නේ කෙසේ ද යන්න වැනි.

# පිළිතුරු සැපයීමේ දී සැලකිල්ලට ගත යුතු පොදු උපදෙස්



1. සාකච්ඡා මාර්ගː ප්‍රශ්න විමසීමේ මාර්ග හා නිවැරදි කිරීමේ ක්‍රම භාවිතා කරමින් දරුවාව පිළිතුරෙන් සෑහීමට පත් කිරීමට උනන්දු වන්න. පිළිතුර සෘජුව ලබා දීම මත පමණක් රැඳා නොසිටින්න. අප පිළිතුරු ලබා දී අවසන් වූ විට ළ ලබා දී ඇති පිළිතුරෙන් දරුවා සෑහීමට පත් වූවා දැයි සලකා බලන්න.

2. ඔබ ලබා දෙන පිළිතුරෙහි අවංක වන්නː එම පිළිතුරෙන් දරුවා අපහසුතාවයට පත් වේ යන බියෙන් බොරු නොකියන්න. කුමක් වුවත් ඔබේ දරුවාට වැරදි තොරතුරු ලබා නොදීමට වගබලා ගන්න. ඔබේ පිළිතුරු වල සත්‍යතාව සහ යථාර්ථය දරුවා ඔබ කෙරෙහි තබා ඇති විශ්වාසයේ මූලික පදනමයි.

3. දරුවා ඔබේ පිළිතුර පහසුවෙන් තේරුම් ගත හැකි අයුරින් සහ මනසින් පිළිගත හැකි අයුරින් සරලව පිළිතුර ලබා දෙන්නː ඔබේ දරුවාගේ මනස අවුල් කරන අවිනිශ්චිත පිළිතුරක් ලබා දීමෙන් ඉවත්ව සිටින්න. ළමයා තවමත් කුඩා බවත් නිවැරදිව තේරුම් ගැනීමට නොහැකි බවත් පවසමින් අසම්පූර්ණ තොරතුරු ලබා දීමෙන් වැළකී සිටින්න. මන්ද එම තොරතුරු ඔහුගේ මනසෙහි රැඳෙනු ඇත.

4. ඔබේ දරුවා අනවබෝධයෙන් පෙළෙන දරුවකු සේ නොසලකන්ː ඔබ නිවැරදි මාර්ගය භාවිතා කරමින් පැහැදිලි කරන්නේ නම් ඔබ ලබා දීමට උත්සාහ කරන්නේ කුමක්ද යන්න ඔහුට තේරුම් ගත හැකිය. විකෘති කිරීමකින් තොරව ප්‍රශ්නයට සෘජුව පිළිතුරු දීමට සැලකිලිමත් වන්න. එවිට ඔහු ප්‍රහේලිකා වලට පැටලෙන්නේ නැත.

5. ඔබේ දරුවා අසන ප්‍රශ්න ගැන දොස් නොකියන්නː සමච්චල් නොකරන්න, බැණ නොවදින්න. ඔහුගේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඔබ සූදානම් බව ඔහුට නිතර ම හැඟෙන්න සලස්වන්න. සමච්චල් කිරීම දරුවාට සිය ආත්ම ගෞරවය හා ආත්ම විශ්වාසය අහිමි කරන අතර ගවේෂණය කිරීමේ ආශාව ද ඔහුගෙන් පහ කරනු ඇත.

6. මැවුම්කරු වටා ඇති දරුවාගේ ප්‍රශ්න සහ මැවුම්කරුගේ පැවැත්ම ගැන සිතා ගැනීමට ඔහුට නොහැකි වීම ගැන කරදර නොවන්නː ඔහුට පිළිතුරු නොදී බේරෙන්නෙට ද තැත් නොකරන්න. මන්ද, මෙය ඔවුන් ඒ තොරතුරු පිළිබඳ වෙනත් ප්‍රභවයන් හරහා සොයා බැලීමට ඉඩ සලසයි.

7. පිළිතුරු සෙවීමට අවකාශයක් ඉල්ලා සිටීමට පසුබට නොවන්නː දැනුම සොයන්නෙකු වශයෙන් පෙනී සිටීම අඥාන ව සිටිය දී ඥානියකු ලෙස පෙනී සිටීමට වඩා උසස් ය. ඔබේ දරුවාට"මම නිවැරදි පිළිතුර සොයා ගන්නා තුරු ඉන්න" යැයි පැවසීම ලැජ්ජාවක් නොවේ.

8. ඔබේ දරුවාගේ ප්‍රශ්න ප්‍රතික්ෂේප නොකර, ප්‍රවේශමෙන්, අවධානමෙන් හා හොඳින් සවන් දීමෙන් පිළිගත යුතුයි. දරුවා හොඳින් ඊක්ෂා බලා ඔහුගේ ප්‍රශ්න හොඳින් අවබෝධ කර මනෝවිද්‍යාත්මක ව හා යථාර්ථවාදී ව දරුවා හදාවඩාගැනීම වනාහි තේරුම් ගැනීමට අපහසු දේවල් පිළිබඳ ඔබේ පැහැදිලි කිරීම් පිළිගැනීමට ඔහුට උපකාරී වේ.

9. ඔබ සැබවින් ම කාර්යබහුල නම්, එම ප්‍රශ්නයට පිළිතුරු දීමට ඔබට කාලය සුදුසු නොවන බව ඔබ මෘදුව දරුවාට පැහැදිලි කළ යුතු අතර ඔබ කාර්යබහුල වේලාවෙන් මිදුණු මොහොතේ ම ඔහුට වහාම පිළිතුරු දීමට වග බලා ගන්න.

10. විස්තරාත්මක පැහැදිලි කිරීම් අනවශ්‍ය නම් එයින් වැළකී සිටින්න: අවුරුදු හයක දරුවෙකුගේ ප්‍රශ්නවලට පිළිතුරු දීම අවුරුදු දහයක දරුවෙකුගේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට වඩා කෙටි විය යුතුය. පාරභෞතිකය හා බැඳුණු ප්‍රශ්න සහ අපහසු ප්‍රශ්න වැනි සවිස්තරාත්මක සාක්ෂි සහ සාධක අවශ්‍ය ප්‍රශ්න සඳහා එය අදාළ වේ. ඒ හැර සාමාන්‍ය වෙනත් ප්‍රශ්නවල පිළිතුරු සීමිත වන අතර සියලු වයස් මට්ටම් සඳහා එකසේ ලබා දෙනු ලැබේ.

11. දරුවාට ග්‍රහණය කළ හැකි යථාර්ථයක් සමග හැකි තරම් ප්‍රශ්නයක පිළිතුර සම්බන්ධ කරන්න: එවැනි වයස් කාණ්ඩයේ දරුවන් තේරුම් ගැනීමට අපහසු ගැඹුරු කරුණු වලින් ඉවත් ව සිටින්න. තවද අර්ථාන්විත පිළිතුරක් සැපයීම පිණිස හැකි තාක් පිළිතුරු සනාථ කරන සාක්ෂි ද ඉදිරිපත් කිරීමට උත්සාහ කරන්න. එවිට ඒවා තාර්කික වේ.

12. දරුවා සඳහා තොරතුරු සැපයීමේ දී දෙමාපියන් අතර එකඟතාව: එනම් දරුවාට තොරතුරු ලබා දීමේ දී දෙමාපියන් අතුරින් කෙනෙකුගේ හෝ අදහස් පටහැනි නොවීම.

13. දරුවා ප්‍රශ්නයක් අසන විට වෙනත් ප්‍රශ්නයකින් එකී ප්‍රශ්නය නිශ්ප්‍රභ කිරීම නොසුදුසුය. "ඔබ අදහස් කරන්නේ කුමක්ද?" යනුවෙන් පියා ඇසීම මෙයට නිදසුනක. තම පියා වෙත ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට නොහැකි වූ නිසා දරුවා කලකිරීමට පත්වේ. මන්දයත් වැඩිදුර පැහැදිලි කිරීමකින් තොරව ඔහුගේ දෙමාපියන් ඔහුව තේරුම් ගන්නා බව දරුවා විශ්වාස කරයි. දෙමව්පියන්ගෙන් කෙනෙකු දරුවාගේ ප්‍රශ්නයෙහි අරමුණ අවබෝධ කර ගැනීමට අවශ්‍ය නම් ,"ඔබ අදහස් කළේ මෙය නේ " වැනි සහතික කිරීමේ ආකාරයකින් ප්‍රකාශයක් භාවිතා කිරීම වඩා සුදුසු ය.

14. යම් නිශ්චිත ප්‍රශ්නයක් සඳහා පිළිතුරු සැපයීමේ දී දෙමාපියන් වෙන් වී තනි තනිවම කටයුතු නොකළ යුතුය. දරුවා ඔහුගේ දෙමව්පියන්ගේ පිළිතුරට වඩා වෙනස් පිළිතුරක් වෙනත් මූලාශ්‍රයක් හරහා ලබා දෙන අවස්ථාවේ දී ඔවුන් ඔහුට නිවැරදි පිළිතුර සරල හා පහසු ආකාරයක් මගින් ලබා දී සෑහීමට පත් කළ යුතු අතර එමගින් ඔහුගේ දෙමව්පියන් කෙරෙහි විශ්වාසය - අඩු නොවී - වර්ධනය වේ. ඒ හැර අප දුන් පිළිතුර නිවරැදි ය යනුවෙන් මුරණ්ඩු වීම සුදුසු නැත.

15. පාඩම් කියාදීමේ ස්වරූපයෙන් නොව සාකච්ඡාවක ස්වරූපයෙන් පිළිතුර සැපයීමට වග බලා ගන්න: බොහෝ උදාහරණ සපයන්න. කතාන්දර කියවා පෙන්වන්න. ඡායාරූප සහිත විශ්වකෝෂ භාවිතා කර දරුවාගේ මනසට අර්ථය ලබා දෙන්න උත්සුක වන්න. සජීවිකරණ ක්‍රීඩා, රංගනය, චිත්‍ර ඇඳීම, කල්පනා කිරීම, ගීත ගැයීම ල සාමූහිකව ගැටළු විසඳීම, බුද්ධිමය ක්‍රීඩා, බිත්ති සැකසීම, ඡායාරූපකරණය යනාදිය භාවිතා කරන්න. විවිධ ක්‍රම උපයෝගී කිරීම දරුවාගේ චින්තන හැකියාව වර්ධනය කරන අතර ආකල්ප හා තොරතුරු මනසෙහි බලවත් සේ පිහිටුවයි.

16. සමහර ප්‍රශ්නවලට එකවර සම්පූර්ණ පිළිතුරු දිය යුතු නැත. එහෙත්, ඒවාට ක්‍රමක්‍රමයෙන් එකකට පසු එක බැගින් පිළිතුරු දිය යුතුය. ඔහු වැඩිවිස්තර ඇසුවේ නම්, දරුවාගේ වයස, ප්‍රශ්න වර්ගය සහ ඔහුගේ දැනුවත්භාවයේ ප්‍රමාණය අනුව වැඩි පිළිතුරු සපයන්න.

17. දරුවා වැඩී යම් තරමක් පරිනත වූ විට, ඔහු අසන ප්‍රශ්නය ගැන ඔහුගෙන් ම අදහස් විමසා සිටීම වඩා උචිතය. එබැවින්, අපි ඔහුගෙන් ඔහු ඇසූ ප්‍රශ්නය ම අසා ඔහු එයට ප්‍රතිචාර දක්වන ආකාරය නිරීක්ෂණය කළ යුතුය. අපට ඔහුගේ ප්‍රතික්‍රියාවෙන් ම ඔහුට පිළිතුරු දිය හැකිය. අප සතු වූ බුද්ධිය හා අවබෝධය හරහා දරුවකු සිතීම නතර කළ යුතුයි. සිය බුද්ධිය පරිහරණය කිරීමට දරුවාට අවකාශය ලබා දිය යුතුයි. එසේ නොකළේ නම් එය නොගැළපෙන රාමුවක් තුළ ඔහුව ඇද දමනු ඇත.



# පිළිතුරු සැපයීමේ දී පුරුදු පුහුණු කිරීමේ ක්ෂේත්‍රයට අදාලව
# සිදුවන වැරදි



අප විසින් අපේ දරුවන්ට සිදු කරන වැරදි පහත අයුරිනි.

- විශේෂයෙන් හැදියාව වර්ධනය කිරීමේ විවිධ පැතිකඩයන් පිළිබඳව සලකා නොබැලීම. මන්ද මේ ක්ෂේත්‍රයේ ආගමික, සදාචාරාත්මක සහ විද්‍යාත්මක පැතිකඩ යනුවෙන් පැතිකඩවල් ඇත. මෙහි එක් අංශයක් කෙරෙහි අවධානය යොමු කිරීම සහ අනෙක් ඒවා නොසලකා හැරීම හෝ ඒවා අතර සමතුලිත නොවීම.

- ක්‍රමක්‍රමයෙන් කටයුතු නොකිරීම. ඕනෑවට වඩා බැණ වැදීම හා දොස් පැවරීම.

- ඔවුන් අපගේ තීරණ වලට සාකච්ඡාවකින් තොරව යටත් වීමට ඇති අපගේ ආශාව.

- විශේෂඥයින්ගෙන් සහ අත්දැකීම්ලත් අයගෙන් විමසීමක් නොකිරීම. හදිසි හා දුර්වල පසු විපරම්, හැදියාව වර්ධනය කිරීමේ දී සහ මඟ පෙන්වීමේ දී අපැහැදිලි බව.

- අපගේ ක්‍රියාවන් අපගේ ප්‍රකාශයන්ට පටහැනි වීම සහ ඍණාත්මක පණිවිඩ යනා දී මේ සියල්ල දරුවාගේ ආධ්‍යාත්මික සහ හැදියාව වර්ධනය කිරීමේ පදනමට බලපාන වැරදි කරුණු ය.


දරුවන් තුළ
දේව විශ්වාසය
හා සම්බන්ධව පවතින
ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
පිළිබඳ ප්‍රායෝගික
උදාහරණ



මෙම කොටසෙහි ලැයිස්තුගත කර ඇති පිළිතුරු මූලික වශයෙන් යොමු කරනුයේ දෙමාපියන්, ගුරුවරුන්, උපදේශකයින් වැනි දරුවන්ගේ ප්‍රශ්න සමඟ සෘජු ව කටයුතු කරන අය වෙත ය. එමෙන් ම දරුවාගේ වයස ල මට්ටම සහ හැකියාවට සරිලන පරිදි පිළිතුරු අන්තර්ගතය සකස් කරන මෙන් අප ඉල්ලා සිටිමු. වයසින්, මනසින් සහ හැකියාවෙන් විවිධ මට්ටමකින් පසුවන දරුවන් සඳහා අපට එක පිළිතුරක් ලබා දිය නොහැක. එබැවින්, අප සැලකිලිමත් විය යුත්තේ පිළිතුරේ මූලය සහ එහි යථාර්ථය පිළිබඳ මිස තිර රචනය කළ වචන පිළිබඳ නොවේ. එසේම, ගෞරවණිය පාඨකයාට හැකි අයුරින් නිදර්ශන ලබා දීම පිණිස පිළිතුරු සැපයීමේ ශෛලියේ සෘජු හා වක්‍ර ආකාරයන් අප භාවිතා කර ඇත්තෙමු. එම පාඨකයා මෙම පිළිතුරු වල බීජය හා ධාතුව සැලකිල්ලට ගෙන තම දරුවාට වඩාත් සුදුසු යැයි පෙනෙන ආකාරයට ඒවා නැවත සැකසිය යුතුය.

දරුවාගේ දේව විශ්වාසය හා සම්බන්ධ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා, ඔවුන්ගේ මානසිකත්වයට හා හැකියාවන්ට ගැළපෙන වාක්‍ය ඛණ්ඩයකින් ගුප්ත හා අදෘශ්‍යමාන කරුණු පැහැදිලි කරන ප්‍රාථමික ආගමික

*සංකල්ප කියා දීමට ඉඩ සලසන ආගමික දැනුමක් දෙමාපියන් සතුව අවම වශයෙන් තිබිය යුතුයි. සාමාන්‍යයෙන් උපදේශකයින් මුහුණ දෙන අභියෝගය තොරතුරු සැපයීම මත පමණක් සීමා නොවේ. එම අභියෝගය දරුවාගේ බුද්ධිය පිළිගන්නා සහ තේරුම් ගන්නා ආකාරයකින් මෙන් ම කාලය, ස්ථානය සහ ඔහු ජීවත් වන තත්වයට ගැලපෙන ආකාරයකින් තොරතුරු සැපයීම තුළ ද සැඟවී ඇත.*

*ඉදිරියේ දී සඳහන් වන්නේ, දරුවන් විසින් නැවත නැවතත් අසනු ලබන වඩාත් ම වැදගත් ප්‍රශ්න ස්වල්පයක නිදසුන් පමණි. දරුවන් අසන සියලුම ප්‍රශ්න මෙහි සඳහන් නොවේ. අපගේ අදහසට අනුව - හොඳ ම පිළිතුරු තෝරා ගැනීමට අපි සැලකිලිමත් වූ නමුත්, ඒවා පමණක් ආදර්ශමත් පිළිතුරු ලෙස අපි වාද නොකරන්නෙමු-දෙමව්පියන් විසින් ආරම්භ කර ඉදිරියට යා හැකි උදාහරණ පමණකි - නිසැකව ම - එම නිදසුන් නිවැරදි කිරීම, සංස්කරණය කිරීම,ඉවත් කිරීම සහ එකතු කිරීම යනාදිය කළ හැකි තත්ත්වයකින් පසුවන්නකි.*

**සැලකිය යුතුයි**

*මෙහෙයවීමට සංකීර්ණ වූ ප්‍රශ්න දරුවන් සතුව තිබෙන හෙයින් දරුවන් ඇති දැඩි කිරීමේ විෂයෙහි ගැටළු සහගත තත්ත්වයක් උදා වන බව කවරෙකු හෝ සිතනනේ නම් ඔහු වැරදි ය. දරුවන් තුළ දැකිය හැකි මෙම ස්වභාවය වනාහි ස්වාභාවික වර්ධනය සහ දරුවාගේ චින්තනයෙහි සහ මානසික හැකියාවන්හි තාර්කික ප්‍රගතියක් පෙන්නුම් කරන නිරෝගී සංසිද්ධියක් ලෙස සැලකේ. ගැටළුව නම් දරුවාගේ වර්ධනය, මානසික විවෘතභාවය ,විශ්වයේ අඩංගු දෑ කෙරෙහි සහ ඔහු වටා තිබෙන දෑ කෙරෙහි ඔහුගේ පිළිගැනීම යන කරුණු ග්‍රහණය කිරීමට දෙමාපියන් තුළ ඇති නොහැකියාවයි. ඒ අනුව, දෙමව්පියන් - සහ දරුවා සමග ගනුදෙනු කරන ඕනෑම අයෙකු - දරුවා සෑහීමට පත් වන අයුරින් පිළිතුරු සැපයීමට උපරිම උත්සාහයක් දැරිය යුතුයි. අර්ධ වශයෙන් හෝ සෑහීමට පත් කරන පිළිතුරු දරුවාට මානසික, බුද්ධිමය හා සමාජ සමතුලිතතාවයක් පවත්වා ගැනීමට උපකාරී වනු ඇත. ඊට පටහැනිව, විකෘතිමත් පිළිතුරු හා වැරදි ප්‍රතික්‍රියා දරුවා තුළ දැඩි අවිධිමත්භාවයක් හා ව්‍යාකූලභාවයක් උදා කිරීමට හේතු වේ. මෙම අවිධිමත්භාවය හා ව්‍යාකූලභාවය දරුවා තුළ ගැටළු සහගත හැදියාවන් සහ අස්ථාවර සිතුවිලි නිපදවනු ඇත.*

*විශාල ගැටළු එකවර ම මතු නොවේ.ගින්න ආරම්භ වන්නේ ගිනි පුපුරකිනි. ඒ අයුරින් ම, මානවයාගේ බොහෝ නරක ගති ලක්ෂණ කුඩා බීජයක් මෙන් බිහි වී නොසැලකිලිමත් කම හා කල් දැමීම යන ගුණාංග එම බීජයට ජලය දමා වර්ධනය කරන්නේය. එකී නරක ගති ලක්ෂණ සිත් තුළ වර්ධනය වී මුල් හට ගැනීමට ආරම්භ වේ. ඉන්පසු එය ඉවත් කිරීමට හෝ ගැලවීමට හෝ නොහැකි වේ.*

# දෙවිඳුන් කෙරෙහි
# විශ්වාසය හා සම්බන්ධ ප්‍රශ්න



කුඩා අවදියේ දී දරුවාගේ මනසෙහි නිතර භ්‍රමණය වන ප්‍රශ්නය නම් එය දෙවිඳුන් පිළිබඳ ප්‍රශ්නය යැයි කිව හැක. දරුවන් දෙමව්පියන්ගෙන් ඒ සම්බන්ධව බහුලව අසන ප්‍රශ්න අප මෙහි ඉදිරිපත් කරන්නෙමු.

## කවුරුන්ද ඒ අල්ලාහ්?

පළමුව ල දරුවා දෙවිඳුන් ගැන විමසන තුරු අපි බලාපොරොත්තුවෙන් නොසිටිය යුතුය. ඊට පටහැනිව, අපි සෑම විට ම සහ සෑම අවස්ථාවක ම දෙවිඳුන් ගැන කථා කිරීමට උත්සුක විය යුතුයි. දෙවිඳුන් සහ ඔහුගේ ගතිලක්ෂණ පිළිබඳ දරුවාගේ ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු ලබා දීම වනාහි, දරුවාගේ බුද්ධියෙහි සහ හදවතෙහි දෙවිඳුන් කෙරෙහි ඒක දේවවාදී විශ්වාසය සහ ඔහු කෙරෙහි විශ්වාසය ද ඇති කරයි. අල්ලාහ්ගේ ආත්මය ගැන සිතීමට අවකාශය ලබා නොදී අහස, වලාකුළු, තාරකා, හිරු, සඳු , මුහුද, ශාක වැනි දෙවියන්ගේ සංඥාවන් සහ මැවිල්ලේ අරුමයන් ගැන සිතීම කෙරෙහි දරුවාගේ මනස යොමු කිරීම වඩා හොඳ ක්‍රමයකි. තවද, ඔහුව සහ ඔහුගේ අවයවයන් වන ඔහුගේ ඇස්, කන්, මුඛය, දිව, අත්, පාද ඇතුළු ඔහුගේ මුළු ශරීරය ම දෙවිඳුන් ඔහුට දුන් පරිත්‍යාග බව අප අවධාරණය කළ යුතුය. දෙවිඳුන් මේ අහස, මේ භූමිය සහ මේ සියලු ශාකසාර මැවූ බව අපි ඔහුට කියා දිය යුතුයි. එමනිසා, "දෙවිඳුන් කවුරුන්?" යනුවෙන් දරුවා ඇසූ වි, අපි සරලව ම කිව යුත්තේ අප අවට තිබෙන සියල්ල හා සිටින සියල්ලන් මැවූ තැනැත්තා ඔහු බවය. ඒ සඳහා ඔහුට බොහෝ උදාහරණ අප ඉදිරිපත් කළ යුතුයි.




අපි මේ අහස් හා භූමි ලෝකයන් ගැන දරුවා දැනුවත් කර මෙම විස්මිත පද්ධතිය සහ සර්ව සම්පූර්ණ සැකැස්ම පිළිබඳ විවරණය කර දුන් පසු, අපි ඔහුගෙන් "ඔබ මෙම සැකැස්ම කෙරෙහි අවධනායන් බැලුවේ ද? යැයි විමසා එහි නිර්මාපකයා සහ සංවිධායකයා සර්වබලධාරී දෙවිඳුන් බව දන්වා සිටිය යුතුයි. එවිට එම දරුවා අවබෝධයෙන් හා පැහැදිලි ව තම දෙවිව දැන හඳුනා ගනී. සෑම දෙයකම මැව්මිකරු වූ දෙවිඳුන් ඔහු බවත්, ඔහු හා සමාන කිසිවක් නැති බවත් ඔහු දයානුකම්පිත, සර්ව පෝෂක හා තපාගශීලී බවත් ඔහු සතුව අලංකාර නාමයන් සහ ගති ලක්ෂණ තිබෙන

බවත් අප ඔහුට කියා දිය යුතුයි. නැදුමට සුදුස්සා ඔහු හැර අන් කිසවෙකු නොවන්නේ ඒ හේතුව නිසා බව අප දරුවාට පැහැදිලි කළ යුතුයි. ඔහු දරුවන්ට ආදරය කරන අතර ඔවුන්ව රැකබලා ගනිමින්, ඔවුනට ප්‍රයෝජනවත් දෑ පිරිනමා ඔවුන්ට සහ අන් සෑම කෙනෙකුටම යහපත් දෑ ම සිදු කරන ලෙස අණ කර ඇත. ඔහු අපගේ යහපත් හා අයහපත් ක්‍රියාවන් පිළිබඳ පරීක්ෂා කරන්නේ ඔහු ය. දැහැමි අයට ඔවුන්ගේ දැහැමි ක්‍රියා හේතුවෙන් වේතනය ලබා දෙන අතර වරදට වරදකරුට දඬුවම් කරන්නේ ද ඔහුය. අල්කුර්ආනයේ අවසාන කෙටි පරිච්ඡේද දරුවන්ට ඉගැන්වීම ප්‍රයෝජනවත් වේ. මන්ද ඒවායෙහි අල්ලාහ් සහ ඔහුගේ ගතිලක්ෂණ සඳහා හොඳම පිළිතුරු අඩංගු වේ. ඔහු (අල්ලාහ්) උපත ලැබෙන්නේවත් ඉපදෙන්නේවත් නැත. ඔහුට සමාන කිසිවෙක් නැත. (112: 3-4) මෙය අල්කුර්ආනයේ අවසාන කෙටි පරිච්ඡේදයක කොටසකි.

### අපට දරුවාගෙන් පහත අයුරින් ප්‍රශ්න ස්වල්පයක් ඇසිය හැකිය:

- මේ ලස්සන ඇඳුම් ඔබ වෙනුවෙන් මිල දී ගත්තේ කවුරුන් ද ?
- මාගේ පියාණන්'යැයි ඔහු පිළිතුරු දෙනු ඇත.
- ඔබව පාසලට ගෙන යන්නේ කවුරුන් ද?
- මාගේ පියාණන්' යැයි ඔහු පිළිතුරු දෙනු ඇත.
- ඔබ අසනීප වූ විට, ඔබව වෛද්‍යවරයා වෙත ගෙන යන්නේ කවුරුන් ද?
- මාගේ පියාණන්' යැයි ඔහු පිළිතුරු දෙනු ඇත.
- ඔබව විනෝද චාරිකාවක් සඳහා රැගෙන යන්නේ කවුරුන් ද?
- මාගේ පියාණන්' යැයි ඔහු පිළිතුරු දෙනු ඇත.
- එසේ නම්, ඔබේ සියලු දේ රැක බලා ගන්නේ ඔබගේ පියාණන් ද?
- ඔව්, යනුවෙන් ඔහු පිළිතුරු දෙයි.

එවිට දෙවිඳුන් අල්ලාහ් ද එසේ ය. අප සියල්ලෝම රැක බලාගන්නේ ඔහු ය. සියලු දේ හි මැවුම්කරු ඔහු ය. ඔබ දකින සෑම දෙයක් ම දෙවියන්ගේ නිර්මාණ ය. සඳ, හිරු, වලාකුළු, මුහුද, කඳු, මිනිසුන්, සතුන් සහ පක්ෂීන්, දේවදූතයන් හා ෂෙයිතාන්වරුන් ඇතුළුව මුළු විශ්වයේ ම මැවුම්කරු අල්ලාහ් ය. ඔහු තපාගශීලී සහ දයානුකම්පිත ය. ඔහු අපව ආරක්ෂා කරන අතර සෑම විට ම අප වෙනුවෙන් යහපත ම කරනු ඇත යනුවෙන් දරුවන්ට කියා දිය යුතුයි.

### අල්ලාහ්ගේ හැඩය මිනිසුන්ගේ හැඩයට සමානද?

නැත, ඔහු අප මෙන් නොවේ. දෙවිඳුන් වැනි කිසිවක් හෝ කිසිවෙක් නැත. මා සහ ඔබ ඇතුළු සියලු දෙනා නිර්මාණය කළේ ඔහු ය. මේ ලොවෙහි ගස්, ගංගා, මුහුද සහ සියල්ල මැව්වේ ඔහු ය. බලයේ උල්පත ඔහු ය. ඔහුට යමක් අවශ්‍ය වූ විට ඔහු "වනු" යැයි පවසන අතර එය වනු ඇත. දෙවිඳුන් මිනිසාට වඩා ඉතා වෙනස් ය. මිනිසාට තවත් මිනිසෙකුව මැවිය නොහැක. එනමුත් දෙවියන්ට එය සිදු කළ හැකි අතර, ඔහුට අවශ්‍ය

ඕනෑම දෙයක් ඔහුට කළ හැකිය. ලෞකික ජීවිතයේ කිසිවෙකුටත් දෙවියන්ව දැකිය නොහැකි බැවින් කිසිවෙකුටත් ඔහුගේ හැඩය විස්තර කළ නොහැක. අපගේ හැකියාවන් සීමිත බැවින් අපට ඔහුගේ අලංකාර හා දීප්තිමත් හැඩයෙන් දැකිය නොහැක. මේ අයුරින් දරුවාට අප විස්තර කළ යුතුයි. පසුව දරුවාට හිරු දෙස ඇස් නොවසා බලා සිටින ලෙස ඉල්ලා "ඔබට දිගටම හිරු දෙස බලා සිටිය හැකිද? යනුවෙන් විමසුවේ නම් "නොහැක" යනුවෙන් ඔහු පිළිතුරු දෙයි. මාගේ ආදරණීය පුතුණේ! අපට දෙවිඳුන් හා ඔහුගෙන් විහිදෙන දීප්තිය ද දරාගත නොහැකි වන්නේ ඒ අයුරිනි. නමුත් අප ස්වර්ගයට ගිය විට - ඔහුගේ අනුමැතියෙන් - අප විසින් ඔහුව දැක ගන්නට පුළුවනි යැයි ඔහුට කියා දිය යුතුයි.

ඇතැම් විට දරුවා තෘප්තියට පත් නොවී ඔහු හා සමාන කිසිවක් නොමැති වන්නේ කෙසේද? යනුවෙන් නැවත ප්‍රශ්න කළ හැකිය. මෙහිදී ඉතා සැහැල්ලුවෙන් දරුවා සෑහීමට පත් කළ යුතු අතර අප මෙසේ දරුවාට පැවසිය යුතුයි. අපගේ බුද්ධිය කොතරම් වර්ධනය වී තේරුම් ගත්ත ද, ඒවා තවමත් මානවයාගේ සීමිත බුද්ධීන් වේ. දෙවිඳුන් ඒවාට අවබෝධය කර ගැනීමට ඉඩ දී ඇති දේ පමණක් ඒවා ග්‍රහණය කර ගන්නා අතර වෙන කිසිවක් පිළිබඳ අවබෝධයක් ඒවාට නැත. අප සදා මිනිසුන් හෙයින් අපට සෑම දෙයක් ම හැදෑරීමට නොහැකි ය. දෙවිඳුන් අප වැනි මනුෂ්‍යයෙකු නම්, ඔහු අප මෙන් අසනීප වනු ඇත. අප මෙන් ආහාරපාන ගනු ඇත. එමෙන් ම මිනිසුන් මිය යනවාක් මෙන් ඔහු ද මිය යනු ඇත. කෙසේ වෙතත්, දෙවිඳුන් අසනීප වන්නේ නැත. ආහාරපාන අනුභව කරන්නේ නැත. එමෙන් ම මිය යන්නේ ද නැත. ඔහු සදා පැවත්මක් ඇත්තකි. ඔහු මේ විශ්වයේ අහස, පොළොව සහ සියල්ලේ මැවුම්කරු ය. එබැවින් ඔහු වැනි කිසිවක් හා කිසිවෙක් නැත. තවද අපට දරුවාගෙන් මෙසේ විමසිය හැකිය. (මිනිසුන් වන අපි) "වනු" යැයි දෙයකට පැවසුවේ නම් ඒ දේ සිදු වේ ද ? "නැත" යනුවෙන් ඔහු පිළිතුරු දෙයි. දෙවිඳුන් අප වැනි මනුෂ්‍යයෙකු නොවන බව හා ඔහු විශිෂ්ඨ නිර්මාපකයකු බව දරුවා සමඟ අපි නිගමනයකට එළැඹිය යුත්තේ මේ අයුරිනි.



අපි දරුවාට මෙසේ පැවසිය යුතුයි: අපගේ සවන ඉතා සීමිතය. අපට සවන් දිය හැක්කේ එක්තරා දුරකින් පමණි. අපට සෑම දෙයක්ම අපගේ සවනට වැකෙන්නේ නම්, අපි වෙහෙසට පත් වෙමු. අපගේ දෘශ්‍ය බලය ද සීමිතය. අපට දැකිය හැක්කේ එක්තරා දුරකින් පමණි. උදාහරණයක් ලෙස බිත්තියක පිටුපස ඇති දේ අපට නොපෙනේ. අපගේ සවන සහ දෘශ්‍ය බලය සීමිත බැවින් අපගේ බුද්ධිය ද එසේමය. එයට සියල්ල ග්‍රහණය කළ නොහැක. මිනිස් බුද්ධිය සීමිත වන අතර එයට සියල්ල තේරුම් ගත නොහැක. දෙවිඳුන් මිනිසා මැවූ දා පටන් අදටත් නොදන්නා කරුණු තවමත් දන්නා කරුණු වලට වඩා අධිකය. - උදාහරණයක් ලෙස - මිනිසාගේ ශරීරයත් සමග ඇති ආත්මය අපට ඉතා සමීප ය. එනමුත් එය අපට නොතරම් සමීපව තිබුණ ද එහි හැඩය හෝ යථාර්ථය අපට සිතා ගැනීමටවත් නොහැකිය. අප තුළ හා අප සමග තිබෙන දෙයක තත්ත්වය ම මෙසේ නම්, අපට පිටතින් ඇති දෑ හි තත්ත්වය කෙසේ නම් විය හැකි ද?

ඒ අනුව, මිනිසාගේ බුද්ධිය සීමිත නම්, එයට දෙවියන්ගේ ආත්මය හෝ යථාර්ථය තේරුම් ගත නොහැක. එසේ නම් දෙවියන්ගේ හැඩය පිළිබඳ තර්කය පරිකල්පනය, බුද්ධිය හෝ මනඃකල්පිතය තුළින් නිගමනය කළ නොහැක්කකි. එය නිගමනය කළ හැක්කේ ආගම තුළින් පමණක් වන අතර අල්කුර්ආනය මෙම ප්‍රශ්නය විසඳන්නේ මෙසේය : ඔහු හා සමාන කිසිවක් නැත, ඔහු සවන් දෙන්නා ය, දකින්නා ය. (42:11) ඒ අනුව දෙවිඳුන් යනු අප හෝ වෙනත් කිසිවක් නොවේ. අප ප්‍රිය කළ යුතු, බලාපොරොත්තු තැබිය යුතු හා බිය විය යුතු දෙවියන්ගේ ශ්‍රේෂ්ඨත්වය මෙයින් ඇඟවේ. ඔහුව ස්වර්ගයේ දැකීම ස්වර්ගයේ ඇති විශාලතම ප්‍රීතිය වීම මඟින් මෙම ශ්‍රේෂ්ඨත්වය ඉස්මතු වේ.

## ? අල්ලාහ්ව නිර්මාණය කළේ කවුද?

සියල්ල ම අල්ලාහ්ගේ නිර්මාණ නම්, එකී "නිර්මාපකයා නිර්මාණය කළේ කවුරුද? යනුවෙන් ද ඔබ විමසන්න ට පුළුවනි. එසේ නොවේ ද? යැයි වැඩිහිටි ඔබ අසා මැවුම්කරුගේ එක් ගති ලක්ෂණයක් වන්නේ ඔහු නිර්මාණයට ලක් වූ නිර්මාණයක් නොවන බවත් ඔහු සියලු නිර්මාණ නිර්මාණ කළ නිර්මාපකයා බවත් කියා දිය යුතුයි. ඔහු නිර්මාණයට ලක් වූ කෙනෙකු නම්, අපි කිසි විටෙකත් ඔහුට නමස්කාර නොකරන්නෙමු. ඔහුගේ ආඥාවන් හා මාර්ගෝපදේශ නොපිළිපදින්නෙමු. දෙවියන්ව නිර්මාණය කළේ කවුරුද? යන ප්‍රශ්නය අසත්‍ය වන්නේ එබැවිනි. අසත්‍ය ප්‍රශ්න අර්ථ විරහිත ය. උදාහරණයක් ලෙස, ත්‍රිකෝණයක හතරවන පැත්තේ දිග ගැන යමෙකු ඔබෙන් ඇසුවේ නම්, ඔබට පිළිතුරක් නැත. මන්ද ත්‍රිකෝණයට පැති තුනකට වඩා නැත. දෙවියන්ව නිර්මාණය කළේ කවුරුද? කියා ඇසීමේ වැරැද්ද නම්, "නිර්මාණයට ලක් වීම"සහ "දෙවිඳුන්" යන වචන එකිනෙක නොගැළපේ. මන්ද දෙවිඳුන් කිසිදා නිර්මාණයට ලක් වන්නේ නැත. නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය අදාළ වන්නේ නිර්මාණයට ලක් වන දෑට පමණි. කිසිවෙකුට කිසිදාක හෝ දෙවිකෙනෙකු නිර්මාණය කිරීමට නොහැකිය. එසේ වූවා නම් දෙවි ද නිර්මාණයට ලක් වූ කෙනෙකු වේ. කිසිදා ඒසේ නොවේ. දෙවිඳුන් අල්ලාහ්ට ආරම්භයක් හෝ අවසානයක් හෝ නැත.

සර්වබලධාරී අල්ලාහ් ව නිර්මාණය කළ කෙනෙකු ඇතැයි අප - හුදු වාදයක් සඳහා - උපකල්පනය කරන්නේ නම්, එම ප්‍රශ්නය ම නැවත නැවතත්, "සර්වබලධාරී අල්ලාහ් ව නිර්මාණය කළ අයගේ නිර්මාණකරු කවුරුද? සර්වබලධාරී අල්ලාහ් ව නිර්මාණය කළ අයගේ නිර්මාණකරුගේ නිර්මාණකරු නිර්මාණය කළේ කවුරුද? යනුවෙන් නොකඩවා අනන්තය දක්වා අසා ගෙන යා හැක. එය සිදු විය නොහැකි කරුණකි. වැඩිදුර පැහැදිලි කිරීමක් වශයෙන් අපි "සොල්දාදුවා සහ උණ්ඩය" උදාහරණයට ගනිමු. සොල්දාදුවෙකුට

වෙඩි තැබීමට අවශ්‍ය නමුත් එසේ කිරීමට නම් ඔහු පිටුපස සිටින සොල්දාදුවාගෙන් අවසර ලබා ගත යුතුය. එම සොල්දාදුවා - අවසර ලබා දීම සඳහා - ඔහු ද පිටුපස සිටින සොල්දාදුවාගෙන් අවසර ලබා ගත යුතුය. මේ අයුරින් අවසානයක් නොමැතිව අවසර පැතීම සිදු වන බව සිතමු. ප්‍රශ්නය නම් පළමු සොල්දාදුවා තුවක්කුවෙන් වෙඩි තබයිද? යන්නයි. පිළිතුර නැත, මන්ද ඔහුට වෙඩි තැබීමට අණ දෙන නිලධාරියාගෙන් සෘජුව අවසර ඉල්ලීමට නොහැකි වූ බැවිනි. එනමුත් ඔහුට වෙඩි තැබීමට අණ දෙන නිලධාරියාගෙන් සෘජුව අවසර ඉල්ලීමට හැකි වුවහොත් එවිට ඔහු වෙඩි තබනු ඇත. එම අණ දෙන නිලධාරියා නොමැතිව, කොපමණ සොල්දාදුවන් සිටියත් ඔහුට කිසි විටෙකත් වෙඩි තැබීමට නොහැකි වේ. එම සොල්දාදුවන් බිංදුව හා සමානය. ඔබ එම බිංදු අසීමිත ලෙස එකිනෙක අසල තැබුව ද (උදා :00) ඒවාට කිසිදු වටිනාකමක් ඇති නොවන්නේය. අප ඒවා ඉදිරියේ 1 හෝ ඊට වැඩි අංකයක් (උදා : 001/002) තැබුවා නම් මිස.

## අල්ලාහ් පැමිණියේ කොහෙන්ද? ඔහුට වයස කීයද?

"මාගේ ආදරණීය පුතුණේ! දෙවිඳුන් නිර්මාණයට ලක් නැති බව ඔබ දැන ගත්තේ නම්, ඒ අයුරින් ම ඔහු උපන්නේවත් ඉපදෙන්නේවත් නැත. ඔහුට ආරම්භයක් හා අවසානයක් නැත. එමනිසා ඔහුට අප වැනි මනුෂ්‍යයෙක් මෙන් වයසක් නැත. මන්ද ඔහු මැවුම්කරු ය. මහිමාන්විත ය. අවශ්‍යතාවයකින් තොර ය. ශ්‍රේෂ්ඨ ය. ස්ථිර ශක්තියේ හිමිකරු ය. බලසම්පන්න සහ දයානුකම්පිත ය. ඔහුට සුන්දර නම් සහ උසස් ගති ලක්ෂණ ඇත. අඩුපාඩුවක් නොමැති පරිපූර්ණත්වයේ ගති ලක්ෂණ ඔහු සතුව ඇත. උත්තරීතර අල්ලාහ් ඔහු සෑම දෙයක්ම සහ සියලු නිර්මාණ මැවූ සේ ම මුළු විශ්වයේ නිර්මාපකයා ද ඔහු ය.

## අල්ලාහ්ට පෙර සිටියේ කවුරුද?

එය "දෙවියන්ව නිර්මාණය කළේ කවුරුද" යන්නට සමාන ප්‍රශ්නයකි. මෙය ද වැරදි ප්‍රශ්නයකි. සර්වබලධාරී දෙවිඳුන් යනු පළමු වැන්නාය. ඔහුට පෙර කිසිවක් නැත. ඔහු අවසානයාය. ඔහුට පසු කිසිවක් නැත. ඔහු මෙසේ පවසයි: ඔහු ප්‍රාරම්භකයාය. අවසානයාය. විද්‍යාමානයාය (අදෘෂ්‍යමාන) අභ්‍යන්තරයාය. තවද ඔහු සියලු දෑ පිළිබඳ සර්ව ඥානීය. (57:3) කාලය යනු ස්ථානයක් හා සමාන ය. එය වෙනත් නිර්මාණ මෙන් දෙවියන්ගේ නිර්මාණ අතුරින් එකකි. නිර්මාණයට ලක් වූ කිසිවක් කිසිදා සිය නිර්මාණකරුව ග්‍රහණය නොකරයි. පරිපූර්ණත්වයේ හා අලංකාරයේ සියලු ගතිලක්ෂණ දෙවිඳුන් සතුය. මෙහිදී අපි නබිතුමාගේ උපදෙස් වලට අවධානය යොමු කළ යුතුය. අබූ හුරෙයිරා ඌ තුමාණන් මෙසේ පැවසූහ: "ෂෙයිතාන් ඔබගෙන් කෙනෙකු වෙතට පැමිණ එය නිර්මාණය කළේ කවුරුද? මෙය නිර්මාණය කළේ කවුරුද ? ඔබේ පරමාධිපති ව නිර්මාණය කළේ කවුරුද? කියා අසන තුරු නොයකුත් අයුරින් ප්‍රශ්න කිරීමට පොළඹවමින් සිටී. එබැවින් ඔහු එවැනි ප්‍රශ්නයක් ඇති කළේ නම් එවිට අල්ලාහ්ගෙන් සරණ පතා එවැනි සිතුවිලි අත්හැරිය යුතු බව නබිබ තුමාණන් පැවසූහ. (මූලාශ්‍රය: බුහාරි හදීස් අංක 3276) මෙවැනි අවස්ථාවන්හි දී දෙවියන්ගේ ඊරෙකවරණය පැතීම සහ දරුවාගේ චින්තනය වෙනත් ප්‍රශ්නයක් වෙත වක්‍ර ආකාරයකින් යොමු කිරීම වැඩිහිටියන් විසින් සිදු කළ යුතුයි. මන්ද ඒ ප්‍රශ්නයත් සමඟ වෙනත් එවැනිම ප්‍රශ්න මතුවටත් නොඇසීම සඳහා ය. මෙය ද යම් අයුරින් වැදගත් පිළිතුරු ක්‍රමයකි. ඔහුගේ චින්තනය වෙනතකට යොමු කිරීම පිළිතුරක් නොමැති නිසා නොවේ. එය අනවශ්‍ය සැකයේ දොරවල් වසා දැමීම සඳහා පමණි.

## අල්ලාහ් ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් ද?

අල්ලාහ්ගේ සැබෑ ස්වරූපය ගැන සිතීමෙන් දරුවාගේ මනස වෙනතකට හරවා ප්‍රයෝජනවත් වන දෑ කෙරෙහි සිතීම වෙත ඔහුට මග පෙන්විය යුතුය. ස්ත්‍රී පුරුෂ බේදය වනාහි නිර්මාණයට ලක් වූ ජීවීන් තුළ ඇති විශේෂණයකි. එය නිර්මාණකරුට අදාළ නොවේ. ස්ත්‍රී පුරුෂ බේදය දෙවිඳුන් ඔහුගේ මැවිල්ලට කළ උපහාරයක් බව මෙසේ පවසයි: තවද ඔහු පිරිමි සහ ගැහැණු යන දෙපක්ෂයම නිර්මාණය කළේය. (53:45) සර්වබලධාරී දෙවිඳුන් එම වර්ගීකරණයට වඩා ඉහළින් සිටී. දේවදූතයන් වැනි වර්ගීකරණයට යටත් නොවන වෙනත් ජීවීන් පවා සිටී. අහස ල වලාකුළු ල වාතය සහ ජලය පවා ස්ත්‍රී පුරුෂ බේදයට ඇතුළත් නොවේ. දුර්වලකමින් වටව සිටින එවැනි නිර්මාණයට ලක් වූ ජීවීන් ම එම වර්ගීකරණයට ඇතුළු නොවන්නේ නම්, දුර්වලකමින් මිදුණු සර්වබලධාරී අල්ලාහ්ට ද එය සුදුසු නොවේ. ( ඔහු හා සමාන කිසිවක් නැත.ඔහු සවන් දෙන්නා ය. දකින්නා ය.) (42:11)

## අල්ලාහ්ගේ පැවැත්ම ගැන අප විශ්වාස කරන්නේ ඇයි? ඔහුගේ පැවැත්මට සාධක මොනවා ද?

දෙවිඳුන් කෙරෙහි විශ්වාස කිරීම යනු කිසිවෙකුටත් ප්‍රතික්ෂේප කළ නොහැකි මානවයාගේ සහජ විශ්වාසයක් වන අතර දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ සාක්ෂි අධික ලෙස දක්නට ඇත. අදටත් ඒ සඳහා සාක්ෂි මිනිසුන් විසින් - ඔවුනොවුන්ගේ විශේෂත්වය සහ ක්ෂේත්‍රයට අනුව - එකිනෙක සොයා ගනිමින් සිටී. මිනිස් ආත්මය තුළ අන්තර්ගත සහජ විශ්වාසය දෙවියන්ගේ පැවැත්ම සනාථ කරයි. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි : මිනිසා ඒ මත මැවූ අල්ලාහ්ගේ ස්වභාවධර්මයයි.(30:30) දෙවියන්ගේ ශ්‍රේෂ්ඨත්වය, බලය සහ රැකවරණය ගැන පවසන අභ්‍යන්තර බලයක් අප සෑම කෙනෙකු සතුව ම ඇත. මෙම විශ්වයේ මනාව සකස් කරන ලද සියුම් පද්ධතියක් පවතින බව විද්‍යාත්මක සාක්ෂි මගින් සනාථ වේ. මෙම සියුම් පද්ධතියට මැවුම්කරුවෙකු සිටීම අවශ්‍ය වේ. නැතහොත් මේ සියලු ජීවීන් බිහි කළේ කවුරුද? ඔවුන් කිසිම හේතුවක් නොමැති ව අහම්බෙන් බිහි වී තිබෙන්නට පුළුවන. එසේ වූයේ නම් සියලු දේ කෙසේ බිහි වී ද යන්න පිළිබඳ කිසිවෙකුත් හඳුනා නොගනු ඇත. මෙය විශ්වාස කළ නොහැකි නිගමනයකි. මෙම සංකල්පයෙහි දෙවන නිගමනයක් නම්, ඒවා තමන්ව ම නිර්මාණය කර වර්ධනය කර ගැනීම. තුන්වන නිග මනයක් ද ඇත. එය නම්: මැවුම්කරුවෙකු සිට ඔවුන් සියල්ල නිර්මාණය කිරීම. මෙම නිගමනයන් තුන විශ්ලේෂණය කිරීමේ දී, පළමු හා දෙවන ඒවා සිදු විය නොහැකි බවත් තුන්වෙනි නිගමනය නිවැරදි හා පැහැදිලි බවත් අපට පෙනී යයි. එනම් මෙම පද්ධතිය සඳහා මැවුම්කරුවෙකු සිටිය යුතු බව මෙයින් සනාථ වේ. අල්කුර්ආනයෙහි දෙවිඳුන් සඳහන් කළේ ද එයයි. එය මෙසේය: එසේ නැතහොත් කිසිවක් නොමැති ව ඔවුන් මවනු ලැබුවෝ ද? එසේ නැතහොත් මවන්නෝ ඔවුහු ද? එසේ නැතහොත් ඔවුහු අහස් හා මහපොළොව මැව්වෝද? එසේ නොව ඔවුහු විශ්වාස නොකරති. (52: 35-36) එසේම,දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ අවබෝධ කළ හැකි දැනෙන සාක්ෂි නම්:

- අල්ලාහ් අපගේ ආයාචනාවන් පිළිගෙන එයට පිළිතුරු දීම.

- අහස් හා පොළොව පරිපූර්ණයෙන් නිර්මාණය කිරීම. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: නියත වශයෙන් ම අහස් හා මහපොළොව මැවීමෙහි ද රාත්‍රිය හා දහවල මාරු වීමෙහි ද බුද්ධිමත් අයට පැහැදිලි සාධක ඇත. (2:190)

• මිනිසා පරිපූර්ණයෙන් නිර්මාණය කිරීම. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයිඃ තවද නුඹලා තුළ ද (සංඥාවන් ඇත) එහෙයින් නුඹලා අවධානයෙන් නොබලන්නෙහු ද?- (51:21)

• තාරකා, කඳු, සතුන් යනාදිය පරිපූර්ණයෙන් නිර්මාණය කිරීම.

මේ සියල්ල මැවුම්කරුගේ නිර්මාණශීලත්වය පිළිබිඹු කරයි. අල්ලාහ්ගේ සංඥාවන් ආත්මවල සහ භෞතික වස්තූන් මෙන් ම ක්ෂිතිජයේ ද ව්‍යාප්ත ව ඇත. ඒවා සියල්ල ම හවුල්කරුවෙකු නොමැති එකම මැවුම්කරු වූ දෙවියන්ගේ පැවැත්ම පෙන්නුම් කරයි. එපමණක් නොව, එවැනි නිර්මාණයන්ගේ පැවැත්මට ද අරමුණක් හා ඉලක්කයක් තිබිය යුතුය. ඒ අනුව ඒවා සියල්ලෝ ම හවුල්කරුවෙකු නොමැති එකම මැවුම්කරු වූ අල්ලාහ්ට නමස්කාර කරති. අබූ හනීෆා තුමාගෙන් යම් පාර්ශ්වයක් දෙවියන්ගේ පැවැත්ම ඔප්පු කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාව උදාහරණයට ගනිමින් දරුවන් වෙත අපට ඉදිරිපත් කළ හැක.

එතුමාණන් මෙසේ පැවසීයඃ මෙම මාතෘකාව පිළිබඳ කතා කිරීමට පෙර මා හට මේ දේ පිළිබඳ පවසා සිටින්න. එනම් (දෙජ්ලා නම් වූ නදියෙහි නැවක්) නැවියෙකු හෝ වෙනත් ආධාරයක් නොමැති ව - ආහාර සහ බඩු රැගෙන ස්වයංක්‍රීයව පැමිණ ස්වයංක්‍රීයව නැංගුරම් ලා ස්වයංක්‍රීයව එහි බඩු භාණ්ඩ බහාලා ස්වයංක්‍රීයව නැවත පැමිණෙයි. එවිට එකී පාර්ශ්වය "එය කිසිසේත් සිදු විය නොහැක්කකි" යැයි පැවසූහ. - අබූ හනීෆා තුමාණන් පිළිතුරු දෙමින් - හුදු නැවක් විෂයෙහි එය විය නොහැක්කක් නම්, අහස් හා පොළොව ඇතුළු මුළු විශ්වය විෂයෙහි පමණක් හැකි වන්නේ කෙසේ ද? යැයි ප්‍රකාශ කළහ. සර්වබලධාරී, සියල්ල දන්නා මැවුම්කරුවෙකු නොමැති ව එවැනි සම්පූර්ණ නිර්මාණයක් බිහි විය නොහැක.

**දරුවාගෙන් මේ අයුරින් ද ඇසිය හැකඃ**

• ඔබට කුසගින්න ඇති වූ විට, එම කුසගින්න නිවීම සඳහා ඔබ ස්වයංක්‍රීය ව ආහාර සොයන්නේ නැති ද?

• ඔබට පිපාසය ඇති වූ විට, ඔබේ පිපාසය සංසිඳුවා ගැනීම සඳහා ඔබ යමක් සොයන්නේ නැති ද?

• ඔබට සුවඳක් දැනෙන විට, ඔබට සතුටක් දැනෙන්නේ නැති ද? ඊට පටහැනිව දුර්ගන්ධයක් දැනෙන විට අසතුටක් දැනෙන්නේ නැති ද?

• අප වටා ඇති මල්, රෝස මල්, අහස සහ ස්වභාවය දෙස බලන විට...ඔබට සතුටක් දැනෙන්නේ නැති ද?

එසේම, මාගේ ආදරණීය පුතුණේ! අපට ආරක්ෂිත සහ සන්සුන් බවක් දැනීම සඳහා අවශ්‍ය අවස්ථාවක රැකවරණය පතා නැඹුරු වීමට ශ්‍රේෂ්ඨ දෙවියෙකුගේ අවශ්‍යතාවය  අපට ස්වයංක්‍රීයව දැනේ. අපට දුකක් හා මානසික පීඩනයක් දැනෙන විට, අපි වහාම දෙවිඳුන් වෙතට ගොස් ඔහුගෙන් ආයාචනා කරන්නෙමු. අපට සතුටක් දැනෙන විට, අපි ඒ වෙනුවෙන් ඔහුට ප්‍රශංසා කරන්නෙමු.

## අල්ලාහ් අප මෙන් සවන් දෙන්නේ ද? දකින්නේ ද? කතා කරන්නේ ද?

සැබැවින් ම, අල්ලාහ් කතා කරන්නේ ය. සවන් දෙන්නේ ය. දකින්නේ ය. ඔහු මෙසේ පවසයිඃ තවද අල්ලාහ් නුඹලා දෙදෙනාගේ කතාවට ද සවන් දෙයි.  නියත වශයෙන් ම අල්ලාහ් සර්ව ශ්‍රාවකය, සර්ව නිරීක්ෂකය. (58: 1) තවද ඔහු මෙසේ පවසයි :නුඹලා දෙදෙනා බිය නොවනු. නියත වශයෙන් ම මම නුඹලා දෙදෙනා සමග සිට සවන් දෙමි. තවද සියල්ල දකිමි.(20:46) තවද ඔහු මෙසේ පවසයිඃ නියත වශයෙන් ම

ඔහු නුඹලා කරන දෑ පිළිබඳ ව සර්ව නිරීක්ෂකය. (11:112) කෙසේ වෙතත්, ඒවා අපගේ කතාව, සවන් දීම සහ දැකීම හා සමාන නොවේ. අල්ලාහ් ඔහුගේ මැවිල්ලට වඩා වෙනස් ය. ඔහු කොතරම් අදෘශ්‍යමාන ව සිටියත් ඔහු සවන් දෙයි. ඔහු කොතරම් දුරින් සිටියත් ඔහු සියලු දේ දකී. ඔහු සියල්ල සවන් දෙයි, දකී. එහෙත්, ඔහුගේ ශ්‍රවණය හා දැක්ම ඌණතාවයෙන් හා දුර්වලතාවයෙන් මවනු ලැබූ දෑහි ශ්‍රවණයට හා දැක්මට සමාන නොවේ. අල්ලාහ් අසමසම ය. ඔහු මෙසේ පවසයිඃ ඔහු හා සමාන කිසිවක් නැත, ඔහු සවන් දෙන්නා ය, දකින්නා ය. (42:11) එහෙයින්. දෙවිඳුන් සියල්ලට ම ඇහුම්කන් දෙන සහ සියල්ල දකින කෙනෙකු නම්, ඔහු තෘප්තියට පත් නොවන යමක් කීම හෝ ඔහු පිළිනොගන්නා තත්ත්වයක ඔහු අපිව දැකීම සුදුසු ද? යන ආකාරයෙන් සෘජු ක්‍රියාවක් සමඟ සම්බන්ධ කර දරුවාට පැහැදිලි කර දීම ඉතා වැදගත් ය.





## ? අල්ලාහ් අප මෙන් කුසගින්නෙන් හා පිපාසයෙන් පෙළෙනවාද?

සර්වබලධාරී අල්ලාහ් කිසිදු අඩුපාඩුවක් නොමැති පරිපූර්ණත්වයේ ගති ලක්ෂණ වලින් පිරිපුන් කෙනෙකි. කුසගින්න සහ පිපාසය දුර්වලකමේ අංගයන් ය. අප දුර්වලකම දෙවියන්ට ආරෝපණය නොකළ යුතුය. එමනිසා, දෙවියන්ට ආහාර ගැනීම හෝ පානය කිරීම හෝ අවශ්‍ය නොවේ. මන්ද සියල්ලෙහි මැවුම්කරු වන අල්ලාහ්ට කිසිවක් අවශ්‍ය නැත. ඔහුට කවදා හෝ යමක් අවශ්‍ය වන්නේ නම්, ඔහු දෙවියෙකු නොවනු ඇත. අල්ලාහ් අවශ්‍යතා වලින් තොර ය. ආහාරයක් වෙත හෝ පානයක් වෙත ඔහුට අවශ්‍යතාවයක් ඇති වන්නේ නැත. ඒ සියලු අවශ්‍යතාවයෙන් ඔහු තොර ය. එපමණක් නොව, සෑම නිර්මාණයක් ම ඔවුන්ව නඩත්තු කිරීමට, පෝෂණය කිරීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට ඔහුගෙන් ම ආයාචනා කරති.

නිර්මාණයන් හා නිර්මාපකයා අතර සැසඳීම කිසිසේත් නොකළ යුතු බව දරුවාට කියා දිය යුතුයි. අප විසින් නිපදවන සෑම දෙයකට ම අපගේ ම ගති ලක්ෂණ හා ආකෘතීන් තිබිය යුතු නොවේ. ඒ අයුරින් ම අප නිර්මාණය කළ අල්ලාහ්ට ද අප මෙන් ගති ලක්ෂණ හා ආකෘතීන් තිබිය යුතු නොවේ. එහෙයින් දෙවියන්ට කුසගින්න සහ පිපාසය ඇති නොවේ. මා ඔබෙන් ප්‍රශ්නයක් අසන්නම්: බයිසිකලය නිෂ්පාදනය කළේ කවුරුද?- එය නිෂ්පාදනය කළේ බයිසිකල් සාදන්නා බව දරුවා පිළිතුරු දෙනු ඇත.-විශිෂ්ටයි. පුතුණේ! - නිදසුනක් වශයෙන් - බයිසිකලය කතා කර එහි නිෂ්පාදකයාගෙන්: ඔබ ආහාරයට ගත්තේ කුමක්ද? ඔබ පානය කරන්නේ කුමක් ද? යනුවෙන් ඇසුවේ නම් ඔබ එයට කුමන අයුරින් ප්‍රතිචාර දක්වන්නේ ද?- එය ඔබේ කර්තව්‍ය නොවේ. එවැනි දෙයක් දැන ගැනීමෙන් ඔබට ලැබෙන්නේ කුමක්ද?අඩුපාඩු නොමැතිව වේගයෙන් ගමන් කිරීම වන ඔබේ ප්‍රධාන මෙහෙවරට ලැබෙන පිළිතුරෙන් ලැබෙන ප්‍රයෝජනය කුමක්ද? යනුවෙන් අසමි යැයි දරුවා පිළිතුරු දෙයි. - විශිෂ්ටයි. මේ අයුරිනි මාගේ පුතුණේ! දෙවිඳුන් අපව මවා ඇත්තේ එක්තරා කර්තව්‍යයක් සඳහා ය. ඒ බව මෙසේ ඔහු පවසයි: තවද ජින් වර්ගයා හා මානව වර්ගයා වන ඔවුන් මට ගැතිකම් කිරීමට මිස මම නොමැව්වෙමි.(51:56) එබැවින් අල්ලාහ්ගේ කුසගින්න හෝ පිපිසාය වැනි ප්‍රශ්න එම කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා අපට ප්‍රයෝජනවත් හෝ උපකාරී නොවේ. ඊට පටහැනිව, එය අපගේ මනස කඩාකප්පල් කරන දේවල් වෙත යොමු කරයි. බයිසිකලය අප වෙත යොමු වන්නේ කවදාද? එය කැඩී ගිය විට, එය සවි කිරීම සඳහා එහි නිෂ්පාදකයා වෙත යොමු වේ. එසේ නොවේ ද? අපගේ වන්දනාමානයෙහි අප දුර්වල වූ විට හෝ අපට යම් අයහපතක් සිදු වූ විට හෝ අපි යාච්ඥාවන් සහ අයැදීම් මගින් අල්ලාහ්ගෙන් රැකවරණය පතන්නේ එබැවින් බව අප දරුවාට පැහැදිලි කළ යුතුයි.

## ? අල්ලාහ්ගේ බලය කොතරම් ශ්‍රේෂ්ඨද?

සීමිත බලයක් හෝ හැකියාවක් ගැන අපි කතා කරන්නේ නම්, එයින් අදහස් වන්නේ අපි කතා කරනුයේ දුර්වලකම්හි ගති ලක්ෂණයක් පිළිබඳව යි. බලයේ අවසානය යන්නෙන් අදහස් කරන්නේ දුර්වලතාවයේ ආරම්භයයි. දුර්වලකම යනු සර්වබලධාරී දෙවියන්ගේ ගති ලක්ෂණයක් නොවේ. එමනිසා, දෙවියන්ගේ හැකියාව අසීමිතය. කිසිවක් මගින් ඔහුව දුර්වල කළ නොහැක. ඒ බව මෙසේ පවසයි: නියත වශයෙන් ම අල්ලාහ් සියලු දෑ කෙරෙහි අති බලසම්පන්න ය. (2:106) ඔහු යමක් අභිමත කළේ නම් "වනු" යනුවෙන් පවසයි. එය එසේම සිදු වනු ඇත. දෙවිඳුන් සෑම දෙයක් කෙරෙහි ම හැකියාවක් ඇත්තෙකි. මන්ද ඔහු සියල්ලේ මැවුම්කරුය. අහසේ හෝ පොළවේ කිසිවක් හෝ කිසිවෙක් ඔහුව දුර්වල නොකරයි. සීමිත හැකියාව යනු මැවීම්වලට අයත් වේ. මන්ද එම හැකියාව ද නිර්මාණයට ලක් වූ දෙයකි. ඊට පටහැනිව, මැවුම්කරුගේ

හැකියාව සීමාවන් හෝ දුර්වලතා නොමැතිව පවතින්නකි. නැමදුම, ආයාචනාවන් සහ අයැදීම් කිරීමට සුදුසු තැනැත්තා අල්ලාහ් පමණක් වන්නේ එබැවිනි. නිර්මාණයන්හි අවශ්‍යතාවන් සපුරාලීම, ඔවුනට පෝෂණය ලබා දීම, ඔවුන්ගේ අපේක්ෂාවන් තහවුරු කිරීම, ඔවුන්ගේ ගැටළු පරිපාලනය කිරීමේ හැකියාව ඇති එකම තැනැත්තා ඒකීය අල්ලාහ් වන ඔහුම ය.

## අල්ලාහ් සිටින්නේ කොහෙද? ඔහු කොතරම් විශාලද?

දරුවා තමාව නිර්මාණය කළ තැනැත්තා අල්ලාහ් බවත්, ඔහු දරුවන්ට බොහෝ සේ ආදරය කරන බවත්, ඔහුට බොහෝ ආශිර්වාද ලබා දී ඇති බවත් තේරුම් ගත් පසු, දෙවිඳුන් - ඔහු පැවසූ පරිදි ඔහුට සුදුසු අයුරින් - අහසෙහි සිටින බව පැහැදිලි කළ හැකිය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: අහසේ සිටින්නා.(67-16) සර්වබලධාරියාණන් අහසෙහි සිටින නමුත් ඔහු පැවසූ පරිදි ඔහුගේ දැනුම සෑම තැනක ම තිබේ. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: ඔබ කොතැනක සිටියත් ඔහු ඔබ සමඟ සිටී. (57:4) මෙම වැකියෙන් අදහස් කරන්නේ දෙවිඳුන් සෑම තැනක ම සිටින බව නොවේ. එක් තැනක සිට එනම් අහසෙහි සිට සියල්ල ග්‍රහණය කරන බව මෙයින් අදහස් වේ. නබි ﷺ තුමාණන් කාන්තාවකගෙන් "අල්ලාහ් සිටින්නේ කොහේද' යැයි ඇසූ විට, ඔහු අහසෙහි' යැයි ඇය පැවසුවාය. මා කවුරුද? යනුවෙන් ඇසූ විට ඇය , ඔබ අල්ලාහ්ගේ දූතයා' යනුවෙන් පැවසුවා ය. ඇය නිදහස් කරන්න. මන්ද ඇය විශ්වාසවන්ත කාන්තාවක්' යැයි නබි තුමාණන් පැවසූහ. ඒ අනුව අපි සියලු දෙනා නබි තුමාගේ ජීවන මගෙහි සඳහන් දේ සමඟ බැඳී සිටින්නෙමු. ඔහු අහසේ සිටියත්, සෑම තැනක ම අපව දැකීමට සහ ඇසීමට ඔහුට හැකිය. දෙවිඳුන් සදා නිරීක්ෂණය කරන බව දරුවාට අවවාද කරමින් සිටීම දරුවා තුළ අභ්‍යන්තර බාධකයක් මතු කර ස්වයං වාරණයක් ඇති කරයි. ඔහුගේ විශාලත්වය ගත් කල, සර්වබලධාරී දෙවිඳුන් ඔහුගේ කිසිම මැවිල්ලක් සමඟ සසැඳිය නොහැක. අල්ලාහ් සියල්ලට ම වඩා උසස් ය. අල්ලාහ් සිය සියලු මැවිලිවලට වඩා විශාලය. ඔවුන් (ජීවීන්) ශ්‍රේෂ්ඨ නම්, ඔවුන්ගේ මැවුම්කරු ඊට ඉහළින් අති ශ්‍රේෂ්ඨ ය. කඳු සුන්විසුනු කර, සාගර චලනය කර, ජලය පොළොවට ගිලෙන ලෙස අණ කරන්නේ ඔහු ය. ඔහුගේ නියෝගය හා අභිමතය නොමැති ව විශ්වයේ කිසිවක් සිදු නොවේ. නිර්මාණකරු කිසිදා නිර්මාණයන් කෙරෙහි අවශ්‍ය නොවන්නේය. අහස ඔහුගේ එක් නිර්මාණයක් වන අතර ඔහුගේ පැවැත්ම ඒ මත රඳා නොපවතී. ඔහුට ඒවා අවශ්‍ය නැත. ඔහු සියලු අවශ්‍යතාවයන්ගෙන් තොර ය.

## අල්ලාහ්ව අපි නොදකින අතරතුර අල්ලාහ් අපව දකින්නේ කෙසේද?

අල්ලාහ් විසින් අපට ලබා දී ඇති දෘශ්‍ය හැඟීම සීමිත වන අතර එයට බොහෝ දේ දැකීමට නොහැක. මිනිසුන් - ඉතා කුඩා වස්තූන් නැරඹීම සඳහා භාවිතා කරන - දෘශ්‍ය උපකරණ සහ විශාල මෙවලම් භාවිතා කරන්නේ එබැවිනි. මිනිසාට නිර්මාණයට ලක් වූ ඇතැම් දෑ දැකිය නොහැකි නම් - තර්කානුකූලව - ඔහුට නිර්මාණකරු වූ සර්වබලධාරී දෙවියන්ව ද දැකිය නොහැකි වනු ඇත. මිනිසාට මෙලොවෙහි ඇති ඔහුගේ හැකියාවන් හරහා දෙවියන්ව දැක ගැනමට නොහැකි ය. අපට ඔහුව දැකිය නොහැක. නමුත් අපි ඔහු කෙරෙහි විශ්වාස කරමු. ඔහු දයානුකම්පිත ය. ඔහු අපව ප්‍රිය කරන්නේය. ඔහු බලවත් ය. සියල්ල කෙරෙහි හැකියාවක් ඇත්තා ය. සියල්ල දන්නා ය. ඒ බව අපි විශ්වාස කරමු. අපි දැන් ඔහු ගැන ම කතා කරමින් සිටින බව ද ඔහු දැනුවත් ය. දෙවිඳුන් අපට වඩා උසස් ය. එමනිසා, ඔහු අප සියල්ලන් ම එකවරම දකී. කෙනෙකු ගොඩනැගිල්ලක වහලයක් උඩ නැගී සිටියේ නම් මගතොටෙහි ගමන් කරන මගීන් දකී. එනමුත් මගීන් ඔහුව නොදකී. ඒ අයුරින් ම අල්ලාහ් අප සෑම ව දකින අතර ඔහු අපට නොපෙනේ. සාමාන්‍යයෙන්

පැවැත්මෙහි තිබුණ ද අපට දැකිය නොහැකි බොහෝ දෑ තිබේ. මේ අයුරින් පැහැදිලි කර දී අපි දරුවාට මෙසේ පැවසිය යුතුය: අපේ දෑස් හරහා සියල්ල දැක ගැනීමට නොහැක. අපට කටහඬ නොපෙනේ. නමුත් අපට ඒවා ඇසේ. වාතය අපට නොපෙනේ. නමුත් අපට එය දැනේ. ඒ අයුරින් අපගේ දෑස්වලට මේ ජීවිතයේ සර්වබලධාරී දෙවිඳුන් ව දැකිය නොහැක. කෙසේ වෙතත්, ස්වර්ගයෙහි අපට සර්වබලධාරී අල්ලාහ් ව - ඔහුගේ අවසරයෙන් - දකින්නට තරම් ශක්තිමත් දෑස් අපට ලැබෙනු ඇත. එහෙයින් : කිසිදු දෘෂ්ටීන් ඔහුට ළඟා විය නොහැක. නමුත් ඔහු සියලු දෘෂ්ටීන් ග්‍රහණය කර සිටී. තවද ඔහු සියුම් ඥානීය. සර්ව ප්‍රඥාවන්තය. (6: 103)

## මිනිසුන් අධික ප්‍රමාණයක් සිටින බැවින් අල්ලාහ් ඔවුන් සියල්ල එකවර දකින්නේ කෙසේද?

එම ප්‍රශ්නයට ප්‍රායෝගිකව පිළිතුරු සැපයීම සඳහා, දරුවා පාරට ගෙන ගොස් අපට මෙසේ ප්‍රශ්න කළ හැකිය. එහි ගමන් කරන මිනිසුන් ගණන් කර ඔවුන්ගේ ගණන පවසන්න. අපි ද ඔබ සමග ගණන් කළ යුතුයි. ඉන්පසු, ඔහුව ගොඩනැගිල්ලක දෙවන මහලට ගෙන ගොස්, ඔහු දකින අය දෙස බලා ගණන් කරන්නට ඉඩ සැලසිය යුතුයි. ඉන්පසු අපි ඔහුව ගොඩනැගිල්ලෙහි ඉහළ මහලට ගෙන ගොස් ඔහුට දුරදක්නයක් ද ලබා දී ඔහු දකින අය ගණන් කරන ලෙස ඉල්ලා සිටිය යුතුයි. එමගින් ඔහුට මිනිසුන්ව වඩාත් පැහැදිලිව දැකීමට හැකි වන අතර ඔවුන්ව වඩාත් නිවැරදිව ගණන් කිරීමට ද හැකි වේ. මෙම උදාහරණයෙන්,අපගේ සීමිත මිනුම් හැකියාව සමග සියල්ල මැනිය යුතු නැති බව හා දෙවියන්ගේ හැකියාව මැවීම්හි හැකියාවට වඩා විශාල හා ශ්‍රේෂ්ඨ බව අපි ඔහුට පැහැදිලි කළ යුතුයි. අල්ලාහ් සියල්ල කෙරෙහි ශක්තිවන්තයාය. (2:106) යන වග අප ඔහුගේ මනසෙහි ගැඹුරු ලෙස සටහන් කළ යුතුයි.

වැඩිහිටි අපට දරුවාගෙන් මේ අයුරින් සංවේදී ප්‍රශ්නයක් ඇසිය හැකිය. කුහුඹුවෙකු සම්පූර්ණ වශයෙන් අපව දකින්නේ ද? නැතහොත් ඒ කුහුඹුවා අපව අවතාරයක් හෝ සෙවණැල්ලක් ලෙස දකින්නේ ද? කුහුඹුවාට පාදයක ඇඟිල්ලේ ඉතා කුඩා කොටසක් දැකිය හැකි බවත්, ඒ ඇඟිල්ල විශාල කන්දක් ලෙස ඒ කුහුඹුවාට දිස් විය හැකි බවත් ඔහු පිළිතුරු සපයයි. එසේ නම් "ඔබ අප සියල්ලන් ම එකවර දකින්නේ කෙසේද? යැයි කුහුඹුවාට ඔබෙන් විමසීමට අයිතියක් ඇතැයි ඔබ සිතනවාද? "එය ස්වාභාවික සාමාන්‍ය ප්‍රශ්නයකි යනුවෙන් ඔබේ පිළිතුර වනු ඇත. මෙම පිළිතුර දෙවිඳුන් ඔබට දුන් ඔබගේ හැකියාවන්ට ද ගැළපේ. කුහුඹුවන්ගේ හැකියාවන් සීමිත වන අතර එක් තැනක නොයෙකුත් පැතිවල කුහුඹුවන්ගේ වාසස්ථාන රාශියක් තිබුණ ද එම ස්ථාන සියල්ල ම එකවර දැකීමට ද ඔබට හැකි වේ. එහෙත්, - සීමිත හැකියාවන් ඇති - කුහුඹුවාට ඔබට මෙන් පෙනෙන්නේ නැත. ඒ අයුරින් ම කිසිවක් සර්වබලධාරී දෙවිඳුන් හා සමාන නොවන බවත්, ඔහු සෑම දෙයක් කෙරෙහි හැකියාව ඇත්තා බවත් අපි එකඟ වූ අයුරින්, අපගේ සීමිත හැකියාවන්ගෙන් දෙවියන්ට ආවේණික වූ හැකියාව ගැන විමසීම සුදුසු නොවේ. අල්ලාහ්ගේ හැකියාව සියලු ජීවීන්ගේ හැකියාවට වඩා විශාල හා ශ්‍රේෂ්ඨය. මන්ද (අල්ලාහ් සියල්ල කෙරෙහි ශක්තිවන්තයාය) (2:106)

## අල්ලාහ් අඳුරේ සිටින අයව දකිනවාද?

අපට හමුදා සොල්දාදුවන් රාත්‍රී ඇස් කණ්ණාඩි භාවිතා කරන වීඩියෝ දර්ශනයක් දරුවාට පෙන්විය හැකිය. අඳුරේ දකින සමහර සතුන් සහ පක්ෂීන්ගේ දර්ශන අපට ඔහුට පෙන්විය හැකිය. එසේම, ඔහු දකින සමහර වීඩියෝ වල සහ ඔහු ක්‍රීඩා කරන ක්‍රීඩා වල ලේසර් වැනි තරංග තිබේ - ඒවා පිටුපස ඇති දේ

හඳුනාගෙන අඳුරේ දැකීමට අපට ඉඩ සලසයි. ඉන් පසු, දරුවට මෙසේ අපට පැවසිය හැකිය: ඇතැම් අවස්ථාවන්හි දී සාමාන්‍ය මනුෂ්‍යයෙකු සහ සරල සත්වයකු අඳුරේ දකින්නේ කෙසේ දැයි ඔබ දුටුවාද? මිනිසා සහ එම සියලු නිර්මාණ මැවූ දෙවිඳුන් ගැන සිතන්න. එවැනි දේවල් නිර්මාණය කිරීමේ හැකියාව අපට ලබා දුන්නේ දෙවිඳුන් නම්, සර්වබලධාරියාණන් වූ ඔහුට එසේ කළ නොහැකිද? දෙවිඳුන් අති ශ්‍රේෂ්ඨ හා වඩා බලවත් ය. ඔහුගේ හැකියාවට කිසිදු සීමාවක් අවහිරයක් හෝ නැත.

## ගෙදර දොරවල් සහ ජනේල වසා තිබිය දී දෙවිඳුන් අපව දකින්නේ කෙසේද?

අපට වෛද්‍ය ස්කෑන් පරීක්ෂණයක පින්තූරයක් දරුවාට පෙන්විය හැකි අතර, දෙවිඳුන් විසින් මවන ලද මිනිසාට ම - එක්ස් කිරණ මගින් ස්කෑන් පරීක්ෂණයක් කර සමෙන් ආවරණය වූ ඇට දැකිය හැකි නම් මිනිසා මැවූ දෙවිඳුන් ගැන ඔබ කුමක් සිතන්නේ ද? එහෙයින් සියලු දොරවල් වසා දමා අප නිවසේ සිටින විට ද ඔහු අනිවාර්යයෙන් ම අපව දකී. නියත වශයෙන් ම දෙවිඳුන් හා සමාන කිසිවක් නැත. ඔහු ගොඩනැඟිලි මගින් දැක්ම අවහිර වන මිනිසුන් මෙන් නොවේ. මැවුම්කරු මැවිල්ලට සමාන වීමට කිසිම ක්‍රමයක් හෝ හේතුවක් නැත. මන්ද දෙවියන්ට සියල්ල කළ හැකි බැවිනි. මෙම පිළිතුර දරුවාගේ හැදියාව සමඟ සම්බන්ධ කිරීම සුදුසු ය. මෙමගින් දරුවන් තුළ බැතිමත්භාවය සහ අභ්‍යන්තර ආගමික රුචිය ස්ථිර කළ හැකිය.

## ඔහු අපේ සියලු ක්‍රියා පිළිබඳ දැනුවත් වන්නේ කෙසේද? ඔහු සියලු මිනිසුන් දෙස නිරීක්ෂණයෙන් බලා සිටින්නේ කෙසේද?

සුන්දරත්වයෙන් හා පරිපූර්ණත්වයෙන් සපිරි සියලු ගතිලක්ෂණ අල්ලාහ් සතුව ඇති බවත් අල්ලාහ්ගේ හැකියාව අසීමිත බවත් දරුවන් සැමදා දැන සිටිය යුතුය. ඔහු සර්වබලධාරී හා ශක්තිවන්තයා ය. ඔහු මෙසේ පවසා ඇත. (අල්ලාහ් සියල්ල කෙරෙහි ශක්තිවන්තයාය)(2:106) ඔහුගේ හැකියාව ශ්‍රේෂ්ඨ වූ හේතුවෙන්, අහසේ හා පොළොවේ ඔහුට නොහැකි කිසවක් නැත. නිර්මාණයට ලක් වූ දෑහි ශක්තිය කොතරම් වර්ධනය වුවත්, අල්ලාහ්ගේ හැකියාව ඒවායෙහි හැකියාවත් සමඟ සසැඳිය නොහැක. අල්ලාහ් ඊටත් වඩා ඉතා විශාලය.- පැහැදිලි කිරීමක් සඳහා - කැමරාවක් හරහා පටිගත කෙරෙන දෑ අපට උදාහරණයක් වශයෙන් ලබා දිය හැක. එම කැමරාව එහි කාචයට වදින ලොකු කුඩා සෑම විස්තරයක් ම පටිගත කර හඳුනාගැනීමට සමත් වේ නම් අල්ලාහ් හැකියාවෙන් උසස් ය. උසස් ආදර්ශයන් ඔහුට ම හිමි ය. ඔහුගේ හැකියාව අසීමිත බැවින් ඔහුට සියල්ලන් ව එකවර නැරඹිය හැකිය. සර්වබලධාරී අල්ලාහ් සෑම දෙයක් පිළිබඳව ම දන්නා අතර, ඔහුගේ දැනුම සර්ව සම්පූර්ණ ,සියල්ල හසු කර ගන්නා හා ඉතා පුළුල් ස්වභාවයකින් යුක්තකි.

දරුවාට තව උදාහරණයක් දිය හැකිය: එනම් විශාල සමාගමක් එයට තම සේවකයින් නැරඹීමට අවශ්‍ය යැයි උපකල්පනය කරමු. එම සමාගම ඔවුනට නොකියමින් නිරීක්ෂණ කැමරා සවි කර තබා සමාගමේ දෙපාර්තමේන්තු තුළ සිදුවන සෑම දෙයක්ම එකම වේලාවක පෙන්වන රූප සංදර්ශක (මොනිටර) හරහා සේවකයින් බැලීමට එම සමාගම පටන් ගත්තේය. දෙවිඳුන් විසින් මවන ලද දුර්වල දාසයාට - මිනිසාට - එවැනි දෙයක් කළ හැකි නම්, මැවුම්කරු වන අල්ලාහ්ට ඔහුගේ මැවිලි සියල්ල ම එකවර දැකිය නොහැකි වන්නේද?

## මිනිසා මිය යන්නේ ඇයි? සහ දෙවිඳුන් මිය නොයන්නේ ඇයි?

දෙවියන්ගේ සියලු මැවීම් සඳහා මරණය නියම වේ. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි : සෑම ආත්මයක් ම මරණය රස විඳිනු ඇත. පසුව ඔබ අප වෙත ආපසු එනු ඇත. (29:57) මිනිසාගේ මරණය මතුලොව ජීවිතයේ ආරම්භයයි. වඩාත් ම වැදගත් ජීවිතය එයයි.

මරණය දුර්වලකමේ සලකුණකි. එම මරණය නිර්මාණයට ලක් වූ ජීවිතයේ අවශ්‍යතාවයකි. දුර්වලකම කිසි විටෙකත් දෙවිඳුන් වෙලා ගන්නේ නැත. අල්ලාහ් නිර්මාණයට ලක් නොවූ අතර ඔහු කිසිදා මරණයට පත් වන්නේ ද නැත. නමුත් මිනිසා යනු නිර්මාණයට ලක් වූ අයෙකු අතර ඔහු මරණය රස විඳිනු ඇත. දෙවියන්ගේ ජීවය අපගේ ජීවයට සමාන වන්නේ නැත. අපේ ජීව මරණයෙන් අවසන් වේ. සෑම ජීවියෙකු ම නික්ම යා යුතු අතර අවසානයේ දී සර්වබලධාරී අල්ලාහ් හැර අන් කිසිවක් ඉතිරි නොවේ. දෙවියන්ගේ පරිපූර්ණ ජීවය වනාහි, පරිපූර්ණත්වයේ සියලු ගතිලක්ෂණ අනිවාර්ය කරන්නෙකි. කිසිදා මිය නොයන ජීවියා වීම ඉන් ඉතා වැදගත් ගතිලක්ෂණයකි.

## මා මෙන් දෙවිඳුන් ද මා හට ආදරෙයිද?


සර්වබලධාරී දෙවිඳුන් සමාව දෙන්නාය. දයාවන්ත ය. ඔහු කරුණාවන්ත, භක්තිමත් හා සත්‍යවාදීන් ප්‍රිය කරයි. ඔහු මෙසේ පවසයි: ඔහු ඔවුන්ට ප්‍රේම කරයි, ඔවුන් ඔහුට ප්‍රේම කරයි. (5:54) ගෞරවය කිරීම, රැකවරණය ලබා දීම, ඔවුන්ගේ ප්‍රශ්න විසඳීම, පෝෂණය කිරීම සහ ඔවුනට සමාව දීම යනාදිය දෙවිඳුන් තම සේවකයන්ට දක්වන ප්‍රේමයේ සංඥා අතරට එක් වේ. අප සෑම කෙනෙකුට ම දෙවියන්ගේ කරුණාව හා ත්‍යාගශීලිත්වය දැනේ. සලාතය සමඟ බැඳී සිටීම, දෙමාපියන්ට ගෞරව කිරීම, පුණ්‍ය කටයුතු සිදු කිරීම, මිනිසුන් කෙරෙහි ත්‍යාගශීලී වීම, අවංක වීම, අල්කුර්ආනය පාරායනය කිරීම, ආයාචනා සහ වෙනත් යහපත් ක්‍රියාවන් මගින් ඔහුගේ ප්‍රේමය සොයා ඔහු වෙත සමීප වීමට උත්සාහ කරන කීකරු සේවකයාට ඔහු ප්‍රේම කරයි. දෙවියන්ගේ ප්‍රේමය ලබා ග උනීමට නම් මේ සියල්ල සිදු කළ යුතුය.





# සුර දූතයන් පිළිබඳ

# ප්‍රශ්න



## සුර දූතයන් යනු කවුරුන්ද? ඔවුන්ගේ හැඩය කෙසේද?

ඔවුන් අල්ලාහ්ගේ නිර්මාණයන් අතුරින් එක් නිර්මාණයක් වන අතර ඔවුන් ආලෝකයෙන් නිර්මාණය කර නිම කොට ඇත. දෙවිඳුන් ඔවුන්ව මනුෂ්‍යයන් මැවීමට පෙර ම මවා ඇත. ඔවුනට අභිමතයක්, මනසක් මෙන් ම පියාපත් ද ඇත. ඔවුන්ගේ ස්වරූපය ද ඉතා අලංකාර ය. ඔවුනට මිනිස් ස්වරූපයෙන් වෙස් මාරුවීමට ද හැක. ඔවුන් ආහාරපාන ගන්නේ නැත. ඔවුනට අණ කළ දේ පමණක් සිදු කරන අල්ලාහ්ගේ සේවකයෝ ය. ඔවුන් විවිධ තරාතිරම් ඇති අයවලුන් වෙති. ඔවුන් අතුරින් වඩා උතුම් වන්නේ ජිබ්රීල් عليه السلام තුමාණන් වන අතර, දිව්‍යමය එළිදරව්ව ධර්ම දූතයින් වෙත දැන්වීමේ වගකීම ඔහුට පැවරී ඇත. මීකාඊල්, ඉස්‍රාෆීල් عليهما السلام සහ වෙනත් නම් ලත් අය සිටිති. ඔවුන්ගෙන් සමහරුන් ආරක්ෂකයින් වේ. සෑම විට ම දාසයින් ආරක්ෂා කිරීම ඔවුන්ගේ වගකීමයි. ඔවුන් විශාල සංඛ්‍යාවක් සිටින අතර, සෑම සුර දූතයෙකුට ම විශේෂ මෙහෙවරක් ඇත.

## සුර දූතයන්ගේ නම් මොනවාද?

සුර දූතයන් අධික සංඛ්‍යාවක් සිටිති. ඔවුන්ගේ සංඛ්‍යාව හා ප්‍රමාණය පිළිබඳ දැනුම ඇත්තේ අල්ලාහ්ට පමණි. ඔවුන්ගේ නම් අතර: ජිබ්රීල් මීකාඊල්, ඉස්‍රාෆීල්, රිළ්වාන්, මාලික් عليهم السلام සිංහාසනය උසුලන්නන් සහ ක්‍රියාවන් ලියා ආරක්ෂා කරන්නන් සහ වෙනත් අය ද සිටිති.

## අල්ලාහ් ඔවුන්ව නිර්මාණය කළේ කුමක් සඳහා ද?

යහපත් දෑ සිදු කිරීම පිණිස සර්වබලධාරී දෙවිඳුන් සුර දූතයන් මවා ඇත. ඔවුන් පිරිසිදු ය. ඔවුන් කිසි විටෙකත් නපුරක් කරන්නේ නැත. ඔවුන් නපුරක් වෙත ළං වන්නේ ද නැත. ආරම්භයේ දී සුර දූතයන්ගේ වාසස්ථානය වූයේ අහස ය. කෙසේ වෙතත්, මිනිසා පොළොවට බැස යාමෙන් ඔවුන් ව ආරක්ෂා කිරීම, රැ කබලා ගැනීම, නිරීක්ෂණය කිරීම, දැන්වීම, උපකාර කිරීම, පාපොච්චාරණය කිරීම, ආගමික සැසිවාරවලට සහභාගී වීම වැනි දෙවිඳුන් ඔවුන්ට අණ කළ ඇතැම් කාර්යයන් කිරීම සඳහා සුර දූතයන්ට ද අහසින් බැසීමට අවශ්‍ය විය. සුර දූතයන් කෙරෙහි ප්‍රධාන මෙහෙවර දෙකක් තිබෙන බව අප දරුවාට දැන්විය යුතුයි. ඒවා නම්: සර්වබලධාරී දෙවියන්ට නමස්කාර කිරීම සහ විශ්වය පරිපාලනය කිරීම ය.

## අපට සුර දූතයන් දැක ගත නොහැක්කේ කුමක් නිසාද?

දෙවිඳුන් නිර්මාණය කළ ස්වරූපයෙන් ම සුර දූතයන්ව දැකීමේ හැකියාව මිනිසුන්ට නැත. ඇතැම් අවස්ථාවන් වලදී, දේවදූතයන් මිනිසුන්ගේ ස්වරූපයෙන් වෙස් වලා ගනී. එවිට මිනිසුන්ට ඔවුන්ව දැක බලා ගැනීමට හැකි වේ. ඉස්ලාම් දහමෙහි කුලුණු පිළිබඳ සඳහන් නබි වදනෙහි ජිබ්රීල් عليه السلام ගම්බද අරාබිවරයකුගේ ස්වරූපයෙන් පැමිණීම මෙයට කදිම උදාහරණයකි.

## ජින් යනු කවුරුන් ද?

ඔවුන් ද අල්ලාහ්ගේ මැවිල්ලකි. අල්ලාහ් ඔවුන් ව ගින්නෙන් නිර්මාණය කර නිම කොට ඇත. අණට කීකරු වී තහනම් දෑ අත්හරින ලෙස ඔවුනට අණ කර ඇත. ඔවුහු ද අනෙක් ජීවීන් මෙන් මිය යති. ඔවුන් ව අපට දැකිය නොහැක. ඒ කෙරෙහි හැකියාව ද අප සතුව නැත. අල්ලාහ් මානවයාගේ හැකියාවට වඩා වෙනස් හැකියාවන් ඔවුනට ලබා දී ඇත. ඔවුන්ට පියාසර කිරීමට, ඉක්මනින් ප්‍රවාහනය කිරීමට සහ වෙස් වලා ගැනීමට ද හැකිය. ඔවුන්ගේ ස්වභාවය මිනිසුන්ගේ ස්වභාවයට වඩා වෙනස් ය. මන්ද මිනිසුන් පසින් සහ ජින්වරු ගින්නෙන් මවා නිම කොට ඇති බැවිනි.

## සුර දූතයන් හා ජින්වරුන් අතර වඩා ශක්තිමත් කවුරුන්ද?


දේවදූතයන් සදා ජීවතුන් අතර සිටින අතර සූර් නම් නලාව පිඹින දිනය තෙක් ඔවුන් මිය නොයයි. එනමුත් ජින්වරු ඊට පෙර ම මිය යති. මරණයේ දූතයා යනු මරණයට පත් කරනු මෙන් අණ ලැබුනු විට - දෙවියන්ගේ අණ පරිදි - ඔවුන්ගේ ආත්මයන් අත්පත් කරන සුර දූතයා ය. සුර දූතයන් වඩා බලවත් වන්නේ එබැවිනි. එපමණක් නොව ජින්වරුන්ගේ ම කොටසක් වන ෂෙයිතාන්වරු සුර දූතයින් දැක බිය වෙති. බද්ර් සටනේ දී දේව විශ්වාසවන්තයින්ට උපකාර කිරීම සඳහා අල්ලාහ් විසින් එවන ලද සුර දූතයන් ව ෂෙයිතාන් දුටු විගස බියට පත් වී මෙසේ පැවසූහ:නුඹලා නොදකින දෑ සැබැවින් ම මම දකිමි. සැබැවින්ම මම අල්ලාහ්ට බිය වෙමි. තවද අල්ලාහ් දඬුවම් දීමෙහි ඉතා දැඩි යැයි ඔහු පැවසුවේය. (8:48)

## සුර දූතයන් මිය යන්නේ ද?

එසේය. සුර දූතයින් ද දෙවියන්ගේ මැවිල්ලකි. සර්වබලධාරී අල්ලාහ් හැර අන් සියල්ලන් ම මිය යති. ඔහු සදා ජීවමාන ය. සදා පැවැත්මක් ඇත්තා ය. ඔහු මෙසේ පවසයි: ඔහුගේ මුහුණ හැර අන් සියල්ල විනාශ වනු ඇත. (28:88) පොළොවේ සියලු වාසීන් මිය යනු ඇත. අහසේ සිටින අයටද එය එසේ ම වනු ඇත. සර්වබලධාරී දෙවිඳුන් හැර අන් කිසිවක් රැඳී නොසිටිනු ඇත. ඔහු සදාකල් ජීවතුන් අතරය.

# දේව ග්‍රන්ථ

## පිළිබඳ ප්‍රශ්න



### දේව ග්‍රන්ථ යනු මොනවාද?



දේව ග්‍රන්ථ යනු ධර්ම දූතයින් සිය පණිවිඩය නිවේදනය කිරීමටත් නීති සම්පාදනය කිරීමටත් හැකි වන අයුරින් අල්ලාහ් තම දූතයින් වෙත පහළ කළ ග්‍රන්ථ ය. ඒවා මිනිස් වර්ගයා මෙලොවෙහි හා මතුලොවෙහි සතුටින් සිටීමට මඟ පෙන්වීමක් හා දයාවක් වශයෙන් පහළ වුණි. ඒවා අතුරින් අප දැනගත් ග්‍රන්ථ නම්: ඉබ්‍රාහිම් عليه السلام තුමාණන්ගේ ලියවිලි, දාවූද් : عليه السلام තුමාණන්ගේ සබූර් නම් දේව ග්‍රන්ථය, මූසා عليه السلام තුමාණන්ගේ තවුරාතය නම් තෝරාහ් ව, ඊසා (යේසුස්) عليه السلام තුමාණන්ගේ ඉන්ජීලය නම් බයිබලය සහ අපගේ ධර්ම දූත මුහම්මද් صلى الله عليه وآله තුමාණන්ගේ අල්කුර්ආනය වේ.

### අපට අල්කුර්ආනය අවශ්‍ය වන්නේ කුමක් නිසා ද? සහ අල්කුර්ආනය ජීවමාන ප්‍රාතිහාර්යයක් වන්නේ කුමක් නිසා ද?

මිනිසා විසින් සාදන ලද සරල යන්ත්‍රයක් සඳහා එය භාවිතා කරන ආකාරය ඉගැන්වීමට මාර්ගෝපදේශ අත්පොතක් අවශ්‍ය නම්, අල්ලාහ්ගේ මැවිල්ල වන මිනිසාට - ලෞකික හා මතුලොව සාර්ථකත්වය හා ශ්‍රද්ධාව පිළිබඳ මාර්ගය පෙන්වීමට මඟ පෙන්වීම් ග්‍රන්ථයක් අවශ්‍ය වේ. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: සියල්ල මැවූ ඔහු (අභ්‍යන්තරය පිළිබඳ) නොදන්නේද? ඔහු සියුම් ඥානීය, අභිඥානවන්තය, යැයි දැනගනු. (67:14)

අල්කුර්ආනය ප්‍රාතිහාර්යයක් වීමට හේතුව නම් මුහම්මද් නබි صلى الله عليه وآله තුමාණන් අවසාන වක්තෘවරයා වන හෙයින්, ඔහුගේ ප්‍රාතිහාර්යය සදාකාලික විය යුතුය. එමෙන් ම එතුමාට පසුව වෙනත් වක්තෘවරයෙකු නොමැති හෙයින් මනුෂ්‍ය වර්ගයා වෙත වූ සාධකය අවසන් දින දක්වා ජීවමාන ව තිබීම අනිවාර්ය වේ. අල්කුර්ආනයෙහි ප්‍රාතිහාර්යය සඳහා වූ සාක්ෂි බහුවිධය. ඒවායින් වඩාත් වැදගත් වන්නේ: භාෂාමය හා ව්‍යාකරණ

ප්‍රාතිහාර්යයයි. සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වන අරාබිවරුන් කෙරෙහි අල්ලාහ් අභියෝග කළේ මෙම ප්‍රාතිහාර්යය හරහා ය. එනමුත් මිනිසුන් සහ ජින්වරු මේ මහා අල්කුර්ආනය වැනි දෙයක් ඉදිරිපත් කිරීමට අසමත් වූහ. මෙය අල්කුර්ආනයේ පදනම දිව්‍යමය සංකල්පයක් බවට වූ ඇඟවීමකි.


## අල්ලාහ් පෙර පහළ කළ ග්‍රන්ථ ආරක්ෂා නොකිරීමට හේතුව කුමක් ද?

සර්වබලධාරී අල්ලාහ් තමා කැමති දේ කරන්නෙකි. ගැඹුරු අර්ථ ඇති හේතු රාශියක් ඔහුට තිබේ. ඒවායින් සමහරක් අප දන්නා අතර තවත් සමහර හේතු අප නොදනිමු. පැහැදිලි සාක්ෂි මගින් පෙනී යන්නේ පෙර පහළ වූ දේව ග්‍රන්ථ ආශ්චර්යයන් නොවන බවයි. එබැවින් ඒවා නොකඩවා පැවතීම අවශ්‍ය නොවීය. එපමණක් නොව, ඒවා සීමිත පුද්ගලයින් සඳහා වූ තාවකාලික රෙගුලාසි පමණකි.

## අල්කුර්ආනය වෙනස් නොවුණු බව තහවුරු කරන සාක්ෂි මොනවාද?

එවැනි ප්‍රශ්නයක් සාමාන්‍යයෙන් අසනු ලබන්නේ සාමාන්‍ය පෙළ හෝ උසස් අධ්‍යාපනය ලබන්නන් විසිනි. එබැවින් අපි නිහඬව හා කල්පනාකාරී ව අල්කුරානය දිව්‍යමය හෙළිදරව්වක් බව තහවුරු කිරීම පිණිස තර්කානුකූල පැහැදිලි කිරීම් කුමක්ද යන්න ඔහුට පැහැදිලි කරමින් මෙසේ කිව යුතුයි: යම් පුවතක් නැවත නැවතත් වාර්තා වී ප්‍රචාරය වූ කල්හි එය සහතික කරනු ලැබේ. අල්කුර්ආනය අනුප්‍රාප්තික වශයෙන් අප වෙත ලැබී ඇත. අනුප්‍රාප්තික වශයෙන් යනුː අසත්‍ය තොරතුරු ලබා නොදෙන බවට සනාථ වූ කණ්ඩායමක් එවැනිම තවත් කණ්ඩායමකින් කරුණු වාර්තා කිරීමයි. එය පොදු ජනයා හා උගතුන් ඇතුළු සියලු දෙනා දනිති. මුස්ලිම්වරුන් මෙම අල්කුර්ආනය පරම්පරාවෙන් පරම්පරාවට වාර්තා කර එය ඔවුන් රැස්වන කණ්ඩායම් වල එකිනෙකා අධ්‍යයනය කර ඔවුන්ගේ ආගමික වතාවත්වල එය කියවා එය දරුවන්ට ද උගන්වති. ගෞරවාන්විත පඬිවරයකු (ෂෙයික්) වරයකු විසින් අල්කුර්ආනයේ යම් අකුරක වැරැද්දක් සිදු වූ විට පවා, වැඩිහිටියන්ට පෙර කුඩා ළමුන් වහාම ඔහුව නිවැරදි කරති. මේ අයුරින් ම කිසිදු අඩු වැඩි කිරීමකින් තොරව පිරිසිදු ව, වෙනසක් සිදු නොවන ආකාරයෙන් එය ආරක්ෂා කර ඔවුන් අප වෙත එය ගෙනවිත් දුන්හ. එවැනි සාක්ෂියක් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම්, නබි ﷺ තුමාණන්ගේ පැවැත්ම සහ ඔහුගේ සගයන් සහ ඉතිහාසයේ ප්‍රසිද්ධ පුද්ගලයින් වැනි ඓතිහාසික කරුණු ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ. එය සෑම තාර්කික පුද්ගලයෙකු විසින්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ. අල්කුර්ආනය වැනි දෙයක් ඉදිරිපත් කරන ලෙස දෙවිඳුන් මිනිසුන්ට සහ ජින්වරුන්ට අභියෝග කළ අතර ඔවුන්ට එය කළ නොහැකි විය. අල්කුර්ආනය සමස්තයක් වශයෙන් එහි ප්‍රකාශයන්, තොරතුරු, නීති සම්පාදනයන් සහ නීතිරීතිවල කිසිදු පරස්පරතාවයක් හෝ හිඟයක් නොමැත.  එයින් පෙන්නුම් කරන්නේ එම අල්කුර්ආනය, ක්‍රියාවන් හා ප්‍රකාශයන් වල ප්‍රතිවිරෝධතා සහ විකෘති කිරීම් ඇතුළත් වන මිනිසාගේ කෘතියක් නොවන බවයි. එය හුදෙක් අල්ලාහ්ගෙන් ම වූ අතර, එය ආරක්ෂා කිරීමේ කර්තව්‍ය ඔහු විසින් ම බාරගෙන ඇත.

# ධර්ම දූතයින් පිළිබඳ ප්‍රශ්න



## ධර්ම දූතයින් සහ පණිවිඩකරුවන් යනු කවුරුන්ද?

ඔවුන් ආදම්ගෙන් පැවත එන මනුෂ්‍යයින් වෙති. දෙවිඳුන් ඔවුනට දිව්‍යමය හෙළිදරව්ව ලබා දුන් අතර ඔවුනොවුන්ගේ සමාජයට දේව පණිවිඩය ලබා දෙන ලෙසත් අල්ලාහ්ට පමණක් නමස්කාර කරන ලෙසත් ඔවුනට අණ කළේය. ඔවුන්ගෙන් පළමුවැන්නා ආදම් සහ අවසානයා මුහම්මද් තුමාණන් ය. අල්ලාහ්ගේ සාමය හා ආශිර්වාදය ඔවුනට ලැබේවා. ඔවුන්ගේ සංඛ්‍යාව අති විශාලය. මන්ද මිහිපිට වාසය කළ සෑම සමාජයක් වෙත ම දෙවිඳුන් ඔවුන් යවා ඇති අතර, යම් හෝ ධර්ම දූතයෙකු විසින් - සෑම ඓතිහාසික යුගයක ම - තම සමාජය අමතා ඔවුන්ව නිවැරදි මාවත කෙරෙහි මෙහෙයවා ඇත.

## දෙවිඳුන් පණිවිඩකරුවන් පහළ කළේ කුමක් නිසා ද?

දෙවිඳුන් පණිවුඩකරුවන් එවා ඇත්තේ මිනිසුන් හට වූ දයාවක් හා මග පෙන්වීමක් වශයෙනි. එමෙන් ම සිය පණිවිඩය සමාජයට දැනුම් දීම සඳහා ය. ධර්ම දූතයකු වනාහි ඔහුගේ ගෝත්‍රයෙන් ම වූ ප්‍රසිද්ධ මිනිසෙකු වන අතර, දේව හෙළිදරව්ව පහළ වීමට පෙර ම ඔහුගේ සත්භාවය ගැන එකී ජනයා සාක්ෂි දැරූහ. දෙවිඳුන් විසින් ධර්ම දූතයින් මිනිසුන්හට ආදර්ශයක් ලෙස පත් කර ඇත. එම ධර්ම දූතයා මිනිසුන් හට ආචාර ධර්ම හා ආකල්ප උගන්වයි. ඔවුන්ට ප්‍රයෝජනවත් වන දේ වෙත මග පෙන්වයි. ඔවුනට හානිවන දෙයින් ඔවුන්ව වළක්වයි. පණිවුඩකරුවන් යැවීමේ ප්‍රධාන අරමුණ නම් මිනිසුන් වෙත යම් සාධකයක් ඇති කිරීම පිණිස සහ අල්ලාහ්ට පමණක් නමස්කාර කිරීම යන එක් ආගමක් මත මිනිසුන් එක්රැස් කිරීම වේ. නිවැරදි මාර්ගය පෙන්වීමට නම් මිනිසුන්ට ඔවුන්ගේ ම භාෂාවෙන් මාර්ගෝපදේශ අවශ්‍ය වේ. එහෙයින් එම පණිවිඩය පැහැදිලිව හා නිවැරදිව ඔවුන් වෙත සේන්දු වීම සඳහා දෙවිඳුන් එම ගෝත්‍රිකයන්ගේ ම මව් බසින් එම ධර්ම ග්‍රන්ථ ධර්ම දූතවරුන්හට පහළ කළහ.

## ධර්ම දූතවරුන් පාපයෙන් නිර්දෝෂීද?

ධර්ම දූතවරු මනුෂ්‍ය වර්ගයාට අයත් කොට්ඨාශයකි. ඔවුන් තුළ මානුෂිය හැඟීම් පිරී ඇත. දේව පණිවිඩය විෂයෙහි අතපසුවීමක් සිදු නොවන අයුරින් ඔවුන්ව අල්ලාහ් ආරක්ෂා කළ අතර ඔවුන් පවසන හා කරන දේ මිනිසුන් අනුගමනය කිරීමට ආදර්ශයක් වීම පිණිස ඔවුන්ගේ ආකල්ප හෝ යහපුරුදු කෙරෙහි චෝදනා එල්ල නොවෙන අයුරින් ඔවුන්ව ආරක්ෂා කළහ. කිසිවෙකුත් තමන් ගෙන යන පණිවිඩය තුළ යම් ගැටළුවක් නොදැක සිටීම එයට හේතුවකි. එහෙත්, ඒ සියල්ල සමග ම, ඔවුන්ගේ දේව පණිවිඩයට අවහිරයක් නොවෙන අයුරින්, ගොවිතැන හෝ යුද්ධයට සුදුසු ස්ථානය වැරදි ලෙස විනිශ්චය කිරීම වැනි සාමාන්‍ය වැරදි ඔවුන්ගෙන් සිදු වේ.

## මුහම්මද් ﷺ යනු කවුරුද?

අල්ලාහ් විසින් එවන ලද අවසාන වක්තෘවරයා එතුමා ය. ඔහුගේ සම්පූර්ණ නම මුහම්මද් ඉබ්නු අබ්දුල්ලාහ් ඉබ්නු අබ්දුල් මුත්තලිබ් අල් හාෂිම් අල් කුරෂී වේ. ඔහු මක්කාවේ උපත ලැබුවේ (ඇත් වර්ෂය)[1] හි රබී අල් - අව්වල් මස සඳුදා දිනක ය. එතුමාගේ මව ගැබ්ගෙන සිටියදී එතුමාගේ පියාණන් මිය ගියේය. එතුමාගේ මව මිය යන විට එතුමාට වයස අවුරුදු හයකි. ඉන් පසු ඔහුගේ සීයා වූ අබ්දුල් මුත්තලිබ් ඔහුව රැකබලා ගත්තේය. එතුමාගේ වයස අවුරුදු අටේදී සීයා ද මිය ගියේය. ඉන් පසු තම මහප්පා වන අබූ තාලිබ් එතුමාණන් ව රැ කබලා ගත්හ. එතුමාගේ සත්භාවය හේතුවෙන් විශ්වාසවන්ත අවංක පුද්ගලයා යන නාමයෙන් එතුමා කැඳවන ලදී. වයස අවුරුදු හතළිහේ දී ධර්ම දූත මෙහෙවර එතුමා හට පිරිනමන ලදී. එතුමාණන් මක්කාවේ අවුරුදු දහතුනක කාලයක් ධර්ම ප්‍රචාරයේ නිරත වූ හ. මක්කා වැසියන්ගේ අවහිරයන් හා බාධාවන් සීමාව ඉක්ම වූ අවස්ථාවක උපන් දේශය හැර දමා මදීනාව වෙත එතුමා සංක්‍රමණය වූහ. එහි අවුරුදු දහයක් රැඳී සිටියහ. මදීනාවේ සිටි අන්සාරිවරුන් අතරත් මක්කාවෙන් පැමිණි මුහාජිර්වරුන් අතරත් සහෝදර බැඳීමක් එතුමාණන් ඇති කළේය. අල්ලාහ්ගෙන් වූ ධර්මය හා නීති පද්ධතිය එහි දී ක්‍රියාත්මක කළ අතර නිසි අයුරින් සිය වගකීම ඉෂ්ඨ කර දේව පණිවිඩයන් දන්වා අවසන් කළ පසු එතුමා හිජ්රි 11 වෙනි වර්ෂයෙහි මෙලොවෙන් සමු ගත්හ.

## මුහම්මද් ﷺ තුමාණන්ගේ සත්‍යභාවය තහවුරු කරන සාක්ෂි මොනවා ද?

මුහම්මද් ﷺ තුමාණන්ගේ දූතත්වය තහවුරු කරන සාක්ෂි බොහෝ ය. එයින් මුඛ්‍ය සාක්ෂි වන්නේ:

- උතුම් අල්කුර්ආනය: මෙම ආශ්චර්යමත් ග්‍රන්ථය එහි තිබෙන විස්මයට පත් කරන නිධන් මෙන් වටිනා අදහස් උදහස් පරම්පරාවෙන් පරම්පරාවට පැමිණෙන ජනයා පුදුමයට පත් කරවයි.

- එතුමාගේ ආධාරකරුවන් පමණක් නොව සතුරන් පවා සහතික කළ එතුමාගේ ජීවන රටාව සහ සදාචාරය. ඔවුන් විසින් එතුමා හැඳින්වූයේ සත්‍යවාදී, අවංක පුද්ගලයා යනුවෙනි.

- එතුමාගේ සමකාලීනයන් විසින් දැක ඇති හා ඒ පිළිබඳ පරම්පරා ගණනාවක් විස්තර කරන ලද හාස්කම් හා ප්‍රාතිහාර්යයන්.

- පරිපූර්ණත්වයෙන් හා අලංකාරයෙන් පිරී ඇති මෙම ෂරීආව නම් නිවැරදි ව්‍යවස්ථාව.

- සෑම කාලයක ම හා ස්ථානයක ම ඉස්ලාමයේ අඛණ්ඩ ව්‍යාප්තිය.

- ඉපැරැණි කතා ප්‍රවෘත්ති අන්තර්ගතය සහ අනාගත සිදුවීම් පිළිබඳ වූ එතුමාගේ අනාවැකි.

---

1. එම කාලවකවානුවේ යේමන් රාජ්‍යයේ රජ කළ ආබ්‍රහා නැමැති පාලකයෙකු විසින් පූජනීයත්වයෙන් පරිපූර්ණ මක්කාවට ජනයන් පැමිණීම වැළැක්වීම පිණිස කඃබාව විනාශ කිරීමට තීරණය කරන ලද. මේ සඳහා විශාල ඇත් සේනාවක් රැගෙන ආබ්‍රහා මක්කාව බලා පිටත් විය. මේ පිළිබඳ වැඩි විස්තර දැන ගැනීම සඳහා ඉස්ලාමීය ඉතිහාසය හා සම්බන්ධ පොත්පත් වෙත යොමු වන්න. ඉස්ලාමීය ඉතිහාසයේ සිදුවූ මෙම සිදුවීම පදනම් කරමින් එම වර්ෂය "ආමුල් ෆිල්" ඇත් වර්ෂය යනුවෙන් නම් කරනු ලැබේ. මෙම සිදුවීම ක්‍රි.ව 570 දී මුහම්මද් නබි තුමාගේ උපතට පෙර සිදු වුවකි.

## ɏදඅ ඍසා එයැ ඒැබටැර ඃඒහ 'කක්යි ඡැජැ 'බා ර්ක්ැසබටි ර්ෑ ඕවදබ ɏසප* සෘසිැ එද එයැ ී නහ සබ ධබැ හසටයඑරෑ

ඔයැ චරදචයැඑ ඃප්හ 'කක්යී චැප්ැ 'බා ඉකිැසබටි ඉැ මචදබ යසප* ඒ ඒනැබ දබ එයැ ඊමර්‍ු එද නැරමීකැපල එයැබ රදිැ එද එයැ ී නහ අසඑය නසඉරුැක ඃචැප්ැ ඉැ මචදබ යසප*ග ධදා 'කපසටයඑහ සි ජ්චිඉකැ දෙ ැඩැරහඑයසබටත බදඑයසබට ැඩැර සබ එයැ ක්බා දර සබ එයැ ී නහ ැැදේවී පසපගී ඇ ජ්බිැැ එදාහල එයැ ඇ්න යමප්බ ඉැප්පැ'ඉකැ එද ඉමසකා' චක්බැ - මිසබට යසි පසබා - අසඑය' ඩැකදප්සඑහ එය්ඒ මචැරිැැි

## නබි තුමාණන් එක රැයකින් අහසට නැගුණේ කෙසේද?

නබි ﷺ තුමාණන් "බුරාක්" නමැති සත්වයා මත ජෙරුසලමට ගොස් ජිබ්රීල් ﷺ තුමාණන් සමඟ අහස තරණය කළේය. සර්වබලධාරී දෙවියන්ට සියල්ල කළ හැකි ය. මහ පොළවේ හෝ අහසේ කිසිම දෙයක් ඔහුව දුර්වල කරන්නේ නැත. වර්තමානයේ අපට දැකිය හැකි පරිදි ල සාමාන්‍ය මිනිසාට - ඔහුගේ තීක්ෂණ බුද්ධිය භාවිතා කරමින් - ශබ්දයේ වේගයට වඩා වේගයෙන් ගමන් කරන යානාවන් නිපදවීමට හැකි වී ඇත. එමෙන් ම පින්තූරය ත්‍රිමාන ලෙස මාරු කිරීමේ තාක්ෂණය ද මිනිසා විසින් සොයා ගෙන ඇත. එකම වේලාවක එකම මිනිසකු නොයෙකුත් ස්ථානවල පෙන්නුම් කිරීමට එම තාක්ෂණයට හැකි වී ඇත. තත්ත්වය එසේ නම් අල්ලාහ් තම මැවිලිවලට වඩා අති ශ්‍රේෂ්ඨ ය. ඔවුනට වඩා හැකියාවෙන් උසස්ය.

## මුහම්මද් ﷺ තුමාණන් අවසාන නබිවරයා වූයේ ඇයි?

පණිවිඩකරුවන් යැවීමේ සංකල්පය සියුම් හේතුවක් සමඟ සම්බන්ධ වේ. එය නම් ජනයාට මග පෙන්වීම හා නිවැරදි මාර්ගය පෙන්වීම. එමෙන් ම පණිවුඩකරුවන්ගේ මරණයෙන් පසු ඔවුන්ගේ ග්‍රන්ථ තුළ ව්‍යාකූලයන් හා වෙනස් කිරීම් සිදු වූ විට, නැවතත් එවැනි ව්‍යාකූලභාවයන් සිදු නොවන ග්‍රන්ථයක් සමඟ පණිවිඩකරුවෙකු යැවීම අල්ලාහ්  ගේ න්‍යායයි. තවද, නැවත නැගිටුවීමේ දිනය දක්වා අල්කුර්ආනය ආරක්ෂා කිරීමේ වගකීම ද දෙවිඳුන් විසින් භාරගෙන ඇති අතර - එය පැහැදිලි ග්‍රන්ථයක් හා සියලු ජීවීන් කෙරෙහි පවතින සාධකයක් ලෙස තිබිය දී - සදාකල් පවතින ප්‍රාතිහාර්යයක් නම්, රසූල් ﷺ තුමාණන් ද වක්තෘවරුන්ගේ සහ පණිවිඩකරුවන්ගේ අවසානයා වීම තාර්කික කරුණකි.

## අපි නබිතුමාට ප්‍රේම කළ යුත්තේ ඇයි?

මන්ද ඔහුට ප්‍රේම කිරීම දේව විශ්වාසයේ කුළුණු වලින් එකකි. සර්වබලධාරී දෙවියන්ට ප්‍රේම කිරීම එම ප්‍රේමය නොමැතිව සම්පූර්ණ නොවේ. එතුමා කෙරෙහි වූ ප්‍රේමය අල්ලාහ්ට ප්‍රේම කිරීම සමග සෘජු ව සම්බන්ධ වී ඇත. එයට හේතුව නම් දෙවිඳුන් මෙම උතුම් පණිවිඩය ලබා දීම සඳහා මිනිසුන් සියල්ල අතුරින් එතුමාව පමණක් තෝරාගෙන ඇති නිසාය. නියත වශයෙන් ම වංශයෙන්, යහගුණාංගයෙන්, ප්‍රකාශයෙන් සහ ක්‍රියාවෙන් උතුම් මිනිසෙකුව ම අල්ලාහ් තෝරාගෙන ඇත. මන්ද පණිවිඩය භාර දිය යුත්තේ කවුරුන් වෙත ද යන්න පිළිබඳ මනාව ඔහු දන්නා බැවිනි. මෙම ශ්‍රේෂ්ඨ කර්තව්‍යය සඳහා අල්ලාහ් සියලු මිනිසුන්ගෙන් ඔහුව තෝරාගත්තේ නම් , සියලු මිනිසුන්ට වඩා ඔහු කෙරෙහි ප්‍රේම කිරීම අපගේ යුතුකමයි. මන්ද ඔහු දෙවිඳුන් පිළිබඳව මිනිසුන්ට ඉගැන් වූ බැවිනි. එතුමා සිය සමූහයාට යහපත් දූතයකු වූ අතර සිය සමූහය කෙරෙහි වඩාත් ම දයානුකම්පිත වක්තෘවරයකු විය. අල්ලාහ්ට පසු එතුමාණන් හැර කෘතඥ විය යුතු අන් කෙනෙකු නැත. ආගම හා යහපත උදෙසා මිනිසුන් ඇරයුම් කිරීමේ මාර්ගයෙහි එතුමා නොයෙකුත් වේදනාවන් විඳ දරා ගත්හ. යමෙකු තමා ගැන අවිශ්වාස කරන විට එතුමා දැඩි ලෙස දුකට පත් විය. එය ඔවුන් නිරාගත වීම පිළිබඳ අනුකම්පාවක් දැනුණු හේතුවෙනි. අල්ලාහ් මෙසේ පවසයිඃ මෙම දෙසුම (අල් කුර්ආනය) ඔවුහු විශ්වාස නොකළේ නම් ඔවුන්ගේ බලපෑම මත දුකට පත් ව නුඹ නුඹවම විනාශ කර ගන්නෙකු විය හැක. (18:6) දෙවියන්ට පසුව ආදරය ලැබීමට වඩාත් ම සුදුසු තැනැත්තා එතුමා වන්නේ ඒ බැවිනි. එතුමාට අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත් වේවා.



# අවසන් දින පිළිබඳ

# ප්‍රශ්න





## අවසන් දිනය යනු කුමක්ද?

දෙවිඳුන් ජීවී සියල්ලම නැවත නැගිටුවන දිනය එයයි. එය අවසාන දිනය ලෙස හැඳින්වෙන්නේ ඊට පසු දිනක් නොමැති නිසාය. එය විනිශ්චය දිනය ලෙස හඳුන්වනු ලබන්නේ මිනිසුන් ජීවිතයේ කළ දේ එදින අල්ලාහ් විනිශ්චය කරන බැවිනි. යමෙකු යහපත් දෑ සිදු කර දෙවියන්ට කීකරු වී ද ඔහු ස්වර්ගයට ඇතුළු වන අතර, යමෙකු නපුරු දෑ සිදු කර එසේත් නැතිනම් දෙවියන්ට අකීකරු වී ද ඔහු නිරයට පිවිසේ. සෑම මිනිසෙකුගේ ම ලෞකික ජීවිතය එදින අවසන් වේ. එය නැවත නැඟිටුවීමේ දිනය ලෙසද හැඳින්වේ. මන්ද එදින මිනිසුන් ඔවුනොවුන්ගේ සොහොන් වලින් අවදි වී විනිශ්චය සඳහා අල්ලාහ් වෙත හැරී යන බැවිනි.

## නැවත නැඟිටුවීමේ දිනය කවදා ද? දෙවිඳුන් එදින අපෙන් සඟවා තැබුවේ කුමක් සඳහා ද?

නැවත නැඟිටුවීමේ දිනය කවදාදැ' යි කිසිවෙකුත් නොදනී. දෙවිඳුන් මෙසේ පවසයිඃ මුහම්මද්! එම හෝරාව එය කවදා සිදුවන්නේ දැයි ඔවුහු ඔබගෙන් විමසති. ඒ පිළිබඳ පැවසීමට ඔබට කුමන බලයක් තිබේද? එහි අවසන් තීන්දුව නුඹගේ පරමාධිපති වෙත ය. ඒ පිළිබඳ බිය වන්නන්ට සැබැවින්ම නුඹ අවවාද කරන්නෙක් පමණි. සැබැවින්ම ඔවුන් එදින සවස් කාලයක් හෝ දිවා කාලයක් හෝ මිස රැඳී නොසිටියාක් මෙන් ඔවුන් එය සිතනු ඇත. (79ඃ 42-4) අල්ලාහ් එය අපෙන් සඟවා ඇත. මන්ද එදින සඳහා සූදානමින් සිට සැමදා අයහපත අත්හැර, යහපත සිදුකර අපගේ උපරිම උත්සාහය එදින වෙනුවෙන් යොදා ක්‍රියා කිරීම සඳහා ය. ඒ දවස කවදාදැ' යි මිනිසා දැන සිටියේ නම්, එදින එළැඹීමට කෙටි වේලාවකට පෙර මිස අන් කිසි වේලාවක් තුළ ඔහු පසුතැවිලි නොවනු ඇත. එවිට ලොව නපුරෙන් පිරී යයි.

## විනිශ්චය යනු කුමක් ද?

එය දෙවිඳුන් මෙතෙක් ආරම්භයේ සිට අවසානය දක්වා මැවූ සියල්ල එක්රැස් කිරීමයි. දෙවිඳුන් මෙසේ පවසයිඃ නියත වශයෙන් ම මුලාරම්භකයින් හා පසු පැවත එන්නන් (යන සියල්ලන්හට) නියමිත දිනක නියමිත වේලාවක එක් රැස් කරනු ලබන්නෝ වෙති යැයි (නබිවරය) නුඹ පවසනු. (56: 49-50) එසේ එක්රැස් කර ඔහු ඔවුන්ගේ ක්‍රියාවන් ඔවුනට පෙන්වා ඒවා සනාථ කර එයට සමාන කුලිය ලබා දෙනු ඇත. යහපත කළ තැනැත්තාට කුසල් ලැබෙනු ඇත. නපුර කළ තැනැත්තාට දඬුවම් ලැබෙනු ඇත. අල්ලාහ් මෙසේ පවසයිඃ එහෙයින් කවරෙක් අණුවක් තරම් ප්‍රමාණයකින් යහපතක් කර ඇත්තේ ද ඔහු එය දැක ගනී. කවරෙක් අණුවක් තරම් ප්‍රමාණයකින් අයහපතක් කර ඇත්තේ ද ඔහු එය දැක ගනී. (99:7-8)

## මරණය යනු කුමක්ද?

අවුරුදු හයක් හෝ ඊට අඩු වයසැති දරුවෙකුට සාමාන්‍යයෙන් මරණය හා නැවත නැගිටුවීම පිළිබඳ සම්පූර්ණ අරුත අවබෝධ කර ගත නොහැකි අතර මරණය යනු සියලු මිනිසුන්ට නොවැළැක්විය හැකි අවසානයයි. අනෙක් අතට, හයත් අටත් අතර වයස්වල සිටින දරුවෙකුට සාමාන්‍යයෙන් මරණයේ අරුත සහ එය සියලු මනුෂ්‍යයන් කෙරෙහි අදාළ බව අවබෝධ කර ගත හැකිය. අටත් දහයත් අතර දරුවෙකුට සම්පූර්ණයෙන් මරණය හා නැවත නැගිටුවීම පිළිබඳ අදහස තේරුම් ගත හැකිය. ඇතැම් විට ඔහු සිය පවුලේ අයෙකු මිය යෑමේ අවස්ථාව දැක තිබෙන්නට පුළුවණි. ඔහු මරණය පිළිබඳ අදහස අත්විඳින පළමු අවස්ථාව මෙය විය හැකිය. මරණය සහ මිනීවළ ගැන ඇසූ විට ඔහුට කෙසේ හැඟෙනු ඇත්දැයි අපි නොදනිමු. එම මාතෘකාව ගැන සඳහන් කිරීමේදී බිය ඔහුගේ හදවත පුරවා ගත හැකිය. ඒ නිසාම - නිදසුනක් වශයෙන් - මියගිය පුද්ගලයා මෙ ලොව අත්හැර වෙනතකට ගමන් කළ බව ඔහුට බොරු කියමින් සෑහීමට පත් නොකර මරණයේ අර්ථය ඔහුට පැහැදිලි කළ යුතුය. මන්ද කෙසේ හෝ නොදුරු අනාගතයේ ඔහු අන් අයගෙන් සත්‍යය දැන ගනු ඇත .

වඩා හොඳ ක්‍රමය නම් - දරුවා පවුලේ මරණ අවස්ථාවකට මුහුණ දීමට පෙර - ඔහුට මිය ගිය කුරුල්ලෙකු හෝ මිය ගිය ගසක් පෙන්වීම උචිත ය. එය දරුවාට මරණය පිළිබඳ සංකල්පය අවබෝධ කළ හැකි ආකාරයකින් පැහැදිලි කරයි. ඉන්පසු මියගිය අය වෙනත් ලෝකයක ජීවත් වීමට පෙළඹෙන බවත්, අප හැදී වැඩුණු විට අප සියල්ලන්ම මිය යන බවත්, අපට පෙර මිය ගිය අය සමඟ එක් වී ස්වර්ග යේ ජීවත් වන බවත් අපි දරුවාට පැහැදිලි කිරීමට උත්සාහ කළ යුතුයි. මරණය යනු අවසානය නොවන බව දරුවා දැන සිටීම වැදගත් ය. එය දේව විශ්වාසී යහපත් ගැත්තා වඩා හොඳ ජීවිතයක් සඳහා නික්ම යාමක් සහ අයහපත් ගැත්තා දඬුවම ලබා ගැනීම සඳහා නික්ම යාමකි. දෙවිඳුන් අපගේ ජීවිත උදුරා ගත් විට, එයින් අදහස් කරන්නේ ඔහු අපට ප්‍රේම නොකරන බව නොවේ. දෙවිඳුන් අපව මරණයට පත් කරන්නේ ඔහු අසල තිබෙන සිතාගත නොහැකි තරම් අලංකාරමත් ස්වර්ගයේ වාසය කිරීම පිණිස ය.

## එසේ නම් සමහර දරුවන් මිය යන්නේ කුමක් නිසා ද?

දරුවන් සාමාන්‍යයෙන් නපුරක් නොකරන අතර ඔවුන් හිතාමතා ම වැරදි දෑ නොකරයි. එබැවින් දෙවිඳුන් මිය ගිය දරුවන් දයාවෙන් පිළිගෙන ස්වර්ගයට ඇතුළත් කරයි. මිනිසා මිය ගොස් ශූන්‍ය වී ගිය ද ඔහුගේ ආත්මය ජීවමානව පවතී. එය මැවුම්කරු වෙතට නැගෙන අතර ඔහුගේ හොඳ මතකය සහ ක්‍රියාවන් ජනතාවගේ හදවත් තුළ රැඳේ. යහපත කිරීමෙන් සහ ඉස්ලාමයේ ඉගැන්වීම් වලට කැපවීමෙන් යමෙකු දෙවිඳුන් හමුවීමට සූදානම් විය යුත්තේ එබැවිනි.

## මරණයෙන් පසු අපි නික්ම යන්නේ කොහෙද?

ලොවෙහි ජීවත් වීමට අල්ලාහ් නිර්ණය කළ කාලය අවසන් වූ විට ල අපි මිනීවළට යන්නෙමු - එය මළවුන් සඳහා නිශ්චිත ස්ථානයයි - දෙවිඳුන් කෙරෙහි විශ්වාස කරන, ඔහුට කීකරු වන සහ ඔවුන්ගේ ජීවිත කාලය තුළ යහපත කළ අයට මෙම මිනීවළ ස්වර්ගයේ උයනක් බවට පත්වේ. අවසන් හෝරාව පැමිණෙන තෙක් ඔහු එහි ආශීර්වාද ලබයි.

## මළවුන් සවන් දේ ද? දකී ද? ඔහු පොළව යට හුස්ම ගන්නේ කෙසේද? ඔහු ආහාරපාන අනුභව කරන්නේ ද? නිදා ගන්නේද?

ඔව්. එසේය, මළවුන් අපගේ සුබ පැතුම් (සලාම්) සවන් දෙන අතර, අප ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කළේ නම් අපගේ ප්‍රාර්ථනාවන් ඔහු වෙත සේන්දු වේ. එහෙත්, ඔහු අප මෙන් හුස්ම ගන්නේ නැත. ඔහු අපගේ ජීවිතයට වඩා වෙනස් වෙනත් ජීවිතයක සිටී. එබැවින් මතුලොව ජීවිතයෙහි ආරම්භය සොහොන් ජීවිතයයි. එයට විවිධ නීති සහ ස්වභාවයන් ඇත. හුස්ම ගැනීම, ආහාර ගැනීම, පානය කිරීම, නිදාගැනීම හෝ රාජකාරියක් වැනි කිසිවක් එහි නැත. එහි ඇත්තේ සදාකාලික සැප හෝ සදාකාලික වදහිංසා පැමිණවීමක් පමණි.

## ස්වර්ගය යනු කුමක්ද? සහ එහි ඇත්තේ කුමක්ද?

ස්වර්ගය සාමයේ නිවහනයි. එය ඔබ කැමති හා ප්‍රිය කරන සියල්ලෙන් පිරුණු සුන්දර ස්ථානයකි. යහපත් ක්‍රියාවන් කළ තපාගශීලී මිනිසුන් යන ස්ථානය ස්වර්ගයයි. එහි විවිධ මට්ටම් වලින් යුත් දොරටු අටක් ඇති අතර විශ්වාසවන්තයන් එයට ඇතුල් වන්නේ සිය යහපත් ක්‍රියාවෙහි සහ දයාවෙහි ප්‍රමාණයට අනුව ය. අඩු යහපත් ක්‍රියාවන් ඇති අයට වඩා වැඩි යහපත් ක්‍රියාවන් ඇති අය උසස් හා අලංකාර මට්ටමක සිටී. එහෙත්, සෑම කෙනෙකු ම සතුටින්, තෘප්තියෙන් හා සාමයෙන් ජීවත් වෙති. ස්වර්ගයේ අපි සතුටින් ජීවත් වෙමු. අප කිසි විටෙකත් අසනීප හෝ වෙහෙසට පත් නොවනු ඇත. තවද සර්වබලධාරී දෙවිඳුන්, ධර්ම දූත මුහම්මද් තුමාණන් ඇතුළුව අනෙකුත් වක්තෘවරුන් සහ අප ආදරය කරන සියල්ලන් එහි මුණගැසෙමු. එහි ආහාරපාන, විනෝදාස්වාදය සහ සතුට වැනි අප ප්‍රිය කරන හා අවශ්‍ය සියල්ල ඇත.

## නිරය යනු කුමක් ද? සහ දෙවිඳුන් එය මැව්වේ කුමක් නිසා ද?

*නිරය යනු වදහිංසා වල නිවහනයි. එය අයහපත් දෑ සිදු කරන, මිනිසුන්ට හිංසා කරන, දෙවිඳුන් ට අකීකරු වන සහ ඔහුගේ අණ පිළිනොපදින අයට දඬුවම් කිරීම සඳහා දෙවිඳුන් විසින් සාදන ලද ස්ථානයකි.*

## සතුන්ගේ ඉරණම කුමක් ද? ඔවුන් ස්වර්ගයට හෝ නිරයට යනවා ද?

*සතුන් යනු අල්ලාහ්ගේ නියෝග හා තහනම් නියෝග වලට යටත්වීමෙන් බැහැර වූ ජීවි වර්ගයකි. ඒවා දෙවිඳුන් විසින් මිනිසුන් උදෙසා මවා වසඟකර දුන් මැවිල්ලකි. ඔවුනට කිසිදු විනිශ්චයක් හෝ දඬුවමක් හෝ නැත. නැවත නැගිටුවීමේ දවසෙහි, ඔවුන් සියල්ලන් ම එක්රැස් කරනු ලබන අතර - ඔවුන් යම් වරදක් සිදු කර තිබුණේ නම් - දෙවිඳුන් ඔවුන් එකිනෙකා අතර පළිගැනීමට සලස්වයි. ඔහු අං නැති බැටළුවන්ට අං ඇති බැටළුවාගෙන් පළිගැනීමට සලස්වයි. සතුන්ගෙන් පළිගැනීම අවසන් වූ විට, දෙවිඳුන් ඔවුනට "පස් මෙන් වනු" යැයි පවසනු ඇත. එවිට ඔවුන් පස් මෙන් වනු ඇත.*



# පෙර නියමය පිළිබඳ

# ප්‍රශ්න



## කද්ර් හෙවත් පෙර නියමය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

*පෙර නියමය කෙරෙහි විශ්වාසය යනු විශ්වාසයේ කුළුණු වලින් එකකි. දෙවිඳුන් මෙසේ පවසයි : තවද ඔහු සියලු දෑ මැව්වේ ය. තවද එය නිර්ණයකින් නිර්ණය කළේය. (25:2) පෙර නියමය යන්නෙන් අදහස් වන්නේ විශ්වයේ යමක් සිදුවීමට ප්‍රථමයෙන් ඒ බව වූ දෙවියන්ගේ සම්පූර්ණ දැනුම, ඒවා ලිඛිතව ලියා තැබීම, ඒ කෙරෙහි ඔහුගේ අභිමතය සහ ඒවා නිර්මාණය කිරීම යනාදිය වේ.*

## සිදුවීමක් සිදු වීමට පෙර ම එය කුමක්ද යන්න දෙවිඳුන් දැන ගන්නේ කෙසේද?

*අපට මෙය අවබෝධ කළ හැකි සරල උදාහරණයකින් පැහැදිලි කළ හැකිය. එනම්, සෙල්ලම් බඩුවක් නිෂ්පාදනය කිරීමට පෙර එයින් කළ හැකි දේ පිළිබඳ අවබෝධයක් සෙල්ලම් බඩු නිෂ්පාදකයා සතුව තිබෙනු ඇත. මන්ද ඔහු එය නිපද වූ අතර එහි ඇති ලොකු හා කුඩා සෑම විස්තරයක් ම ඔහු විසින්ම නිම වී ඇති බැවිනි. එමනිසා, මෙම සෙල්ලම් බඩුව සහ එහි හැකියාවන් පිළිබඳ සම්පූර්ණ දැනුම ඔහු සතුව ඇත. එසේනම්, මේ සියල්ලට හැකියාව ඇති මිනිසා නිර්මාණය කළේ අල්ලාහ් ය. එබැවින් දෙවිඳුන් ශක්තියෙන් වඩාත් ශ්‍රේෂ්ඨය. දැනුමෙන් වඩා ව්‍යාප්ත ය. නිර්මාණය කිරීමෙන් සර්ව සම්පූර්ණය. ඔහුගේ මැවිල්ල පිළිබඳ එහි පෙර තත්ත්වයත්, එය මැවීමේ අතරතුර එහි තත්ත්වයත්, එය මැවූ පසු එහි තත්ත්වයත් ඔහු සම්පූර්ණ ලෙස දනී. ඊට අමතරව, මිනිසා ඇතුළු කාලය සහ ස්ථානය නිර්මාණය කළේ අල්ලාහ් ය. එමනිසා සිදු වූ, සිදු වන සහ යමක් සිදු වීමට පෙර එය සිදු වූයේ නම් කුමක් වේ ද? යන්න ද අල්ලාහ් මැනවින් දනී.*



## අපගේ ක්‍රියාවන්හි අප බල කිරීමකට ලක් වී තිබේ ද? මිනිසාට ඔහුගේ ක්‍රියාවන්හි තේරීමක් තිබේද?

මිනිසා සතුව ස්ව කැමත්තෙන් තොරව සිදුවන විෂයන් හා ස්ව කැමත්තෙන් හා තේරීමක් ඇතිව කරන විෂයන් ද වේ. උපත සහ මරණය, ජීවිතයේ කාල සීමාව, අපගේ දෙමව්පියන් සහ අපගේ ඥාතීන් යනාදිය ස්ව කැමත්තෙන් තොරව සිදුවන විෂයන් වේ. ඊට පටහැනිව, යාච්ඤාව සිදු කිරීම හා සිදු නොකිරීම, දෙවිඳුන් පිළිබඳ විශ්වාස කිරීම හා නොකිරීම යනාදිය ස්ව කැමත්තෙන්, තේරීමක් ඇතිව කරන විෂයන් වේ. මෙම නිදහස සමඟ, අපගේ කැමැත්ත දෙවියන්ගේ කැමැත්ත තුළ වේ. එයින් අදහස් කරන්නේ කෙනෙකු යම් දෙයක් ස්ව කැමත්තෙන් සිදු කිරීමට පෙළඹී එය අල්ලාහ් වැළක්වීමට සිතුවේ නම් ඔහුගේ අභිමතයට අනුව ම එය වළක්වයි. එසේම ස්ව කැමත්තෙන් යම් දෙයක් සිදු නොකිරීමට අප බැඳී සිටියත් දෙවියන්ට එය කරවීමට අවශ්‍ය නම්, ඔහුගේ අභිමතයට අනුව ම එය සිදු වේ. එහෙත්, ඔහු මිනිසාට නිදහස ලබා දීමට තීරණය කළ අතර, මිනිසාගේ තේරීම් සම්බන්ධයෙන් මිනිසා විමසනු ලැබේ. පහත දැක්වෙන අල්කුර්ආන් වාක්‍යයෙහි තේරුම ද එයයි: තවද ලෝ වැසියන්ගේ පරමාධිපති වන අල්ලාහ් අභිමත කරන්නේ නම් මිස, නුඹලා අභිමත නොකරන්නෙහු ය. (81:29) ස්ව කැමත්තක් නොමැති වීම සහ නිදහස පිළිබඳ ගැටළුව ප්‍රායෝගිකව විස්තර කළ හැකිය. එය කෙසේද යත්, උපදේශකයා වීදුරු කෝප්පයක් ගෙනැවිත් දරුවාට මෙම කෝප්පය බිම හෙළා එය බිඳ දැමිය හැකි දැයි විමසිය යුතුයි. ඇත්තෙන් ම, මට පුළුවනි යැයි දරුවා උත්තර දෙයි. සැනින් උපදේශකයා මෙසේ විමසිය යුතුයි : එසේනම් ඔබ එසේ බිඳ නොදමා වැළකී සිටීමට හේතුව කුමක්ද? එසේ බිඳ දැමීම වැරදිය, එසේ බිඳ දැමීම නොකළ යුතු දෙයකි යනුවෙන් දරුවා පිළිතුරු ලබා දෙයි.

ඉන් අනතුරුව උපදේශකයා මෙසේ අදහස් දැක්විය යුතුයි: ඔබ හොඳ ළමයෙක් නිසා ඔබ මෙම කෝප්පය කඩන්නේ නැති බව දෙවිඳුන් පෙර ම දනී. නපුරු ළමයෙක් එය කඩන බව ද ඔහු දනී. එසේ නම්, මෙම කෝප්පය බිම හෙළීමෙන් කිසිවෙකු හෝ ඔබව වළක්වා තිබේ ද? එසේත් නැතිනම් අනිත් දරුවාට එය කඩන්නට කවරෙකු හෝ බල කළේ ද? යහමඟ හා අයහමඟ පවතින්නේ මේ අයුරිනි. උපදේශකයා තවදුරටත් මෙසේ කියයි: අල්ලාහ් මිනිසා වෙනුවෙන් ලියූ දේ මිනිසා නොදන්නා අතර, ඔබ එවැනි ලියූ දේ දැන ගැනීමට ද අවශ්‍ය නැත. එහෙත්, දෙවියන්ගේ දැනුම (නිර්ණයන් ලියා තැබීම ඇතුළු ව) පුළුල් හා සර්ව සම්පූර්ණ බව ඔබ විශ්වාස කළ යුතුය. ඔබගේ කැමැත්ත පිළිබඳ සහ ඔබ ඔහුගේ නියෝග වලට කොතරම් කීකරු වේද යන්න ගැන ඔබ සැලකිලිමත් විය යුතුයි. එය ඔබගේ හැකියාවේ සහ කැමැත්තෙහි සීමාවයි.

## දෙවිඳුන් ඇතැමුන්ට යහමඟ පෙන්වා තවත් අයට යහමඟ නොපෙන්වූයේ කුමක් නිසා ද?

දෙවිඳුන් සියලු ජනයාට මඟ පෙන්වීම ලබා දුන්නේය. ඔහු මෙසේ පවසයි: තවද අපි ඔහුට (හොඳ නරක යන) මාවත් දෙක වෙත මඟ පෙන්වූයෙමු. (90:10) මෙම මඟ පෙන්වීම යන්නෙන් අදහස් කරන්නේ සත්‍යය සහ අසත්‍යය පැහැදිලිව පෙනෙන නිවැරදි මාර්ග ඔවුනට පෙන්වීමයි. ඉන්පසු අල්ලාහ් මිනිසුන්ට තේරීමේ නිදහස ලබා දුන්හ. එමනිසා, සමහරු නිවැරදි මාර්ගය තෝරා ගන්නා අතර තවත් සමහරු වැරදි මාර්ගය තෝරා ගනිති.

## පවක් සිදු කර නොමඟ යන බව දෙවිඳුන් පෙර ම ලියා තිබේ නම් අපට දඬුවම් කරන්නේ කුමක් නිසා ද?

මේ පිළිබඳ දැනුම අල්ලාහ් සතු වන අතර මිනිසුන්ට ඒ පිළිබඳව සැබෑ අවබෝධයක් නොමැත. මිනිසුන් සතුව ඇත්තේ හුදු උපකල්පනයන්, මිත්‍යාවන් සහ නොදැනුවත්කම පමණි. ඒ අනුව, මිනිසා මෙලොව ජීවිතයේ කරන දේ පිළිබඳ විමසුමට ලක් වන අතර එය සිදු වන තුරු මිනිසාට තමාට නියම කර ඇති දේ දැන ගැනීමට කිසිසේත් නොහැකිය. ලිඛිත පෙර නියමය යනු අතීතයේ සිදු වූ දේ සඳහා වන සාධකයක් මිස ඉදිරියේ එන දේ සඳහා වන සාධකයක් නොවේ. අපට මෙසේ ද පැවසිය හැකිය. දෙවිඳුන් ඔබගේ ජීවිත සිදුවීම් ලියා තිබේ නම්,ඔබට ප්‍රතිලාභ ගෙනෙන දෑ පමණක් සිදු කර හානි කර දෑ අත්හරින්නේ කුමක් නිසා ද? නිදසුනක් වශයෙන්, යමෙකුට යම් නගරයකට යාමට අවශ්‍යයි. එම නගරයට ආරක්ෂිත සහ භයානක යන මාර්ග දෙකක් තිබේ නම් ඔහු තෝරා ගන්නේ කුමන මාර්ගය ද? නිසැකව ම, පළමු මාර්ගයයි. මතුලොව ගමන ද එසේම ය. දෙවියන්ගේ අණට කීකරු වීමෙන් හා තහනමින් දුරස් වී මිනිසා ස්වර්ගයට යන ආරක්ෂිත මාර්ගය තෝරා ගනී. පෙර නියමය යනු ඕනෑම කෙනෙකුට ඕනෑම දෙයක් සිදු කිරීමට වූ සාධකයක් නම්, අපට කිසි විටෙකත් අපරාධකරුවන්ට චෝදනා කිරීමට හෝ ඔවුන් අත්අඩංගුවට ගැනීමට නොහැකි වනු ඇත. මන්ද ඔවුන් ඔවුන්ගේ ක්‍රියාවන් සඳහා තර්කයක් ලෙස පෙර නියමය භාවිතා කරනු ඇත. මිනිසුන් සර්වබලධාරී අල්ලාහ්ට පිළිගෙන ඔහුට යටත් විය යුත්තේ එබැවිනි. මන්ද ඔහු කරන දේ ගැන ඔහුගෙන් ප්‍රශ්න නොකෙරේ. එහෙත්, ඔවුන්ගෙන් ප්‍රශ්න කරනු ලැබේ. (21:23) මැවීම ඔහුගේම ය. බලය ද ඔහුගේම ය.

## අල්ලාහ් අපව නිර්මාණය කළේ කුමක් නිසා ද? විශ්වයේ ආරම්භය කුමක්ද? අල්ලාහ් සතුන් නිර්මාණය කළේ කුමක් නිසා ද?

අල්ලාහ් මෙසේ පවසයි: තවද ජින් වර්ගයා හා මානව වර්ගයා වන ඔවුන් මට ගැතිකම් කිරීමට මිස මම නොමැව්වෙමි. (51:56) උන් වහන්සේ අපව මවා ඇත්තේ අපට ම ප්‍රයෝජනවත් වන අරමුණක් සඳහා ය. - එය නම් අප ඔහුට නමස්කාර කිරීම වේ. - එමෙන් ම ඔහු අපගේ ක්‍රියාවන්ට අනුව මතු ලොවෙහි ප්‍රතිඵල සූදානම් කර ඇත. ස්වර්ගය යහපත් තැනැත්තන් සඳහා වන අතර නිරය වැරදිකරුවන් සඳහා වේ. මේ මුළු විශ්වය ම දෙවියන්ගේ නිර්මාණයකි. එය අකුරට ම හා දැනුමෙන් සාදා නිම කර ඇත. අහස සහ පොළොව නිර්මාණය කොට අහසෙහි ග්‍රහලෝක ව්‍යාප්ත කළේ ඔහු ය. ඔහු තාරකාවන් නිර්මාණය කළේ පාද සංඥාවන් ලෙස සහ අලංකාරයක් ලෙස ය. ඔහු සූර්යයා නිර්මාණය කළේ අපට උණුසුම ලබා දීමටත්, ශාක පෝෂණය කිරීමටත්, විෂබීජ විනාශ කිරීමටත් ය. සත්වයින් ව වසඟකර අල්ලාහ් නිර්මාණය කොට ඇත්තේ මිනිසාගේ බඩු බාහිරාදිය රැගෙන යෑමටත්, ඒවා ආහාරක් වශයෙන් ගැනීමටත් ය. අල්ලාහ් මෙසේ පවසයි: තවද අලංකාරයක් ලෙස ද ඒවායෙහි නැග ප්‍රවාහනය කරනු පිණිස ද අශ්වයින් කොටළුවන් හා බූරුවන් ද (ඔහු මැව්වේය) තවද නුඹලා නොදන්නා දෑ ද ඔහු මවන්නේය. (16:8) මහපොළව වාසය කිරීමට සුදුසු අයුරින් සූදානම් කිරීම හා මිනිසා නිර්මාණය කිරීමට පෙර ම අන් සියල්ල නිර්මාණය කොට අවසන් කිරීම යනු අල්ලා මිනිසා කෙරෙහි පමණක් විශේෂයෙන් කළ ගෞරවයකි. එපමණක් නොව මේ නිර්මාණ සියල්ල ඔහුගේ ප්‍රශංසාව තුළින් ඔහුව සුවිශුද්ධ කරයි. ඒවා ද අල්ලාහ්ගේ ගැත්තන් මෙනි ය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: අහස් හත හා මහපොළොව ද ඒවායෙහි සිටින දෑ ද ඔහුව සුවිශුද්ධ කරයි. ඒ කිසිවක් හෝ ඔහුගේ ප්‍රශංසාව තුළින් ඔහුව සුවිශුද්ධ කරනු මිස නැත. නමුත් ඔවුන් සුවිශුද්ධ කරන අයුරු නුඹලා වටහා නොග න්නෙහුය. නියත වශයෙන් ම ඔහු දයාලු ය. අති ක්ෂමාශීලීය. (17-44)

## යම් හෝ පණිවිඩකරුවෙකු යවා නොමැති අයගෙන් දෙවිඳුන් විනිශ්චය කරන්නේ ද?

අල්ලාහ් ඔවුනට තීක්ෂණ බුද්ධිය ලබා දුන් නිසා ඔවුන් විමසුමට හා විනිශ්චයට ලක් වේ. නැවත නැඟිටුවීමේ දවසේ දී දෙවිඳුන් ඔවුන්ව පරීක්ෂාවට ලක් කරනු ඇත. තවද ආඥාවන් නිකුත් කරනු ඇත. ඔවුන් එම පරීක්ෂණයට නියමිත අයුරින් පිළිතුරු දී එම ආඥාවන්ට කීකරු වුවහොත් ඔවුන් ස්වර්ගයට ඇතුළු වනු ඇත. ඔවුන් අකීකරු වුවහොත් ඔවුන් නිරයට යනු ඇත.

## භූමියෙහි නපුරක් ඇත්තේ ඇයි?

මෙම ලෞකික ජීවිතය වනාහි යම් පරීක්ෂණයකි. එය පරිච්ඡේද දෙකකින් ගොනු කරන ලද නවකතාවක පළමු පරිච්ඡේදය වැනි ය. මතුලොව යනු පීඩිතයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ප්‍රතිචාර දැක්වීමේ හා විනිශ්චය කිරීමේ නිවහනයි. එය නවකතාවේ දෙවන පරිච්ඡේදය වැනි ය. නපුරු මිනිසුන් සිටීම සහ මෙම ජීවිතයේ ඔවුනට දඬුවම් හිමි නොවීම පරීක්ෂණයක් වන්නේ ඒ නිසාවෙනි. තවද මෙය අවසානය නොවේ. සෑම කෙනෙකු ම ඔවුනොවුන්ගේ ක්‍රියාවන් සඳහා විපාකය ලබා ගැනීම පිණිස නැවත නැඟිටුවීමේ දිනයේ දී නැඟී සිටිය යුතුය. දෙවිඳුන් මෙසේ පවසයි : එහෙයින් කවරෙක් අණුවක් තරම් ප්‍රමාණයකින් යහපතක් කර ඇත්තේ ද ඔහු එය දැක ගනී. කවරෙක් අණුවක් තරම් ප්‍රමාණයකින් අයහපතක් කර ඇත්තේද ඔහු එය දැක ගනී. (99: 7-8)

## අල්ලාහ් නපුරු මිනිසුන් නිර්මාණය කළේ කුමක් නිසා ද?

අල්ලාහ් මිනිසුන් ව මැවූ අතර හොඳ හෝ නරක දේ අතුරින් කළ යුතු දෑ තෝරා ගැනීමේ නිදහස ඔවුන්ට ලබා දී ඇත. ඔබට ශිෂ්ඨ සම්පන්න විය හැකි අතර ඔබට එසේ නොවී සිටීමට ද හැක. කෙසේ වෙතත්, ප්‍රතිවිපාක පිළිබඳ වගකීම ඔබ විසින් බාරගත යුතුය. මෙය දෙවියන්ගෙන් ලද ආශීර්වාදයක් හා ඔහුගේ සියුම් ඥානය පෙන්නුම් කරයි. මන්ද නපුරු මිනිසුන්ට ද යහපත් අයවලුන් ලෙස ජීවත් වීමේ අවකාශය මෙමඟින් ලැබෙනු ඇති අතර එසේ වීමට ඔවුනට උපකාර කිරීම අපගේ යුතුකමයි. එහෙත්, ඔවුන් ප්‍රතික්ෂේප කර ඔවුන් සිදු කරන පාපයන් සමඟ ඇලී සිටියේ නම්, අපගේ යුතුකම වන්නේ අල්ලාහ්ගේ ආදරය හා වේතනය ලබා ගැනීම පිණිස එවැනි අයවලුන්ගේ නරකින් මිනිසුන්ව වැළැක්වීමයි.




සර්වබලධාරියාණන් මෙම ලෝකයේ සෑම දෙයක ම නිර්මාතෘ වන අතර එය පරීක්ෂාවේ හා පීඩාවේ නිවහනක් බවට පත් කර ඇත. ඔහු මෙසේ පවසයි: ඔහු වනාහි මරණය සහ ජීවය මැව්වේ ය. මන්ද නුඹලා අතුරින් කවරෙකු ක්‍රියාවෙන් වඩාත් දැහැමි දැයි ඔහු නුඹලා ව පරීක්ෂා කරනු පිණිසය. (67: 2) ෂෙයිතාන්වරුන් සහ මිනිසුන් අතුරින් නොමඟ ගිය අයවලුන් සතුව නපුර පැවතීම ද දේව පරීක්ෂාවෙන් එකකි.



## සමහරුන් ආබාධිතව හෝ විකෘතිමත්ව උපත ලබන්නේ කුමක් නිසා ද?

මෙවන් අය දෙවිඳුන් විසින් පරීක්ෂාවට ලක් කරනු ලබන්නේ ඉවසිලිවන්ත වී වේතනය වැඩි වශයෙන් ලබා ගැනීමට සහ ඔහු අපට කළ දායාද අඛ විසින් සිහිපත් කර ගැනීමට ය. තවද ඔහුගේ හැකියාවන් ඉදිරියේ අපගේ දුර්වලතාවය ද එය අපට මතක් කර දෙයි. අප අතුරින් බොහෝ දෙනෙකු සෞඛ්‍ය සම්පන්න ලෙස ඔහු නිර්මාණය කොට ඇත. අපි ඒ සඳහා ඔහුට කෘතඥ විය යුතුය. උඩගුකම් පෑමෙන් නිවරැදි මාර්ගයේ ගමන් කිරීමට නොහැකි වේ. එබැවින් නිහතමානී ව හා එකිනෙකා සමඟ සහයෝග යෙන් කටයුතු කළ යුතුයි. විනිශ්චය දවසෙන් පසු, දෙවියන්ගේ අනුමැතියෙන් යහපත් දෑ කළ අයවලුන් ස්වර්ගයේ නිරෝගී සදාකාලීන ජීවනයක් ගත කරනු ඇත .

## පොහොසත් හා දුප්පත් අයවලුන් සිටින්නේ කුමක් නිසා ද? සමහර නරක මිනිසුන් මාලිගාවල සහ යහපත් මිනිසුන් කූඩාරම් වල ජීවත් වන්නේ ඇයි?

මේ ජීවිතයේ සෑම ජීවන මාර්ගයක් ම අල්ලාහ්ගෙන් ය. ඔහු විසින් මිනිසා පරීක්ෂාවට ලක් කෙරේ. ඇතැම් විට යහපත් මිනිසාගේ තපාගශීලීභාවය පරීක්ෂා කිරීම සඳහා ජීවනමාර්ග අධික ව පිරිනමයි. වෙනත් අවස්ථාවලදී සොරකමට හා ඊර්ෂ්‍යාවට එරෙහිව ඔහුගේ ඉවසීම සහ විඳ දරාගැනීම පරීක්ෂා කිරීමට ඔහු ඔහුට පෝෂණය ලබා නොදෙයි. යහපත් පුද්ගලයා මේ කෙටි කාලීන ජීවිතයේ ඉවසිලිවන්ත ව සිටින තාක්, විනිශ්චය දිනයේ ඔහුගේ විපාකය විශාල වේ. අනෙක් අතට, බොහෝ ආශීර්වාද ඇති තැනැත්තා අන් අය සමඟ අයහපත් අයුරින් කටයුතු කරමින් ඔවුනට කිසිවක් ලබා නොදී සිටින්නේ නම්, ඔහුට නැවත නැගිටුවීමේ දිනයේදී දඬුවම් ලැබෙනු ඇත. මන්ද ඔහු දෙවියන්ගේ ආශීර්වාදය අගය නොකළ බැවිනි.

දරුවාට අප මෙසේ පැවසිය හැකිය. දෙවිඳුන් විසින් මිනිසුන් ධනවතුන් හා දුප්පතුන් ලෙස විවිධ මට්ටම්වලින් මවා ඇත. එසේ මැවීම මගින් ධනවතුන් දුප්පතුන්ට යම් හෝ දෙයක් ලබා දෙයි. එමෙන් ම ශක්තිමත් අය දුර්වලයන්ට උපකාර කරයි. මිනිසුන් අතර තරාතිරම් තිබිය යුතු බව දේව න්‍යායයි. මිනිසුන්ගේ භාෂා වෙනස් ය. ඔවුන්ගේ වර්ණ විවිධ ය. ඔවුන් නොයෙකුත් ජාතීන් සහ ස්වභාවයන් ඇත්තන් ය. ඔවුන් අතර ජවසම්පන්න සහ කම්මැලි අයද සිටී. කරුණාවන්ත සහ ආත්මාර්ථකාමී. ත්‍යාගශීලී සහ දඩබ්බර අයද සිටී. ඔවුන් මුදල් හා ද්‍රව්‍ය වලින් වෙනස් ය. ඔවුන් අතර දුප්පතුන් සිටින අතර ධනවතුන් ද සිටිති. ඔවුන් සියල්ලන් ම පරීක්ෂණයට ලක්ව ඇත. පොහොසත්කම විභාගයක් වන අතර දුප්පත්කම ද එසේම ය. ඔහු ධනවතුන් සකාතය ගෙවන්නේ ද? පුණ්‍ය කටයුතු සිදු කරන්නේ ද? ත්‍යාගශීලී වන්නේ ද? යනුවෙන් පරීක්ෂා කරයි. එසේම දුප්පතා ඉවසිලිවන්තද? වෙහෙස මහන්සි වී වැඩ කරනවාද? ආදායම සොයා නොයෙකුත් ප්‍රදේශවලට යන්නේ ද? අල්ලස් ගන්නේ ද? සොරකම් කරන්නේ ද? යනුවෙන් පරීක්ෂා කරයි. ඒ සියල්ල පරීක්ෂාවන්ය. එහෙත්, පෝෂණය සපයනු ලබන්නේ දෙවිඳුන් විසින් ම වන අතර, පොහොසත්කම සහ දුප්පත්කම ස්වර්ගයට හෝ නිරයට ඇතුළු වීම වළක්වන්නේ නැත. සෑම කෙනෙකු ම ඔහු සතුව ඇති දෙයින් පරීක්ෂා කරනු ලැබේ. සියලුම මිනිසුන් එකසේ ධනවත් නම්, ඔවුන් එකිනෙකාට සේවය නොකරන අතර ඔවුනට එකිනෙකා අවශ්‍ය නොවනු ඇත. දෙවිඳුන් මෙසේ පවසයි : තවද ඔවුන්ගෙන් ඇතැමෙකු ඇතැමෙකුගෙන් සේවා සලසා ගැනීම සඳහා ඔවුන්ගෙන් ඇතැමෙකු ඇතැමෙකුට වඩා ඉහළින් තරාතිරම් වලින් උසස් කළෙමු. (43:32) ජීවන කවය ගමන් කරන්නේ එලෙස ය. එනමුත් සියල්ලන් එක් මට්ටමක සිටියේ නම් එවන් තත්ත්වයකදී ජීවන කටයුතු අඩපණ වේ.

## ? අපි අසනීප වන්නේ කුමක් නිසා ද? සහ මිනිසුන්ට විපත් සිදුවන්නේ කුමක් නිසා ද?

අල්ලාහ් විසින් සියල්ලන් ම පරීක්ෂාවට ලක් වේ. එය ඔහු අසනීප දරා ගනීවිද?නැතිනම් ඔහු කෝප වේවිද? යැයි නිරීක්ෂණය කිරීම පිණිස ය. ඉවසිලිවන්තව සිටින ඕනෑම කෙනෙකුට සර්වබලධාරී දෙවිඳුන් තිළිණ ලබා දෙයි. එමගින් නැවත නැගිටුවීමේ දිනයේ දී විශ්වාසවන්තයා සතුටු වනු ඇත. ලෙඩරෝග, විපත් සහ කරදර යනු තම තරාතිරම ඉහළ නැංවීම, අහංකාරයෙන් හා උඩගුකමින් අපගේ හදවත් හා සදාචාරය පවිත්‍ර කිරීම සඳහා වූ දෙවියන්ගේ නිර්ණයන් අතුරින් එක් නිර්ණයකි. එසේම, විශ්වාසවන්තයා යාච්ඥාව සහ ඉවසීමෙන් දෙවිඳුන් ට සමීප වන අතර එමගින් ඔහුගේ දේව විශ්වාසය සහ යහපත් ක්‍රියා වර්ධනය වේ. දෙවිඳුන් ද ඔහුට ප්‍රේම කරනු ඇත. මිනිසාට සෞඛ්‍යය හා සැප සම්පත් වල වටිනාකම එමගින් ඉගෙන ගත හැකිය. මෝටර් රථයක් ආදර්ශයට ගනිමින් දරුවාගෙන් මෙසේ අසන්න පුළුවනි : ඒ මෝටර් රථය නිපදුවේ කුමක් සඳහා ද? ගමන් කිරීමට නේද?එසේනම් නිෂ්පාදන සමාගම තිරිංග භාවිතා කිරීමේ ක්‍රමයත් සමග එය සෑදුවේ ඇයි? එසේ කිරීම එහි චලනයට විරුද්ධ නොවේද? නියත වශයෙන් ම එහි ආරක්ෂාව සඳහා තිරිංග අවශ්‍ය වේ. මෝටර් රථය සාදන ලද්දේ ගමන් කිරීම සඳහා වුව ද තිරිංග නියම වේලාවට එය නැවත්වීමට උපකාරී වේ. එමගින් රියදුරුගේ ජීවිතය විනාශ වීමෙන් වළක්වයි. දෙවිඳුන් ඔහුට නමස්කාර කිරීමෙන් අපව සතුටින් තැබීමට සැලැස්වූවා සේම, නොසැලකිල්ලෙන් පසුවන මිනිසා තමා කුමන අරමුණක් වෙනුවෙන් මවනු ලැබුවේ ද එම ශ්‍රේෂ්ඨ කර්තව්‍යය සිහිපත් කර ගැනීම සඳහා නොයෙකුත් විපත් ද දෙවිඳුන් නිර්මාණය කළේය. එමගින් තම නොසැලකිල්ල නවත්වා සිය දෙවිඳුන් සිහිපත් කර ඔහුගෙන් පාපොච්චාරණය අයැ ද ඉවසීමෙන් හා කුලිය බලාපොරොත්තුවෙන් ජීවත් වේ.

## හානිකර සතුන් හා කෘමීන් නිර්මාණය කළේ අල්ලාහ් ද?

අල්ලාහ් සෑම දෙයක ම මැවුම්කරුවා ය. සියල්ලෙහි පරමාධිපති ද ඔහු ය. ඔහු ඔහුගේ හැකියාවෙන් ඒ සියල්ල මවා ඇත්තේ කෙසේ ද එසේම ඔහුගේ ප්‍රඥාවෙන් ද ඒවා මවා ඇත. මන්ද සැබැවින් ම ඔහු සර්වඥානී සර්ව ප්‍රඥාවන්ත ය. අප නොදන්නා දේ ඔහු දනී. අල්ලාහ්ගේ දැනුම සහ ප්‍රඥාව සසඳන විට අල්ලාහ් අපට දුන් දැනුම ඉතා අල්පය. ඔහු මෙසේ ප්‍රකාශ කරන්නේ එබැවිනි: දැනුමෙන් නුඹලා වෙත පිරිනමනු ලැබ ඇත්තේ ස්වල්පයක් මිස නැත. (17:85) අල්ලාහ් එම සතුන් මැවීමේ සියුම් හේතු සියල්ල දැන ගැනීමට අපට නොහැක. දෙවිඳුන් තම මැවිල්ලෙහි පරිපූර්ණත්වය සහ ඔහුගේ නිර්මාණවල ප්‍රවීණත්වය එළිදැක්වීම එයින් එක් සියුම් හේතුවකි. ඒවා නිර්මාණයන් රාශියක් වුව ද ඒවා සියල්ලට දෙවිඳුන් ආහාර සපයයි. එමෙන් ම දෙවිඳුන් එවැනි හානිකර සතූන් මිනිසාට පරීක්ෂණයක් ලෙස මවා ඇති අතර ඒවා මඟින් කවරෙකුට හෝ හානියක් සිදු වන්නේ නම් ඒ සඳහා කුලිය ද ලබා දෙයි. එවැනි සතුන් ඝාතනය කිරීම මඟින් ඝාතකයාගේ ධෛර්යය පිලිඹුබු වේ. එසේම, ඔහුට වඩා පහත් මැවිල්ලක් හේතුවෙන් වේදනාවට හා පීඩාවට ලක් වීමෙන් මිනිසාගේ දුර්වලතාවය හා නොහැකියාව මිනිසාට පෙන්නුම් කරයි. එපමණක් නොව, ඖෂධ හා අත්හදා බැලීම්වලින් පෙනී ගොස් ඇත්තේ සර්ප හෝ එයට සමාන විෂ වලින් ප්‍රයෝජනවත් ප්‍රතිදේහ කිහිපයක් ලබා ගත හැකි බවයි. එම සර්පයන් ගොවිතැන් විනාශ කරන මීයන් අනුභව කරති. මෙම හානිකර සතුන්ගෙන් බොහොමයක් වෙනත් ප්‍රයෝජනවත් සතුන් සඳහා ආහාර වේ. එසේ නම් මෙය දෙවිඳුන් පරිපූර්ණ කළ සොබාදහමේ ඇති සමතුලිතතාවයේ පරිපථයකි.



## අපි දිනකට පස් වතාවක් යාච්ඥා කළ යුත්තේ කුමක් නිසා ද?

දෙවිඳුන් අපට අණ කළ යාච්ඥාව වනාහි විශ්වාසවන්තයාගේ ආත්මය පවිත්‍ර කිරීමේ හා නඟා සිටුවීමේ ක්‍රමය වේ. ඒවායින් ලැබෙන යහපත සමඟ සසඳන විට ඔවුන් දරන උත්සාහය ඉතා අල්ප ය. සලාතය නම් වන්දනාව තුළ අල්කුර්ආන් පාරායනය, මෙනෙහි කිරීම් සහ අයැදීම් ඇතුළත් වීම හේතුවෙන් සහ වන්දනාවේ අනෙකුත් අංගයන් එය සම්පූර්ණයෙන් ඇතුළත් කර ගැනීම හේතුවෙන් (සලාතයෙන් බැහැරව) අල්කුර්ආන් පාරායනය, මෙනෙහි කිරීම් සහ අයැදීමට වඩා සලාතය ඉතා ශ්‍රේෂ්ඨය. මන්ද සලාතය තුළ සියලු අවයවයන් හරහා ගැතිකම පෙන්නුම් කරනු ලබන බැවිනි.

විශ්වාසවන්තයින් සලාතය මගින් ප්‍රීති වෙති. මක්නිසාද යත්, ඔවුන් සලාතය අතරතුර සර්වබලධාරී දෙවිඳුන් සමඟ සිටින නිසාත් එහි දී ඔවුන් කැමති සෑම දෙයක් ම ඔහුගෙන් අයදින අතර දෙවිඳුන් ද ඔවුන්ට පිළිතුරු දීමට උත්සුක වේ. අප විසින් සලාතය ඉටු කරනු ලබන්නේ අල්ලාහ් ඒ කෙරෙහි අපට අණ කළ නිසාවෙනි. දෙවියන්ගේ අණට කීකරු වීමට අපි සැමවිට බැඳී සිටිමු. අපි ඔහුට නැමදුම් කරන්නේ ඔහු අපගේ මැවුම්කරු සහ සර්ව පෝෂකයා වූ හේතුව නිසාත් ඔහුගේ නිමක් නැති අසංඛ්‍යාත ආශීර්වාද සඳහා නමස්කාර කිරීමට සුදුසු නිසාත් ය. ඔහු මෙසේ පවසයි: අල්ලාහ්ගේ ආශිර්වාද නුඹලා ගණන් කළ ද නුඹලා ඒවා තක්සේරු නොකරනු ඇත. (16:18) මෙම වන්දනාව අපගේ ප්‍රේමයේ ප්‍රකාශයක් වන අතර සර්වබලධාරී දෙවියන්ට කෘතවේදය පළ කිරීම හා ඔහුට අපගේ අවශ්‍යතාව ප්‍රකාශ කිරීමකි. එවිට ඔහු අපගේ සෞඛ්‍යය ආරක්ෂා කරනු ඇති අතර යහපත භාග්‍ය කර, නපුරෙන් අපව ආරක්ෂා කරයි. එම වන්දනාව කිසිදා දෙවියන්ට අවශ්‍ය නැත. ඔහු අප වෙත හෝ අපගේ ක්‍රියාවන් වෙත හෝ අවශ්‍යතාව ඇත්තෙකු නොවේ. ඔහු ඒවායින් ප්‍රයෝජන නොලබයි. මෙම ක්‍රියාවන් දෙවියන්ගෙන් පැමිණි ආඥාවන් වන අතර, ඔහුගේ වක්තෘ මුහම්මද් ﷺ තුමාණන් එම ආඥාවන් ක්‍රියාත්මක කළ අයුරින් අප යාච්ඥා කිරීම ඔහු ප්‍රිය කරයි. ෂහාදාව නම් සාක්ෂි දැරීම යන්නෙහි තේරුම ද එයයි.



- එනම්, අපි අල්ලාහ්ට ඔහුගේ දූතයාණන්ගේ ක්‍රමවේදයෙන් වන්දනාමාන කරන්නෙමු යන්නයි
- මෙම වන්දනාවන් ස්වර්ගයට ඇතුළු වීමට හේතුවක් වන විශාල ප්‍රතිඵල ලබා ගැනීමේ මාර්ගයකි. මක්නිසාදයත් ප්‍රතිඵලයක් ලබා දීමට නම් ක්‍රියාවක් අවශ්‍ය බව අල්ලාහ්ගේ න්‍යායයි. ස්වර්ගය දෙවියන්ගේ දේපළක් වන අතර එය මිල අධිකය. එයට විශාල පිරිවැයක් අවශ්‍ය වන්නේ එබැවිනි. එම පිරිවැය නම් කීකරුකම වේ.



## මාගේ සලාතයෙහි දෙවියන්ගෙන් ඉල්ලා සිටියත් ඔහු මාගේ ප්‍රාර්ථනාවට පිළිතුරු නොදුන්නේ කුමක් නිසා ද?

අයැදීම සඳහා ආචාර ධර්ම ඇත. ඒවා පිළිබඳ සැළකිලිමත් වීම අනිවාර්ය වේ. මෙලොව නිසි අයුරින් ක්‍රියාත්මක වීම සඳහා දෙවිඳුන් තබා ඇති නීතිවලට ගරු කිරීම ඒවාට ඇතුළත් ය. අපි දෙවියන්ගෙන් අයැදිමු. තවද ඔහු අපට යහපත් යැයි තෝරා ගත් දෑ සිදු කරනු ඇත. නිදසුනක් ලෙස ඔබ ඔබේ පියාගෙන් මෝටර් රථ සඳහා වෙන් වූ මාර්ගයක බයිසිකලය පැදවීමට ඉල්ලා සිටියේ නම් ඔහු ඔබට ආදරය කරන නිසාත්, එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම වඩා හොඳ බව දන්නා නිසාත් ඔහු එය ප්‍රතික්ෂේප කරනු ඇත. දෙවිඳුන් කොතරම් තපාගශීලීද යත්, අපගේ අයැදීම් අවස්ථා තුනකට බෙදා ඇත: **පළමුවැන්න** - ඔහු අපගේ ඉල්ලීම් පිළිගෙන අප අසා සිටි දෑ ලබා දෙනු ඇත. **දෙවැන්න** - ඔහු අපට සිදුවීමට යන ව්‍යසනයකින් හෝ නරක දෙයකින් අපව ආරක්ෂා කරයි. **තුන්වැන්න** - එය නැවත නැගිටුවීමේ දිනයෙහි අපි අයැදූ දෑ ට වඩා යහපත් දෑ ස්වර්ගයෙහි ලබා දීමට අප වෙනුවෙන් ඉතිරි කර තබයි.

## ඇයි මා මාගේ මිතුරා මෙන් ලස්සන නොවන්නේ?

දෙවිඳුන් සෑම කෙනෙකුම ඔහුට ගැළපෙන විශේෂ ස්වරූපයෙන් මැවූ නිසා ය. දෙවියන්ගේ සියලු නිර්මාණ සුන්දර ය. දෙවිඳුන් මෙසේ පවසයි: සැබැවින්ම අපි මිනිසා ව ඉතා අලංකාර හැඩයකින් මැව්වෙමු. (95:4) සෑම පුද්ගලයෙකු ම තමාගේ ම හැඩයෙන් විශේෂ ය. වඩාත් අලංකාර ලෙස නිර්මාණය කරන ලද අය දෙවිඳුන්ට වැඩි වශයෙන් කෘතඥ විය යුතු අතර, එසේ නොමැති අය දෙවිඳුන්ට යටත් වී එය පිළිගත යුතුය. කෘතවේදී සහ ඉවසිලිමත් සියල්ලන් සඳහා ඉහළ පදවීන් සහ අතිමහත් තිළිණ ඇත.

## අල්ලාහ් අපට ප්‍රේම කරන්නේ නම් නරක දේ අපට සිදුවන්නේ කුමක් නිසා ද?

යහපත් හා අයහපත් අය වෙන් කර හඳුනා ගැනීම සඳහා දෙවිඳුන් අපව පරීක්ෂා කරයි. ඇතැම් විට මිනිසා දෙවිඳුන්ගේ රැකවරණය පතා සෑම විටම ඔහු වෙතට සමීප වීම සඳහා ද ඒ අයුරින් පරීක්ෂා කරනු ලැබේ. අල්ලාහ් යහපත් දනන්ව ද පරීක්ෂා කරනු ඇත.එය ඔවුන් ව පවිත්‍ර කිරීමටත් ඔවුන්ගේ නිලයන් ඉහළ නැංවීමටත් ය. එවිට ඔවුන් අන් අයට ආදර්ශයක් බවට පත් වී සාමාන්‍ය මිනිසුන් ද ඔවුන් ව අනුගමනය කර පීඩාවන් විඳ දරාගනු ඇත. නබි ﷺ තුමාණෝ මෙසේ පැවසූහ: "වඩාත් ම පරීක්ෂාවට ලක් වූ අය වක්තෘවරු ය. පසුව ඔවුන්ට සමීපතමයන් ය. පසුව ඔවුන්ට සමීපතමයන්" (තිර්මිදි: 2398) ආගමික ඇල්මෙහි ප්‍රමාණයට අනුව සියල්ලන් පරීක්ෂාවට ලක් වෙති. ආගමෙහි ස්ථිර නම්, ඔහුගේ පරීක්ෂාවන් වඩාත් දරුණු වේ. වක්තෘවරුන් දැඩි ලෙස පරීක්ෂාවට ලක් කළේ

එබැවිනි. ඔවුන්ගෙන් සමහරක් ඝාතනය කරනු ලැබුවෝය.තවත් සමහරු තුවාල ලැබූහ. තවත් අය අයියූබ් عليه السلام වැනි වක්තෘවරුන් දරුණු රෝගයකින් පසු විය. අපගේ වක්තෘවරයාණන් වන මුහම්මද් තුමාණන් ﷺ මක්කම සහ මදීනාහි දැඩි ලෙස තුවාල වූ නමුත් ඔහු ඉවසිලිවන්තව සිටියේය. මෙයින් අරමුණ වන්නේ, සිය විශ්වාසය හා ඇදහිල්ල අනුව සැබවින් ම ඇදහිලිවන්තයන් හා භක්තිවන්තයන් මත දුෂ්කරතා ඇති වීමය. එමෙන් ම, අල්ලාහ් තමාට අවශ්‍ය දේ කරනු ඇත. ඔහුට අවශ්‍ය පරිදි නියෝග කරනු ඇත. සර්වබලධාරී ඔහු කරන දේ ගැන විමසනු නොලබයි. මන්ද විනිශ්චයකරුවන්ගෙන් මහා විනිශ්චයකරු ඔහු වන බැවිනි.



ඉහත සඳහන් වූයේ බහුලවම අසනු ලබන ප්‍රශ්න වන අතර වෙනත් ප්‍රශ්නවලට පිළිතුරු සඳහා විද්‍යුත් පණිවිඩ හරහා අප හා සම්බන්ධ වීමට ඔබව සාදරයෙන් පිළිගනිමු. (jrakaf@gmail.com)

# අවසානය

අවසාන වශයෙන්, හැදියාව වර්ධනය කිරීමේ ක්ෂේත්‍රයෙහි වැදගත් නිර්දේශ කිහිපයක් පහත සඳහන් වේ:

- පුහුණු පාඨමාලාවන් හරහා දෙමව්පියන් තුළ තිබෙන අධ්‍යාපනය කෙරෙහි වූ උත්සුකය තීව්‍ර කිරීම. මන්ද ඔවුන් දෙදෙනා නැවුම් අධ්‍යාපනය සහ දැනුවත්භාවයෙන් යුත් විශිෂ්ට පරම්පරාවක් බිහි කිරීමේ මූලික සාධකයක් වන බැවිනි.

- ඉස්ලාමීය අනන්‍යතාවයෙන් පිරුණු මාධ්‍ය වැඩසටහන් සහ කාටූන් ජාත්‍යන්තර තාක්ෂණ ප්‍රමිතියට ගැළපෙන පරිදි සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම. එමගින් එය අවධානයට හා නැරඹීමට ලක් වේ.

- දරුවන් අරමුණු කර ගත් මාධ්‍ය වැඩසටහන් ක්ෂේත්‍රයේ සම්මන්ත්‍රණ සහ පර්යේෂණ පැවත්වීම සහ ඒ කෙරෙහි උනන්දු කරවීම. මෙය අපගේ අනන්‍යතාවය සමඟ අපගේම නිෂ්පාදන නිපදවීමට සහ විනෝදාස්වාද විකල්ප සැපයීමට උපකාරී වේ.

- ළමා අධ්‍යාපන ක්ෂේත්‍රයේ තවමත් දෝෂ සහිත හා දුර්වල තත්ත්වයක පවතී. පවතින බොහෝ වැඩසටහන් පවා විවිධ පරිසරවල විවිධ සංස්කෘතීන් ගණනාවක ලක්ෂණ වලින් යුත් පරිවර්තනයන් පමණි. එම දුර්වලතාවය ශක්තිමත් කිරීම සඳහා අපගේ ඒකාබද්ධ ප්‍රයත්නය තීව්‍ර කළ යුතුය.

- දරුවන් සඳහා දේව විශ්වාසය පෝෂණය කිරීමේ ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම. විශේෂයෙන් මෙම ක්ෂේත්‍රයේ පුහුණුකරුවන් සහ උපදේශකයින් බිහි කිරීම. තවද එම වැඩසටහන් දරුවන්ගේ විවිධ අධ්‍යාපන මට්ටම්හි කාර්යයේ යෙදී සිටින පුහුණුකරුවන් හා ගුරුදෙගුරුන් ඉලක්ක කර ගත් වැඩසටහන් වශයෙන් තිබිය යුතුය. එමෙන් ම මෙහි දී දරුවන්ගේ වයස් හා දැනුමෙහි ස්ථාවරය පිළිබඳ අවධානය යොමු කළ යුතුයි.

- අදාළ විෂයමාලා සංවර්ධනය කිරීම. එහි දේව විශ්වාසය හා සම්බන්ධ නූතන ප්‍රශ්න සමකාලීන හා සම්පූර්ණ ආකාරයකින් විසඳන අධ්‍යාපනික හා විද්‍යාත්මක තොරතුරු අඩංගු විය යුතුය.



مركز أصول
OsoulCenter
www.osoulcenter.com

osoulcenter
+966504442532
www.osoulcenter.com

عرض تعريفي عن مركز أصول
ومجالاته ووحداته.. مشاهدة ممتعة لك

International Organization for Standardization
ISO
9001
حاصل على شهادة
الاعتماد من الأيزو

حاصل على جائزة التميز
في العمل الخيري

ළමා වියේ මුල් අවදියේදී දරුවා තුළ මෙලොව පැවැත්ම පිළිබඳ දැක්ම තහවුරු කිරීම අතිශය වැදගත් වේ. එම කාලයෙහි දරුවාගේ මානසිකත්වය තුළ අන්තර්ගත වන අදහස් පුද්ගලයකුගේ පෞරුෂත්වය විවිධ අංශවලින් සාදන ප්‍රධාන පදනම ලෙස සැලකේ. දරුවා ජීවිතය පුරාම ඵලදායී සහ කාර්යක්ෂම පුද්ගලයෙකු ලෙස ගමන් කිරීමට සහ එහි විවිධ මාර්ග ඔස්සේ සමබර ලෙස ගමන් කිරීමට රුකුලක් වන අයුරින් එම පැවැත්ම පිළිබඳ දැක්ම සම්පූර්ණයෙන්ම ස්ථාපිත කිරීම වැදගත් වේ. දරුවා අසන සහ දකින දෙයින් මේ ලෝකයේ තමාගේ ම අනුවාදයක් ගොඩනගයි. ඉන්පසු ඔහුගේ ජීවිතයේ ඉතිරිව ඇත්තේ අවට තත්ත්වයන් අනුව මෙම ප්‍රධාන අනුවාදය වෙනස් කිරීම හා සංවර්ධනය කිරීම පමණි.




9 786038 249369

osoulcenter

www.osoulcenter.com

ISO 9001

To Download This Book, please Visit:

OSOUL STORE osoulstore.com